sinhalaebooks.com




Scanned with CamScanner

sinhalaebooks.com

Sugako Hashida

# ඔෂින්

## දෙවන කොටස

සුමිත්‍රා විතාරණ

සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන
135, කුඩායාල, අඟුරුවාතොට, හොරණ

Scanned with CamScanner

sinhalaebooks.com

ඔබින්
දෙවන කොටස

© සුමිත්‍රා විතාරණ

ප්‍රථම මුද්‍රණය 2011 අප්‍රියෙල්
දෙවන මුද්‍රණය 2011 සැප්තැම්බර්

ISBN - 978 - 955 - 0600 - 03- 8

පිටකවරය
පුෂ්පානන්ද ඒකනායක

පරිගණක පිටු සැකසුම
පුෂ්පානන්ද ඒකනායක
'ද ෆොන්ට් මාස්ටර්'
45/96, නාවල පාර,
කොළඹ 05.

මුද්‍රණය
තරංජී ප්‍රින්ටර්ස්
506, හයිලෙවල් පාර,
නාවින්න,
මහරගම.

ප්‍රකාශනය
සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන
135, කුඩායාල, අඟුරුවාතොට,
හොරණ
0714-815874

Scanned with CamScanner

sinhalaebooks.com

# පිදුම

80 දශකයේ සිට ම ප්‍රේක්ෂිකාවක
ලෙස ඔෂින් ඇසුරු කළ, ඔෂින්ට
ආදරය කළ මගේ සිහිනය වූයේ
ඇය පාඨකයන් අතරට ගෙන යෑමය.
ඒ සිහිනය, සැබෑ කර
ගන්නට මංපෙත් විවර කර දුන්
අතුල රන්සිරිලාල්
මහතාට
ඔෂින් වෘත්තාන්තයේ
දෙවන කොටස
ගෞරවයෙන් පුදමි.

Scanned with CamScanner

sinhalaebooks.com

## මගෙන්......

'ඔෂින්' නම් වූ ජපන් ටෙලි සිත්තම ඔස්සේ ලියන ලද ඔෂින් නවකතාවේ දෙවන කොටස ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටකිනි. ඔෂින්, බිරිඳක ලෙස ජීවිත අභියෝගයන්ට මුහුණ දෙමින් චිත්ත ධෛර්යයෙන් යුතුව ඒවා ජය ගන්නා ආකාරයත්, මවක ලෙස අප්‍රමාණ දරු සෙනෙහසින් යුතුව කටයුතු කරන ආකාරයත් මේ නවකතාවෙන් කියැවේ.

සෑම සාහිත්‍ය නිර්මාණයක ම නොකියා කියන පණිවිඩයක්, අනාගත දැක්මක් සනිටුහන්ව තිබෙන අතර එය ග්‍රහණය කර ගැනීම තුළින් නිවැරදි ජීවන දර්ශනයක් මත පිහිටා ආධ්‍යාත්මික සහනයක් ලබා ගැනීමට ඔෂින් චරිතය මඟ පෙන්වන බව මම සිතමි.

'ඔෂින්' නවකතාව ශ්‍රී ලාංකික පාඨකයන් දෝතට පිරි නැමීමට මට හැකිවූයේ ඔෂින් ටෙලි සිත්තම සිංහල භාෂාවෙන් හඬ කැවූ ටයිටස් තොටවත්ත මහතාත් ජාතික රූපවාහිනී සංස්ථාවේ හඬ කැවීම් හා උප ශීර්ෂ ගැන්වීම් අංශයේ අධ්‍යක්ෂ අතුල රන්සිරිලාල් මහතාත්, සමුද්‍ර වෙත්තසිංහ මහතාත් මේ කාර්යයෙහිලා මට දැක්වූ අප්‍රමාණ සහයෝගය හා මඟ පෙන්වීම නිසා බව කෘතඥ පූර්වකව සඳහන් කරමි. ණය ගැතිවෙමි. ස්තුතිවන්ත වෙමි.

සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන කාර්ය මණ්ඩලයට හා 'ඔෂින්' නවකතාව කියවා සිත් නිවා ගන්නා පාඨක ඔබට ද මගේ ස්තුතිය පිරි නමමි.

සුමිත්‍රා විතාරණ

නො.14,
විල්තෙර උයන
උතුරු වැව රවුම
කුරුණෑගල
2011. 04. 16

037-2221394

Scanned with CamScanner

sinhalaebooks.com

# එක

විවාහයත් සමඟ ඔෂින්ගේ ජීවිතය බෙහෙවින් වෙනස් වුණා. ඇයට අවශ්‍ය වුණේ තම සැමියාට උදව් කරන්නයි. ඒ ව්‍යාපාරික පැත්තෙන්. කගායා ආයතනයේදී ඇය ලබාගත් ව්‍යාපාරික දැනුමෙන් ප්‍රයෝජන ගන්න ඇය සිතුවා. ඒ නිසා කොණ්ඩා සැකසීම සඳහා යෙහෙළියන්ගේ නවාතැනට යාම ඈ නතර කළා, ඔවුන්ව දැනුවත් කිරීමෙන් පසුව.

"සුමිකෝ මට සමාවෙන්න. මම කල්පනා කළා රූසෝට උදව් වෙන්න. ඒ නිසා ඔයාලගෙ කොණ්ඩා සකසන්න මට එන්න වෙලාවක් නැති වෙයි."

"කමක් නෑ ඔෂින්. දැන් ඔයා ව්‍යපාරිකයෙක්ගේ බිරිඳක්. මෙහෙම එන්න හොඳ නැහැනෙ. ඔයා කොයි තරම් කාලයක් අපිව ලස්සණ කළා ද? ඒ හැමදේටම ස්තුතියි."

"මේ, මේ. එහෙම ස්තුතියි කියලා හරියන්නේ නෑ. දන්නවාද අපි මේ ජෝඩුවට හොඳ පාටියක් දෙන්න ඕනෑ."

සුමිකෝ කිව්වා.

"ඒවා අමතක කරලා නැහැ. ඔෂින් අපේ බාල සොහොයුරියනේ නේද?"

යෙහෙළියන්ගෙන් සමුගෙන ආපසු පැමිණි ඔෂින්,

"ගෙන්ජි, ඔන්න මම ආයෙ ම කොණ්ඩ සකසන්න පිට යන්නෙ නැහැ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ආ ඒක හොඳයි. මම මැඩම්ට කියන්නමයි හිටියේ, මහත්තයගෙ බිස්නස් වලට උදව් කරන්න කියලා."

"ගෙන්ජි මමත් එහෙම තමයි හිතුවේ. මේ බිස්නස් ගැන මට උගන්වනවාද ගෙන්ජි."

"ඔව්, ඔව්, මම ටික ටික උගන්වන්නම්කො. මැඩම් ඔය ඉන්න ගමන් මේ පොත්වල ලියලා තියෙන ගණන් මිනුම් එහෙම කියවලා බලන්නකෝ. ඔයා කගායා වලදී මේවා ටික ටික කරලා තියනවා කිව්වනේ."

"ඔව් ගෙන්ජි, මට ඒවා සේරම ඉගැන්නුවේ යශිරෝ මැඩම්. මම මැඩම්ට හැමදාම ණය ගැතියි."

ඔෂින්ගේ දෑස කඳුළින් පිරී ගියා.

ගෙදර වැඩ නිමකරන ඔෂින් සාප්පුවට ගොස් වැඩ කරන්න ආසා කළා. ඇය එහෙ තිබූ රෙදි පාට අනුව වර්ග කර අල්මාරි වල ඇහිරුවා. ලෝම රෙදි වෙනම ම ප්‍රදර්ශනයට තිබ්බා. බොහෝ විට රෙදි තොග මිලදී ගැනීමට පැමිණි ගැණුම්කරුවන් සමඟ සුහද ව කතාබහ කළා. ඒ අයට තේ කෝප්පයකින් සංග්‍රහ කළා. උණුසුම් දිනවල මුහුණ අත් පා පිරිසිදු කර ගැනීමට තෙත තුවා ගෙනවිත් ඔවුන්ට දුන්නා.

රූසෝ බොහෝ වෙලාවට සාප්පුවේ නොසිටි නිසා ගෙන්ජි ගණන් ලියූ පොත්පත් ඔෂින්ට දී ඇය ලවා ඒවා නිවැරදි කර ගත්තා. මේ පොත්පත් බලන ඔෂින්ට තේරුණා රෙදි තොග වශයෙන් බෙහෙවින් අලෙවි වී ඇති බව. ඒවා දී තිබුණේ ණයට. එහෙත් ණය එකතු කිරීමට කිසිම සැලසුමක් තිබුණේ නෑ. එසේම රෙදි තොග නිතර ගෙන ඒම නිසා වියදම් බෙහෙවින් වැඩි වී තිබුණා.

"ගෙන්ජි බඩු අලෙවි වුණාට ණය එකතු කරලා නැහැනේ."

"මැඩම්, අපි ණය ඉල්ලුවොත් සුළු වෙළෙන්දෝ බංකොලොත් වෙනවා. ඒ නිසා රූසෝ මහත්තයා ණය එකතු කරන්න උනන්දු වෙන්නේ නැහැ"

"අපේ වියදමත් වැඩියි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් පොත් වසා පසෙක තැබුවා.

"ගෙන්ජි, මේ ගේයි ඉඩමයි රූසෝගෙම ද?"

"ඔව් මැඩම්, ගේ නම් මහත්තයගෙ. ඉඩම නම් බද්දට ගත්ත එකක්."

"එහෙමද?"

සාප්පුවෙ වැඩ කරන සෑම විට ම ඔෂින්ට මතක් වුණේ ඇය කුඩා කලම අම්මාට කියූ ඇයගේ බලාපොරොත්තුවයි.

"මම නම් කවදාවත් ගොවි බිරිඳක් වෙන්නෙ නම් නෑ අම්මා. අම්මයි ආච්චම්මයි වගේ දුක් විඳින්න. මම කවදාහරි බිස්නස් කරනවා."

ඔෂින් සතුටින් හිටියා ඒ පිළිබඳ සිතමින්. තමා ඉලක්කය කරා පැමිණි බවයි ඇයට දැනුණේ. මේ ව්‍යාපාරය දියුණු කරගත යුතුයි. වියදම් අඩුකරගත යුතුයි. ඇය නිතරම සිතුවා.

සවස රූසෝ ගෙදර ආවා.

"ඔෂින් මම ආවා. මෙන්න ඔයාට කේක් එකක් ගෙනාවා"

"මෙච්චර ලොකු කේක් එකක්. ලොකු මිලක් ඇති."

"මිලෙන් වැඩක් නෑ ඔයාට. ඔයා මට ස්තුති කළේවත් නෑ."

"ස්තුතියි ඔයාට. එහෙම නම් අපි කේක් කමු."

"මම ඇතුළට එන්නද?"

"ආ........ ඒ සුමිකෝ නේද? එන්න සුමිකෝ."

සුමිකෝ සාප්පුවට ඇතුළු වී සියල්ලන්ටම හිස නමා ආචාර කළා. ඔවුනුත් ප්‍රති ආචාර කළා.

"ඔයා ආව එක හොඳයි. අපි කේක් කන්නයි හැදුවේ."

ඔෂින් කේක් එක කපා සුමිකෝටත් ගෙන්ජිටත්, රූසෝටත් පිරිනැමුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"දන්නවද ඔෂින් මං ආවේ ඔය දෙන්නට ආරාධනාවක් කරන්නයි. ලබන බදාදා ඇතෑන්ස් හෝටලේ ඔය දෙන්නා වෙනුවෙන් මඟුල් සාදයක් පවත්වනවා. ඉතින් ගෙන්ජිත් එක්කගෙන ම ඔය දෙන්න ම එන්න."

"ඇතෑන්ස් හෝටලේ? ඔයාට ලොකු මුදලක් වියදම් වෙයි."

"ඒකට කමක් නෑ. අපි හැමෝම එකතු වෙලයි මේ උත්සවය ඔයාලා වෙනුවෙන් පවත්වන්නේ."

"බොහෝම ස්තුතියි සුමිකෝ."

ඔෂින් හිස නමා ආචාර කළා.

"එහෙම නම් මම යනවා. අමතක කරන්න එපා දිනය."

"හොඳයි. හොඳයි. මෙයාලට අමතක වුණත් මට මතකයි." කී ගෙන්ජි සුමිකෝ කැටුව දොර ළඟට ගියා.

"ඔෂින් මම ඔයාට හොඳ බටහිර ගවුමක් ඕඩර් කළා."

"ඔය ඇත්තමද රූසෝ. ඒත්"

"ඇයි. මම ඔයාට හොඳ තෑග්ගක් දුන්නෙත් නෑ. අනිත් එක දැන් ඔයා අදින්න පළඳින්න ඕනෑ ව්‍යාපාරිකයෙක්ගේ බිරිඳ වගේ."

"ඒත් රූසෝ අපේ බිස්නස් හොඳ නෑ. ණය දුන්න ඒවා?"

"ඔයා බිස්නස් ගැන වදවෙන්න එපා. ඔයා මගේ බිරිඳ වගේ ගෙදර කටයුතු කරන්න. බිස්නස් කරන්නේ මමනේ. ගෑනු මොනවද බිස්නස් ගැන දන්නේ? හහ් හහ් හා..........." රූසෝ හඬ නඟා සිනාසුණා.

තවත් දෙදිනකට පසු පැවැත්වූ උත්සවයට රූසෝත්, ඔෂින් හා ගෙන්ජිත් ගියා. ඔෂින් ඇඳ සිටි ඇඳුම් පැළඳුම් වලින් ඇය වෙනමම කැපී පෙනුණා. සුදු සේද ගවුම ඔෂින්ට හොඳට ගැලපුණා. ඇයගේ හිස කෙස් සකස්කර තිබුණේ බටහිර විලාසිතාවකට. ඒ රූසෝගේ කැමැත්ත අනුවයි.

සියලු දෙනාම අත්පොලසන් දී ඔවුන්ව පිළිගත්තා. ජපන් කෑම බීම, මේස මත සකස් කර තිබුණා. සෑම මේසයකම සකේ

Scanned with CamScanner

sinhalaebooks.com



බෝතල් සමඟ ලී කූරක ගසා පුළුස්සන ලද කුකුල් මස් වලින් හා හරක් මස් වලින් සැකසූ යකිතෝරි සහිත ආහාර බත්දේසි ද, ඒ අතර තිබුණා. සැම දෙනාටම මනාල යුවළට දිගාසිරි පතා කැමති ආකාරයෙන් ආහාර පාන ගත්තා. සකේ වැඩිපුරම භාවිතා කළේ පිරිමි අය. ඔෂින්ගේ යෙහෙළියන් නිතරම ඔවුනට සංග්‍රහ කළා. ගෙන්ජි සකේ බෝතල් කීපයක්ම කටේ තියාගෙන ම බීගෙන ගියා.

සියලුදෙනා ම අලිංගන නැටුමට එකතු වුණා.

"ඔන්න බලන්න මම නටනවා "

ගෙන්ජි ගෙ නැටුම් බලමින් සියලු දෙනා සතුටු වුණා.

"ඔෂින් අපට අදට විතරක් රූසෝ එක්ක නටන්න දෙන්න." කියමින් අකිතෝ රූසෝගේ අත අල්ලා ගත්තා.

ඔෂින් හිනැහෙමින් ඒ දෙස බලා හිටියා.

"මේ මැඩම්, රූසෝ මහත්තයාව ඔයා බැඳ ගත්තේ නැත්නම් ඉතින් එයා මේ ගොල්ලන්ටම තමයි."

ගෙන්ජි කීවෙ මහ හඬින්. සියලු දෙනාම හිනා වුණා. මේ වන විට ගෙන්ජි පමණක් නොව රූසෝද සකේ බීමෙන් හොඳටම මත් වෙලා.

"කෝ මගෙ සකුරා මල ඔෂින්. මට ....... මට...... එයා එක්ක නටන්න ඕනෑ......."

"ඔෂින් අන්න රූසෝ ඔයාට අඬගහනවා."

"මම නටන්න දන්නේ නෑ සුමිකෝ."

"ඒකට කමක් නැහැ. යමු යමු...... මේ රූසෝ මෙන්න ඔයාගේ ඔෂින්."

"මගේ ඔෂින්........ මගේ....."

රූසෝ ඔෂින්ගේ ඉණ වටා අත දමා ඇය වැලඳගෙන තාලයට පා තබමින් නැටුවා. ඔෂින් නම් රූසෝ වැලඳගෙන ප්‍රාර්ථනා කළේ අනාගතයේ සියලු දෙය යහපත්ව පවතීවා යනුවෙනි.

Scanned with CamScanner

sinhalaebooks.com



සියලු දෙනාම එදෙස බලාගෙන හිටියේ සතුටින්. යාළුවෙක් රෑසෝ අතට සකේ බෝතලයක් ගෙනැවිත් දුන්නා. ඔහු එය කටේ තියාගෙනම බීගෙන ගියා. ඔෂින් එතනින් මෑත්ව ඇවිත් පුටුවක ඉඳ ගත්තා.

මේ අතර ටනකුරා සාප්පුවේ සේවකයෙක් පැමිණ ඔෂින්ට කතා කළා.

"මැඩම් ටිකක් එළියට එන්න."

"හොඳයි."

එළියේ හිටියේ රෑසෝගේ වෙළඳ ආයතනයේ ප්‍රධාන කළමනාකරු. ඔහු හිස නමා ඔෂින්ට ආචාර කළා.

"මැඩම්, හදිසි පණිවිඩයක්."

"පණිවිඩයක්.?"

"ඔව්, අපේ ලොකුම ගනුදෙනුකාරයාගේ බිස්නස් බංකොලොත් වෙලා. එහෙ තියෙන අපේ බඩු ටික ගන්න ඕනෑ."

ඔෂින්ගේ හිතේ මෙතෙක් පැවති සතුට පලා ගියා.

"මොනවත් කරන්න බැරිවෙයි. දෙන්නටම හොඳටම වෙරි." කී ඔෂින් ටික වේලාවක් කල්පනා කර "එහෙම නම් අපි කරත්තයක් අරගෙන ගිහින් අපේ රෙදි අරගෙන එමු." කිව්වා.

"ඒත් මැඩම් දැන් රෑ වෙලා වැඩියි. අපි හෙට උදේටම යමු. මං හෙට උදේම සේවකයෝ එක්ක එන්නම්."

"හොඳයි."

ඔහු ඔෂින්ට ආචාර කර හිස නමා පිටව ගියා.

"ඔෂින් අපි රෑසෝයි, ගෙන්ජියි කරත්තයක නංවා ගෙන යමු නේද?" සුමිකෝ කිව්වා.

"ඔව්, එහෙම හොඳයි."

එහෙ මෙහෙ වැනෙමින් කෑගසමින් සිටි රෑසෝත්, ගෙන්ජිත් කිප දෙනෙක්ම කරත්තයකට නැංවුවා. ඔවුන් නිවසට පැමිණි

Scanned with CamScanner

sinhalaebooks.com



විගසම දෙන්නාම මෙට්ටය මත ඇද වැටී නින්දකට වැටුණා. ඔෂින්ට නම් ඒ නින්ද ගියේම නැහැ. පාන්දරම කළමනාකරු පැමිණ සාප්පුවේ දොරට තට්ටු කළා. ඔෂින් ගමනට සූදානම්වයි හිටියේ. ඇය රූසෝ හා ගෙන්ජි අවදි කිරීමට උත්සාහ ගත්තා.

"ගෙන්ජි නැගිටින්න. හදිස්සියක්. නැගිටින්නකෝ."

"රූසෝ.......... රූසෝ........."

එහෙත් දෙදෙනාටම ඇහැරවීම අසීරු වුණ නිසා ඔෂින් දොර ඇරගෙන එළියට ගියා.

"අපි යමු. දෙන්නම ඇහැරවා ගන්න බැරි වුණා."

ඔවුන් ගොස් ව්‍යාපාරිකයා මුණ ගැසුණා.

"සමාවෙන්න. මම ටනකුරා මහත්තයාගේ බිරිඳ. ඔෂින් ටනකුරා. ඔබ අපේ සාප්පුවෙන් ගත්ත බඩුවලට මුදල් ගෙවා නැහැ. ඒ නිසා අපේ බඩු ආපිට ගෙනියන්නයි ආවේ. සමාවෙන්න ඒ ගැන."

ඔෂින් හිස නමා ආචාර කළා.

ව්‍යාපාරිකයා නිහඬව ම බලාගෙන හිටියා.

සේවකයෝ ඔහුගේ ගබඩාවෙන් රෙදි මිටි ගෙනැවිත් කරත්තයට දැමුවා.

"ඔය ගැන කනගාටුයි."

ඔෂින් හිස නමා ආචාර කර ආපිට එන්න පිටත් වුණා.

මේ වෙලාවේ ගෙන්ජි අවදි වී ඔෂින් කොහේදැයි සොයා බැලුවා.

"රූසෝ මහත්තයා, රූසෝ මහත්තයා දැන් අවදි වෙන්න හොඳටම දවල් වෙලා."

රූසෝ මෙට්ටය මතින් නැගී සිටියා.

"ගෙන්ජි කෝ ඔෂින්?"

"ඒක තමයි මම කියන්න හැදුවේ. මැඩම් පේන්න නැහැනේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ආ එහෙනම් උදෙන්ම ෂොපින් යන්න ඇති. ගෙන්ජි මම යනවා නාන්න. මටත් හරි වෙහෙසයි."

"රූසෝ මහත්තයා. ඇත්තටම මැඩම් කොහේ ගිහින්ද?"

"වදවෙන්න එපා ගෙන්ජි. එයා එයි."

"ඊයේ ගෙදර ආවෙ කොහොමද කියලාවත් මට මතක නෑ." ගෙන්ජි හිසට අත තියාගෙන කල්පනා කළා.

"මට මතක අපි ඊයේ හුඟාක් සකේ බිව්වා. මත්වුණා සෑහෙන්න. මැඩම්ට තරහා යන්න ඇති."

එවිට ම සාප්පුවේ දොර ඇරෙන හඬත්,

"ඇතුළට ම ගෙනත් තියන්න."

ඔෂින්ගේ හඬත් ඇසුණා.

"අන්න ඇවිත්."

ගෙන්ජිත් රූසෝත් සාප්පුව ඉදිරියට පැමිණියා.

"මේ මොකද වෙන්නේ?"

රූසෝත්, ගෙන්ජිත් විමතියෙන් බලාගෙන හිටියා.

"සමාවෙන්න. උදේ කෑම හදන්නැතුව ගියේ."

ඔෂින් දෙස නොබැලූ රූසෝ සේවකයන් දෙස බලා,

"ඇයි මේ?"

"මේවා අර ව්‍යාපාරිකයාගෙන් අපි ආපිට ගෙනාවා."

"අපි?"

"ඔව්, මැඩම් අපි එක්ක මේවා ගේන්න ගියා."

රූසෝ ඔෂින් වෙතට ගොස් කම්මුලට පාරක් ගැහුවා. ඔෂින් විසි වී ගොස් බිම වැටුණා. ගෙන්ජි රූසෝ අල්ලා ගත්තා.

"උඹ....... උඹ.......... මට ලැජ්ජා කළා."

"මම ඔයාට ලැජ්ජා කළේ නෑ රූසෝ."

"නෑ මට ලැජ්ජා කළා. උඹ වෙළෙන්දෙකුට අපහාස කළා."

Scanned with CamScanner

sinhalaebooks.com



"රූසෝ ඊයේ පාටිය වෙලාවෙයි ඒ වෙළෙන්දා බංකොලොත් වෙලා බව දැනගත්තේ. ඒක කියන්න ඔය දෙන්නම හොද සිහියෙන් හිටියේ නැහැ. අපි හිතුවා පාන්දර ම යන්න. මං උදෙත් ඔය දෙන්නව ඇහැරව ගන්න බැලුවා."

"වහගන්නවා කට. ඔහොම හිතු මනාපෙට වැඩ කරන්න බැහැ. ඒක බොහොම දරුණු දෙයක්. අපි වෙළෙන්දෝ එක්සත් වෙන්න ඕනෑ. උඹ එයාව ලැජ්ජාවට පත් කළා."

"රූසෝ මම කළේ වරදක් නම් මම ඒ රෙදි ආපිට ගිහින් දෙන්නම්. තත්වය පහදලා දීලා සමාව ගන්නම්."

"හොඳට මතක තියාගන්නවා. ගෑනු බිස්නස් කරන්න ඕන නෑ."

ඔෂින් එළියට ගොස් සේවකයන්ට හා කළමනාකරුට කතා කළා.

"සමාවෙන්න මට. මගෙ මහත්තයාගේ හිත හොඳටම රිදිලා. අපි මේවා ආපිට ගෙනියමු."

මෙවිටම සාප්පුවට තවත් වෙළෙන්දෙක් පැමිණ සිටියා.

"එපා එහෙම ආපිට ගෙනියන්න." එසේ කී ඔහු රූසෝ ඉදිරියට ගියා.

"හොඳයි ඔබ බඩු ටික ආපිට ගෙන්වා ගත්ත එක." රූසෝ නිහඬව බලාගෙන සිටියා.

"අන්න ණයකාරයෝ සාප්පුවට පැනලා ඒකෙ තිබුණ බඩු අරගෙන යනවා. මිස්ට ටනකුරා ඔබ ඉක්මනට ක්‍රියාත්මක නොවුණා නම් ඔබේ රෙදිත් ණයකාරයෝ පැහැරගෙන යනවා."

"ඒත් ආපිට ගත්තා කියලා ණය පියවෙන්නේ නැහැනේ."

"ඒත් ඔබේ බඩු ටිකවත් ඉතුරු වුණා නේ."

"දැන් මේවා ආපිට දීලා වැඩක් නෑ. බිස්නස් බංකොලොත් වෙලානම් මේවා සේරම ඉස්ටෝරුවට ම ගෙනියන්න." ගෙන්ජි කීවා.

Scanned with CamScanner

sinhalaebooks.com



සේවකයෝ රෙදි මිටි සාප්පුවේ අල්මාරි වලට ගෙනැත් දැම්මා. රූසෝ කිසිවක් නොකියා කාමරේට වැදී දොර වහ ගත්තා.

"මගේ හිතට වේදනායි ගෙන්ජි."

"එයාට මොනවත් කියන්න යන්න එපා මැඩම්. එයා තනියම හිටපුවාවේ."

"මෙහෙ හැම බිස්නස් එකක්ම අමුතුයි. එයාට හොඳටම කේන්ති ගිහින් නේද ගෙන්ජි."

"මැඩම් එයා හිතාගෙන හිටියේ එයා හොඳ බිස්නස්කාරයෙක් කියලා. එයාගේ මාන්නයට ලොකු පහරක් වැදුණා."

"ඒත් රූසෝට..........."

"මේක මැඩම් ඔයා භාරගන්න එපා."

"නෑ ගෙන්ජි මම නිසා එයාගේ හිත අවුල් වුණා." ඔෂින් කඳුළු පිස දමමින් කිව්වා.

"විවාහය ලෙහෙසි නැහැ." ඔෂින් සුසුමක් හෙලුවා. "කල් යනකොට ඕවා මැඩම්ට තේරුම් ගන්න පුළුවනි."

ඔෂින් කල්පනා කළා. අපේ බිස්නස් බංකොලොත් වෙයිද? එහෙම වෙලා අපි දුප්පත් වෙයිද? ඒත් ඔෂින් දුප්පත් කමට නම් බය නැහැ. ඔෂින්ට දුක හිතුණේ දුප්පත්කම නුහුරු රූසෝට ඒවා විඳ දරා ගැනීම අපහසු වන නිසයි. රූසෝට තමාට මෙන් අභියෝග වලට මුහුණ දීමට නොහැකි බව ඔෂින්ට තේරුම් ගියා. රූසෝ පිළිබඳ ඇයට ඇතිවුණේ කනගාටුවක්.

Scanned with CamScanner

sinhalaebooks.com

# දෙක

ඔෂින් හිතූ ආකාරයටම සාප්පුව බලාසිටිද්දී බංකොලොත් වුණා. ඒක ඒ කාලයේ රටේ ආර්ථිකය සමඟ සිද්ධ වුණු මුළු රටටම බල පෑ ආර්ථික පරිහානියක ප්‍රතිඵලයයි. තත්වය කොයි තරම් භයානක වුණාද කියනවා නම් රූසෝලා වැනි ව්‍යාපාරිකයින්ට පවා සහල් කඩෙන් ණයට ගැනීමට සිදු වුණා. මේ ණය නොගෙවා ඇති බව ඔෂින් දැන හිටියේ නැහැ.

එක් දිනක් හාල් කඩේ සේවකයෙක් ඔෂින් හමු වීමට ආවා. ඔහු ඔෂින්ට හිස නමා අචාර කළා.

"ගෙනාපු හාල් තියෙනවා. දැන්නම් හාල් අවශ්‍ය නැහැ." ඔෂින් කිව්වා.

"නෑ මැඩම්, හිඟ මුදල් ගන්නයි ආවේ."

"හිඟ මුදල්...... ආ..... හ්......, ඔව්මයි මට රූසෝ මහත්තයා සල්ලි දුන්නා. මටයි ඒක අමතක වුණේ."

"ඒකට කමක් නෑ මැඩම්. දැන් අපේ මහත්තයා ණයට හාල් දීමත් නතර කරලා. ටනකුරා සාප්පුවට නම් දෙනවා මොකද මැඩම්ලට ණය ගෙවන්න පුළුවනිනේ."

"ආ..... ඔව් ඔව් ඉන්න ටිකක්."

ඔෂින් කාමරයට ගොස් මුදල් නෝට්ටු කීපයක් ගෙනැවිත් ඔහු අත තිබ්බා.

"බොහෝම ස්තුතියි. ගිහින් එන්නම්."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි."

සවස් වන විට ගෙන්ජි ඔෂින් සොයාගෙන උයන ගෙට ආවා.

"ගෙදර වියදමට සල්ලි දෙන්න බැරිවුණානේ ආ මෙන්න."

"ගෙන්ජි ඔය ටික අරන් තියන්න. මහත්තයට ඕන වුණොත් දෙන්න. ඔන්න මම හාල් සල්ලි ගෙව්වා."

"මොනවා මම නෑ කියනකම් ඉඳලා අර හොරා උයන ගේ පැත්තෙන් රිංගුවද?"

"ගෙන්ජි අපි ණය ගත්තොත් දෙන්නම එපෑයැ. ඇයි මට නොකිව්වේ? තාත්ත මඟුලට කියලා දුන්න සල්ලි තියෙනවානේ. අපි මඟුලක් ගත්තෙත් නැහැනේ."

"මේක අපට කරදර කාලයක්."

"මට ඒක තේරෙනවා."

"මහත්තයා මේ දවස්වල ණය එකතු කරනවා."

මෙවිටම ඉදිරි දොර දෙසින් කිසිවෙකු කතාකරන හඬ ඇසුණා.

"මිස්ට ටනකුරා.......... මිස්ට ටනකුරා......."

ඔෂින් හා ගෙන්ජි සාප්පුව ඉදිරියට ගියා.

"ගෙන්ජි මහත්තයා මං ගෙනිච්ච රෙදි ටික ආපිට ගෙනාවා. දැන් රෙදි වෙළඳාම් වෙන්නේ නෑ. මං මේවා ගෙන ගියේ අත්පිට මුදලට. ඒ නිසා මේ රෙදි භාර අරගෙන මට මුදල් ගෙවන්න."

"එහෙම..... එක...පාරට"

"නෑ ගෙන්ජි. ඔයා ගණන් බලන්න. අපි ඒ ණයත් ගෙවා දමමු."

ඔෂින් ඔහුටත් මුදල් දුන්නා.

"දැන් මැඩම් කොණ්ඩා සැකසුම් වලටත් නොයන නිසා මුදල් වියදම් කරන්න එපා."

Scanned with CamScanner

sinhalaebooks.com



"නෑ ගෙන්ජි, යාළුවෝ මට මුදල් වගයක් දුන්නා "

"අනේ මම දන්නේ නැහැ. අපි බංකොලොත් "

"ගෙන්ජි ඇයි ඉතින් ඔය තරම් දුක් වෙන්නේ. බංකොලොත් කියන්නේ දුප්පත් වුණා කියන එකයි. මම නම් දුප්පත් කමට බය නැහැ. මම දුප්පත් කම හොඳට විඳලා තියෙනවා. ඒ නිසා මම හැම විටම හදන්නේ දුප්පත් කමෙන් උඩට එන්න."

"මැඩම් ඔහොම කිව්වට රූසෝ මහත්තයා ඉන්නේ හරිම දුකෙන්. අද අපේ සේවකයෝ හැමෝම අස් කළා. ඒ අය බොහොම දුප්පත් අය. මහත්තය ඒ බව දන්නවා. ඒ වුණාට කරන්න දෙයක් නෑ. මහත්තයා පපුව පැළෙන්න තරම් දුකෙන් හිටියේ."

එහෙම කිව්ව ගෙන්ජිගෙ ඇසින් කඳුළු ගලා ආවා. ඔහු හිස බිමට හරවා ගත්තා.

"ගෑනුන්ට ඕවා තේරෙන්නේ නැහැ."

කියමින් ගෙන්ජි එතනින් නැගිට යන්න ගියා.

පසුවදා උදේ ඉට්ෂු ඔෂින් සොයාගෙන ආවා.

"ඉට්ෂු ඇයි හදිස්සියේ මැඩම් අසනීපයෙන්ද?"

"මෙහෙම ගියොත් නම් ඔෂින්, මැඩම් අසනීප වෙයි. ඒකයි මම ඔයා සොයාගෙන ආවේ. දැන් එහෙ සේවිකාවෝ කවුරුත් නැහැ. මම නම් මැඩම් තනි කළේ නැහැ. මම අද මේ ආවේ මැඩම්ටත් නොකියා. අනේ ඔෂින් ඔයාට බැරිද අපිට උදව් කරන්න. මැඩම් හවස් වෙනකම් තනියම කොණ්ඩා සැකසුම් කරනවා. ඔයත් ආවොත් මැඩම්ට ලෙහෙසියක් නේ. අනේ ඔෂින්." ඉට්ෂු ඔෂින්ගේ අතින් අල්ලා ගත්තා.

"හොඳයි ඉට්ෂු මම අද රූසෝ ආවාම එයාගෙන් අහලා එයා කැමති වුණොත් හෙට ම එන්නම්කෝ"

" අනේ ඔෂින් ඔයා එන්නම ඕනෑ. "

ඉට්ෂු ආපිට ගියේ ඔෂින් පිළිබඳ විශ්වාසයකින්. එදා සවස රූසෝ කෑම මෙසයට වාඩි වූ විට ඔෂින් ඒ පිළිබඳව කතා කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම කළගුණ සලකන්න ඕන රූසෝ. ඔයා දන්නවනේ මැඩම් තමයි මට කොණ්ඩා සැකසුම් කරන්න ඉගැන්නුවේ. ස්වාධීනව කරලා හරිහම්බ කරගන්න කියලා මාර්ගය කියලා දුන්නේ. මම මේ මගේ හිතවත් අය ආරක්ෂා කරනවා නෙමෙයි. ඒක මගේ යුතුකම."

"කමක් නෑ ඔෂින්. ඔයා ගිහින් මැඩම් හසකාවාට උදව් කරන්න."

"ස්තුතියි. රූසෝ" ඔෂින් හිස නමා ආචාර කළා.

"මං ඔය දෙන්නට වද දෙන්නේ නෑ. මම උදේ, දවල් කෑම පිළියෙල කරලා යන්නම්. රෑ වෙන්න ඉස්සර ආපිට එන්නම්."

"කමක් නෑ ඔෂින් වද වෙන්න එපා. ගෙන්ජියි මමයි ඒවා බලාගන්නම්. ඔයා යන්න."

ඔෂින් පසුවදා උදේ හසකාවා මැඩම්ගේ සාප්පුවට ගොස් එහි උයන ගෙය පැත්තෙන්ම ඇතුළට ගියා. ඉට්ෂු ඔෂින් දැක්කා විතරයි,

"ඔයා ආවා නේද ඔෂින්. දැන් මැඩම්ට පුදුම හිතෙයි."

සාප්පුව ඇතුළේ මේ වෙලාවේ කාන්තාවන් කිහිප දෙනෙක් ම තමන්ගේ අවස්ථාව එනතෙක් බලා හිටියා.

ඔෂින් පාවහන් ගලවා තබා ඇතුළට ගොස් සුදු කබාය ඇඳ ගත්තා. මැඩම් ඔෂින්ව දුටුවේ එවිටයි. ඇය පුදුමයෙන් ඔෂින් දෙස බලා හිටියා. ඔෂින් ඇයට ආචාර කර කාන්තාවන් ඉදිරියට ගියා.

"එන්න මැඩම්, පරක්කු වුණා සමාවෙන්න. ඉට්ෂු මේ අනිත් මැඩම්ලාටත් එක්ක තේ ගේන්නකෝ."

එම කාන්තාව සමඟ කැඩපත ළඟට ගිය ඔෂින් ඇයගේ කර වැසෙන සේ තුවායක් දමා පනාව ගෙන හිස කෙස් පීරන්න පටන් ගත්තා. හසකාවා මැඩම්ටත් පෙර ඇය කාන්තාවන් කීප දෙනෙක්ගේ ම කොණ්ඩා සැකසුම් නිම කළා. දිවා ආහාර වෙලාවේ මැඩම් ඔෂින්ට කතා කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් ඔයා ආව එක මට හරිම ධෛර්යයක්. ඔෂින් එක පාරටම ඔයා දකිනකොට මට පුදුමත් හිතුණා."

ඔෂින් හිනැහී කෑම බඳුන් මැඩම් හසකාවාට ළං කළා.

"තනියම වැඩ කරලා මට හරිම මහන්සියි ඔෂින්. පසුගිය දවස්වල මම හිතුවේ සාප්පුව වහල දාලා ගමේ යන්න ඕනෑ කියලා."

"එහෙම හිතන්න එපා මැඩම්, මම දැන් එනවා නේ."

"ඒක ඇත්ත." ඉට්ෂු කිව්වා.

*　　　*　　　*　　　*

රූසෝ මිටි මේසය ළඟ වාඩි වී හිටියා. ගෙන්ජි කේතලයෙන් තේ කෝප්පයට වත් කර රූසෝ ළඟින් තිබ්බා.

"ගෙන්ජි."

"ඇයි මහත්තයා?"

"ගෙන්ජි, ඔෂින් විවාහ කරගෙන මම කළේ වරදක් කියලයි මට හිතෙන්නේ. "

"මහත්තයා එහෙම හිතන්නේ මැඩම් වැඩට යන නිසාද?"

"නෑ බිස්නස් බංකොලොත් වුණ නිසා."

"නෑ මහත්තයා ඒ ගැන හිතන්න එපා. මැඩම්ගේ හිත හරිම හයියයි. මැඩම් කියන්නේ සැමියයි, බිරිඳයි සියල්ල විඳ දරා ගෙන එකට ඉන්න ඕනෑ කියලා. ඒක දෙන්නට ම ශක්තියක් කියලා. අනිත් එක රූසෝ මහත්තයා තාම සාප්පුව බංකොලොත් නැහැ නේ. මේ ඇඳුම් තොග අපි කොහොම හරි විකුණමු."

"ඒත් කවුද රෙදි මිලදී ගන්නේ. රටේ ආර්ථිකය පහතට වැටිලා. අපිට හිස උස්සන්න ලැබෙන එකක් නෑ කාලෙකට."

"මහත්තයා ඕවා නොහිතා රෑ කෑම කාලා නිදාගන්න. මම මැඩම් එනවද බලන්න යන්නම්."

"ගෙන්ජි ඔන්න මම ආවා."

ඔෂින් හා ගෙන්ජි ආචාර කර ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ගෙන්ජි, මහත්තයා රෑ කෑම කෑවාද?"

"ඔව්, මම අන්න වතුර උණු කළා. ඇඟ හෝදා ගන්න."

"ගෙන්ජි මම ඔයාට ණය ගැතියි."

ඔෂින් ඉක්මනින් නින්දට වැටුණා. රූසෝ හිටියේ අවදියෙන්. නිදන ඔෂින්ගේ අත සෙමෙන් අල්ලාගත් රූසෝ සෙමෙන් වැලපුණා.

"මට සමාවෙන්න ඔෂින්. ඔයා ආයිම දුක් විඳිනවා. ඒ මම නිසා. මට දුකයි ඔෂින්."

ඔෂින් හිටියේ තද නින්දක නිසා මේ කිසිවක් ඇයට ඇසුණේ නැහැ.

ඔෂින් දිගටම මැඩම්ට උදව් කරන්න ගියා. ඒ අවුරුද්දේ අවසාන දින කීපය. ජනවාරි තුන්වෙනිදා තෙක් පැවැත්වෙන ඔසොගත්සු උත්සවය වෙනුවෙන් හසකාවා මැඩම්ගේ සාප්පුව කාර්ය බහුල වුණා. ජනවාරි පළවෙනිදා ඔෂින්ට ගෙදර යාමටවත් නොහැකි වුණා. මධ්‍යම රාත්‍රිය තෙක් කාන්තාවන් පැමිණියා, කොණ්ඩා සකසා ගැනීමට.

"ඔෂින් අද ඔයාටත් බොහෝම මහන්සි ඇති. ඔයා නොහිටින්න මට නම් මෙච්චර වැඩ කරගන්න බැරි වෙනවා."

ඉට්ෂු උණුවෙන් ම ආහාර බඳුන් ගෙනැවිත් ඔෂින් හා මැඩම් ඉදිරියේ තිබ්බා.

"ඉට්ෂුත් එන්න. ඔයත් හුඟක් මහන්සි වුණා." ඔෂින් කිව්වා.

"ඔව් ඔෂින්, ඒක ඇත්ත."

මැඩම් කිව්වා.

"එහෙම නම් ඔෂින් ඔයා හෙට පාන්දරම ගෙදර යන්න. මේ සල්ලි ඔයාගේ."

මැඩම් යෙන් පනහේ මුදල් නෝට්ටුවක් ඔෂින් ළඟින් තිබ්බා.

"මැඩම් මට මුදල් ඕනෑ නෑ. මම ආවේ මැඩම්ට උදව් කරන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් මටත් නිකම්ම වැඩ ගන්න බැහැ නේ. මම ගෙවන්නම ඕනෑ."

අවසානයේ ඔෂින් මැඩම්ට ස්තුතිකර මුදල් භාර ගත්තා. ඔෂින් පාන්දරින් ම පිටවී ගියා.

"ආයුබෝවන්."

ඔෂින් ගෙට ඇතුල් වුණා.

"අපි අවුරුදු සුප් එක හදන්න ඕනෑ නේද ගෙන්ජී?".

"ඒක මැඩම් අතින් ම එපා යැ හදන්න."

"රූසෝ ඊයේ රෑ එන්න බැරි වුණාට සමාවෙන්න." කමක් නෑ කියන්නාක් මෙන් රූසෝ හිස වැනුවා.

"කමක් නෑ මැඩම් එළිවෙලා හරි ආවානේ." ගෙන්ජි කිව්වා.

"සමාවෙන්න ඔයාලට වද දුන්නාට."

ඔෂින් උණුසුම්ව සුප් එකක් සාදා එයට නූඩ්ල්ස් එකතු කර මේසයට ගෙන ආවා.

"අපි අද අලුත් අවුරුද්දේ සකේ බොමු."

රූසෝ සකේ බෝතල් කීපයක් උණුසුම් කර මේසය මත තැබුවා.

"මැඩම් මට මේක දුන්නා."

ඔෂින් යෙන් පනහේ මුදල් නෝට්ටුව මේසය මතින් රූසෝ ළඟට තල්ලු කළා.

"කොණ්ඩා සැකසුම් ගානටලූ මට ඔය ගෙව්වේ."

"මම හිතුවේ ඔෂින් මැඩම් හසකාවට උදව්වට ගියා කියලා. ඇයි ඔයා මුදල් ගත්තේ?"

"මමත් කිව්වා මම උදව් කරන්න ආවේ කියලා. කමක් නෑ රූසෝ අපි පස්සේ ණය ගෙවමු. තියාගන්න මේක ඔයාගේ බිස්නස් වලට."

Scanned with CamScanner

sinhalaebooks.com



"එපා."

රූසෝ තරහින් කිව්වා.

"බිස්නස් වැඩවලට ගෑනුන් ගේ සල්ලි ඕනැත් නෑ. ඒවට ඇඟිලි ගහන්න ඕනැත් නෑ."

"ඔයා දුක් වුණාට ආර්ථිකය බිඳ වැටිලා. ඒ මොනවා වුණත් අපි දෙන්නා එකට ඉන්නවානේ."

ඔෂින් රූසෝ ගේ දෑතම අල්ලා ගෙන කීවා.

*　　　*　　　*　　　*

ඒ 1925 අවුරුද්දයි.

ඔෂින් නම් අවුරුද්ද පටන් ගත්තේ සතුටින්මයි. රූසෝ ගේ බිරිඳ වීම ගැන ඇය හරියට සතුටු වුණා. පසුවදාම රූසෝ ණය එකතු කිරීමට පිටව ගියා.

"සුබ දිනයක් වේවා."

ඔෂින් රූසෝට සුබ පතා ඔහු නොපෙනී යනතෙක් ම බලා සිටියා.

ඇය ඒ ගමන් ම රෙදි සාප්පුවට ගියා. ගෙන්ජි කවුන්ටරයේ වාඩි වී බලාගෙන හිටියා.

"අපේ බඩු ගන්න කවුරුත් ආවේ නැහැ නේද ගෙන්ජි. අපේ බඩු එතනමයි නේද?"

"අපිට අලුත් බිස්නස් එකක් පටන් ගන්න අමාරුයි. රූසෝ මහත්තයට තියෙන්නේ සාගා වලට යන්නයි. එහෙ එයාගේ පවුලේ අය ඉන්නවා. විශේෂයෙන් තාත්තා ඉන්නවා. ඉඩ කඩම් තියෙනවා."

"ඒත් ගෙන්ජි මම අකමැතියි සාගා යන්න."

"ඒ වුණාට යන එක හොඳයි. එයා මෙහෙ දුක් විඳිනවා. ඔයාට ඒක තේරෙන්නේ නෑ මැඩම්."

"මොනවා වුණත් මම නම් සාගා යන්නේ නැහැ."

"දරුදඬු වෙන්න එපා මැඩම්. සාගා ලස්සණයි. මුහුදත් ළඟයි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කාමරයට ගොස් දොර වසා ගත්තා. තව ටික වෙලාවකින් ඇය ගෙන්ජිට,

"මම එළියට ගිහින් එන්නම් ගෙන්ජි."

"හොඳයි."

ඔෂින් ගියේ හසකාවා මැඩම් හොයාගෙනයි.

ඔෂින් මැඩම් ඉදිරියේ වාඩි වුණා.

"මැඩම් මට දිගටම මෙහෙ වැඩ කරන්න දෙන්න මැඩම්."

"ඔෂින්, ඇයි මේ?"

"මැඩම් මට උදව් කරන්න."

ඔෂින් හිස බිමට නමා ගත්තා.

"ඔෂින් ඔයා විවාහ වෙලා."

"ඒත් මැඩම් අපට සල්ලි අවශ්‍යයි. වැඩ නොකළොත් අපට ජීවත් වෙන්න අමාරුයි."

"මම හිතුවේ නැහැ ඔෂින්ට ආර්ථික ප්‍රශ්න ඇති කියලා. මම හිතුවේ ඔයාට සරුයි කියලා. ඒක කාගෙවත් වරද නෙමෙයි ඔෂින් අපේ රටේ ආර්ථිකය පහත වැටිලා. තේ බොන්න ඔෂින්."

ඔෂින් තේ කෝප්පයක් වත් කර ගත්තා.

"ඔෂින් ඔයා මා එක්ක වැඩ කරන්න එන්න. මට ඒක සතුටක්. ඔයා බටහිර මෝස්තර කරන්න."

"ඒත් මැඩම් මේ සාප්පුවේ බටහිර මෝස්තර කරනවට මැඩම් කැමති ද?"

"ඒ ඒ කාලේ එහෙම ප්‍රතිපත්ති තිබුණේ. අපිත් කාලෙට අනුව හැඩ ගැහෙන්න එපා යැ. ඒ කාලේ අපේ හොඳ ම කාලේ. කොයි තරම් වැඩ තිබුණ ද?"

"මැඩම් මාව වැඩට ගන්නවා නේද?"

"ඔව් ඔෂින්, ඔයා එන්න. අපි වැඩ කරමු."

Scanned with CamScanner

sinhalaebooks.com



එදා රෑ ඔෂින් රූසෝ ගේ කකුල් සෙමින් මිරිකමින් කතා කළා.

"ඔෂින්ට හොඳට පුළුවනි මසාජ් කරන්න."

"ඇයි රූසෝ මම සකායා වලදී යගිරෝ මැඩම්ගේ කකුල් මසාජ් කරනවා නේ."

"රූසෝ මම හසකාවා මැඩම් ළඟ වැඩට යන්න ද?"

"ඔය ඇත්තටම ද අහන්නේ?"

"ඔව් රූසෝ ඔයා මොකද කියන්නේ.?"

"ඒත් සල්ලි වලට නම් එපා."

"සල්ලි නැතිව බැහැනේ රූසෝ."

"එහෙම නම් මම විරුද්ධයි. වැඩට යන්න දෙන්නේ නෑ."

"ගෙන්ජි කිව්වා අපට සාගා යන්න වෙයි කියලා. ඒත් ඒකට මම සතුටු නැහැ. මට එහෙ යන්න බයයි රූසෝ. අම්මා අපේ මඟුලට විරුද්ධයි නේ."

"හුම්......" රූසෝ සුසුමක් හෙලුවා.

"රූසෝ මට ඕනෑ හැමදාම ඔයා එක්ක ඉන්නයි. අපි එකටම ඉමු. ඒක අපි දෙන්නට ම ශක්තියක්."

ඔෂින් මේ සියල්ල කීවේ තමන්ටමයි.

Scanned with CamScanner

sinhalaebooks.com

# තුන

1924 ලෝක සංග්‍රාමය නිමා වුණත් රටේ ආර්ථිකය නම් දියුණු වුණේ නැහැ. රූසෝ සාප්පුවේ රෙදි විකිණීමට කෙතරම් උත්සාහ ගත්තත් ඒ එකක්වත් සාර්ථක වුණේ නෑ.

ඔෂින් වැඩට ගියේ ගෙදර අයට කෑම සකස් කරලා තියලයි.

"ගෙන්ජි දවල් කෑම රත් කරලා ගන්ඩ. රූසෝ කැමති නැහැ නිවුන කෑම කන්න."

"මැඩම් ඇයි මේ තරම් මහන්සි වෙන්නේ?"

"ඇයි ගෙන්ජි මට මේක වෙහෙසක් නෙමෙයි. මේ මම කළ රස්සාවනේ. මම යනවා."

"පරෙස්සමෙන්."

රූසෝ අවදි වුණේ දැන්.

"රූසෝ මහත්තයා ඇත්තට ම ඔයා මැඩම්ට යන්ඩ ඉඩ දුන්න ද?"

රූසෝ නිහඬව හිටියා.

"මැඩම් වැඩ කරනවට මට දුකයි. සාගා ගියොත් මොකද?"

"බෑ ආපිට සාගා යන්න බැහැ. ඔෂින් යන්න කැමති නෑ. ඔෂින් ඔය වැඩට යන්නෙත් ඒ නිසා. ඒත් ගෙන්ජි මම එයාගෙන්

Scanned with CamScanner

sinhalaebooks.com



යැපෙන්නේ නම් නැහැ. මෙහෙ කොටු නොවී ඔහෙ වැඩ කරපුදෙන්."

ඔෂින් තමා අපරදිග කොණ්ඩා මෝස්තර කරන බව දන්වා අත් පත්‍රිකා ලිව්වා.

"ඔෂින් ගේ අත් අකුරු ලස්සණයි."

"දෙන්න ඔෂින් මම මේවා අලවන්නම්."

ඉට්ෂු කිව්වා.

"ඔයානම් වෙළෙන්දෙකුටම හරියන බිරිඳක්." මැඩම් හිනැහුණා.

"ඒත් මැඩම් මම රූසෝ ගේ බිස්නස් දන්නේ නැහැ."

"ඔයාට කියලා දුන්නොත් ඔයත් බිස්නස් අල්ලා ගනියි."

සුමිකෝ සහ මිතුරියන් ඔෂින්ට පාරේදී මුණ ගැහුණා.

"ඇයි ඔෂින් ආයිම වැඩට යන්නේ? දැන් ඔයා මිසිස් ටනකුරා"

"ඒක ඇත්ත."

"ඔෂින් ඔයා ආයිම අපි ළඟට එන්නකො. මොකටද ඔච්චර ඈත යන්නේ."

"මම එන්නම්කෝ."

"ඒත් ඒකෙන් ඔෂින්ට වාසියක් නැහැනේ. අපෙන් ගන්නේ අඩු ගාණක් නේ."

"ඒකට කමක් නැහැ. ඔයාලා මට මොනතරම් උදව් කළාද?" ඔෂින් ඔවුනට ආචාර කර යන්න ගියා.

"ඇත්තටම ඇයි ඔෂින් සල්ලි තියෙද්දී වැඩට යන්නේ?"

ඔෂින් ඈතට ගිය පසු සුමිකෝ ඇසුවා.

"ඔයා දන්නේ නැද්ද දැන් රූසෝ බංකොලොත් වෙලා."

"එහෙමද? හරි කනගාටුයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ගෙන්ජි මම ආවා."

ඔෂින් ගෙට ඇතුල් වුණා.

"කෝ රූසෝ?"

"එයා නගරෙන් පිටට යනවා කිව්වා."

"වෙළඳාම කොහොමද ? අනේ මම මෝඩ ප්‍රශ්න අහනවා නේද? සීත කාලයත් ආවා නේද?"

"හරිම අමාරු කාලයක්."

"තාමත් එහෙමයි."

"ඒත් අපි තුන්දෙනා එකට ඉන්නකොට එකම පවුලක් වගේ. ඒක හරියට වටිනවා. ගෙන්ජි සකේ බෝතල් රත් කරන්න. රූසෝ දැන් එයි."

"ඔෂින්, ඇයි ඔයා පෝස්ටර් අලවන්න ගියේ. ඒක මට ලැජ්ජාවක් ඔෂින්." රූසෝ නිවසට පැමිණි ගමන් ම කිව්වා.

"මොකක්ද ඕකේ ඇති ලැජ්ජාව. ඔයත් ඔය අනුන් ඉදිරියේ හිස නමන්නේ."

ගෙන්ජි උත්තර දුන්නා.

"ඔයා දන්නවද රුසෝ පෝස්ටර් බලලා අද එක කාන්තාවක් දෙන්නෙක්ම සාප්පුවට ආවා."

ඔෂින් කීවේ සතුටින්. පසුදින එය අට දක්වා වැඩි වුණා. ඔෂින් බටහිර කොණ්ඩා මෝස්තර අලුත් විදිහට නිර්මාණය කළා. මාසයක් යනකොට නැවතත් සාප්පුවට වැඩ අධික වුණා. හැමෝට ම අවශ්‍ය වුණේ බටහිර කොණ්ඩා මෝස්තර. හසකාවා දවසක් ඔෂින්ට කතා කළා.

"ඔෂින්, මටත් බටහිර කොණ්ඩා මෝස්තර ඉගෙන ගන්න හිතෙනවා."

"කොයි තරම් හොඳයි ද මැඩම්."

"ඉතින් ඔෂින් මට උගන්වන්නකෝ."

"මැඩම්ට උගන්වන්න දෙයක් නෑ. මතකද දවසක් මැඩම්

Scanned with CamScanner

sinhalaebooks.com



තේ මට ඉගැන්නුවේ."

"දැන් මට මතක නැහැ ඔෂින්."

"හොඳයි අපි විවේක වෙලාවක ඉට්ෂුගේ කොණ්ඩය සකස්කරමු."

"ඒක හොඳයි."

සවස ඔෂින් නිවසට යාමට සූදානම් වුණා.

"ඔෂින්, මම ඔයාටත් එක්ක මාළු ගෙනාවා. අර භාජනයේ තියලා තියෙන්නේ. යනකොට අරගෙන යන්න."

"ස්තුතියි."

විවේක හැම විටම බටහිර මෝස්තර, ඉට්ෂුගේ කොණ්ඩය උපයෝගී කරගෙන මැඩම් පුරුදු වුණා. ඔෂින් උදව් වුණා.

"හරිම ලස්සණයි."

ඔෂින් ඒවා අගය කළා. ඉන්පසු දිගට ම බටහිර මෝස්තර කොණ්ඩා සැකසීම් කළ නිසා සාප්පුවට පැමිණි සේවාලාභීන් වැඩි වුණා.

"ඔෂින් මම හිතාගෙන හිටියේ සාප්පුව වහලා ගමේ යන්න. අපරාදේ එහෙම කළා නම් නේද?"

"ඔව් මැඩම්."

"ඉතින් මේ සේරම ඔයා නිසා."

"අපි මේ සාප්පුව තවත් දියුණු කරමු."

"ඔව් ඔෂින්, ඔයා නිසයි වෙස්ටන් ඉස්ටයිල් කරන්න හිතුවේ. ඉතින් මේ සේරම සලකලා මම ඔයාට ආදායමෙන් සීයට පනහක් දෙනවා."

"එපා මැඩම්, ඔබට වැඩ කරනවට මට එහෙම සල්ලි ඕනෑ නෑ."

"ඒ වුණාට තව දුරටත් මම ඔයාගේ ගුරුතුමිය නෙමෙයි. අපි හවුල් කාරයෝ. තේරුණා නේද? මේ මුදල් අරගෙන යන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



හසකාවා මැඩම් කිමෝනාව තුළින් ගත් ලියුම් කවරයක් ඔෂින් ඉදිරියේ තිබ්බා. ඔෂින් නොසැලී මැඩම් දෙස බලාගෙන හිටියා. ඇයගේ දෑස කඳුළින් පිරුණා.

"බොහෝම ස්තූතියි."

කඳුළු ගලන දෑස බිමට හරවා ඇය මැඩම්ට හිස නැමුවා.

"යන්න ඉක්මනට ගෙදර. මාළු භාජනයත් අරගෙන යන්න අමතක කරන්න එපා."

"ගෙන්ජි මම ආවා."

ඔෂින් ගෙට ගොඩවුණා.

"අදත් මැඩම් මටත් එක්ක මාළු අරගෙන."

"දෙන්න මම ඒක සකස් කරන්නම්."

"නෑ නෑ මමයි ගෙදර ගෘහනිය. මමයි උයන්නේ. ගෙන්ජි මේ සල්ලි තියාගෙන රූසෝට ඕනෑ වෙලාවට එයාට දෙන්න."

"දන්නවද මැඩම් අපට ලොකු ඕඩරයක් ලැබෙන්න යනවා."

"හරි හොඳයිනේ. එහෙම නම් මේ මුදල් අතමාරුවක් විතරයි හරිද?"

"ඔව්, මැඩම්."

"ඒ සල්ලියි මේවයි සේරම අපේ. අපි තුන්දෙනාගේ."

ඔෂින් හා ගෙන්ජි හඬනගා සිනාසුණා.

එදා රූසෝ නිවසට ආවේ ලොකු සතුටකින්.

"ඔෂින් ඔයා දන්නවද?"

"නෑ කියන්නකෝ."

"අපිට ලොකු ඕඩර් එකක් ලැබෙන්න යනවා."

"ඒක ලොකු සතුටක්. අපේ කාලය හොඳ වේගන එනවා නේද ගෙන්ජි."

"ඔව්, ඔව්."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් ඔයා වැඩිය මහන්සි වෙන්න එපා "

"වද වෙන්න එපා රූසෝ. මම හරිම සතුටින්නේ වැඩ කරන්නේ."

"ඔයාගේ ඔය සතුට නිසා මිසක් ඇත්තටම කියනවා නම් මම කැමැති නැහැ මගේ බිරිඳ වැඩට යවන්න."

ඔෂින් රූසෝ ගේ උරහිස සෙමෙන් මිරිකමින් කතා කළා.

"හොඳයි ඔයා පොහොසත් වුණ ගමන් මම ගෙදර නතර වෙනවා."

මෙහෙම කිව්වට ඔෂින්ට මතක් වුණේ මැඩම් හසකාවා.

"ඔෂින් ඔයා අතරමඟදී පැනලා යනවද?"

"නෑ මැඩම් මම දිගටම එනවා. මැඩම් එපා කියනකල් එනවා."

"මම කවදාවත් ඔයාට එපා කියන්නේ නෑ ඔෂින්. මට ඔයා ඕනෑ. ඔයා වෙස්ටන් ස්ටයිල් කරනවා දැකලා මට ඒවා කරන්න ආශාවක් ඇති වුණා. ඔයා නිසයි මේ සාප්පුව දියුණු වුණේ. ඔයා ගියොත් මම අමාරුවේ ඔෂින්."

"ඔය බොරු නේද මැඩම්."

දෙන්නාම හඬ නගා හිනාවුණා.

ඔෂින් දිගටම සාප්පුවට ගියා. ඒ වගේම සතුටින් වැඩ කළා. එදා සවස නිවසට එන විට ගෙන්ජි කවුන්ටරයේ වාඩි වී බලාගෙන හිටියා.

"මං ආවා."

ඔෂින්ට ප්‍රති උත්තරයක් ලැබුණේ නැහැ.

"ඇයි ගෙන්ජි ප්‍රශ්නයක් ද?"

ඒත් ගෙන්ජි නිහඬයි.

"කෝ රූසෝ තවම ආවේ නැද්ද?"

ගෙන්ජි කාමරය දෙස බැලුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"එහෙම නම් මම ඉක්මනට උයන්නම්."

"එපා, හදිසි නැහැ. රූසෝ මහත්තයා නිදි ද බලන්න."

"ඇයි රූසෝ අසනීපයෙන් ද?"

"නෑ ..."

ඔෂින් කාමරයේ දොර ඇරගෙන කාමරයට ගියා. රූසෝ ඇඳුම් පිටින් ම මෙට්ටය මත වැතිර සිටියා. ඔහු බිත්තිය පැත්තට හැරී සිටියත්, ඔහු නොනින්දේ බව ඔෂින්ට දැනුණා.

"රූසෝ, රූසෝ ඇයි මේ."

ඔෂින් රූසෝ ගේ ඇඟට අත තිබ්බා.

"යනවා යන්ඩ එළියට යනවා."

රූසෝ බෙරිහන් දුන්නා. ඔෂින් ගැස්සිලා ගියා.

"ඇයි ...... ඇයි මේ."

"යනවා යන්ඩ කට වහගෙන මට ඉන්ඩ දීලා."

ඔෂින්ට තේරුම් ගන්ඩ බැරිවුණා රූසෝ ගේ මේ කේන්තිය කුමක් නිසාද කියලා.

ඇය කඳුළු පිස දමමින් ගෙන්ජි ළඟට ගියා.

"මැඩම් ඒවා ගණන් ගන්ඩ එපා."

"නෑ ගෙන්ජි මොකක්ද සිද්ධ වෙලා තියෙන්නේ."

"අර අපි කිව්ව ලොකු ඕඩර් එක, ඒක බොරුවක්. වංචාවක්. එයාව රවට්ටලා. මේක රූසෝ මහත්තයගෙ මෝඩකම''

"ඔහොමත් ගැටවලට අහුවෙනවද?"

"මේකයි මැඩම්, මහත්තයා හිටියෙ අමාරුවෙ වැටිලා. ඒ නිසා මුදලක් ලැබෙනවා කිව්වාම එයා ඒකට කෑදර වුණා. ඒ නිසා එයාට වංචා කළා කියලා එයාට තේරුණේ නැහැ. එයා ලැජ්ජා වෙනවා."

"අපේ රෙදිත් අපට අහිමි වුණා."

Scanned with CamScanner

sinhalaebooks.com



"පොලිසියට කිව්ව ද?"

"එයා කවුරුවත් දැන ගන්නවට කැමැති නෑ. ඊට වඩා මැරෙන එක හොඳයිලු."

"මාත් එක්කත් තරහ වෙලා ඉන්නේ."

"මේවා දැනගත්තාම ඔයා වද වෙනවා කියලා එයාට දුකයි. ඒකයි ඒ. මැඩම් මම කියන දේ අහන්න. දැන් සාගා යන එකයි හොඳ."

පහුවදා උදේම ඔෂින් රූසෝ'ට කතා කළා.

"රූසෝ නැගිටින්න. ඔයා ඊයේ ඉඳලාම බඩගින්නෙනේ. එන්න අපි කෑම කන්න යමු. මම කෑවෙත් නැහැ. එන්න. ගෙන්ජි කන්නෙත් නැහැ ඔයා බඩගින්නේ නිසා. එන්න රූසෝ."

රූසෝ ඔෂින් දෙස බලාගෙන හිටියා.

"රූසෝ හොඳම දේ ඔය සේරම අමතක කරලා දමන එක."

ටික වෙලාවක් නිහඬව සිටි රූසෝ,

"ගෙන්ජි ඔයාට කිව්වද?"

"ඔය ලැජ්ජා වෙන්න දෙයක් නෙමෙයි රූසෝ. අපේ රෙදි ටිකක් නැති වුණා එච්චරයි."

"ඔයා මොනවද කතා කරන්නේ ඔෂින්."

"රූසෝ කෑම කන්න එන්න. මම වැඩට යන්නත් ඕනෑනේ."

"ඔයා යන්න මම පස්සේ කන්නම්."

"ඔයා යන්ඩ මැඩම්, මම මහත්තයට කෑම ටික දෙන්නම්."

ගෙන්ජි ඇවිත් කිව්වා.

එදා සවස් වීමට පෙර මැඩම්ට කියා අවසර ගෙන ඔෂින් නිවසට පැමිණියා.

"මම ආවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි මැඩම්."

"ගෙන්ජි ඔයා මොනවද ඔය කරන්නේ?"

"මම මේ කවර ටිකක් ඇලෙව්වා. පාළුයි නේ."

"ඒ වුණාට ඔයා මහන්සි වෙන්න එපා ගෙන්ජි. ගෙදර බලාගන්නවා. රූසෝව බලාගන්නවා. ඔයා කොයි තරම් අපට උදව් කරනවද? ඔයාලා නිදහසේ ඉන්න. මට පුළුවන්නේ මුදල් හොයන්න. තේරුණාද? ගෙන්ජි මට ඕනෑ අපි තුන්දෙනා සතුටින් ඉන්නයි. ගෙන්ජි මහත්තයා තාම කාමරේද?"

"නෑ, මැඩම්, මැඩම් ගියාට පස්සේ ඇඳ පැළඳගෙන යන්න ගියා."

"කෑම කෑවෙත් නැද්ද?"

"නෑ, පිටින් කෑම ගන්නම් කිව්වා."

ඔෂින් රෑ කෑම සකස් කළා. වෙලාව ගත වී ගියා. රූසෝ පැමිණියේ නැහැ..

"හොඳටම රෑ වෙලා. ගෙන්ජි කෑම කාලා නිදාගන්න."

"නෑ මම රූසෝ මහත්තයා එනතෙක් ඇහැරලා ඉන්නම්. මැඩම් නිදාගන්ඩ."

"දැන් දොළහටත් ළඟයි. ඇයි රූසෝ මේ තරම් පරක්කු. මට බයත් හිතෙනවා ගෙන්ජි."

"අපි බලමු."

තවත් පැයක් පමණ ගෙවී ගියා. එකවරටම දොරට වේගයෙන් ගහන හඬ ඇසුණා.

දෙදෙනා ම දොර ළඟට දුවගෙන ගියා.

දොර අරින විට රූසෝ බිම වැටී හිටියා. ඔහු සමඟ තවත් කීප දෙනෙක් හා කාන්තාවක් හිටියා.

ගෙන්ජිත් ඔෂින් සමඟම රූසෝ ඔසවා ගත්තා.

"හොඳයි එයාව ගෙයින් තියලා එමුකෝ."

Scanned with CamScanner

sinhalaebooks.com



කාන්තාව ඉණට දෑත ගසා ගත්තා.

"ඔහේද මෙයාගේ බිරිඳ?"

එළියට ආ ඔෂින්ගෙන් කාන්තාව ඇහුවා.

"මෙයා අපේ බාර් එකේ බීලා බීලා වැටුණා. ඒකයි අරගෙන ආවේ. මෙයාගේ බිල ගෙවනවා නම් හොඳයි."

ඇය පැවසුවේ ඔෂින්ටත් ඔරවමින්.

"හොඳයි."

"මෙන්න බිල"

"මැඩම් එන්න ටිකක් ඇතුළට."

"ගෙන්ජි මොනවත් කතා කරලා වැඩක් නැහැ. අපි මේ බිල ගෙවමු."

"මේ තරම් විශාල මුදලක්."

ගෙන්ජි බිල දෙස බැලුවා.

"කමක් නෑ ගෙන්ජි. අපට කන්න නැති වුණත් කමක් නෑ. අපි මේ බිල ගෙවමු. ගෙන්ජි රූසෝව බලන්න."

ඔෂින් බිල ගෙවා දමා රූසෝ නිවසට ගෙන ඒම පිළිබඳව ඔවුනට ස්තුති කළා.

"අපි ඔය බීපු මිනිස්සු ගෙවල් වලට අදින්නේ ඔය ස්තුති අහන්න නෙමෙයි. අපේ බිල් වලට සල්ලි ගන්න."

ඇය කීවේ අහක බලාගෙන.

ඔෂින් ගෙන්ජි සමඟ රූසෝ ගේ මඩ ගෑවී තිබූ ඇඳුම් ඉවත් කර උණු වතුර මිරිකූ තුවා වලින් ඔහුගේ මුහුණ හා අත් පා සේදුවා. මේ මොනවා කළත් රූසෝ දැඩි නින්දක පසු වුණා.

"ඔය බිල නම් වැඩියෙන් දමාගෙන එන්න ඇති."

"කමක් නෑ ගෙන්ජි. ඒ ගැන හිතන්න එපා. මේ වෙලාවේ රූසෝ ගැන බලමු."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒ වුණාට ඔයා මහන්සි වෙලා සල්ලි හොයනවා. මෙයා ඒවා වියදම් කරනවා."

"එයා හිතේ අමාරුවටයි එහෙම කරන්න ඇත්තේ. වෙරි බැස්සාම අපි ඒ ගැන කතා කරමු."

මේ සිදුවීමෙන් පසු රූසෝට බිස්නස් පිළිබඳ උනන්දුව නැතිව ගියා. රූසෝට අවශ්‍ය වුණේ විනෝද වෙන්ඩ. බොහෝ දිනවල ඔහු රාත්‍රියේ නිවසට ආවේ බීමතින්මයි. ඔෂින් කිසිවක් කිවේ නැහැ. ආවතේව සේරම කළා. ගෙන්ජි නම් රූසෝට අවලාද කිව්වා.

"මැඩම් මහන්සි වෙලා මුදල් හොයනවා."

"ඉතින්, මොනවද ගෙන්ජි කියන්නේ."

රූසෝ මෙට්ටය මත ඇද වැටෙනවා.

රූසෝ අවදි වෙන්නේ පසුවදා. එවිට ඔෂින් වැඩට ගිහින්. ගෙන්ජි තරහ වැඩි කමට කතා කරන්නේ නැහැ.

රූසෝට ඊයේ සිදුවීමක් මතක් වුණා.

රූසෝ හිටියේ කයිකෝ එක්ක. කයිකෝ අවන්හලේ සේවය කරන සේවිකාවක්. ඊයේ කයිකො ගෙ උපන් දිනය. රූසෝ සල්ලි වියදම් කරලා වටිනා කේක් එකක් ගෙනාවා. ඒ වෙලාවේ රූසෝ හිටියේ වෙරි මතින්. හරියට මේ වෙලාවටම සුමිකෝ අවන්හලට පැමිණියා. පැමිණ බලාගෙන හිටියා.

"රූසෝ......"

සුමිකෝගේ වේගවත් හඬට රූසෝ හැරී බැලුවා.

"ඔයාට ලැජ්ජා නැද්ද රූසෝ?"

"ඔය කෙල්ලගෙ උපන්දිනය සමරන්න ඔයා රජෙක් වගේ වියදම් කරන්නේ කාගේ සල්ලි ද?"

"කාගෙ සල්ලි ද?"

"ඔව්, ඕවා අර අහිසංක ඔෂින් හම්බ කරන සල්ලි. ඔයා සැමියෙක් විදිහට ලැජ්ජා වෙන්න ඕනෑ. තමන්ගේ බිරිඳ වැඩට

Scanned with CamScanner

sinhalaebooks.com



යවනවා. ඒ මුදලින් විනෝද වෙනවා."

"ඔයා ඕවා අහන්න එපා කයිකො. මේ ඉටි පන්දම් නිවන්න. හා හැපි බර්ත් ඩේ.........."

සුමිකෝ කයිකෝටත් බැණ වදිමින් යන්න ගියා.

"අද මම වේලාසන එන්න ඕනෑ. ඔෂින්ගෙන් මේවා අහන්න ඕනෑ"

රූසෝ තදින් දෑස පියා ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com

# හතර

ඔෂින් ගෙදර ආවා විතරයි. රූසෝත් ගෙදර ආවා.

"රූසෝ ඔයා අද වේලාසන. හොඳයි ඒක. කෑම ටිකක්වත් රස්නෙන් කන්න බැරි යැ අදවත්. "

රූසෝ ගෙයි එහා මෙහා ඇවිද්දා වේගයෙන්.

"රූසෝ ඇයි ඔයා අසනීපයෙන් ද?"

"මිනිස්සු කියනවා මම සල්ලාලයෙක්ලු. මම ගෑනිගෙන් යැපෙනවලු."

"ක.... කවුද එහෙම කියන්නේ රූසෝ?"

"කවුද? කවුද? තමන් දන්නේ නෑ තමන් කියන දේවල්"

"මම? මම කාටද කීවේ. මොනවද කීවේ?"

"ඒවා වැඩක් නෑ මට එක දෙයයි කියන්න තියෙන්නේ. තමන්ට මා එක්ක ඉන්න බැරි නම් යන එකයි තියෙන්නේ."

"මොනවද රූසෝ කියන්නේ?"

"මට නිදහස ඕනෑ. කොටින්ම මට එපා උඹ."

මෙවර රූසෝ ඇඟිල්ලක් දික් කර ඔෂින්ට තර්ජනය කළා.

"මොනවද මේ රූසෝ මහත්තයා."

"ගෙන්ජිට කතාවක් නෑ මෙතන. යනවා යන්ඩ."

"ගෙන්ජි රූසෝ මහත්තයාට තරහා ගිහිල්ලා. මොනවත් කියන්න එපා."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් සෙමෙන් කිව්වා.

රූසෝ ඔෂින්ට බැන වදිමින් කාමරයට ගොස් මෙට්ටය මත වැතිරුණා.

"මැඩම්."

ඔෂින් ගේ දෑසට කඳුළු ආවේ නෑ. ඒත් ඔෂින් සිටියේ දුකින්.

"මැඩම් රූසෝ මහත්තයා කියපු දේවල් ගණන් ගන්න එපා."

"නෑ ගෙන්ජි මට හිතාගන්න බෑ ඇයි රූසෝට මේ තරම් තරහ ගියේ කියලා."

"ඔය මොනවා කිව්වත් එයා මැඩම්ට ආදරෙයි. එයාට සමාව දෙන්න. මම නම් කියන්නේ මැඩම් සාගා ගියානම් හොඳයි. දැන් රූසෝ මහත්තයාත් හිතනවා සාගා ගියොත් හොඳයි කියලා."

"නෑ ගෙන්ජි මම නම් සාගා යන්නේ නෑ. රූසෝට ඕනෑ නම් එයා ගියා වේ."

"මැඩම්."

"ඔව්, ගෙන්ජි මම නොගියත් එයා යයි. මම හැම තිස්සේම හිතුවේ රූසෝ ගේ සැප ගැන. මට දුක පුරුදුයි ගෙන්ජි. ඒත් රූසෝට දුක විඳලා පුරුදු නැහැ."

ඔෂින් පසුදින වැඩට ගිය විට හසකාවා මැඩම් සමඟ රූසෝ පිළිබඳව කතා කළා.

"මටත් ටිකක් ඔය ගැන ආරංචි වුණා. රූසෝ බීමට ඇබ්බැහි වෙලා කියලා. මම හිතන්නේ ඔෂින් වැඩට එනවට අකමැති ඇති."

"ඒත් මැඩම් ජීවත් වෙන්න සල්ලි ඕනෑ. ඒ නිසා වැඩ කරන්නත් ඕනෑ."

"ඔයා හම්බ කරන මුදල් සේරම රූසෝට දෙන්නේ ඇයි?"

"මැඩම් එයා මුදල් පරිහරණය කළ කෙනෙක්. දැන් කිසිම ආදායම් මාර්ගයක් නැහැ. එයාට ඒක වේදනාවක්. ඒ නිසයි මම

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝට මුදල් දෙන්නේ."

"ඉතින් ඔෂින් සැමියා ඒ මුදල් නාස්ති කරනවා."

"මේ දවස් රූසෝට කරදර දවස්."

"ඒත් එයා ඔයාගෙන් අයුතු ප්‍රයෝජන ගන්නවා කියලා ඔයාට තේරෙන්නේ නැද්ද ඔෂින්."

ඔෂින් බිම බලා ගත්තා.

එදා සවස ඔෂින් නිවසට යන විට සුමිකෝ අතරමඟ දී මුණ ගැහුණා.

"ඔෂින් මම මේ ඔයාව මුණ ගැහෙන්න හිටියේ. ගෙදර නොගියේ රූසෝ මුණ ගැහෙයි කියලා."

ප්‍රශ්නාර්ථ හැඟීමකින් ඔෂින් සුමිකො දෙස බැලුවා.

"ඔෂින් ඔයා අපේ හොඳ යෙහෙළියක්. රූසෝත් එහෙමයි. ඒත් ඔය දෙන්නගෙන් අපි වැඩිය සමීප ඔයාට. ඔයා අහිංසකයි."

"සුමිකෝ ඇයි මොකක්ද කාරණාව."

"ඔෂින් මම කියන දේවල් අහලා ඔයා කලබල වෙන්න එපා. ළඟදී දවසක අවන්හලකදී මම රූසෝට බැන්නා."

"බැන්නා? "

"ඔව්, කෙල්ලක් එක්ක හෝටලයට ඇවිත් හිටියා. බොරුවට සල්ලි නාස්ති කරනවා. ඒ නිසා මම රූසෝට බැන්නා."

"රූසෝ සුමිකොට බැන්නේ නැද්ද?"

"නෑ මට නම් බැන්නේ නෑ. හැබැයි මම හිතුවා ඔයාට නම් ගිහින් බනියි කියලා."

"නෑ එහෙමම මොනවත් කිව්වේ නැහැ. එහෙම නම් සුමිකෝ මම යන්නද?"

"හොඳයි."

දෙදෙනාම ආචාර කර දෙපසට ගියා.

"මිනිස්සු කියනවා මම සල්ලාලයෙක්ලු. මම ගෑනිගෙන් යැපෙනවලු."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින්ට එදා රූසෝ කිව්ව වචන මතක් වුණා.

'එහෙම නම් මේකයි හේතුව. මට එක දෙයයි තීරණය කරන්න තියෙන්නේ. ඔව් මම රූසෝගෙන් වෙන් වෙනවා. එතකොට එයාට සාගා යන්න පුළුවනි. කොහොම වුණත් මම මේවා හසකාවා මැඩම්ට කියනවා. එයා මට අම්මා කෙනෙක් වගෙයි.'

ඔෂින් සියලු විස්තර හසකාවා මැඩම්ට කිව්වා.

"මොනවා කරන්නද ඔෂින් සැමියා කම්මැලියෙක් නම් බිරිඳට දුක් විඳින්න සිද්ධ වෙනවා. මම හිතනවා ඔයා එයාගෙන් වෙන් වෙන්න ගත්ත තීරණය සාධාරණයි කියලා. ඔයා අපි එක්ක මෙහෙ ඉන්න. වෙන කරන්න දෙයක් නැහැ."

ඔෂින් මේ දිනවල නිවසට ගියත් ඇයට එළිවනතෙක් නින්ද ගියේ නෑ.

එදා ඔෂින් කොණ්ඩා සැකසුම් කරමින් සිටින විට ඇයට අපහසුතාවත් දැනුණා. උගුර පිච්චීගෙන වගේ ආවා. ඔෂින් එළියට දුව ගියා. ඇයට කෑම වමනය ගියා.

"ඇයි ඔෂින්."

හසකාවා මැඩම් හා ඉට්ෂු දුවගෙන ආවා. ඉට්ෂු ඔෂින්ව අල්ලා ගත්තා.

"මට මේ දවස්වල රෑට නින්ද ගියේ නෑ මැඩම්."

නැවත ද ඇයට වමනය ගියා.

"නෑ ඔෂින් මට නම් හිතෙන්නේ ඔයාට දරුවෙක් ලැබෙන්න."

"දරුවෙක්?" ඔෂින් ඉක්මනින් ඉඳ සිටි තැනින් නැගිට්ටා.

"ඔව්, ඔෂින් ඔය වෙන අසනීපයක් නෙමෙයි. අදම ඔයා සෞඛ්‍ය සේවිකා කාර්යාලයට යන්න. ඉට්ෂුත් එක්කම යන්න."

ඔෂින් ඒ ගමන ගියේ තනියම. අනේ දෙවියනේ එහෙම වෙන්න එපා. මේක අසනීපයක් විතරක් වෙන්න.

Scanned with CamScanner

sinhalaebooks.com



ඒත් ඔෂින් පරීක්ෂා කළ සෞඛ්‍ය සේවිකාව කීවේ ඇය ගැබ්ගෙන ඇති බවයි.

'දෙවියනේ, රූසෝ්ගෙන් වෙන් වෙන්න තීරණය කළා විතරයි.'

ඔෂින් සුසුම් හෙලුවා.

"මට මේ ප්‍රශ්නේ තවත් පැත්තක් පේනවා ඔෂින්. රූසෝ ඔයා වැඩ කරනවට කැමති ද?"

"නෑ මැඩම් එයා මම වැඩ කරනවට කැමතිත් නැහැ. ඒත් එයා මොනවත් කරන්නෙත් නැහැ. එයා නිතරම ඉන්නේ කේන්තියෙන්. සමහරවිට දුකෙන්."

"ඔෂින්, ඔයා වැඩ කරන එකත් මේකට එක හේතුවක්. සමහරවිට එයා වෙන කෙල්ලෙක් බැන්දා නම් මුදල් හොයන්න මොනවා හරි කරයි. ඔෂින් මම කතා කරන්නේ මගෙ අත්දැකීම් එක්ක. බිරිඳක් තම හැකියාව නිසා වැඩ කරන්න වැඩිපුර සැමියාට සේවය කරන්න ගත්තාම සැමියත් බෙලහීන වෙනවා. හොඳ මිනිහෙක් ලැබුණත් අන්තිමට නිකමෙක් වෙනවා. මට ඒ දෙය වුණා. මම ඒ දෙය තේරුම් ගත්ත ගමන්ම එයාගෙන් වෙන් වුණා. ඉන් පස්සේ තනිකඩව හිටියා. ඒ අපට දරුවෝ නැති නිසා. ඒත් ඔෂින් ඔයාට එහෙම තීරණ ගන්න බෑ. දරුවෝ කියන්නේ දේව කැමැත්ත."

"මැඩම් මම මොනවද කරන්න ඕනෑ."

"වද වෙන්න එපා. ඉවසාගෙන ඉන්න. කාලය සියලු ප්‍රශ්න විසඳයි. දැන් ඉතින් සතුටින් ඉන්න."

හසකාවා මැඩම් කී කරුණු ඔස්සේ ඔෂින් කල්පනා කළා. මගෙයි වැරැද්ද? රූසෝ ගේ බිස්නස් වැටුණා ම මම හිතුවා මුදල් හොයලා එයාට උදව් වෙන්න. මම එහෙම හරි හම්බ කළ නිසා එයාගේ ආත්ම ගෞරවය නැති වුණා. ඒකයි බීමට වැටුණේ. මම හිතුවා හොඳ බිරිඳක් නම් සැමියාට මුදල්වලට කරදර නොකළ යුතු යැයි කියා. මමයි වැරැද්ද කළේ. ඔව් මම අද ඉඳලා වැඩ කරන එක නවත්වනවා. ඔෂින් හසකාවා මැඩම් සොයා ගෙන ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මැඩම් මම අදම අස්වෙනවා. මට සමාවෙන්න."

"ඔෂින්.....??"

"ඔව් මැඩම් මගෙ පවුල් ජීවිතය වටිනවා මැඩම්. මට අස්වෙන්න දෙන්න මැඩම්."

"ඔෂින්, මුදල් නැති වුණොත් ඔයාට බඩගින්නේ ඉන්න වෙයි."

"මට කෑම ගෙනැත් දෙන එක මගෙ සැමියාගේ වගකීමක්. මම හරි නේද මැඩම්. අනේ මට සමාවෙන්න."

"ඔයා මහ පුදුම ළමයෙක් ඔෂින්. ඔයා කැමති නම් යන්න, ගිහින් හාමතේ ඉන්න. ඒත් මා ගැනවත් සාප්පුව ගැනවත් වද වෙන්න එපා."

ඔෂින් හඬා වැලපුණා. මැඩම් ඔෂින්ගේ හිස පිරිමැද්දා.

"ඔයා නැතිව මට පාළුයි ඔෂින්. ඔයාට හැකි අවස්ථාවක මාව බලන්න එන්න. ඔයාට ඕනෑම දේකට මම පිහිට වෙනවා."

රූසෝ ගෙන්ජි සමඟ කතා කරමින් හිටියා.

"ගෙන්ජි මම තීරණයක් ගත්තා සාගා වලට යන්න."

"ඒක හොඳයි. කොහොම හරි මැඩම්වත් පොලඹවා ගන්න ඒ ගමනට."

"එයා ඒක ප්‍රතික්ෂේප කළොත් මම එයාගෙන් වෙන් වෙනවා. මට දිගටම ඔෂින්ගෙන් යැපෙන්න බෑ. මෙහෙ ඉඳලා මට කරන්න දෙයකුත් නැහැ."

"හොඳයි අපි බලමු මැඩම් මොකද කියන්නේ කියලා."

"ගෙන්ජි මම ගෙදර ආවා. ආ.... අද රූසෝත් වේලාසන ඇවිල්ලා. රූසෝ කියන්න ආරංචියක් තියෙනවා."

"මොකක්ද?"

"මම අස් වුණා."

"ඇයි?"

Scanned with CamScanner

sinhalaebooks.com



"වැඩ වැඩියි රූසෝ."

"ඇයි රණ්ඩු වුණාද?"

"නෑ, ඇයි මම වැඩ කරන්නේ. ඔයා මාව බලාගන්න."

"එහෙම නම් අපි සාගා යමු."

"බෑ ටෝකියෝ වලම ඉන්න ඕනෑ."

"ඒත් මෙහෙ ඉඳලා කරන්න දෙයක් නෑ."

"හිතට ගත්තොත් අපේ සාප්පුව දියුණු කරගත හැකියි."

"නොකෙරෙන දේවල් ගැන කතා කරලා වැඩක් නෑ. මම තනියම හරි සාගා යනවා."

"එතකොට මම තනිවෙයි. දැන් ඔයාට එහෙම මාව තනි කරලා යන්න බෑ. මම දැන් අම්මා කෙනෙක්. ජනවාරි මාසයේ අපේ බබා ලැබෙයි."

"ඔෂින්, ඔය ඇත්තමද?"

රූසෝ ඇසුවේ සතුටින්.

"මට හරි සතුටුයි."

"ඔව් මටත් එහෙමයි. ඔන්න ගෙන්ජි සීයා වෙන්න යන්නේ. අපේ දරුවා වෙනුවෙන් අපි දියුණු වෙන්න ඕනෑ රූසෝ. මින් පස්සේ මම වැඩ කරන්නේ නෑ රූසෝ."

එදා රාත්‍රියේ නින්දට ගිට විටත් රූසෝ ඒ පිළිබඳ කතා කළා.

"ඔෂින් අස්වුණොත් මැඩම්ට පාඩුයි නේද?"

"දන්නවද බබාටයි, මටයි ඉන්නේ ඔයා විතරයි. මට සැප එපා. ඒත් ඔයා එක්ක ඉන්න ඕනෑ."

එදා ඉඳලා ඔෂින් වැඩට ගියේ නැහැ. ගර්භණී සමයේ ඇතිවන අපහසුතා ඇය එතරම් ගණන් ගත්තෙත් නැහැ. ඒත් ඔෂින් ඇයගේ මුළු ජීවිතයටම කාර්යයක නොයෙදී සිටින මේ කාලය ඔෂින්ට මානසික වදයක් වුවත් රූසෝ උත්සාහවන්තයෙක්

Scanned with CamScanner

sinhalaebooks.com



කිරීමට නම් මෙසේ ක්‍රියාකළ යුතු බව ඇය නිතරම තමාටම කියා ගත්තා.

"ඔෂින් ගෙන්ජි කියනවා විදුලි බිල ගෙවන්න යෙන් පහක් හොයාගන්න බැරිවුණා කියලා."

"ලයිට් කපනවා නම් කපපුදෙන් රූසෝ."

"ඕවා කිය කියා ඔයා හොඳට ගෙදරට වෙලා ඉන්නවා."

"ඔයා දන්නවද රූසෝ කඩෙන් හාල් දෙන්න බෑ කිව්වලු. ඉතින් අපට හාල් නෑ, මාළු නෑ, එළවළු නෑ. දැන් ඉතින් අපට බඩගින්නේ ඉන්නයි වෙන්නේ."

රූසෝ කිසිවක් නොකියා වැස්සේම කුඩේ රැගෙන යන්න ගියා.

"මැඩම් පහුගිය දවස් දෙක තුනේ අපේ මහත්තයා මේ රෙදි විකුණන්න හැම තැනම ගියා. ඒත් බැරි වුණා."

"ගෙන්ජි මේවා ඔහෙ තිබුණදෙන් මේවා විකුණන්න කාලයක් එයි. එතකල් රෙදි ටික රැක ගනිමු."

ඔෂින් කීවේ හිනැහෙමින්.

"මට නම් හිතාගන්න බෑ මැඩම් කොහොම හිනා වෙනවද කියලා. කෑමට බඩු ගේන්නවත් මුදල් නෑ."

"ගෙන්ජි මේ දුප්පත්කම පටන් ගත්තා විතරයි. උයන්න දෙයක් නැත්නම් අපි මොකද කරන්නේ? අපි බඩගින්නේ ඉඳිමු. වේලාසන නිදා ගනිමු. නැත්නම් බඩගින්න අපට කරදර කරයි."

"මැඩම්, මේක සෙල්ලමක් නෙමෙයි. මේ දවස්වල බඩගින්නේ ඉන්න හොඳද? සාගා ගියා නම් මේ කිසි දෙයක් නැහැ."

රූසෝ ගැණුම්කරුවෙක් සමඟ පැමිණ සාප්පුවේ තිබූ සේප්පුවක් විකුණුවා.

"ගෙන්ජි මේ සල්ලි වලට අපට කන්න කෑම අරගෙන එන්න."

"එපා ගෙන්ජි, ඔය සල්ලි වලට නූඩ්ල්ස්, හාල්, එළවළු ටිකක්

Scanned with CamScanner

sinhalaebooks.com



ගේන්න. අපි ඒවා උයලා කමු."

"කී දවසකටද ඉතින් මේ සල්ලි."

"රූසෝ ඔයා කවදාවත් දුප්පත්කම විඳලා නැහැ නේද?"

කිසිවක් නොකී රූසෝ යන්න ගියා. ටික වේලාවකින් හසකාවා මැඩම් ඔෂින් සොයා ආවා.

"ඔෂින්, ඇයි රූසෝ රණ්ඩු වෙලා ගියා ද? මගෙ ඇඟෙත් හැප්පිගෙනයි ගියේ."

"නෑ මැඩම් රණ්ඩු වුණේ නෑ. එන්න වාඩි වෙන්න."

"මේ කෑම ඔයාට ගෙනාවේ."

"ස්තුතියි මැඩම්."

"හුඟක් ආරංචි ආවා. කඩේ බිල ගෙවලා නෑ කියලා කඩෙන් බඩු දෙන්නේ නෑ කියලා. ගෙදර බඩු විකුණනවා කියලා."

"ඔව් මැඩම් කුස්සියේ බඩු කීපයක් වික්කා. දැන් හොඳට ගේ ඉඩ තියෙනවා."

ඔෂින් හිනාවුණා.

"ඕක හිනාවෙන්න දෙයක් යැ ඔෂින්. ඔයා හාමතේ මැරෙයි. තව පොඩි එකෙකුත් බඩේ තියාගෙන."

හසකාවා මැඩම් ඒ ටික කිව්වේ කෝපයෙන්.

"දරුවා ගැන හිතන්න. මම නම් හිතුවා මෙහෙම වෙයි කියලා. මේ සල්ලි ගන්න."

"එපා මැඩම්, අපි දැන් මාසයක් විතර දුක් උහුලාගෙන හිටියා. බඩගින්නේ හිටියා. රූසෝ එක එක ගෙදර බඩු විකුණුවා. තවත් එයාට තේරෙන්න අරින්න ඕනෑ."

"එයාට වැරදි තේරෙනකොට සේරම ඉවර වෙයි. ජීවිත පවා."

"මම දන්නවා මැඩම් මේ කිට්ටුවක අපට අම්මෙක්, තාත්තෙක් නැහැ. ළඟම නෑදෑයෙක් වගේ මැඩම් අපට හරිම හිතවත්. ඒත් මේ මුදල් මට ගන්න බැහැ. මැඩම්ට තේරෙනවානේ

Scanned with CamScanner

sinhalaebooks.com



මම එහෙම කරන්නේ ඇයි කියලා. රූසෝට මා වෙනුවෙන් මේ බබා වෙනුවෙන්, අපි නිසා දුක් විඳින ගෙන්ජි වෙනුවෙන් හිතන්න, ජීවත්වෙන්න මාර්ග හොයන්න අවස්ථාව දෙන්න ඕනෑ. මේ මුදල් ගත්තොත් ඒකට අවස්ථාව නැතිව යනවා. මා ගැන අනුකම්පා කරනවට ඔබතුමියට බොහෝම ස්තුතියි. මේ මුදල් ආපිට ගන්න මැඩම්. "

ඔෂින් හිස නමා ආචාර කළා.

"අනේ මම දන්නේ නෑ ඔෂින්."

හසකාවා මැඩම් මුදල් සහිත ලියුම් කවරය ආපසු අරගෙන යන්න ගියා.

ගෙන්ජි ලියුම් කවර ඇලෙව්වා, රාත්‍රී කාලයෙත් දිගටම.

"ගෙන්ජි ඔයා ගිහින් නිදාගන්න."

"මට නින්ද යන්නේ නෑ මැඩම්, නිකම්ම ඉන්නත් බෑ. ඒ නිසා මම මේ ලියුම් කවර ටික අලවන්නම්."

ටිකකින් රූසෝ කෑම බඳුන් කීපයක්ම අරගෙන පැමිණියා.

"ඔෂින් එන්න මෙන්න මම අපිට කෑම ගෙනාවා. ගෙන්ජි මේවා මේසයට අරින්න."

"කාගෙන්ද මේවා ඔයා කඩෙන් ඕඩර් කරලාද ගෙනාවේ."

ගෙන්ජි ඇසුවා.

"ගෙන්ජි මෙන්න සල්ලි. මට යෙන් සීයක්ම හම්බ වුණා. මේකෙන් කඩේ ණය ගෙවමු. විදුලි බිලයි, ජල බිලයි ගෙවන්නත් පුළුවනි."

"රූසෝ මහත්තයා ඕවා ගිනි පොලියටද ගත්තේ?"

"ගෙන්ජි මතකද හරුකි. ගමේ හිටියෙ. දැන් එයාට සරුයි. එයා මට දුන්නා."

"හරුකි කියන්නේ අර අඳ ගොවියගේ පුතා. ඇයි එහෙම කෙනෙකුට හිස නැමුවේ?"

Scanned with CamScanner

sinhalaebooks.com



"බිස්නස් කරද්දී මම කාටවත් හිස නැමුවේ නැහැ ගෙන්ජි. ඒත් දැන් යෙන් එකකටත් මම හිස නමනවා. ඒ ඔෂින් නිසා, අපේ බබා නිසා, ගෙන්ජි නිසා තේරුණාද? මම හරුකිට මගේ කරදර කිව්වා. ඒ පිට කෙනෙකුට මගෙ කරදර කිව්ව මුල් වතාව. ඔෂින්, මම මේවා ආපිට ගෙවනවා. මම මේ කරදර වලින් ගොඩ එනවා. මම වැඩ කරනවා. වැඩ කරලා මේ ණය ගෙවනවාමයි."

"මට ඒක ලොකු සතුටක් රූසෝ."

"අපි මේ අපේ බිස්නස් එක කොහොම හරි ගොඩ ගමු."

"හරි අපි උදව් කරනවා නේද ගෙන්ජි."

"ඔව්, ඔව්, රූසෝ මහත්තයා අපි උදව් කරනවා."

"දැන් අපි කෑම කමුද ? මට හරිම බඩගිනියි."

"ඔෂින්, ඔයා බඩගින්නෙම ඉඳලා මාව මට්ටු කළා නේද?"

"ඉවසුවේ හරි අමාරුවෙන් රූසෝ. ඔයාට මේ තත්වය වැටහෙන්නේ නැති වෙයි කියලා බඩගින්න විඳ දරා ගත්තා. බලන්න රූසෝ අපි ළඟ තියෙන්නේ හුඟක් වටිනා ලෝම රෙදි. ඒවට අපි මොනවා හරි කරමු."

"මොනව කරන්නද කියලයි මට තේරෙන්නේ නැත්තේ."

"සේරටම ඉස්සර වෙලා මැඩම් කෑම කාලා ඉන්න. ඔහොම බඩගින්නේ ඉන්න හොඳ නෑ නොවැ."

"රූසෝ මොනවද කරන්න බැරි. උවමනාව තියනවා නම්. මොනව උනත් අපි දෙන්නා එකටනේ ඉන්නේ."

"ඔව්, ඔෂින් ඔයා මා ළඟ ඉන්නවානේ. ඔයා නැතිව මට ජීවිතයක් නෑ ඔෂින්, පහුගිය දවස්වල මම නිතර හිතුවේ කොහොමද ඔෂින්ට කෑම ටිකක් ගෙනිහින් දෙන්නේ කියලා."

"එන්න එන්න දෙන්නම; කෑම ලෑස්තියි."

ඔෂින් හිටියේ දැඩි සතුටකින්. ඔෂින් දියත් කළ නිහඬ සටන ජය ගැනීමේ සතුටින්.

Scanned with CamScanner

sinhalaebooks.com

# පහ

"මැඩම් අර පහළ පොත් කඩේ නෝනා මගෙන් ඇහුවා එයාට උත්සවයකට යන්න තියෙනවා කියලා ඔයාට කියලා කොණ්ඩය සැකසුම් කරගන්න පුළුවන්ද කියලා."

"මම දැන් ඕවා කරන්නේ නැහැනේ ගෙන්ජි."

"මැඩම් රූසෝ මහත්තයා ගෙනාව යෙන් සීයත් ඉවරයි, ණයම ගෙවලා. ඉතින් මුදල් ටිකක්........"

"යන්න ගෙන්ජි ඒ නෝනා බලාගෙන ඇතිනේ."

"මැඩම් වැඩි වෙහෙසක් නැතිව කීයක් හරි හොයා......"

"ගෙන්ජි, මම ආයිම කොණ්ඩා දමලා සල්ලි හොයන්න පටන් ගත්තොත් බඩගින්නේ ඉඳලා මම කළ දේවල් අපතේ යනවා. තේරුණා නේද?"

ඔෂින් මල් ගස් වලට වතුර දමන්න පටන් ගත්තා.

රූසෝ සවස ගෙදර ආවා.

"දැන්නම් මේ රෙදි බිස්නස් ගැනම හිතලා බැහැ ඔෂින්. වෙන මොනව හරි බිස්නස් එකක් කරන්න ඕනැ. එහෙම නැත්නම් රස්සාවක්වත්. මට සාප්පුවක වැඩට යන්න පුළුවනි."

"නෑ. නෑ, රූසෝ ඔයාට සාප්පුවක වැඩට යන්න නම් මම ඉඩ දෙන්නේ නැහැ. ඔයා සේවකයෙක් නෙමෙයි. ව්‍යාපාරිකයෙක්."

Scanned with CamScanner

sinhalaebooks.com



"අපි මේ රෙදි තොග ගානට අඩු මුදලකට දීලා දමමු "

"බැහැ රූසෝ මේ රෙදි මමයි බේරලා ගෙනාවේ. මේවා මටත් අයිතියි. අපි මේ රෙදි වලින්ම කරන බිස්නස් එකක් ගැන හිතමු."

"මගෙන් කෙනෙක් ඇහුවා මේ රෙදි වලින් ළමා ඇඳුම් මහන්න හවුල් කාරයෙක් වෙනවද කියලා."

"ළමා ඇඳුම්? ඉතින් හොඳයි නේ රූසෝ."

"ඒත් ඉතින් ඇඳුම් මහන්න මැෂින් ඕනෑ. කොහොමත් මූල ධනයක් අවශ්‍යයි. "

"අපි කොහොම හරි මූල ධනය හොයමු."

"ඔයා මේ වැඩ ලෙහෙසියෙන් කරන්න හැදුවට මේවා අමාරු දේවල් ඔෂින්."

" රූසෝ අපි මේ රෙදි ටිකක් පේමන්ට් එකේ විකුණමු."

"ඔයා හරි මෝඩයි ඔෂින්. මම කොහොමද පේව්මන්ට් එකේ බඩු විකුණන්නේ. මම සාප්පුවක අයිතිකාරයෙක්."

"පේව්මන්ට් එකේ වික්කත්, සාප්පුවේ වික්කත් එකයි නේ. ටිකක් අඩු ගානට විකුණමු. එතකොට මිනිස්සු ඒවා ගන්ඩ එයි."

"කරන්නම් මම පිට රස්සාවක්. නොකෙරෙන දේවල් ගැන කතා කරන්න එපා ඔෂින්."

පසුවදා දවල් ඔෂින් ගෙදරින් පිටව නගරය පැත්තට ගියා. ඇය වීදිවල එහෙ මෙහෙ ඇවිද්දා. එක වීදියක ම හිටියේ රෙදි වෙළෙන්දෝ. ඔවුන් පාර දෙපස බිම එලන ලද බුමුතුරුණු වල රෙදි දමාගෙන කෑගසමින් රෙදි විකුණනවා.

"එන්න නෝනා මේ රෙදි ලාබයි."

"මේ තොග වෙළෙන්දෙක් ගෙන් ගත්ත රෙදි. බල බල යන්න එපා බොහොම අඩුවට දෙන්නේ."

"අද විතරයි. අද විතරයි. හෙට නම් ගන්න බැරිවෙයි. දැන්ම ම ගෙනියන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



එක් එක් වෙළෙන්දා රෙදි විකිණීමට කියන ප්‍රකාශන අසමින් ඔෂින් වීදියේ එහා මෙහා ඇවිද්දා. ඔවුන් ඒවා කියන ආකාරය රෙදි ගැන කරන විස්තර ඔෂින් හොඳින් නිරීක්ෂණය කළා. ඇය නිවසට පැමිණ සවස් කාලයේ වර්ණවත් රෙදි මිටි කීපයක්ම එක තැනට ගොඩ ගැහුවා.

"මොනවද ඔය කරන්නේ?"

ගෙන්ජි ඇසුවා.

"මම මේ රෙදි වල දූවිලි යන්න වෙන තැනකට දැම්මා."

"ඕවා වැඩක් නෑ." මෙහෙම කිවුව ගෙන්ජි ඔෂින් ළඟටම පැමිණ

"මැඩම්, දැන්නම් මටත් මෙහෙ කරන්න දෙයක් නෑ. සාගා යන්නමයි හිතෙන්නේ. ඒත් ඔයයි, මහත්තයයි දාලා යන්න දුකයි."

"තව ටික දවසක් ඉවසන්න ගෙන්ජි."

එදා රාත්‍රියේ ඔෂින්ට නින්ද ගියේ ම නැහැ.

"ඇයි ඔෂින් නින්ද යන්නේ නැද්ද?"

"මට ටිකක් මහන්සියි."

"ඔෂින්, අපි සාගා යමු ඔෂින්. මේ බබත් හොඳට හදා ගමු. අම්මත් හොඳට සතුටු වෙයි. එහෙ ගංගා තියෙනවා. මුහුදත් ළඟයි. පරිසරයත් ලස්සණයි. ඔයා වගා කරන්නත් ආසයි නේ. තාත්තට ඉඩම් තියෙනවා. අපි එක ඉඩමක් ඉල්ලාගෙන වගා කරමු. ඕන්නම් අපට ඉඩමක් ගොඩ කරන්නත් පුළුවනි. ගඟ ළඟ ඉඩම් හරිම සරුසාරයි ඒවා. මෙහෙම දුක් විඳින්න ඕනෑ නෑ ඔෂින්."

ඔෂින් නිහඬව දෑස වසාගෙන හිටියා. ඔෂින්ට නින්ද යන්න ඇතැයි රූසෝ හිතුවා.

පසුදා රූසෝ නිවසින් පිටවූ විගස ඔෂින් ගෙන්ජිට කතා කළා.

"ගෙන්ජි කේක් කන්න හිතුණා. මේ බඩු ටික ගෙනාවොත්

Scanned with CamScanner

sinhalaebooks.com



මට ම හඳුන්න පුළුවනි. එතකොට අපි ඇති වෙන්න කේක් කමු."

"දෙන්න මැඩම් ලිස්ට් එක. මා ළඟ සල්ලි තියෙනවා. ලියුම් කවර අලවපු සල්ලි වගයක් කඩෙන් ගන්නත් තියෙනවා."

"ඒවා ඉතුරු කරගන්න ගෙන්ජී. මේ බඩු ණයට ගේන්නකෝ. දැන් අපිට ණයට දෙනවානේ."

ගෙන්ජී පිටත්ව ගිය විගස ඔෂින් රෙදි මිටි කීපයක්ම අත් කරත්තයට පටවා ගත්තා. ලිපියක් ලියා කවුන්ටරයේ තබා දොර වසා දැම්මා. අපහසුවෙන් වුණත් අත් කරත්තය තල්ලුකරගෙන නගරය දෙසට ගියා. ඇය වෙළෙන්දන් රෙදි විකුණු වීදියට ම ගියා. ඒ වනවිට වැඩි දෙනෙක් වෙළෙන්දන් පැමිණ නොසිටි නිසා ඉඩ තිබූ තැනක පදික වේදිකාවේ පරණ රෙද්දක් බිම අතුරා ඔෂින් රෙදි මිටි සියල්ල ඇය පසෙක තබා ගත්තා. ඉන්පසු එහි දණ ගසා ගත් ඇය,

"ආ එන්න එන්න බලන්න මෙන්න ඉස්තරම්ම රෙදි."

ඇය ලීයකින් රෙදි වලට තට්ටු කළා.

"එන්න බලන්න. මේවා කොයිතරම් ලාබද කියලා."

"මේවා හොඳ ලොම් රෙදිද?" එක් අයෙක් ඇසුවා.

"ඔව් මහත්තයා මේවා එංගලන්තයෙන් ගෙන්නපුවා. හොඳයි ඉන්න මම ඔප්පු කරන්න මේවයෙ අනර්ඝ බව. මහත්තයා කරුණාකරලා ගිනි පෙට්ටියක් තියෙනවා නම් දෙන්න."

ඔහු සාක්කුවෙන් ගිනි පෙට්ටිය ගත්තා.

"මෙන්න මේ නූල් කෑල්ල පුච්චන්නකෝ ගිනි කූරක් ගහලා. අන්න දැක්කා නේද මේවා හොඳ ලොම් රෙදි. හරි ලාබයි. ගන්න නෝනා, මේ මහත්තයලත් ගන්න."

"ඇත්ත තමයි. හොඳ රෙදි."

කීප දෙනෙක් රෙදි මිලදී ගත්තා.

"අනේ මේකේ වෙන පාටක් නැද්ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"නෑ නෝනා මම ටිකයි ගෙනාවේ. හෙටත් ගේනවා."

"ආ ඒ පාටින් මට යාර දෙකක් දෙන්න."

"එහෙම නම් හෙට ගේනකල් මට මේ රෙදි යාර දෙක දෙන්න."

"ආ ඉන්න නෝනා, හරි."

"මෙන්න මහත්තයා ඉතිරි සල්ලි."

"ඔව් කලිසම් මහන්න හොඳ රෙදි. බලන්න මේවා වල බර කොච්චරක් ද ඕනෑ. ආ හරි ඉන්න."

"හෙටත් එනවද?"

"ඔව් හෙටත් ගේන්නම්."

මෙවිටම එහි සිටි පිරිස දෙපසට තල්ලු කරමින් හැඩිදැඩි පිරිමි කීපදෙනෙක් ඔෂින් ඉදිරියට පැමිණියා.

"කවුද උඹට මෙතන වෙළඳාම් කරන්න කීවේ?"

"මොනවා ඔහේලාගේ අවසරය මට මොකටද?"

"ආ මෙකිගේ කට වැඩියි. විසි කරපන් ඔය රෙදි පාරට."

ඔවුන් රෙදි ටික පාරට විසි කළා.

"ඒයි නවත්තපල්ලා ඔය වැඩේ." ඔෂින් කෑගැහුවා.

"මෙකිගේ කට වැඩියි. ගහමු ඕකිට ආයි මෙහෙ නොඑන්න."

එක් අයෙක් ඔෂින් ගේ මුහුණට දුන් පහරින් ඇය විසි වී බිම ඇද වැටුණා.

"ආයිම මට අත තිබ්බොත් බලාගනිල්ලා."

බිම වැටී ඔෂින් කෑගැහුවා.

"නවත්වනවා ඕක."

ගැඹුරු කටහඬක් පසෙකින් ඇසුණා. හැඩිදැඩියන් පසෙකට වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මොකද මේ?"

"කේන් මහත්තයා මේකි අපෙන්වත් අවසර නොගෙන මෙතන වෙළඳාම් කළා. ඒ මදිවට තර්ක කරන්නත් එනවා."

"මේ අහනවා."

ඔහු ඇයට කතා කර ඇය දෙස බලා හිටියා.

"උඹත් චණ්ඩියෙක් ද? ජේනවද මගෙ රෙදි වලට කරපුවා."

"මේ රෙදි පුච්චනවා කට වැහුවේ නැත්නම්."

"නවත්තපල්ල ඔය කතා. මේ ගෑනු කෙනාගේ රෙදි ටික ඔය කරත්තයට දමාපල්ලා."

"උඹලට මම බය නෑ. උඹලා රස්තියාදුකාරයෝ."

"තවත් කෑ ගහලා මේ මිනිස්සු අවුස්සා ගන්ඩ එපා. මේ මිනිස්සු දරුණුයි. මටත් බැරිවෙයි පාලනය කර ගන්ඩ."

" මම පොලිසියට යනවා."

"ඔන්න බලන්න කේන් මහත්තයා මේකිගේ කට."

"උදව් කරනවා එයාට. දානවා කරත්තයට බඩුටික. කෝ බලන්ඩ ඔය ඇඳුම් ඔතපු කොලේ. ටනකුරා රෙදි වෙළෙන්දෝ. ආ ඔබ ව එව්වේ ටනකුරා ද?"

ඔෂින් නිහඬවම රෙදි කරත්තය අදින්නට වුණා. ඇයගේ කටෙන් ලේ ගලා ගියා. කේන් ටික දුරක් කරත්තය තල්ලු කළා.

"ප්‍රවේශමෙන් යන්ඩ."

මේ වෙලාවේ රූසෝ හා ගෙන්ජි ඔෂින් ගියේ කොහේදැයි විමසමින් හිටියා.

"මට කේක් එකකට බඩු ගේන්න කිව්වා. මම බඩු අරගෙන එනකොට මේ ලිවුම කාමරේ තිබුණා."

"කෝ බලන්න."

"මම එළියට යනවා. එන්න රෑ වෙයි. කෑම ලෑස්ති කරලා."

"මම හිතන්නේ ගෙන්ජි මැඩම් ආයිම වැඩ පටන් අරගෙන.

Scanned with CamScanner

sinhalaebooks.com



හසකාවා මැඩම්ගේ සාප්පුවට යන්න ඇති."

"එහෙම නම් ඒක ලියුමේ ලියන්න එපායැ."

"දන්නවනේ ඔෂින්ගේ හැටි."

"කොහොම වුණත් රූසෝ මහත්තයා අපි මැඩම් හොයන්න යමු."

"ඔව් ඒක හොඳයි."

මෙවිටම ඉදිරි පස දොර ඇරෙන හඬ ඇසුණා. ඇරුණු දොරින් ඇතුළට පැමිණි ඔෂින් සිහි නැතිව බිම ඇද වැටුණා.

"මැඩම්, මැඩම්."

"ඔෂින් ඇයි මේ මොකද වුණේ. ගෙන්ජි වතුර ගෙන්ඩ. ඔෂින්, ඔෂින්, මූණත් තුවාල වෙලා. කොහේ හරි වැටුණ ද දන්නේ නෑ."

රූසෝ ඔෂින්ගේ හිස ඔඩොක්කුවෙන් තබා ගත්තා.

රූසෝ ගෙන්ජි ගෙන ආ තුවායෙන් ඔෂින්ගේ මුහුණ පිස දැම්මා. ටික වෙලාවකින් ඔෂින් දෑස් ඇරියා.

"ඔෂින් ඔයාට මොකද සිද්ධ වුණේ. වැටුණා ද? එළියෙ කරත්තයෙ රෙදි තියෙන්නේ. ඔයා ස්ටෝර්රූවේ රෙදි අරගෙන කොහේද ගියේ."

"රෙදි...... රෙදි........... ආ......... මම හුඟක් රෙදි වික්කා. ඔව් කෝ..... කෝ ..... මගෙ සල්ලි බෑග් එක."

ඇය හදිසියෙම බිම වාඩි වී බෑග් එක සෙව්වා.

"සල්ලි බෑග් එක?"

"ඔව් රූසෝ මම රෙදි හුඟක් විකුණුවා."

"කොහේද?"

"පේව්මන්ට් එකේ."

"අනේ බෑග් එක එතන වෙන්ඩ ඇති."

"මොනවද ඔෂින් මේ කියන්නේ."

"අනේ ගෙන්ජි එතන ගිහින් බලන්ඩ ගෙන්ජි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒ කියන්නේ ඔයා පේව්මන්ට් එකේ රෙදි විකුණුවා." රූසෝ විමතියෙන් බලාගෙන හිටියා.

"හොඳට බිස්නස් වුණා රූසෝ අර රස්තියාදුකාරයෝ."

"මට තේරෙනවා උන් ඔයාට ගැහුවා නේද? මෙහෙම බබෙක් හම්බ වෙන්ඩ ඉඳගෙන ඔයා මොනවද කරගන්ඩ හදන්නේ ඔෂින්."

"පේව්මන්ට් එකේ බිස්නස් කරන්න අවසර ඕනෑ."

"ඒ රස්තියාදුකාරයන්ගෙන් ? මම පොලිසියට කියනවා."

"මොකද කීවේ නැත්තේ මට මෙහෙම කරනවා කියලා. මීට වඩා තුවාල නූන එක පුදුමයි. බඩේ බබෙක්."

"මැඩම්, ඇඟට අමාරුද?"

"ඇඟට නෙමෙයි මගෙ හිතට අමාරුයි ගෙන්ජි. මගෙ සල්ලි බෑග් එක."

"කමක් නෑ බබයි ඔයයි බේරුණා මදෑ"

"හොඳ පාඩමක් ඉගෙන ගත්තේ. ඔයා ගෑනියෙක් ගෑනුන්ට බෑ බිස්නස් කරන්න. ගෑනු බිස්නස් කරන්න ඕනෑ නෑ. තේරුණාද?"

"මැඩම් මේ අත ළඟ තුවාල වෙලා. ඉන්න මම බෙහෙත් ගේන්නම්."

ඔෂින්ට කේන්තියි. "මේතරම් මහන්සිවෙලා හොයා ගත්ත සල්ලි. මගේ අවාසනාව."

"අර යක්ෂයෝ ආවේ නැත්නම්."

ඔෂින්ගේ බඩත් ටිකක් රිදුණා. ඒ වෙලාවේ නම් බබා ගැන ඔෂින්ට බය හිතුණා. ගමනේ අවදානම තේරුණා. ඒත් සෙවූ මුදල් අහිමි වීම ගැන ඇයට දැනුණේ දැඩි වේදනාවක්.

රූසෝ ඔෂින්ට වේදනානාශක බෙහෙත් පෙති කීපයක්ම දුන්න නිසා ඇයට පසුවදා වනතුරු ම හොඳට ම නින්ද ගියා.

"ඔෂින්, නැගිටින්න ගෙන්ජි ඔයාට කැඳ හැදුවා. බොන්න,

Scanned with CamScanner

sinhalaebooks.com



ඉන්න මම උදව් කරන්න."

රූසෝ ඔෂින්ව ඔසවා වාඩි කෙරෙව්වා.

"ඔයාට අමාරුද ඔෂින්."

"අපි දොස්තර කෙනෙක් ගෙන්නමුද රූසෝ මහත්තයා."

"එපා මට එච්චර අමාරු නෑ. ඒ වුණාට මට තරහයි රූසෝ."

"දැන් ඒක අමතක කරලා දමන්න."

"ඔයාට නම් ඒක කියන්න ලෙහෙසියි. අපරාදේ අපට මුදල් අවශ්‍ය වෙලාවෙම. "

ඔෂින් කැඳ ටික බිව්වා.

"රූසෝ හුඟක් දවල් වෙලා ද?"

"ඔව්, ඔෂින් දවල් දහයත් පහුවෙලා. මම මේ කියන්න හැදුවේ ආය එහෙම ඔහොම අවදානම් වැඩ කරන්න එපා. ජේව්මන්ට් කාරයෝ කියන්නේ වෙනම ලෝකයක්. හරියට පාතාලයෙ අය වගෙයි."

"රූසෝ එතන වැරදි වැඩක් නම් කෙරුණේ නැහැ. හැමෝම රෙදි වික්කා. හුඟක් ලාබෙට නිසා මිනිස්සු රෙදි ගත්තා. මම කොයි තරම් රෙදි වික්ක ද?"

"ඕක ඉවරයි. දැන් පොඩ්ඩක් නිදාගන්න."

"ගෙන්ජි එළියේ කලබලයක් වගෙයි. ගිහින් බලන්න." ගෙන්ජි දොර ළඟට යනකොට ම මේ කතාව ඇහුණා.

"මම මේ ගෑනු කෙනෙක්ව හොයනවා. එයා ඊයේ ජේව්මන්ට් එකේ රෙදි වික්කා. වයස විස්සක් විතර ඇති. ලස්සන කෙල්ලක්. එයාගේ රෙදි ඔතපු කොළේ ටනකුරා කියලා ලියලා තිබුණා."

"මේ තියෙන්නේ ඒ සාප්පුව තමයි."

ගෙන්ජි ඔෂින් සිටි කාමරයට දුව ගෙන ගියා.

"අන්න අරුත් ආයි ම මෙහෙ ඇවිත්. මැඩම්ගේ හැඩ රුව කිය කියා හොයනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔයා ඔහොම ඉන්න මම ගිහින් බලන්නම්."

රූසෝ දොර ඇරගෙන එළියට ගියා.

"මම හිතන්නේ මේ ටනකුරා මහත්තයා."

"ඔව් ඒ මම."

මෙවිටම ඔෂින් ද දොර ඇරගෙන එළියට ආවා.

"ඕ ඔයා ටනකුරා මහත්තයාගේ බිරිඳ ද?"

"ඊයේ ඔහේලා මට අඩන්තේට්ටම් කළා. අදත් ගහගන්ඩ ද?"

"ඔෂින් කට වහගන්න."

"නෑ මෙහෙම එවුන්ට හොඳින් කතා කරලා බැහැ."

"සමාවෙන්න, මගේ බිරිඳ වැරැද්දක් කළේ. එයා දැනගෙන හිටියේ නැහැ අනවසරයෙන් වෙළඳාම් කරන්න බැහැ කියලා."

"රූසෝ ඔයාට පිස්සුද මොකටද මෙයාගෙන් සමාව ඉල්ලන්නේ."

"මම හිතුවා බොහෝම හිත තද ගෑනු කෙනෙක් කියලා. උපන් අවුරුද්ද වෘෂභ ලග්නෙන් නේද?"

කේන් ඇසුවා.

"මොකටද ඔහේට ඒ ගැන කියන්නේ."

"මොකද මගෙ සොයුරිය උපන්නෙත් ඒ වර්ෂයේ. ඔයා වගේමයි. හිත හරිම හයියයි. ඒත් එයා අවුරුදු දෙකකට ඉස්සර මිය ගියා. හදිසි අනතුරකින්."

"ඕවා අපට මොකටද?"

"ඔෂින් " රූසෝ සැර කළා.

"මෙන්න ඔයා වට්ටලා ආපු සල්ලි පසුම්බිය. එතන වැටිලා තිබිලා මට ගෙනැත් දුන්නා. මම හිතුවා ඔයා ඒ ගැන දුකින් ඇති කියලා. ඒකයි ගෙනැත් දෙන්න ආවේ."

ඔෂින් කිසිවක් කීවේ නැහැ. නොසෙල්වී බලා සිටියා.

ගෙන්ජි ඔහු අතින් මුදල් පසුම්බිය ගෙන ඔෂින් අත තබන

Scanned with CamScanner

sinhalaebooks.com



විට ඇයගේ දෑසින් කඳුළු කඩා වැටුණා.

"මගෙ රස්සාව නම්බුකාර නැහැ මැඩම්, හැබැයි මම හොරෙක් නෙමෙයි. මගෙ නම කේන්. බජාර් එකේ කවුරුත් මම ගැන දන්නවා. ටනකුරා මහත්තයා ඔබට ඉන්නේ බොහොම ධෛර්යවන්ත බිරිඳක්. හොඳින් බලාගන්න. එහෙම නම් මම ගියා."

"ටිකක් ඉන්න. මට එතන වෙළඳාම් කරන්න අවසර දෙන්න පුළුවන්ද?"

ඔෂින් ඇසුවා.

"හොඳයි මම එතන අයිතිය දෙන්නම්. මම ඔයා ගැන පැහැදුණා. ඔයා මගෙ සොයුරිය වගෙයි."

"සමාවෙන්න මම වැරදි විදිහට කතා කළාට. ගෙන්ජි අපි සකේ බෝතල් ටිකක් ගෙනැත් සංග්‍රහයක් කරමු. "

"ඔව් ඒක හරි. එන්න කේන් අපි මිත්‍රත්වය සමරමු."

රූසෝ පෙරමුණ ගත්තා. ඔෂින් සියලු වේදනා පසෙක දමා ඔවුනට සංග්‍රහ කළා.

"මැඩම් ඔයා ගේ ගම යමගාටා නේද?"

ඔෂින් පුදුම වුණා.

"හැබැයි යමගාටා වල ශෛලියට වෙනස්ව කතා කරන්නේ."

"ඒ මම ටෝකියෝ ඇවිල්ල වසර ගණනක්ම ගතවුණ නිසයි."

"ඔයා මගේ ගමේ කෙනෙක්. එන්න වෙළඳාම් කරන්න, මම ඔයාට උදව් කරනවා. ඔයා ඉගෙන ගන්න ඕනෑ එතන කතාකරන හැටි. එතන ඉන්න ස්ටයිල් එකක් තියෙනවා. මෙන්න මෙහෙමයි කියන්නේ."

"ආයුබෝවන් සර්, ආයුබෝවන් මැඩම්, ඔබ සැම මට සවන් දුන්නාට ස්තුතියි. මම කියන්නම් මම ආවේ කොහේ ඉඳලාද කියලා."

Scanned with CamScanner

sinhalaebooks.com



"කකුල් දෙක මෙහෙම පළල් කරලා අත බිමට හරවා ගන්න ඕනෑ."

ඔෂින් ඒ විදිහට පුරුදු වුණේ හිනැහෙමින්. ගෙන්ජිත් එලෙසම නිරූපනය කළා. රෑසෝ සියල්ලම දෙස නිහඬව බලාගෙන හිටියා.

කේන් සමු අරගෙන යන්න ගියා.

"ඔෂින්, ඔයා අර මිනිහා විශ්වාස කරනවා ද?"

"කේන් ගැන නේද අහන්නේ. ඇත්තටම මම කේන්ව විශ්වාස කරනවා. මොකද එයා යමගාටා වල කෙනෙක් නිසා."

"මේ රෙදි ටිකත් නැති වෙන්න වැඩක් ද දන්නේ නැහැ."

"ඔහොම කියන්න එපා රෑසෝ. ඔයා මට උදව් කරන්න. අපි එකට වැඩ කරමු. ගෙන්ජිත් අපට උදව් කරයි."

රෑසෝ අමනාපයෙන් ඉවත බලා ගත්තා.

ඔෂින්, ගෙන්ජි සමඟ ස්ටෝරුවට ගොස් රෙදි තෝරා කරත්තයට දැම්මා.

දුරකථනයේ හඬ ඇසුණා.

ඔෂින් දුරකථනය කනේ රඳවාගෙන ඉදිරියේ වූ උපකරණය පැත්තට කතා කළා.

"අනේ ඇත්ත ද? ඔයාට බොහෝම ස්තුතියි. එනවා එනවා. නොවරදවා ම එනවා."

රෑසෝ ඔෂින් ළඟට පැමිණියා.

"අර රස්තියාදුකාරයා ද කතා කළේ."

"ඔව් අර කේන් කතා කළේ. අද රෑ රෙදි සල්පිලක් දමනවාලු. අපිටත් එන්නලු රෙදි ටික අරගෙන. ඉන්න මම අපිට රෑ කෑම හදනකල්. කේන්ටත් කෑම ටිකක් හදාගෙන යන්නම් නේද?"

ඔෂින් උයන ගෙට ගොස් ඉක්මනින් කෑම සූදානම් කළා. ඇයට දැනුණේ දැඩි සතුටක්.

Scanned with CamScanner

sinhalaebooks.com

# හය

ඔෂින් එදා රැම ස්ටෝරුවෙන් ගත්ත රෙදි කරත්තයට පටවාගෙන ගෙන්ජි සමඟ වෙළඳාමේ යන්න සූදානම් වුණා.

"ඔෂින්."

ඒ රූසෝ ගේ වේගවත් හඬ.

"ඕනෑ නෑ යන්න."

"ඇයි රූසෝ මාව නවත්වන්නේ."

"කේන් කියන්නේ රස්තියාදුකාරයෙක්. ඒ වගේම ඔවුන් හොරු."

"නෑ එහෙම නෑ එයා මගේ සල්ලි සේරම ගෙනාවා."

"ඒ වුණාට ඒ මිනිහා දරුණු මිනිහෙක්. එයා එක්ක ඇයි හොඳයියක් ඕනෑ නෑ."

"හරි පුදුමයි රූසෝ. එදා ඔයා එයාට හොඳට සැලකුවේ. එතකොට හොඳයි."

"ඒ, ඒ මිනිහා උදව් කළ නිසා."

"ඉතින් රූසෝ දැනුත් කේන් අපට උදව් කරනවා. ඔයා එයාව සැක කරන්නේ එයාගේ රස්සාව නිසයි."

"ඇති කතාව. දානවා ගෙන්ජි ඔය ඇඳුම් ස්ටෝරුවට."

"අනේ රූසෝ මට මේක කරන්න දෙන්න. අපි සල්ලි ටිකක්

Scanned with CamScanner

sinhalaebooks.com



හොයා ගනිමු."

"ගෙන්ජි ඇහුණද මම කිව්ව දේ."

"එපා ගෙන්ජි ගෙනියන්න. රූසෝ මේ රෙදි මටත් අයිතියි. බංකොලොත් කාරයන්ගෙන් මේ රෙදි ටික බේරා ගත්තේ මම."

"මමත් ඉන්නවනේ රූසෝ මහත්තයා. මැඩම් ගැන බයවෙන්න එපා."

"රූසෝ ඔයාම නේද කිවේ මූල ධනයක් තියෙනවා නම් ඇඳුම් මහන්න පටන් ගන්න පුළුවනි කියලා. ඇයි ඉතින් දැන් හරස් කපන්නේ. ඔයාට ඕනෑ බිස්නස් කරන්න නම් අපට උදව් කරන්න."

රූසෝ නිහඬව සිටියා කල්පනා කළා.

"කැමැත්තක්."

ඔහු කීවේ සුසුමක් හෙලමින්.

"හොඳයි රූසෝ. අපි පස්සේ හමුවෙමු. යමු ගෙන්ජි."

"මම ඔයාලා එනතෙක් බලාගෙන හිටියේ. මෙතන එක්කෙනා වෙන තැනකට යැව්වා. ඔයාලගේ රෙදි මෙතන තියා ගන්න."

කේන් කිව්වා.

"මම කේන්ට කරදර කරනවා නේද? සමාවෙන්න ඒ ගැන."

ඔෂින් හිස නමා ආචාර කළා.

"නැහැ ඔයාට උදව් කරන්න ලැබුණ එක ලොකු සතුටක් මට. මට මගේ සොයුරිය නිතර මතක් වෙනවා මැඩම් ව දැක්කාම"

"ඔයා බොහොම හොඳ කෙනෙක් කේන්. ඔයාලා වගේ අය මේ තැන්වල ඉන්න ඕනෑ. "

"මේවා හොඳ රෙදි නේ. ඇයි අඩු මිලට විකුණන්නේ."

"කමක් නෑ කේන් මේ ටික විකුණාගන්න ම ඕනෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි පටන් ගන්න."

"මේ රෙදි බලන්න. එන්න මහත්තයලා. විශේෂයෙන් මහත්තයලට මෙන්න සූට් එකක් මහගන්න. බාගෙට බාගයක් අඩුවෙන් "

"මේ පාට විතරද?"

"නෑ අර කරත්තේ තව පාට තියෙනවා. සර්ට ඕනෑ මොන පාටද?"

ගැනුම්කාරයෙන් පිරිවරාගෙන වෙළඳාම්කරන ඔෂින් දෙස පපුවේ දෑත් බැඳගෙන කේන් බලාගෙන හිටියා.

තව ටික වේලාවකින් රූසෝත් පැමිණ ඔෂින් දෙස බලාගෙන හිටියා.

"ආ එන්න සර්ලා එන්න මැඩම් තව ටිකයි. බොහෝම අඩු මිලට දෙන්නේ."

කේන් ඔෂින්ලාට උදව් කළා.

රූසෝ නිවසට පැමිණ ස්ටෝරුව දෙස බැලුවා.

රෙදි හුඟක් විකිණිලා. වැඩේ නරකමත් නෑ.

"මට හරිම සතුටුයි ගෙනාව රෙදි ටික විකුණලා ඉවර කරගන්න ලැබුණාට."

ගෙන්ජි යෙන් කොළ කීපයක් කේන්ගේ සගයන්ට දුන්නා.

"බොහෝම ස්තුතියි මැඩම්. අපට මුදල් දුන්නාට."

"ඔයාලා කේන් එක්ක අපේ ගෙදර එන්න."

"ඒත් මැඩම් අපි වගේ අය ගෙදර ආවාම ඔයාලට ප්‍රශ්න ඇතිවෙයි."

"අපි එහෙම හිතන්නේ නෑ නේද ගෙන්ජි."

"ඔව්, ඔව්." ගෙන්ජි කිව්වා.

"ඔන්න අපි ආවා."

ඔෂින් ගෙට ගොඩවුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"තනියම පාළුවෙන් උන්නා නේද? ඉන්න ඉක්මනට මම කෑම හදන්න."

"එපා, ඔෂින් ඔයාට මහන්සියි."

"මැඩම් ඉන්න මම කෑම හදන්නම්."

"ඇයි ගෙන්ජිටත් මට වගේම මහන්සියි."

"එහෙම නම් අපි තුන්දෙනාම කෑම හදමු."

"අන්න හොඳයි. අපි පවුලක් විදිහට එහෙම තමයි ඉන්න ඕනෑ."

ආහාර ගන්නා විට ඔෂින් කතා කළා.

"රූසෝ මෙන්න සල්ලි. අපි කරත්ත ගාස්තුව ගෙව්වා. අර කේන්ගේ උදව්කාරයත් අපට උදව් කළ නිසා ඒ ගොල්ලන්ටත් අපි ගෙව්වා."

"ඇයි කේන්ට කප්පම් දුන්නේ නැද්ද?"

"කේන් එහෙම කෙනෙක් නෙමෙයි රූසෝ. එයාව තේරුම් ගන්න."

"ඒක ඇත්ත. කේන් බොහොම හොඳ කෙනෙක්."

ගෙන්ජි කිව්වා.

"ඒත් ලබන මාසේ මම වෙන තැනක රස්සාවට යන්න ඉන්නේ."

"රූසෝ ඔයා රස්සාවට යන්න අවශ්‍ය නැහැ. කේන්. හොඳ උපදේශයක් දුන්නා. එයා කියනවා මේ වටිනා රෙදි පේව්මන්ට් එකේ අඩු මිලට විකුණන්න එපාලු. ළමා ඇඳුම් මහලා අපේ සාප්පුවේ විකුණන්නලු."

"මාත් ඕක හිතුවානේ."

"ඒක තමයි දැන් අපට සල්ලි ටිකක් තියෙනවා. තව පේමන්ට් එකේ රෙදි ටිකක් විකුණලා සල්ලි වැඩිකර ගෙන අතන රාක්ක අයින් කරලා මැෂින් තුනක් කුලියට අරගෙන දමලා ළමා ඇඳුම් මහමු."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් සාප්පුව ඉදිරියට පැමිණ හිතින් සැලසුම් කළා.

"මෙතන මැෂින් තුනක් තියාගන්නවා. මේ ෂෝ කේස් එක පාරට පේන තැනකට අල්ලලා ඇඳුම් ඒකේ ප්‍රදර්ශනයට තියනවා. ඔය සුළු වෙළෙඳුන්ටත් විකුණන්න දෙන්න බැරියැ."

ඔෂින් උස් හඬින් කියන විට ගෙන්ජිත් රූසෝත් මූණෙන් මූණ බලාගෙන හිටියා.

"රූසෝ අපි ඉස්සර වෙලාම මේකේ ෂෝ කේස් අයින්කරලා බිත්තියක් දමමු. ගෙන්ජි හෙට ම පෙදරේරුවා ගෙන්නලා ගණන් බලමු."

"ඔෂින් ඔච්චර ඉක්මනට ඕවා කරන්න බැහැ."

"එහෙම නෙමෙයි රූසෝ අපි දැන් පටන් ගත්ත වැඩේ දිගටම කරගෙන යමු. ඕක කල් දම දමා ඉන්න අවශ්‍ය නැහැනේ."

පසුවදාම සාප්පුවේ අලුත් වෙනස් කිරීම් සඳහා පෙදරේරුවන් කැඳෙව්වා.

"මෙතනින් බිත්තියක් දමාගන්න ඕනෑ. හැබැයි ඉතින් හුගක් මුදල් වියදම් කරන්න නම් අමාරුයි මේ වෙලාවේ."

"මේ ස්ටෝරුව හැදුවෙත් මම තමයි මැඩම්. මම මේක අඩුමුදලකට හදලා දෙන්නම්."

ඔෂින් මැහුම් ආයතනයකට ගියා.

"එන්න මැඩම්."

"ස්තුතියි."

දෙදෙනාම හිස නමා ආචාර කර ගත්තා.

"මට මැෂින් පාවිච්චි කරන හැටි දැනගන්න ඕනෑ. ඒ එක්කම ඔබේ ආයතනයෙන් මැෂින් තුනක් ගන්න අවශ්‍යයි. කුලී පදනම යටතේ නම් වැඩිය හොඳයි."

"හොඳයි මැඩම්, අපි මැෂින් දෙනවා ගෙවීමේ ක්‍රමයට. කුලී පදනමටත් දෙන්න පුළුවනි."

"ස්තුතියි, එහෙම නම් මේ මැෂින් එක පාවිච්චි කරන හැටි මට කියලා දෙන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



ඇය ඔෂින්ට මැෂිමක් ක්‍රියා කර පෙන්නුවා. ඔෂින් එහි වාඩි වී එය ක්‍රියාත්මක කර බැලුවා.

"නූල හරියට දැම්මේ නැත්නම් නූල නිතරම කැඩෙනවා."

"හොඳයි."

"මේ දවස්වල මොනවද වෙළෙඳපලේ වැඩියෙන් අලෙවි වෙන්නේ."

"මම හිතන්නේ ළමා ඇඳුම් වලට ඉල්ලුමක් තියෙනවා. විශේෂයෙන් ළමයින්ගේ පාසල් ඇඳුම් වලට."

"හොඳයි එහෙම නම් මේ මහත්මියට පුළුවන්ද මේ නගරයේ ඇඳුම් මෝස්තර සකස් කරන ගුරුතුමියක් මට මුණ ගස්වන්න."

"පුළුවනි. මම අඳුරන ගුරු මහත්මියක් ඉන්නවා. මම එයාට කියන්නම් මැඩම්ගේ ලිපිනය දුරකථන අංකය මට ලියලා දෙන්න."

"ස්තුතියි."

ඔෂින් නිවසට ගොස් මැෂින් කුලී පදනම යටතේ ගැනීමට ගණන් බැලුවා. ඒ සමඟම නූල් සඳහා යන වියදම වෙනම සඳහන් කළා. මෝස්තර කැපීම ඉගැන්වීම සඳහා පැමිණෙන ගුරුතුමියට ගෙවිය යුතු මුදල් ද ඇය සඳහන් කළා.

සාප්පුව ඉදිරියෙන් දොරට තට්ටු කරන හඬ ඇසුණා.

දොර අරින විට එහි සිටියේ කාන්තාවක්.

"මගේ නම හකමොටෝ. මට පුළුවනි ඔබට උදව්කරන්න. මම ඇඳුම් මෝස්තර නිර්මාණය කරන හැටි කියලා දෙනවා."

"ඔබේ පැමිණීම සතුටක්. එන්න ඇතුළට."

ඇය ඔෂින්ට ළමා ඇඳුම් මෝස්තර කීපයක්ම චිත්‍රණය කර පෙන්නුවා. රෙදි පිරිමහලා කපන්න පතරොම් සකස් කර ගන්නා ආකාරයත් කියා දුන්නා. ඔෂින් ඇයට තේ වලින් සංග්‍රහයක් පැවැත්තුවා. කවරයක දමා වැඩි මුදලක් ගෙව්වා.

"හොඳයි තව දින තුනකින් මම ආපිට එන්නම්. එවිට තව

Scanned with CamScanner

sinhalaebooks.com



පැටන් ටිකක් කියලා දෙන්නම්."

"හොඳමයි. ස්තුතියි ඔබට."

දෙදෙනාම හිස නමා ආචාර කර ගත්තා. මෙවිටම රූසෝ නිවසට පැමිණියා.

"මේ මගේ මහත්තයා රූසෝ ටනකුරා."

ගුරුවරිය ඔහුට හිස නමා ආචාර කර යන්න ගියා.

"ඒ ඇඳුම් මෝස්තර උගන්වන ගුරුමහත්මියක්."

"ඔෂින් ඔයා දැන්ම බිස්නස් එක පටන් ගත්තා ද? මට කීවෙත් නැහැ."

"නැහැ රූසෝ මම මේ ඒවා සැලසුම් කරනවා."

"හිතුවක්කාර කම වැඩියි ඔෂින් ඔයාගේ. එක්කෝ ඔයාට හුඟක් සල්ලි ඕනෑ නේද? මේ දවස්වල අලුත් බිස්නස් ලෙහෙසි නැහැ. තේරුම් ගන්ඩ ඒක."

"රූසෝ මම සල්ලි වලට කෑදර කමට නෙමෙයි බිස්නස් කරන්න හිතුවේ. ඒක පුංචි කාලේ ඉඳල තිබුණ මගේ බලාපොරොත්තුවක්. කගායා වලදී මම ඒකට අත්පොත් තිබ්බා. මම ආසයි බිස්නස් කරන්න."

"ඔයා භයානක දෙයකට අතගහලා තියෙන්නේ."

"මම කැමතියි එහෙම අභියෝග වලට."

"ඕක හීනයක් විතරයි ඔෂින්."

"නෑ රූසෝ අපි දෙන්නම එකතු වුණොත් මේ හීනය හැබෑකරගන්න පුළුවනි."

"ඔයා ගෑනියෙක්. ළඟදීම අම්මා කෙනෙක් වෙනවා."

"ඒවා සේරම ස්වභාවික දේවල්."

"මැෂිමක් අතින් අල්ලලා නැහැ. බිස්නස් ගැන භය හතර දන්නේ නැහැ. මේවා ලෙහෙසි වැඩ ද?"

"මම මැෂිමක මහන්න පුරුදු වුණා. ළඟදී ඒවා කුලී පදනමට

Scanned with CamScanner

sinhalaebooks.com



මෙහෙට ගේනවා. ගැනු ඇඳුම් මහන්න ලෙහෙසියි. මම හසකාවා මැඩම් ළඟ ඉන්නකොට කිමෝනා මහනවා දවස් දෙකකින්. රෑ දෙකයි ඇහැරලා ඉන්නේ. සේරම මහන්නේ අතේ."

පසුවදා ඔෂින් එක මැෂිමක් ගෙදරට ගෙන්වා ගත්තා.

රූසෝ මේ සියල්ල පසෙක දමා උත්සාහ ගත්තා රෙදි සුළු වෙළඳුන්ට විකිණීමට. ඒත් ඒ එක ප්‍රයත්නයක්වත් සාර්ථක වුණේ නැහැ. ඔෂින්ගේ සිහින සාප්පුව පිළිබඳ රූසෝ තුළ තිබුණේ නුරුස්නා හැඟීමක්. ඒ නිසා ඔහු දවසේ වැඩි කාලයක් නිවසින් පිට ගත කළා.

ඔෂින් දින කිපයක්ම ගුරුතුමියගෙන් ළමා ඇඳුම් මෝස්තර ඉගෙන ගත්තා. දිනක් ඇය ලාබ රෙද්දකින් පතරොම් ආධාරයෙන් ළමා ඇඳුම් කීපයක් කැපුවා. ඒවා ප්‍රවේසමට මැෂිමෙන් මැහුවා. පුංචි කමිසයකට සමනළයෙක් ද වර්ණවත් නූලෙන් මසා එය ප්‍රදර්ශන රාක්කය තුළ එල්ලා තැබුවා.

"ඔෂින්"

ඒ රූසෝ ගේ හඬ.

"එන්න රූසෝ. ඔයාට මහන්සිත් ඇති. ගෙන්ජිට කිව්වා ඔයාට වතුර උණු කරන්න කියලා. ගිහින් ඇඟපත සෝදා ගන්න."

ඇය රූසෝ පැමිණි විට.

"රූසෝ බලන්න අර පුංචි කමිසේ හොඳයි ද කියලා."

රූසෝ කමිසය රාක්කයෙන් ගලවාගෙන හරව හරවා බැලුවා.

"ඔයා මේක සල්ලි වලට ගත්ත ද?"

"නෑ, මම මයි මැහුවේ."

"ඔයා?"

"ඔව් රූසෝ මම ඔය වගේ කමිස මෝස්තර හතරකට මැහුවා. මේ ඒවා. ඒවාවල වැඩ ඉවර නැහැ තවම."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් මේ මෝස්තර ඇන්දේ ගුරුතුමී ද?"

"නෑ රූසෝ, මම ඒවා ඇන්දා. ලාබ රෙද්දකින් මැහුවා."

"ෂා මේවා හොඳයි නේ."

රූසෝ පුදුමයෙන් කිව්වා.

"හොඳයි අපි ගණන් බලමු මේවාට රෙදි කෑල්ලකට යෙන් තුනයි. මැහුම් කුලියට යෙන් දෙකක් දමමු. ලාබයට යෙන් එකක දමමු. ඔව් ඔෂින් මේ කමිසයක් යෙන් 6 කට විකුණන්න පුළුවනි. එහෙම නම් ඔයා මේ රෙද්දෙන්ම තව කමිස මෝස්තර 4 කට කමිස 20 ක් මහන්න. අපි බලමු. විකුණන්න පුළුවන්ද කියලා. විකුණන්න බැරි වුණොත් අපි ඒක අමතක කරමු."

"මැඩම්, මම ඒවා පේමන්ට් එකට ගෙනිහින් විකුණනවා."

"හොඳයි ගෙන්ජි. මම ඉක්මනට ඒ ටික මහන්නම්."

"හැබැයි රෑ නිදි මරාගෙන මහන්න තහනම් හොඳද ඔෂින්. දැන් මට බඩගිනියි. එන්න කෑම කමු."

රාත්‍රී නින්දට ගිහින් රූසෝ ඔෂින්ගෙ අතකින් අල්ලා ගත්තා.

"ඔෂින් ඇත්තම කියන්න ද?"

"කියන්න."

"මම පැරදුණා ඔෂින්."

"නෑ රූසෝ එහෙම හිතන්න එපා. ඔයා නොහිටින්න මම මේ ව්‍යාපාරවලට අත ගහන්නේ නැහැ. ඔයයි මට ශක්තිය වුණේ ධෛර්ය වුණේ."

"මම ඔයාට හොඳ ෂෝ කේස් එකක් හදවලා දෙන්නම්. මම ඔයාට උදව් කරන්න එපායැ."

රූසෝ නින්දට වැටුණා. ඔෂින් සෙමෙන් නැගිට සාප්පුව ඉදිරියට ගියා. ලොකු ඉටි පන්දමක් දල්වාගෙන මෝස්තර හතරකට කමිස කපන්න පටන් ගත්තා. පසුවදා උදේ රූසෝ ඉතිරි මහන යන්ත්‍ර සාප්පුවට ගෙන ඒමට ගියා. ඒ සමඟ හකමෝතෝ

Scanned with CamScanner

sinhalaebooks.com



ගුරුතුමිය මුණ ගැසී ඇඳුම් මැසීමට ගැහැනු ළමුන් තුන්දෙනෙක් සොයා දෙන ලෙස ඉල්ලා සිටියා.

"ගෙන්ජි රූසෝ මහත්තයා අර කමිස දැකලා හරියට සතුටු වුණා. ඒ එක්කම එක කමිසයක ගණන් හැදුවා. එයා හරි දක්ෂයි නේද ගෙන්ජි."

"ඔව් මහත්තයා බිස්නස් වලට හරිම දක්ෂයි."

"අපේ අලුත් බිස්නස් එක හරියයි ද? වරදියි ද කියලයි එයා නිතරම හිතුවේ."

"නෑ මැඩම්, බිස්නස් වලටත් වාසනාව බලපානවා. මට හිතෙනවා ඒ වාසනා ගුණය ඔයාට තියෙනවා කියලා."

"නෑ ඒ වාසනාව අපි තුන්දෙනාටම තියෙනවා."

මැහුම් මැසීම සඳහා ගැහැනු ළමුන් තිදෙනෙක් පැමිණියා.

"මැඩම්. අපි ආවා."

"එන්න. මම ඔයාලා එනතෙක් බලාගෙන හිටියේ. මම ටනකුරා මහත්තයගෙ බිරිඳ ඔෂින්."

"හොඳයි."

"වැටුප් ගෙවීම කොහොමද?"

"මහන කෑලි ගාණට ගෙවන්න මැඩම්."

"හොඳයි."

"අපි මේ කමිස මෝස්තර පහකට මහනවා. හැබැයි මතක තියා ගන්න ඇඳුම් විකුණුවේ නැතිනම් අපි මේ සාප්පුව වහනවා. ඔයාලා මුලින්ම ඒ ගැන දැන ගන්න එක හොඳයි හිතුවා."

මෙවිට ම රූසෝ රෙදි තොගයක් රැගෙන පැමිණියා.

"මෙන්න ඔෂින් බලන්න පාට එහෙම හොඳද කියලා."

"ළමයින්ට ගැළපෙන පාට."

"මේ සේරම පාට තේරුවේ මම."

"ස්තුතියි රූසෝ."

රූසෝ ඔෂින් ගේ අගය කිරීමෙන් දැඩි සතුටට පත් වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com

# හත

ටික දිනකින් ටනකුරා සාප්පුව නැවත විවෘත වුණා. මෝස්තර පහකට මසන ලද පාසල් ඇඳුම් ද එහි වූ අතර ඒවායේ මිල බෙහෙවින් අඩු විය.

දිනක් හසකාවා මැඩම් ඉට්ෂු සමග ෂාප්පුවට පැමිණියා.

"ඔෂින් කෝ හුඟක් ඇඳුම් නැහැනේ. මම හිතුවේ ඔයා ඇඳුම් ගොඩගහගෙන ඇති කියලා."

"නෑ මැඩම් අපි මෝස්තර පහයි නිර්මාණය කළේ. හුඟක් අඩු මිලකට දෙන්නේ."

"ඔෂින්, මම හිතනවා ඔයා කොණ්ඩා සැකසුම් සාප්පුවක් දැම්මා නම් මීට හොඳයි කියලා."

"බැහැනේ මැඩම්. මම බැන්දේ රෙදි වෙළෙන්දෙක් නේ."

දෙන්නාම හිනැහුණා.

රූසෝ ඇඳුමක් ගැන ඔෂින්ගෙන් තොරතුරු ඇහුවා.

"ආ දෙන්නම කුරුලු ජෝඩුව වගෙ ඉන්නවා වගෙයි නේද රූසෝ."

" ඔව් මැඩම් ඒකේ රහස තියෙන්නේ ඔෂින්ගේ ළඟයි."

"ඒ මොකක් ද?"

"ඒ තමයි ඔෂින්ගේ උත්සාහය."

"නෑ මැඩම් මගෙ ශක්තිය රූසෝ යි."

Scanned with CamScanner

sinhalaebooks.com



"හරි සතුටුයි දෙන්නාම මෙහෙම එකතුවෙලා වැඩ කරනවට."

ගෙන්ජි සමඟ එක්ව ඉට්ෂු පාරේ යන අය දැනුවත් කළා.

"පොඩි අයගෙ ඇඳුම් තියෙන්නේ. පාසල් ඇඳුම් තියෙනවා. බොහෝම මිල අඩුයි. ගොඩ වෙලා බලලා යමු. එන්න එන්න."

මේ අතර ගෙන්ජි අත් පත්‍රිකා බෙදා දුන්නා.

කාන්තාවන් දෙතුන් දෙනෙක් සාප්පුව ඇතුළට පැමිණියා. ඔවුන් සමඟ පැමිණි ළමුන්ට ඇඳුම් තෝරුවා.

"බලන්න මැඩම් මේ ඇඳුම."

රූසෝ ඇඳුමක් ඇයට දුන්නා.

"මේ බබාට නම් ටිකක් ලොකුයි."

"ටිකක් ලොකු වුණාට කමක් නෑ. මේ ගොල්ලත් ඉක්මනට උස යනවා."

"මේ ඇඳුම් හෝදන්න පුළුවන්ද?"

කාන්තාවක් ලොම් රෙද්දෙන් මැසුව ඇඳුමක් පෙන්නුවා.

"පුළුවනි මැඩම්."

"පාට එහෙම යයි ද?"

"නෑ මේවා ලෝම රෙදි නිසා වතුර මිරිකන්න එපා. වතුර වැටෙන්න වනලා තියන්න."

"මගෙ මිනිබිරි ඉල්ලන්නේම අපරදිග ඇඳුම්. තියෙනවද?"

"තියෙනවා. එන්න මැඩම්. මේ බලන්න."

රූසෝ ඇඳුම් තේරීමට උදව් කළා.

"බොහෝම ස්තුතියි ඔබේ පැමිණීමට."

ඔෂින් හිස නමා ආචාර කළා.

සවස ඔෂින්ට වෙහෙසක් දැනුණා. සාප්පුව වසා දැම්මා.

"ඔෂින් අද වික්කේ ඇඳුම් දෙකයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඉතින් ඒ මදෑ රූසෝ."

"ඒ වුණාට මට නම් එහෙම මදි."

"වද වෙන්න එපා. තවම එක දවසයි ගත වුණේ. මොනවා වුණත් ඔයා මා එක්ක ඉන්න නිසා මගෙ හිතේ බලාපොරොත්තු කඩ වෙන්නේ නැහැ."

"බබා ඉන්න නිසා හුඟක් මහන්සි වෙන්න එපා ඔෂින්. "

"නෑ රූසෝ බබත් දැන ගනියි ජීවත් වෙන්න තියෙන අමාරුව."

ඔෂින් කීවේ හිනැහෙමින්.

"රූසෝ ඔයා අද මට හුඟක් උදව් කළා. ඔයාට ස්තුතියි ඒ ගැන."

"මම ඔයාට මුළු හදවතින්ම ආදරෙයි රූසෝ."

"එහෙමද? මමත් ..........."

රූසෝ ඔෂින්ගෙ දෑතම ගෙන සිප ගත්තා.

සාප්පුව විවෘත කර දින දහයක් ගෙවී ගියා. සමහර දවස්වල එක ඇඳුමක්වත් විකුණුනේ නැහැ. ඔෂින් ඒ පිළිබඳ එතරම් දුක්වන බවක් නොපෙන්නුවත් ඇය රූසෝට කතා කළා.

"රූසෝ මම අපේ මුදල් වියදම් කළා කියලා හිතෙනවා. මට ඒ ගැන සමාවෙන්න."

"ඔෂින් ඒ ගැන හිතන්න එපා. මේ ඇඳුම් හොඳයි. ඒ වගේම ලාබයි. අපි බලමු."

"ඒත් රූසෝ මම ආයිම ඇඳුම් මහන්නේ නැහැ."

"ඒ වුණාට මම සාප්පුව වැහෙන්න දෙන්නේ නැහැ."

තවත් දින කීපයක් ගෙවී ගියා. සවස් වරුවක පිරිමි දෙන්නෙක් සාප්පුවට ආවා. ඔවුන් කතා බහෙන් තොරව ඇඳුම් එකින් එක අරගෙන බැලුවා. ගෙන්ජි බිය වුණේ ඔවුන්ගේ නිහඬතාවයට.

"මැඩම් ඉක්මනට එන්න. පිරිමි දෙන්නෙක් ඇවිත් ඇඳුම් බලනවා. මට නම් ඒ දෙන්නා ඇල්លුවේ නැහැ."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් ඉදිරියට ගොස් ඔවුනට ආචාර කළා.

"මේ මහත්තුරු?"

"අපි ඇඳුම්, ලී බඩු විකුණනවා."

ඔවුන් කාඩ් එකක් ඔෂින්ට දුන්නා.

"ඔයාලගේ ඇඳුම් හොඳයි ලාබයි කියලා අපට ආරංචි වුණා."

"මේ කාලේ ළමා ඇඳුම් වලට ඉල්ලුමක් තියෙනවා. අපි කැමතියි ඔබේ ඇඳුම් අපේ සාප්පුවට ගෙන ගිහින් විකුණන්න."

"මම නම් එහෙම අදහස් කළේ නැහැ."

"ඒ වුණාට මැඩම් මේක හොඳ ආයෝජනයක්."

"මම සැමියාගෙන් අහලා කියන්නම්."

"සැමියා කැමතියි."

"මිස්ට ටනකුරා තමයි අපට කීවේ ඔබ ඇඳුම් මහන බව."

"හොඳයි ඉක්මනින් පිළිතුරක් එවන්නම්. පැමිණියාට ස්තුතියි."

සවස රූසෝ පැමිණියා.

"රූසෝ මම නම් කැමති අපේ සාප්පුවට පාරිභෝගිකයෝ පුරුදු කර ගන්නයි."

"ඒ වුණාට ඔෂින්, ඔවුන් ගේ සාප්පුව හොඳට ජනප්‍රිය එකක්. ඒකට නිතරම සෙනඟ එනවා. අපේ ඇඳුම් ඒකේ තියලා විකුණුවා ම ඒක අපට ආර්ථික වාසියක්. අනිත් කාරණේ ඔෂින් මිනිස්සුන්ට තවම අපිව විශ්වාස නැහැ. මිනිස්සු මෙහෙ නොඑන්නේ ඒකයි. මේ ඇඳුම් අපි නිර්මාණය කරන ඒවා බව දැන ගත්තා ම ඒ ගොල්ලන්ම මෙහෙට එනවා. තේරුණා ද?"

"මේ ඇඳුම් මිනිස්සුන්ට හුරුකරන්න කාලයක් දෙන්න වෙයි."

"රූසෝ ඔයා එහෙම හිතනවා ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"අනිත් එක ඔෂින් ඔයා මහන්සි වුණා. ඔයාට පරාද වෙන්න දෙන්නේ නැහැ මම."

පසු දින ම ඔෂින් මැසූ ඇඳුම් රැගෙන ගියා. සාප්පුව නැවත පාළු වුණා.

"මටත් වැඩක් නෑ වගෙයි."

ගෙන්ජි කිව්වා.

"කමක් නෑ ගෙන්ජි අපි වියදම් කළ මුදල් ටික ආපිට ලැබෙයි නේ."

"මම හිතන දේ අපේ ඇඳුම් විකිණෙයි ද කියලයි."

රූසෝ එවිටම පැමිණියා.

"ඔෂින් මෙහෙ වෙළි වෙළි තිබුණ ඇඳුම් අන්න ටකිසාරා ගෙ සාප්පුවේ උණු කැවුම් වගෙ විකිණෙනවා."

"මොනවා? මෙහෙ ඇඳුම් විකිණිලා."

"එයාල ඒ ඇඳුම් සියයට විස්සක් වැඩි කරලත් ඒ ඇඳුම් විකිණෙනවා."

"අන්න දැක්කා නේද ජනප්‍රිය බවේ රහස"

"මට නම් විශ්වාස කරන්නවත් බැහැ."

"ඔෂින් අපට ඉදිරියට වැඩ වැඩි වෙයි. මිස්ට ටකිසාරා මෙහෙ එනවා කිව්වා තව ඕඩර්ස් ලැබෙයි. "

"හැබැයි ඔෂින් අපිට තව මැෂින් පහක්වත් ගන්න වෙනවා."

එදා සවස ටකිසාරා පැමිණියා. ඔහු රූසෝ මිල කළ ගාණටත් වඩා ඇඳුම්වලට මුදල් දුන්නා. ඉක්මනින් පාසල් ඇඳුම් මසා දෙන ලෙස ඉල්ලුවා. ගෙන්ජි සකේ බෝතල් තබා මේසයක් සූදානම් කළා. රූසෝ හා ටකිසාරා සකේ පානය කළා.

"ඔයත් ටිකක් ගන්ඩ."

"එපා බබාට හොඳ නෑ."

ටකිසාරා යන්න ගියා. රූසෝ තවත් සකේ බිව්වා. ඔහු මත්

Scanned with CamScanner

sinhalaebooks.com



වුණා. රූසෝ මෙට්ටය මත වැටී කෑගැහුවා.

"ඔෂි.....න් ඔෂින් මම..... පැරදුණා බිස්නස් වලින්."

"ඔව් ගෙන්ජි මම පැරදුණා."

"ඔයාගේ ඇඳුම්...... තමයි....... හොඳ.......ම.."

"මට ඉන්නේ ......... ලෝකෙ හොඳම ගෑනි. ඔව් ඔෂින්."

"කොහොමද මැඩම් දැන් මහත්තය ගෙ කතාව."

"ගෙන්ජි, ඒත් මට බයයි වගේ."

"නෑ මැඩම් මහත්තයත් දැන් මැඩම් එක්ක හවුල් වෙලා නිසා අපිට පුළුවනි දියුණු කරන්න මේක."

"එහෙම හිතමු නේද ගෙන්ජි. මේ අපි තුන්දෙනාගෙම ව්‍යාපාරය."

"ඇයි හතර දෙනයි."

"ඒ කවුද?"

"ඇයි බබා."

"ආ ඔව් හොඳ බබෙක්."

ඔෂින් කුස දෙස බලා සෙමෙන් අතගෑවා. ගෙන්ජි අහක බලාගෙන හිනාවුණා.

ලොකු බලාපොරොත්තු තිබුණත් ව්‍යාපාරය නම් ඒ තරම් ඉක්මනින් දියුණු වුණේ නැහැ. ඔෂින් ගෙන ආ මහන මැෂින් දෙකේ කාන්තාවන් දෙන්නෙක් වැඩ කළා. ඔෂින් එක මැෂිමක් පාවිච්චි කර ඇඳුම් මැහුවා. එක දවසක කාන්තාවන් කීප දෙනෙක්ම සාප්පුවට පැමිණියා.

"කෝ රූසෝ මහත්තයා. එයා අපට එන්න කිව්වා. මෙහෙ මැහුම් වැඩ තියෙනවා කියලා."

"මැඩම්, මැඩම්."

ගෙන්ජි ගේ කෑගැසීමට ඔෂින් එළියට ගියා.

"මේ රූසෝ මහත්තයගෙ නෝනා."

Scanned with CamScanner

sinhalaebooks.com



කාන්තාවන් ඔෂින්ට හිසනමා ආචාර කළා.

"මගෙ නම ඔෂින්, මේ අය රූසෝ මහත්තයා සෙව්වේ ඇයි?"

"මැඩම්, රූසෝ මහත්තයා කිව්වා මෙහෙ මැහුම් වැඩ තියෙනවා කියලා. අපට එන්න කිව්වා."

"මොනවා......... මැහුම් වැඩ?"

"ඇයි ඔබ ඒ බව දැනගෙන හිටියේ නැද්ද?"

"නැහැ...... මේකයි මෙහෙ තියෙන්නේ මැෂින් තුනයි. ඒවල වැඩට අය ඉන්නවා. මගෙ සැමියට අමතක වෙන්න ඇති ඒ බව. සමාවෙන්න."

"හරි වැඩක් නේ, සැමියා කරන දේ බිරිඳ දන්නේ නැහැ."

"ඒ මදිවට අපි හිටපු වැඩපල වලින් අස්වෙලා ආවේ. මේ කම්කො තමයි අපට කීවේ අපි ගන්න වැටුප වගේ දෙගුණයක් ගෙවනවා කියලා."

"අපි මොකද කරන්නේ, අපිට රස්සාවල් නැති වුණා."

"ඇයි රූසෝ මහත්තයා අපව එහෙම රැවැට්ටුවේ."

"ඔයා තමයි කම්කෝ මේකට වග කියන්න ඕනෑ."

ඔවුන් බහින් බස් වෙන්න පටන් ගත්තා.

"කලබල කරගන්න එපා. මගෙ මහත්තයා එන තෙක් අපි ඉවසමු."

ඒත් ඒ අරගලය සංසිඳුණේ නැහැ.

"මේ මැඩම් කියන එක අහන්න. කලබල කර ගන්නේ නැතිව ඉන්න." ගෙන්ජිත් කිව්වා.

මේ අතර රූසෝ පැමිණියා.

"ආ ඔයාලා ආවාද?"

"ඒත් රූසෝ මහත්තයා, ඔබේ බිරිඳ කියනවා මෙහේ වැඩ නැහැ කියලා."

Scanned with CamScanner

sinhalaebooks.com



"කලබල නොවී ඉන්න."

"රූසෝ." ඔෂින් රූසෝ ළඟට ම ගිහින්.

"ඇයි මේ අය ගෙන්නුවේ ඔයාට අමතක වුණා ද මැෂින් තුනක් තියෙන බව. ඒවට වැඩට අය ඉන්නවානේ."

"ඔෂින්, මම අද තව මැෂින් පහක් ගෙනාවා. අන්න ඒවා එළියේ." රූසෝ කීවේ ආඩම්බරයෙන්.

"ගෙන්ජි මේ අයත් එක්ක ඒවා ඇතුළට ගන්න."

"අම්මේ දැන් තමයි ඇඟට ලේ ටිකක් ඉනුවේ. අපේ රස්සාවල් නැතිවුණා තමයි කියලමයි හිතුණේ."

කාන්තාවන් දෙදෙනා බැගින් මැෂින් ඔසවාගෙන ආවා.

"රූසෝ......" ඔෂින් කාමරයට ගියා. රූසෝ ඇය පසුපස ගියා.

"මම විරුද්ධයි මේ වැඩේට. අපි ඉන්න සේවිකාවන්ගෙන් මේ ඕඩර් ටික මස්සවා ගනිමු. මමත් මහනවානේ."

"එහෙම බිස්නස් කරන්න බැහැ ඔෂින්. බිස්නස් කරන්න නම් විශ්වාසය තියෙන්න ඕනෑ. ඒගොල්ලන් ඉල්ලන දිනයට ඇඳුම් ටික දෙන්න ඕනෑ. එතකොටයි ඕඩර් ගන්න පුළුවන්. ජපානය දැන් වෙස්ටන් ඉස්ටයිල් වලට පුරුදු වීගෙන එන්නේ. කිමෝනාවට වඩා ඒ ඇඳුම් පහසු නිසා. අපි ලෑස්ති වෙන්න ඕනෑ ඒ ඉල්ලීම සපුරන්න. තේරුණා ද ඔෂින්. මේ කෙල්ලෝ හොයා ගන්න මම හරියට මහන්සි වුණා."

"ඒත් හය දෙනෙක්ට මැෂින් පහයි."

"මේකයි දැන් ඔයා මහන්සි වෙන්න ඕනෑ නෑ. දැන් ඔයා අපේ බබා ගැන හිතන්න. ඔෂින් මේ මැහුම් ව්‍යාපාරය ආරම්භ කළේ ඔයා. මේක දවල් හීනයක් වෙන්න දෙන්නේ නෑ මම."

"ඕවා කියන්න නම් ලෙහෙසියි."

ඔෂින් ගේ මුහුණෙන් පෙනුණේ අවිනිශ්චිත බවක්.

"මේ මගේ ජීවිතේ තීරණාත්මක මොහොතක්. මම ලොම්

Scanned with CamScanner

sinhalaebooks.com



රෙදි වෙළෙන්දෙක් වෙලා හිටියා. බැට කෑවා. බඩගින්නේ හිටියා. ඒ සේරම අතීතයට. අනාගතය පැහැදිලියි. ඔෂින් ඔයා බයවෙන්න එපා."

රූසෝ ඔෂින්ගේ මුහුණ තමා පැත්තට හරවා ගත්තා.

"මිනිහෙක් පියෙක් වුණා ම බොහෝ ම මහන්සියෙන් වැඩ කරනවා. මමත් මේ මහන්සි වෙන්නේ ඔයයි දරුවයි වෙනුවෙන්. තේරුණා ද ඔෂින්."

ඔෂින් රූසෝ ගේ මුහුණ දෙස බලාගෙන හිටියා.

"ඔව්, රූසෝ අපි පැරදුණොත් ආයෙම මුල ඉඳලා පටන් ගනිමු."

"අන්න හරි ඔෂින්, ඔයා තේරුම් ගත්තා මට හරි සතුටුයි."

ගෙන්ජි දොරකඩට විත් බලාගෙන හිටියා.

"සමාවෙන්න, මහත්තයා, ඔකිතාරා ඇවිල්ලා. මහත්තයව මුණ ගැහෙන්න."

රූසෝ එළියට ගියා.

"මැඩම් දැන්නම් හිනාවෙනවා නේද? ඉස්සර වෙලා මූණේ වැහි වලාකුළු."

"මම දැන් විරුද්ධ නෑ ගෙන්ජි."

"ඔව් මැඩම්, දෙන්නට දෙන්නා විරුද්ධ වුණොත් කිසිම දියුණුවක් නැහැ. සතුටු වෙන්න. අපි බලමු මටත් හිතෙනවා මේක හොඳ ඉදිරි පියවරක් කියලා."

එදා රාත්‍රියේ රූසෝ නින්දට ගොස් ඔෂින් කොහේදැයි සෙව්වා. ඔෂින් ඉදිරි කාමරයේ මේසයක් ළඟට වී වැඩක නිරතව සිටිනවා රූසෝ දැක්කා.

"ඔෂින්, මේ රෑ ඔයා මොකද කරන්නේ."

"ඒ ගොල්ලන්ට අලුත් ස්ටයිල් ඕනෑ කිව්වා. මම කීපයක් ම ඇන්දා. හොඳද බලන්න."

"කෝ බලන්න." රූසෝ එතනම වාඩි වී ඔෂින් ඇඳි සිතුවම් ඇත් කර බැලුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි ඔෂින්."

"මේ ස්ටයිල් එක තනි පාටින් ම ද මහන්නේ."

"ඔව්, රූසෝ මම හිතුවේ එහෙම"

"හොඳයි මම හෙට උදේ ම ඔයාට රෙදි හොයලා දෙන්නම්."

"ස්තුතියි රූසෝ. ඒත්, බලන්න රූසෝ අපි මහන්සි වෙනවා. ඒ ගොල්ලන් අපේ ඇඳුම් විකුණලා ලාබ ගන්නවා."

"ඒ ගැන හිතන්න එපා ඔෂින්. අපි පාසල් නිල ඇඳුම් මහමු. එහෙම මහලා නමක් හදා ගනිමු. එන්න නිදාගන්න යන්න. ඔයාට නිදි මරන්න හොඳ නෑ. "

" නෑ මම ලෙඩෙක් නෙමෙයි. මේක අසනීපයක් නෙමෙයි. මම තව මෝස්තර ටිකක් අඳින්න ඕනෑ."

"මට නිදිමතයි. මම යනවා."

රූසෝ මහන්සි වී තවත් ඇනවුම් කීපයක් ම හොයා ගත්තා. සෑම දෙනාම සතුටින් වැඩ කළා. ඔෂින් කෑම සකස් කරමින් හිටියා.

"ඔෂින් මම අද පිටින් කෑම කන්නේ. මොකද ඔකිසාරලාට කෑමකට කතා කරන්නයි හිතාගෙන ඉන්නේ."

"හොඳයි."

ඔෂින් හිනැහෙමින් කිව්වා. රූසෝ යන්න ගියා.

ගෙන්ජි සියල්ල අසාගෙන සිටියා.

"මොකද මහත්තයා කියන්නේ."

"එයා අද පිටින් කෑම ගන්නවලු."

"ඔව් ඉතින් අතට කීයක් හරි ලැබෙනවානේ."

"නෑ ගෙන්ජි අපි අපේ ව්‍යාපාරිකයින්ට සලකන්න ඕනෑ නේ. ඒ නිසයි. කොහොම වුණත් රූසෝ ඉන්නේ හරි සතුටින්. මට ඒ ගැන හරි සතුටුයි. නැත්නම් මෙලහකට සාගා ගිහින්. දැන් එහෙම ඕනෑකමක් නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"මැඩම්, ඔයාට පුතෙක් ලැබුණොත්, සාගා යන්න පුළුවනි. ඔය තරහ මරහ නැතිවෙයි දරුවව දැක්කම."

"මැඩම්, මැඩම්,"

සේවිකාවක් දුවගෙන ආවා.

"කයිකො ගෙ අත තුවාල වෙලා."

"හොඳයි යමු."

ඔෂින් සාප්පුව තුළට ගියා.

"ඉදිකටුවද වැදුණේ. අනේ ලේ එනවා. ඔයා බෙහෙත් ටිකක් දමා ගන්න. විවේක ගන්න."

"ඒත් මැඩම් ඕඩර් එක දෙන්න පරක්කු වෙයි."

"කමක් නෑ ඔයා වෙනුවට මම මහන්නම්."

"මැඩම්...... ඔයා වැඩ කරන්න එපා."

ගෙන්ජි විරුද්ධ වුණා.

"බැහැනේ ගෙන්ජි අපි වෙලාවට ඕඩර් එක දෙන්න එපායැ."

රාත්‍රියේ රූසෝ ගෙදර ආවේ ගේෂා කාන්තාවක් දෙන්නෙක් වත්තන් කරගෙනයි. එළියට වී හිටිය ගෙන්ජි පිළිකුලෙන් බලාගෙන හිටියා.

"යනවා, යනවා, යන්ඩ."

ගෙන්ජි ගේෂා කාන්තාවන් පන්නා දමා සාප්පුව තුළට ගොස් බිම වාඩි වී අහක බලාගෙන හිටියා.

"මොකද මේ රෑ වෙනකල් කරන්නේ?"

ගෙන්ජි ඇසුවේ කේන්තියෙන්. එවිටම ඔෂින් එතැනට ආවා.

"මම මේ රෑ නිදි මරන්නේ ආශාවට නෙමෙයි."

රූසෝ එහෙ මෙහෙ පැද්දුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් අහගන්න මගෙ අලුත් ම ප්ලෑන් එක."

රූසෝ විසි වෙමින් ගොස් මැෂිමක් අල්ලා ගත්තා.

"මේ මැෂින්..... මේවා රෑට පාවිච්චි කරන්නේ නැහැනේ. මම හොයා ගන්නවා රෑටත් මැහුම් මහන්න සේවිකාවෝ. එතකොට අපිට තවත් ඕඩර් ගන්න පුළුවනි."

"රූසෝ මැෂින් ගැන නෙමෙයි. ඒවා වල වැඩකරන මිනිස්සු ගැනයි හිතන්න ඕනෑ."

"මොකටද ඒ අය ගැන හිතන්නේ. ඒ ගොල්ලන් කැමති නම් රෑට වැඩ කරන්න වැඩිපුර ගෙවනවා. එතකොට අපේ පැක්ටරිය දිවා රෑ නිෂ්පාදනය කරනවා ඇඳුම්."

"ඇයි රූසෝ එහෙම හිතන්නේ. මිනිස්සුන්ගේ නැතිබැරිකම් නිසා ඒ මිනිස්සු රෑ වැඩ කරයි තමයි. ඒ වුණාට රාත්‍රිය තියෙන්නේ දවල් තිස්සේ වැඩ කරන අයට වෙහෙස නිවා ගන්න. ඒකයි ස්වභාවධර්මයේ නියමය. උදේට වැඩ කරනවා."

"ඔෂින් ඔය කතා මට වැඩක් නෑ. මම එහෙම රෑ වැඩ දමනවාමයි."

"රූසෝ මොකද මේ මෙච්චර තණ්හාවක්. දැන් ඔයාට මුදල් තියෙනවා ඕනෑ තරම්."

"ඇයි බීලා එන්ඩත් එක්කම."

ගෙන්ජි කීවේ කෝපයෙන්.

"බැහැ ඔෂින් මේක තරගකාරී ලෝකයක්. ඔයා මට කිව්වා මට ඕනෑ දෙයක් කරගන්න කියලා. දැන් ඇයි මෙහෙම කතා කරන්නේ?"

"මම එහෙම කතා කරන්නේ මගෙ සොයුරිය හරුන් ගැන හිතලා. එයා රෑ දවල් වැඩ කරලා අන්තිමට ලෙඩ වුණා. අඩු වයසින් ම මිය ගියා."

"අපි බලෙන් වැඩ ගන්නේ නැහැ."

"ඒත් මිනිස්සු මැරිගෙන වැඩ කරයි මුදල් ලැබෙන නිසා. ඒ මිනිස්සු ඉක්මනට මැරිලා යයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒක ඔෂින්ගෙවත්, මගෙවත් වරදක් නෙමෙයි."

"නැත්තේ ඇයි රූසෝ. ඔයානේ ඒ මිනිස්සු පොළඹවත්තේ. ඔයයි වරදකාරයෝ වෙන්නේ."

"ඔෂින් මතක තියාගන්නවා ඔයා මේ ගෙදර ගෑනි. ගෑනියෙක් දන්න බිස්නස් එකක් නැහැ. තමුසෙ මගෙ දරුවා බලාගෙන මගෙ ගෙදර බලාගන්නවා. තේරුණා ද?"

ඔෂින් අඬමින් ම කාමරයට දුව ගියා.

"මොකක් ද මහත්තයා ඒ කියපු කතාව."

"නෑ ගෙන්ජි ඔෂින් මහ කරදරකාරී, හිතුවක්කාර ගෑනියෙක්. ඒ කතා ඕනෑ නෑ. මෙන්න මේ සල්ලි වලින් මගෙ අම්මට කිමෝනාවක්, බඳ පටියක්, සෙරෙප්පු දෙකක් තෑගි වශයෙන් යවනවා."

"මහත්තයා හරි වැරදියි මහත්තයා."

"ගෙන්ජි මේ මගෙ ස්ටෝරුව. මම කරන්නේ මට ඕනෑ දේ තේරුණා ද?"

"මේක විනාශයක් රූසෝ මහත්තයා. කවුද මේ ව්‍යාපාරය මේ තත්වයට ගෙන ආවේ කියලා දැන් රූසෝ මහත්තයට මතක නෑ නේද?"

"ඒවා පරණ කතා."

"රූසෝ මහත්තයා කන්ද නැග්ගා වගේම කන්ද බහින්නත් ශක්තිය ඕනෑ. ඒක අමතක කරන්න එපා. මහත්තයා පටන් ගත්තා ආයිම සල්ලි නාස්ති කරන්න. බීමට, ගේෂාවන්ට."

"මේවා මගෙ සල්ලි ගෙන්ජි."

"කොහොමද සම්පූර්ණයෙන් ඔයා ගේ සල්ලි කියන්නේ? මැඩම් මේවා පටන් ගත්තේ. ඔයා එයා ගැන හොයලා බලනවද? අම්මට තෑගි යවන්ඩලු. ඔයා මොනවද මැඩම් වෙනුවෙන් අරගෙන දුන්නේ? එයාව සතුටු කරන්න අඩු වශයෙන් එයාගේ අම්මට පුංචි තෑග්ගක්වත් යවන්ඩ හිතුවද? ඔයා හරිම ආත්මාර්ථකාමියි."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ නිහඬව අසාගෙන හිටියා. ගෙන්ජිත් හඬ අඩුකරගෙන කතා කළා. තමාට ම කියා ගත්තා.

"මට පේනවා මහා විනාශයක් වෙන්ඩ යනවා කියලා. ඒකයි මම මේවා කියන්නේ. මට දුකයි මැඩම් ගැන. මහත්තයලා දියුණු වෙලා සාගා ගිහින් අම්මලා බලලා එනකල් මමත් ඉන්නේ ආසාවෙන්. ඇයි මේ මැඩම්ගේ හිත රිදවන්නෙ මහත්තයා. මීට වඩා වගකීමෙන් වැඩකරන්න ඕනෑ කාලයක් මේක. මේවා මම කියන්නේ මම මහත්තයට ආදරේ නිසා."

රූසෝ ටික වෙලාවක් නිහඬව සිට ඔෂින් සොයා ගෙන ගියා.

ඔෂින් මෙට්ටය මතට වී දෑස් පියාගෙන හිටියා. රූසෝ එතනම වාඩි වුණා.

"ඔෂින්, මම ඒ අදහස අත ඇරියා. ඔයා කිව්ව දේවල් ඇත්ත. ඔෂින් අපි මේ විදිහට අපේ ව්‍යාපාරය දියුණු කර ගනිමු."

"රූසෝ මට සමාවෙන්න මම ඔයාව තරහ කළාට."

"නෑ, ඔෂින් මමයි ඔයාගේ හිත රිදෙව්වේ. ඒ ගැන මට සමාවෙන්න. ඔෂින් ඔයයි මේ ව්‍යාපාරය ගොඩ ගත්තේ. මේ සල්ලි ඔයාටත් අයිතියි. මේවා වලින් ඔයාට ඕනෑ දෙයක් ගන්ඩ."

රූසෝ යෙන් කොළ කීපයක් ඔෂින් අත තිබ්බා.

"ස්තූතියි රූසෝ, මට මොනවත් අවශ්‍ය නැහැ."

"එහෙම නම් ඔයා මේ සල්ලි යමගාටා යවන්න. අම්මට අපි මොනවත් යැව්වෙත් නැහැනේ."

"ස්තූතියි ඔයාගේ කරුණාවට. අපි එහෙනම් ඔයාගේ අම්මටයි තාත්තටයි තෑගි යවමු. ඒක මට සතුටක්."

"ඔෂින් ඔයා හරිම හොඳයි." රූසෝ ඔෂින් ව වැලඳ ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com

# අට

ඔෂින් ගෙය අස්කරමින් හිටියා.

"මැඩම්, ඕවා කරන්න එපා. මම හවසට අස්කරලා දෙන්නම්."

"වද වෙන්න එපා ගෙන්ජි. මේවා මට කරන්ඩ පුළුවනි."

"ඒ වුණාට මහත්තයා නම් ඉන්නේ හරිම බයෙන්. ඔයා වැඩ කරන නිසා වැඩට කෙනෙක් ගෙනැත් දෙන්න ඕනෑ කිව්වා."

"ඇයි එච්චර වද වෙන්නේ. මට මේවා කරන්න පුළුවනි."

ඔෂින් අමාරුවෙන් බඩු එහා මෙහා අදිනකොට ගෙන්ජි බයෙන් බලාගෙන හිටියා.

"ඔෂින්, ඔෂින්."

"ආ රූසෝ වේලාසනම ඇවිල්ලා. තවම මට මේක අස්කරගන්නත් බැරි වුණා."

රූසෝ ගෙය ඇතුළට ආවා.

"මොකද කරන්නේ ඔෂින්? ඕවා ඔයාට තනියම කරන්න බැහැනේ. ආ ඒක නෙමෙයි එන්න එළියට යන්න. අද විශේෂ අමුත්තෙක් ආවා."

"අමුත්තෙක්? ඔයා මට කීවෙත් නැහැ. බඩුත් එහෙ මෙහෙ ඇදලා දමලා." රූසෝ කිව්වා. "ඒකට කමක් නෑ මේ ඔයා දන්න අමුත්තෙක්."

Scanned with CamScanner

sinhalaebooks.com



"දන්න අමුත්තෙක්?"

"ඔව් එන්නකෝ යන්න."

රූසෝ ඔෂින්ව අල්ලාගෙන එළියට ගියා. එළියේ පඩිය මත හිටගෙන හිටියේ ෆුජි.

"අම්මා, ඔයා? කොයි තරම් කාලෙකට පස්සෙ ද? එන්න අම්මා ඇතුළට මට හරිම සතුටුයි. ඇයි එන බව නොකීවේ අම්මා. රූසෝ යවනවනේ එහෙම නම් ස්ටේෂමට."

"රූසෝ තමයි මාව එක්කගෙන ආවේ. රූසෝ මට ලියලා එව්වා මේ ගමන රහසක් වශයෙන් තියා ගන්න ඔෂින් පුදුම කරවන්න ඕනෑ කියලා."

"මොනවා රූසෝ දැනගෙන හිටියා."

"ඔව් ඔෂින් රූසෝ මට ගමනට මුදල් එවලා තිබුණා."

"ඔයාට ස්තුතියි රූසෝ."

ඔෂින් හිස නමා ආචාර කළා.

"ඉතින්, ඔය මැඩම්ව එක්කගෙන එන්නකො ගෙට."

ගෙන්ජි කිව්වා.

"ඔව් ම තමයි. අම්මා තාම හිටගෙන ම. එන්න අම්මා ගේ ඇතුළට. හැබැයි ගේ නම් හරිම අවුලක්."

"ඒකට කමක් නෑ. මම ඒවා අස්කරලා දෙන්නම්කො."

"වාඩි වෙන්න අම්මා. අපි තේ බොමු. අම්මට මහන්සිත් ඇතිනේ."

"ඔෂින් ඔයා හරි වාසනාවන්තයි දුව. ඔයාට හොඳ සැමියෙක් ලැබිලා තියෙනවා. මම රූසෝ කවදාවත් දැකලා නැතිවුණාට ස්ටේෂමේදී මම හිතුවා මේ ඉන්නේ රූසෝ තමයි කියලා. එයා හිටියේ මෙන්න මේ කොළේ අල්ලාගෙන."

ෆුජි තුනට හතරට නැමූ කොළයක් දිග ඇරියා. ඒක ඔෂින්ට පෙන්නුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම මේ කොළේ අරගෙන තියා ගන්නවා මතක සටහනක් විදිහට."

"ඉන්න ඔෂින්, මම මේවා අස්කරලා දාන්නම්."

"එපා අම්මා ඒවා තිබුණාවේ. අපි යමු අම්මා උණු වතුර නාන්න. මේ ළඟම තියෙන්නේ. "

"ඒක හොඳයි මැඩම්. එතකොට මහන්සියත් අඩුවෙයිනේ. මම කෑම හදන්නම්."

ගෙන්ජි කිව්වා.

"එපා. ඒවා ගෑනුන්ගේ වැඩ. අපි කෑම හදලා මේවා අස්කරමු. යමු ඔෂින්. මොකද මම ආවේ අද හෙට යන්න නෙමෙයිනේ. ඔයාට බබා හම්බවෙනකල් මම මෙහෙ ඉන්නවා."

"මහත්තයා බොහොම හොඳ වැඩක් කරලා."

"ස්තුතියි ගෙන්ජි."

"ඔබටත්....."

ගෙන්ජි හිස නැමුවා.

ඔෂින් අම්මත් සමඟ ගේ අස්කළා.

"ඔෂින් ඔයා වැඩ කරන එක හොඳයි. එතකොට බබා පොඩි වෙනවා. එතකොට හම්බවෙන්න හරි පහසුයිනේ. මම සෝජිගේ පවුලටත් ඕක කිව්වා. වැඩ කරන්න කිව්වා. සෝජි කිව්වා ඔහෙ හිටපුවාවේ වද දෙන්න එපා කියලා. සෝජි සේරම වැඩ කළා. බබා ලොකුවෙලා හරි වේදනාවක් වින්දා. එතකොට නම් මම කීව ඒවා මතක් වෙන්න ඇති. "

"තාමත් සෝජියි හාමිනෙයි තපුරුකම් කරනව ද?"

"මම ඔය හැමදේම විඳදරා ගෙන ඉන්නවා ඔෂින්. මම බඳින කාලේ ගෑනු අපි නැන්දම්මාට ගරු කළා."

"සාගා ගියා නම් මටත් ප්‍රශ්න ඇතිවෙනවා අම්මා. රූසෝ ගේ අම්මා මට කැමති නෑ."

"ඔව් දුව එයා හරි. කවුරුත් කැමති දරුවෝ දෙමාපියන්

Scanned with CamScanner

sinhalaebooks.com



තෝරලා දෙන දේවල් කරනවා නම් නේ. රූසෝ පොහොසත් පවුලක. ඔයා අද ගොවියෙක් ගේ දුවක්."

"ඒක ඇත්ත අම්මා. මම රූසෝ ගේ අම්මා එක්ක තරහ නැහැ අම්මා."

"ඔයාලා කාටවත් යටත් නෑ. ඒක හොඳයි."

"මුලදි බොහෝම කරදර තිබුණා. අපි දෙන්නා එකතු වෙලා ඒවා ජයගත්තා අම්මා."

ෆුජි කඳුළු වගුරවමින් අඬමින් සිටියා.

"ඇයි අම්මා මොකද මේ?"

"මට දුව එක්ක මෙහෙම ඉන්න වෙයි කියලා හිතුවේ නැහැ දුව. හරුන්, කාසෙන් මැරුණා. අනිත් දෙන්නා ගැනත් මොනවත් තොරතුරු දන්නේ නැහැ. තාත්තා හැදුවේ ඔයාව විකුණන්න. මම ඔයාව බේරා ගත්තා. මම හිතුවේ නෑ ඔයාව දැකගන්න ලැබෙයි කියලා. මේක හීනයක් නම් මාව අවදි කරන්න එපා."

"අම්මා........ අනේ දුක්වෙන්න එපා අම්මා. අම්මා ඔයාට ස්තුතියි අම්මා මාව එදා බේරාගත්තාට."

රූසෝ හතරදෙනාටම හෝටලයකින් කෑමට යෑමට රිසිවරයෙන් ඇනවුම් කළා.

"ඔෂින් තමයි අපේ ගමේ ම ඉන්න වාසනාවන්ත ම බිරිඳ"

කෑමට ගොස් වාඩි වී සිටින අතර ෆුජි කිව්වා.

"අම්මා මේ කෑම කාලා බලන්න. මේක තමයි ටෝකියෝවේ තියෙන හොඳම හෝටලය. අම්මා මේ තියෙන්නේ උණ ගොබ තම්බලා. කාලා බලන්න."

ඔෂින් ෆුජිට විවිධ කෑම වර්ග ළං කළා.

"ඔෂින් ඉස්සර අපි කාපු හැටි මතක් වුණා."

"ඔව් අපි කෑවේ රාබු බත්."

"මොනවද ඔෂින් රාබු බත් කියන්නේ."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ ඇසුවා.

"අපට වැඩිය හාල් නැති නිසා හාල් ටිකක් ලිපේ තියලා ඒකට රාබු පුංචිවට කපලා දමනවා. ඒ බත්වත් ළමයිට බඩ පිරෙන්න දෙන්න තිබුණේ නෑ අපිට."

අම්මා උත්තර දුන්නා.

"ඕක තමයි රූසෝ අද ගොවියන්ගේ සැබෑ තත්ත්වය. රසය ගැන දන්න නිසා දුක් විඳින්න පුළුවන් වුණා. "

"ඒක හොඳයි මැඩම්. රූසෝ මහත්තයා පොහොසත් නිසා, සැපට හැදුණ නිසා, එයාට දුක ගැන තේරෙනවා අඩුයි. නමුත් මැඩම් ඔබේ අත්දැකීම් නිසාම ඔබ ආවට පස්සේ රූසෝ මහත්තයා දියුණු වුණා."

මේ කතාබහ සියල්ලට ඇහුම්කන් දීගෙන සිටි ගෙන්ජි කිව්වා.

ඔෂින් මව ටෝකියෝවේ පන්සල් වලට, සත්තු වත්තට, නාට්‍ය බලන්න එක්කරගෙන ගියා. ෆුජි මේ ටෝකියෝ ආව පළමු අවස්ථාව. ඇයත් ආසාවෙන් හැම තැනම ඇවිද්දා. ඔෂින් මේ ගමන්වලින් ලොකු සතුටක් ලැබුවා. ඈත් ඒ වනතෙක් ටෝකියෝවේ විවිධ තැන්වල ඇවිද තිබුණේ නැහැ.

"අර නාට්‍ය අපි ළඟ ඉඳලා ම බැලුවා වගේ නේද ඔෂින්."

අම්මා කීවේ සතුටින්.

"අම්මා නිසා මටත් ඇවිදින්න යන්න අවස්ථාවක් ලැබුණා."

"මැඩම් අදත් කයිකොට උණ හැදිලා. යන්න ඕනෑ කියනවා."

"ආ..... එහෙමද? මම එතන වැඩ කරන්නම්."

"එපා මැඩම්. ඔයාට දැන් ඕවා කරන්න බැහැ."

"නැහැ ගෙන්ජි. අපිට ඕඩර් එක දෙන්න බැරිවෙයි වෙලාවට."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒකට කමක් නෑ මහත්තයා ඒ ගැන බලාගනියි."

"කයිකෝ ඔයාට හොඳටම උණ නේද? ඔයා යන්න ගිහින් බෙහෙත් අරගෙන විවේක ගන්න."

"ඒත් මැඩම් මේ ඕඩර්."

"ඒක මම බලාගන්නම්. ඔයා යන්න."

ඔෂින් අපහසුවෙන් මහන අයුරු ගෙන්ජි බලාගෙන හිටියා.

"මේ ලොකු මැඩම් අපේ මැඩම් අන්න මහනවා. එයාට වැඩ කරන්න එපා කියන්න."

ෆුජි කෑම සකස්කරමින් හිටියා.

"එයාට අමාරුනම් එයා වැඩ නතර කරයි. වද වෙන්න එපා ගෙන්ජි."

"ඒ වුණාට.."

"මේක අසනීපයක් නෙමෙයි."

ගෙන්ජි නැවතත් ඔෂින් දෙස බලමින් හිටියා. ඇය එකවරම බඩඅල්ලා ගත්තා.

"දැන්නම් විත්නඹු අම්මා ගෙන්නවමු."

"එපා ගෙන්ජි මට පොඩි කැක්කුමක් ආවා. දැන් ඒක හරි. කෝ බොන්න ඕනෑ හොඳ වතුර එකක් දැන්නම්."

ඒත් ටිකකින් ඇයට කොන්ද පැත්තෙන් දැඩි වේදනාවක් දැනුණා. ඔෂින් මැෂිමෙන් ඉවත්ව,

"අම්මා එන්න."

කෑගැහුවා.

සියලු දෙනා ඇයව වටකර ගත්තා.

"එපා ඔයාලා වැඩ කරන්න. මට අම්මා ඉන්නවානේ."

මෙවර නම් ඔෂින්ට දැඩි වේදනාවක් දැනුණා.

මව ඇය අල්ලා ගත්තත් කෙඳිරි ගාමින් ඔෂින් කාමරයට

Scanned with CamScanner

sinhalaebooks.com



ගියේ බඩගාමින්.

"අයියෝ අම්මා හරි වේදනාවයි."

මෙවිටම රූසෝ ආවා.

"යන්න සර් වින්නඹු අම්මා එක්ක එන්න."

සේවිකාවෝ කෑගැහුවා.

"ගෙන්ජි උණු වතුර ටිකක් ගෙනෙන්න."

"පිරිමින්ට මෙහෙ තහනම්."

අම්මා උණුවතුර එක අතට ගනිමින් ගෙන්ජිට කිව්වා.

කෙසේ හෝ වින්නඹුව එන්න කලින් ඔෂින්ට බබා ලැබුණා.

"ඔහෑ.... ඔහෑ......"

කාමරය තුළින් ආ දරුවාගේ හඬ ඇසී රූසෝ හා ගෙන්ජි අත් අල්ලාගෙන නැටුවා.

"ගේන්න තව උණු වතුර"

දෙන්නාම කලබලයෙන් වතුර උණු කළා.

දරුවාගේ හඬ ඇසුණා.

"ඔයත් ඔහොම කෑගැහුවා රූසෝ මහත්තයා."

"ඇත්ත ද ගෙන්ජි මේ වගේමද?"

" රූසෝ මහත්තයා ඔබ හරි වාසනාවන්තයි. ඔන්න ඉන්නවා ලස්සණ කොලු පැටියෙක්."

නැවතත් ගෙන්ජිත් රූසෝත් අත් අල්ලාගෙන උඩ පැන්නා.

"මට බලන්න ආසයි."

"එන්න ඇතුළට."

ෆුජි කතා කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝත්, ගෙන්ජිත් කාමරය ඇතුළට ගියා. ඔෂින් නෙත් පියාගෙන හිටියා.

ඇය ළඟ හිටියේ රූසෝගේත් ඔෂින්ගෙත් පළමු දරුවයි. ෆුජි ඔෂින්ගේ ඉහඉද්දර වාඩි වී සිටියා.

"ඔයා හරි වාසනාවන්තයි දුව. කරදරයක් නොවී දරුවා ලැබුණා."

"අම්මා ඒ අම්මාගේ ආරෙට. මගෙ අම්මට කවදාවත් වින්නඹු අම්මලාගේ උදව් ඕනෑ වුණේ නැතිලු. මට මතකයි නංගියි මල්ලියි හම්බවෙනවා. අම්මා අන්තිම මොහොත වනතෙක් කුඹුරේ වැඩ කළා. ඒ නිසා මගෙ දෙවෙනි දරුවත් හම්බවෙනකල් මමත් වැඩ කරනවා."

"ඔව් ඔෂින් අපි හුඟක් දරුවෝ හදමු. ඒ ගොල්ලන්ගේ අනාගතය සරු කරන්න අපේ ව්‍යාපාරය දියුණු කරමු."

රූසෝ ගේ දරුවා වෙනුවෙන් රූසෝට ව්‍යාපාරිකයින්ගෙන් බොහෝ තෑගි ලැබුණා. දින කීපයක් ගත වී ගියා. ඔෂින් කාමරයෙන් එළියට ආවා.

"ඔෂින් කොහෙද ඇවිදින්නේ. ඔයාට ඇවිදින්න හොඳ නෑ."

"දැන් දවස් ගානක් ගියා. මගෙ අම්මා දවස් තුනෙන් ආයිම කුඹුරට ගියා."

"ඒ දුවේ මට නිවාඩු නැති නිසානේ. ඔයා විවේකයෙන් ඉන්න."

"නෑ අම්මා මටත් එහෙම විවේකයක් අවශ්‍ය නැහැ."

"ඔෂින් බලන්න මේ නම දිහා හොඳයි නේද?"

රූසෝ බිත්තියේ එල්ලා තිබූ කොළයක් පෙන්නුවා.

"ටකේෂි?"

"ඔව් අපේ පුතාගේ නම ටකේෂි."

"මම නම් ඒ නමට කැමති නැහැ රූසෝ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ටකේෂි කියන්නේ ශක්තිය කියන එකයි."

"ඒ වුණාට ඒ නම හරියට යුද හමුදා සෙබළෙකුගේ නමක් වගෙයි. ඒ නම එපා."

"ඔෂින්, තමන්ගේ පළමු දරුවට නම තියන්න ඕනෑ තාත්තා. ඉතින් රූසෝ තේරුව නම හොඳයි. ඒකට විරුද්ධ වෙන්න එපා." අම්මා කිව්වා.

රූසෝ එළියට ගියා. 'අමුත්තෙක් ඇවිල්ලා' ගෙන්ජි කිව්ව නිසා.

"අම්මා මතකද මම සන්සකු මාමා ගැන කිව්වා. එයා මගෙ නමට හුඟක් තේරුම් කියලා දුන්නා. මට තාම මතකයි ඒවා. මට හොඳ නමක් තිබ්බේ මගෙ අම්මනෙ නේද?"

"ඔෂින් මෙන්න ඔයාට අමුත්තෙක්."

"අනේ කේන් නේද? එන්න වාඩි වෙන්න. ඔයාව දැක්කේ හුඟක් කාලෙකින්. අපට බැරිවුණා ඔයාව බලන්න එන්නවත්."

"නෑ ඔෂින් මම පහුගිය දවස්වල දුරගමනක් ගිහින් හිටියේ. ආපසු ටෝකියෝ ආව ගමන් ඔයාව බලන්න ආවා. ඔයාලා දියුණු වෙලා."

"ඔව් කේන්. අමාරුවෙන් දියුණු වුණා."

"මෙන්න මැඩම් ගේ යාළුවෝ බබා බලන්න ඇවිල්ලා."

සුමිකෝ සහ යෙහෙළියොත් හසකාවා මැඩම් සමඟම ඇවිත් තිබුණා.

"අපේ යාළුවෝ සේරම ඉන්න නිසා අපි පොඩි උත්සවයක් සූදානම් කරමු."

"මම කෑම හදන්නම්."

"එපා අම්මා මම හෝටලයකින් ඕඩර් කරන්නම්. ගෙන්ජි සකේ ගේන්නකෝ."

"හොඳයි."

ඉක්මනින් පුංචි උත්සවයක් සූදානම් වුණා. අමුත්තොත්

Scanned with CamScanner

sinhalaebooks.com



උදව් කළා. ඒ කෑම මේසයේදී හැමෝම කතා කළේ ඔෂින්ගේ උත්සාහවන්තකම ගැනයි. රූසෝත් මේ කතා වලට සම්බන්ධ වුණා.

"ඒ කාලයේ අපට කන්න තිබුණෙත් නැහැ. මම කල්පනා කළේ ම ඔෂින්ට කෑම ගෙනැත් දෙන්නේ කොහොමද කියලා."

"ඔෂිනුත් හොඳට ඉවසුවා. ඒකෙන් එයාගේ පවුල් ජීවිතය ආරක්ෂා වුණා."

"මතකද දවසක් සුමිකෝ ඔයා මට බැන්නා. අර ගේෂා කෙල්ලට උපන්දින කේක් එකක් අරගෙන දුන්නට."

රූසෝ සුමිකෝට කිව්වා.

"දැන්නම් මම ඒවා ගැන ලැජ්ජා වෙනවා. ඔෂින්ට හිත් වේදනා දුන්නට."

"දැන් නේ මම දන්නේ ඔයාලාගේ අතීතය ගැන. දැන්නම් මම තවත් පැහැදුණා ඔය දෙන්නා ගැන."

කේන් කිව්වා.

"එහෙම නම් අපි සින්දු කියමු"

රූසෝ ගේ මිහිරි ගායනයට සියල්ලෝ ම අත්පොළසන් දුන්නා. සකේ බී මත් වූ රූසෝ එළියේ එහෙම ම නින්දට වැටුණා. ෆුජි කෑම මේසය අස්කළා. දරුවා නළවා නිදි කළ ඔෂින් කාමරයෙන් එළියට ආවා.

"සමාවෙන්න අම්මා, අම්මාට කරදර කරනවාට."

"ඔෂින් මම දැනගෙන හිටියේ නැහැනේ ඔයාලට කරදර තිබුණ බව. ඊයේ සාදයේ දී කතා අහලා තමයි මම දැනගත්තේ."

"ඔව් අම්මා දුක නිසාම අපි ගොඩ ආවා. දුක කියන්නේ ජීවිතයට අභියෝගයක්."

"ඔෂින් මම ආපිට යන්න ඕනෑ."

"අම්මා මෙහෙ ඉන්න අපි එක්ක. අපිට වදයක් කියලා

Scanned with CamScanner

sinhalaebooks.com



හිතන්න එපා අම්මා."

"ඒත් දුව මගෙ ගෙදර යමගාටා වල. ඒ ඔයාලාගේ මහ ගෙදර. ඒක රැකගන්න නම් මම ගෙදර යන්න ඕනෑ. නැත්නම් සෝජි හිතයි මම මෙහෙම නතර වුණා කියලා. ඒ ගෙදර කඩල දමයි."

"ඒත් සෝජියි එයාගේ හාමිනෙයි අම්මට වෙනස්කම් කරනවානේ අම්මා."

"ඒ වුණාට කමක් නෑ දුව. ඒ ගෙදර ඔයාලට යන්න එන්න තියෙන්න ඕනෑ. ඒක තාත්තා හැදුව ගෙදර. හරුන්ගේ ආච්චම්මගේ මතක සටහන් තියෙන්නේ ඒ ගෙදර. ඒ නිසා මම යන්න ඕනෑ."

"ඔයා ටකේෂි ලොකු වුණාම එහෙ එක්ක එන්න. හිම පෙන්වන්න. ගංගා, කඳු එහෙම බලන්න."

ෆුජි ආපිට යන දවස ළං වුණා. රූසෝත් වරින් වර ෆුජිට ඔවුන් සමඟ සිටින ලෙස කීවත් ඇය කීවේ මහ ගෙදර රැකගත යුතු බවයි.

"අම්මා මේ ලේන්සුවේ ගැට ගහලා තියෙන්නේ අම්මාගේ දවල් කෑම. විස්කෝතුත් තියෙනවා. දුම්රියේදී ඒවා කන්න. මේ තියෙන්නේ සෝජිලාටයි, අහල පහල අයටයි තෑගි. අම්මා ඒවා දෙන්න."

රූසෝ රික්ෂෝවක් ගෙන ආවා.

"මම ටෝකියෝව බැලුවා, නාට්‍ය බැලුවා, විවිධ කෑම ජාති කෑවා. ඉතිං රූසෝ ඔයාටත් ඔෂින්ටත් ස්තුතියි. ගෙන්ජි ඔබටත් ස්තුතියි."

"හොඳයි මැඩම් ගිහින් එන්න."

"සනීපයෙන් හිටියොත් දෙවෙනි දරුවා හම්බවෙනකොටත් මම එනවා දුව ඔයාට උදව් කරන්න."

ඔෂින්ගේ දෑසින් කඳුළු කඩා හැලුණා. ඇය සාලුවක් ගෙනවිත් මවගේ දෙවුරහිස වැසුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"දරුවා හොඳට බලාගන්න. දෙන්නා හොඳින් ඉන්න."

ෆුජි රික්ෂෝවේ නැග යන ආකාරය සියලු දෙනා බලා සිටියා.

"අම්මා ප්‍රවේශමෙන්."

මව නැති පාළුව ඔෂින්ට හොඳට ම දැනුණා. ටකේෂි තුරුලු කරගෙන ඇය මවගේ දයාව, කරුණාව ගැන හිතුවා.

"මැඩම්, මැඩම් ඉක්මනට එළියට එන්න."

ගෙන්ජිගේ හඬ අසා ඔෂින් සාලයට ගියා. එහි මෙට්ටය මත වාඩි වී සිටියේ රූසෝ ගේ පියා. ඔෂින් ඉක්මනින් දණගසා හිස නමා ආචාර කළා.

"තාත්තා ආව එක අපට ලොකු සතුටක්."

"ලොකු මහත්තයා ඇයි ලියුමක් එව්වේ නැත්තේ එනවා කියලා. ස්ටේෂමට යන්න තිබුණානේ."

ගෙන්ජි කිව්වා.

"මට ඕනෑ වුණා මගෙ මුණුබුරාව ඉක්මනට බලාගන්න."

"එන්න තාත්තා."

ඔෂින් පෙරමුණ ගෙන ටකේෂි සිටි කාමරයට ගියා.

"මෙන්න මගෙ මුණුබුරා. ඔයා හරි ලස්සණ දරුවෙක්. මොකක්ද නම කීවේ, හරි මතකයි ටකේෂි නේද? ගෙන්ජි මට ලියල යවලා තිබුණා."

"තාත්තා"

කාමරයට පැමිණි රූසෝ පුදුමයෙන් බලාගෙන හිටියා.

"රූසෝ ඔයා පුංචි කාලෙත් මේ වගේමයි."

"ඇයි තාත්තා හදිසියේම."

"මම ආවේ සතුටුවෙන්න රූසෝ සමඟ මගෙ මුණුබුරා වෙනුවෙන්."

"මට හරිම සතුටුයි තාත්තා. අම්මා සනීපයෙන්

Scanned with CamScanner

sinhalaebooks.com



ඉන්නවාද?"

"අසනීපයක් නෑ. ඔෂින් මේක සීයාගෙන් මුණුබුරාට තෑග්ගක්."

ලියුම් කවරයක් ඔෂින් අතට දුන්නා.

"ස්තුතියි තාත්තා."

ඔෂින් හිස නැමුවා.

"රූසෝ මේවා අම්මට කියන්න අවශ්‍ය නැහැ."

"ඇයි තාත්තා අම්මා තවම අපි එක්ක අමනාපයෙන්. ඔෂින් ගිය මාසෙත් ගෙදර සේරටම තෑගි යැව්වා. අම්මා හරි අසාධාරණයි."

"රූසෝ මොනවද ඔය කියවන්නේ. තාත්තා ආවේ අපේ ටකේෂි බලන්න."

"ඒ වුණාට තාත්තා......."

"රූසෝ ඔය කතා එපා. තාත්තාට මහන්සි ඇති වතුර ටිකක් උණු කරන්නම් තාත්තා."

"මැඩම් ඉන්න මම ඒක කරන්නම්."

"මම කැමතියි ඔයාලාගේ වැඩපල බලන්න."

රූසෝ පියා කැටුව ගොස් වැඩපල පෙන්නුවා.

"තාත්තා ළඟදීම ජපන් ගෑනු අය කිමෝනා ඇඳීම අතාරිනවා. එතකොට වෙස්ටන් ඇඳුම් වලට තමයි තැන ලැබෙන්නේ."

"ඉතිං මොනවද රූසෝ ප්ලෑන් කළේ."

"තාත්තා මම ඉඩමක් අරගෙන පැක්ටරියක් හදලා මැෂින් තිහක් දමන්න තමයි හිතාගෙන ඉන්නේ. "

"බොහොම හොඳයි."

"ඒත් සල්ලි ටිකක් මදි."

"හොඳයි මම ඔයාට සල්ලි දෙන්නම්. ඒක ණයක් විදිහට දෙන්නම්කෝ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔය ඇත්තම ද තාත්තා. ස්තුතියි."

රූසෝ හිස නමා ආචාර කළා.

රාත්‍රියේ නින්දට ගියවිට රූසෝ ඒ බව ඔෂින්ට කිව්වා.

"ඔෂින් තාත්තා කිව්වා පැක්ටරිය හදන්න සල්ලි දෙන්නම් කියලා."

ඔෂින් රූසෝ දෙස බලා සිටියා.

"ඇත්තට ම ඔයා දියුණු කරන්නද යන්නේ වැඩපල."

"ඔව් මම මැෂින් තිහක් දාන්න පැක්ටරියක් හදලා එතනම අපිට ඉන්න ගෙයක් හදනවා."

"ඒත් රූසෝ දැන් ජපානයේ ආර්ථිකය බැහැලා."

"ඒවා හිත හිත ඉඳලා බැහැ. මට ණය දෙන්නත් අය ඉන්නවා. ටනකුරා නිෂ්පාදන උසස්. ඒ වගේම මම මගේ අම්මට පෙන්වන්න ඕනෑ අපේ දියුණුව. එතකොට ඔය නරක ගති ඇරිලා යයි තේරුණා ද?"

"රූසෝ ඕවා සිහින......."

"නෑ මම කරලා ඔප්පු කරනවා. අපි දියුණු වෙලා පුතා අරගෙන ගෙදර යමු."

ඔෂින් කල්පනා කළා. රූසෝට අවශ්‍ය ඔවුන්ගේ දියුණුව මවට පෙන්වීමටයි. ඒත් ණය ගැනීම ගැන ඇය බියවුණා. තාත්තා මුදල් දුන් විට ඉතිරි මුදල් ණය ලෙස ගන්නා බවයි රූසෝ කීවේ. තාත්තා හමු වූ ඔෂින් ඔහුට පැහැදිලි කළා පවතින තත්වය ගැන.

"තාත්තා ඔය මුදල් දෙන්න එපා."

"මම දන්නව ඔෂින් බොහෝම දුරදිග හිතන බව. ඒත් දැන් රූසෝ ඒක තීරණය කරලා ඉවරයි. ඒ නිසා අපි එයාට අවස්ථාවක් දීලා බලමු. තේරුණාද ඔෂින්."

"එහෙමයි."

ඔෂින් හිස පහත් කර ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔයාලා දියුණු වෙලා සාගා එන්න. අම්මා එතකොට ඔයාලාගේ උත්සාහය අගය කරයි."

තාත්තා ආපිට ගොස් රූසෝට මුදල් එව්වා. ඔහු ඉක්මනින් ඉඩමක් මිලදී ගත්තා.

"ඔෂින් හම්බවුණා ඉඩමක්. ඉඩම අයිතිකාරයා බංකොලොත් වෙලා හිටියේ. අඩුගාණකට ගත්තා."

"ඉඩම ගන්න මුදල්?"

"ඇයි තාත්තා මට සල්ලි එව්වා. ඒක ණයක් විදිහට මම ආපිට ගෙවනවා. ෆැක්ටරිය හදන්න ණය දෙන්න කෙනෙක් ඉන්නවා."

"රූසෝ අපිට ඔය ණය ආපිට ගෙවන්න පුළුවන්ද?"

"පුළුවන් ඔෂින් මම මැෂින් තිහ දම්මලා ඇඳුම් මස්සනවා. ඒවා උසස්ම තත්වයේ ටනකුරා නිෂ්පාදන. අලෙවි වෙයි උණු කැවුම් වගේ."

ඔෂින් කිසිවක් කීවේ නැහැ. ඇය තුළ ණය ගැනීම ගැන තිබුණේ බියක්. ඒත් රූසෝට කිසිවක් කීවේ නැහැ.

"අපි එයාට අවස්ථාවක් දීලා බලමු." රූසෝ ගේ පියාගේ වචන ඇයට සිහිවුණා.

එහෙම බලමු. ඇයත් සිතා ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com

# නවය

රූසෝ ෆැක්ටරියේ වැඩ පටන්ගෙන තිබුණා. ඔහු ගත කළේ අවිවේකී ජීවිතයක්. ඔහු සවස නිවසට පැමිණෙන විට නිවස දෙස බලමින් සිටි තරුණියක් ඔහු දැක්කා. ඔහු සෙමෙන් ඇය වෙත ළං වුණා.

"කායෝ...... මේ ඔයා නේද?"

කායෝ තිගැස්සී ආපිට හැරුණා.

"රූසෝ..... එහෙම නම් මම හරියට තැනම හොයාගෙන ඇවිත්."

"ඔෂින්, ඔෂින් එන්න එළියට. මෙන්න ඔයාට අමුත්තෙක් ඇවිත්."

ඔෂින් එළියට දුවගෙන ආවා. ඇය විමතියෙන් මොහොතක් නතර වුණා.

"මිස් කායෝ ඔයා...."

ඔෂින් කායෝ වැලඳ ගත්තා.

"කොයිතරම් කාලෙකට පස්සෙද? එන්න මිස් කායෝ යමු ඇතුළට."

"මම ආවේ ඔයාගේ දරුවා බලන්න. මට ඔයාගේ මංගල උත්සවයට එන්නත් බැරිවුණානේ. ආච්චම්මා කිව්වා ඔයාලව බලාගෙන එන්න කියලා."

Scanned with CamScanner

sinhalaebooks.com



"යගිරෝ මැඩම් සනීපෙන් ඉන්නවද මිස් කායෝ."

"ඔව් නිතරම ඔයාව මතක් කරනවා."

රූසෝ ටකේෂිව වඩාගෙන ආවා.

"මෙන්න අපේ පැටියා. මෙයා තමයි අපිට වාසනාව ගෙනාවේ."

කායෝ ටකේෂිගේ පුංචි කම්මුල් අතගෑවා.

"කායෝ ඔයාට දරුවෝ නැද්ද?"

රූසෝ ගේ ප්‍රශ්නයට කායෝ බිම බලා ගත්තා.

"ඉතින් මිස් කායෝ මීනු මැඩම් සනීපයෙන් ද?"

ඔෂින් ඉක්මනින් ප්‍රශ්නයක් ඇසුවා.

"ඔෂින් ඔයා මට පුංචි කාලෙදි වගේ මිස් කායෝ කියන්න එපා. යාළුවෙකුට වගේ කායෝ කියන්නකෝ. මම කැමතියි එහෙම කියනවට."

"මැඩම් අර කයිකොට සනිප නැහැලු. ගෙදර යන්න ඕනැලු."

"මිස් කායෝ ඔයා එහෙම නම් තේ බොන්න. මම ඉක්මනට එන්නම්."

"එපා ඔෂින් යන්න ඕනෑ නෑ. ඔයා කායොත් එක්ක ඉන්න."

"ඒත් ඕඩර් එක පරක්කුවෙයි රූසෝ."

"ඔය කයිකො හරියට වද දෙනවා. මම එයාව අස්කරලා දමනවා."

"එපා එයා අසනීප වුණේ අපේ වැඩ කරලා."

"පිස්සු කතා කියන්න එපා ඔෂින්. ඕවා අපේ ප්‍රශ්න නෙමෙයි."

"එහෙම කතා කරන්න එපා. අපිට යුතුකමක් තියෙනවා අපේ සේවකයන්ගේ ලෙඩ දුක් ගැන සොයලා බලන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒ මොකට ද? එයා අස්කළොත් ඒ වෙනුවට එන්න පෝලිමේ ඉන්නේ."

"රූසෝ මට ඔය වගේ කියනකොට මතක් වෙන්නේ මගෙ සහෝදරී හරුන්ව. එයා රෑ දවල් වැඩ කරලා සේද කම්හලේ නැගිලා අසනීප වුණා. එයා රෝහලකට ගෙනිච්චෙ නෑ. කම්හලෙන් එළියට දැම්මා. අන්තිමට දුක් විඳලා මැරිලා ගියා. වයස දහනවය වෙනකොට ජීවිතයත් ඉවර වුණා. "

රූසෝ කල්පනා කළා.

"මම පිළිගන්නවා ඔෂින්."

"අනේ කායෝ සමාවෙන්න ඔයා ඉස්සරහා රණ්ඩු වුණාට."

"නෑ මට ඉරිසියයි ඔයාලා ගැන. ඔයාලා සාකච්ඡා කරලා ප්‍රශ්න විසඳාගන්නවා. මට මතක් වුණේ කෝටා එයත් නිතරම කියනවා සේවකයන් රැකගැනීම හාම්පුතුන්ගේ යුතුකම කියලා."

"කායෝට කෝටා මතක් වෙලා වගේ."

රූසෝ විහිළු කළා.

"නෑ මම........"

"කායෝ මම වැඩකරලා එන්නම්."

"හොඳයි ඔෂින් මම ඔයාට උදව් කරන්නම්කෝ."

"ඊට ඉස්සර මේ කාමරයට ගිහින් ඇඳුම් මාරු කරගන්න."

ඔෂින් කල්පනා කළේ කායෝගේ ගමන ගැනයි. කායෝ මේ තමාගේ දරුවා බලන්න ආව ගමනක් නොවන බව ඔෂින්ට තේරුණා. ඒත් හැකි අයුරින් කායෝට සංග්‍රහ කළ යුතු බව ඇය හිතුවා.

ඔෂින් කායෝ වෙනුවෙන් ඇය කැමති කෑම සකස් කළා.

"ඔෂින් මා ගැන වද වෙන්න එපා. ඔයා හරි කරුණාවන්තයි. ඇත්තටම ඔයා ටෝකියෝ ආව නිසා ඔයාගේ අනාගතය සරු වුණා. මට නම් පාර වැරදුණා ඔෂින්. මම හැමදේම අතහැරලා

Scanned with CamScanner

sinhalaebooks.com



සකායා ගියේ. මම හිතුව විදිහට විවාහය මට සැනසුමක් ගෙනාවේ නැහැ. මට ඇතිවෙලා. මම ආපිට යන්නේ නෑ. ඔෂින් මම මෙහෙ රස්සාවක් හොයා ගන්නවා. ඔෂින් ඔයාට විතරයි මාව තේරුම් ගන්න පුළුවන්. විශ්වාසය තියන්න පුළුවන් ඔයා ගැන විතරයි."

ඔෂින්ට ටකේෂි අඬන හඬ ඇසී ඇය ඔහු වඩාගෙන ආවා.

"කායෝ ඔයාටත් බබෙක් හිටියොත් ඔයාටත් සතුටින් ඉන්න පුළුවනි."

"එපා මට ඒ මිනිහාගෙන් ළමයි. අර ගේෂා කෙල්ලට ළමයෙක් ඉපදුණා. ඒ වෙලාවේ මම අම්මලට කිව්වා මට වෙන් වෙන්න ඕනෑ කියලා. නමුත් හැමෝම කිවේ ඒ මගේ වරද කියලා. ඔෂින් එයාගේ උපාධියට ඒ හැමෝම සලකනවා. ඔන්න ඕවා නිසයි මම කෝටා ගැන හොයලා බැලුවේ. ඔෂින් මම කෝටා ඉන්න තැන සොයා ගත්තා."

"කොහේ ද? හිරේ ද?"

ඔෂින් කලබලයෙන් ඇසුවා.

"නෑ, එයා ඉන්නේ ගොවි සමුපකාර මධ්‍යස්ථානයේ. කෙනෙක් කිව්වා එයා දේශනයකට ටෝකියෝ එනවා කියලා. ඒකයි මම ඔයාගේ දරුවා බලන්න එනවා කියලා ගෙදරින් අවසර අරගෙන ආවේ."

කායෝ ඔෂින් ගේ අතින් අල්ලා ගත්තා.

"අනේ ඔෂින් මම කරදරයක් කියලා හිතන්න එපා. මම දුරකථන අංකයක් හොයා ගත්තා. මම හෙට උදේම කෝටාට කතා කරනවා. ඊට පස්සේ එයා මුණ ගැහෙන්න යනවා. සමහර විට ඊට පස්සේ මුළු ජීවිත කාලයම එයා එක්ක ඉන්නවා."

ඔෂින් කිසිවක් නොකියා බලා සිටියා.

පසුදින උදේම ඇය දුරකථනයෙන් කෝටා ඇමතුවා.

"කෝටා ගෙදර නැද්ද එහෙම නම්. එයා ආව ගමන් මේ ටනකුරා සාප්පුවට කතා කරන්න කියන්න. අද දවස තුළ කොහොම හරි කතා කරන්න කියන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"කාටද ඔෂින් කායෝ උදේම ටෙලිෆෝන් කරන්නේ."

ඔෂින් නිහඬව සිට කතා කළා.

"එයා මිස්ට කෝටා ව මුණ ගැහෙන්න කියනවා."

එවිටම කායෝ ඔවුන් අතරට පැමිණියා.

"කායෝ මිස්ට කෝටා හම්බවෙන්න යන්න හදන්නේ. ඒවා සිරිත් වලට හොඳ නෑ."

"ඔය සිරිත් විරිත් මට වැඩක් නෑ රූසෝ. මට කෝටා මුණගැහෙන්න ඕනෑ. එයාට මගේ හිතේ තියෙන දුක කියන්න ඕනෑ. එයාට නොකියා මම විවාහ වුණේ. එයා තරහින් ඇති. අනේ රූසෝ, අනේ ඔෂින් ඔය දෙන්නා මගෙ හැඟීම් තේරුම් ගන්න බලන්න."

කායෝ ටනකුරා සාප්පුවට එන සෑම දුරකථන පණිවිඩයකදීම ඒ කෝටා යයි සිතා බලන්න ගියා.

රූසෝ ඔෂින්ට කතා කළා.

"ඔෂින්, ඔයත් කායෝ එක්ක යන්න. එයා තනියම යන එක හොඳ නෑ."

"මමයි රූසෝ එයාට බොරු කළේ. දවසක් කෝටා එයාව හොයාගෙන කාමරයට ආවා. මම ඒ බව කායෝට කීවේ නැහැ. ඒ ගැන මගේ හිතට වද දෙනවා. ඉතින්, මම කොහොමද එයාගේ ගමන නවත්තන්නේ."

සවස ඔෂින් දරුවාගේ ඇඳුම් සෝදා වැලට දමමින් හිටියා. ලස්සණ ඇඳුමකින් සැරසුන කායෝ ඔෂින් සොයා ආවා.

"ඔෂින්, මට කෝටා කතා කළා. එයත් එක්ක කෑමකට එන්න කිව්වා."

ඔෂින් කිසිවක් නොකියා බලාගෙන හිටියා. කායෝ ගේ මුහුණ සතුටින් පිරිලා. ඒත් ඔෂින් ගේ හිතට දැනුණේ බරක්. ඇයි මේ ඇය හිතුවා. කෝටා ඔෂින් ගේ පළමු පෙම්වතා වීමද? තවමත් ඇය ඔහුට ආදරය කරනවා ද? නැහැ නැහැ මම දැන් හිතන්නේ මගෙ රූසෝ ගැන, මගෙ ටකේෂි ගැන. ඔෂින්

Scanned with CamScanner

sinhalaebooks.com



ටකේෂිගේ කුඩා ඇඳුමක් කම්මුලට තබා සිප ගත්තා.

කායෝ අවන්හලේ මේසය ළඟ පුටුවක වාඩි වී නොඉවසිල්ලෙන් බලා හිටියා. කොයි මොහොතේ කෝටා දැකගන්න දැයි ඇයගේ දෑස් දස අත දිව්වා. ටික වේලාවකින් කෝටා ආවා. කායෝ ඔහු ඉදිරියට ගියේ නොඉවසිල්ලෙන්.

"ඔයා තාම ලස්සණයි."

"කෝටා ඔයත් එතරම් ම වෙනස් වෙලා නැහැ. කෝටා වැදගත් වෙන්නේ රූපෙ නෙමෙයි. හදවත නොවෙනස්ව තිබීමයි."

"ඔව් කායෝ, මම ඔයාට හරියට වද දුන්නා. මම ඔයාව මුණ ගැහුණේ ඔයාගෙන් සමාව ගන්නයි."

"මගෙ වරද මට ඔයා එනතෙක් ඉන්නයි තිබුණේ."

"නෑ ඔයා ගත්ත තීරණය හරි. මගේ එක්ක තව දුරටත් හිටියා නම් ඔයා දුකට පත් වෙනවා."

"ඒත් මගේ විවාහය බියකරු හීනයක්. ටෝකියෝ ඉන්නකොට ඔයා එනතෙක් බලා හිටි කාලය හරිම මිහිරියි. මම ආපිට යන්නේ නෑ කෝටා. මම ඔයා එක්ක ඉන්නවා."

"තේරුම් ගන්න කායෝ මම මේ ආවේ ඔයාගෙන් සමාව ගන්න. ඔයාට මතකනේ පහුගිය කාලය. හිතන්න එපා නැවත ඒ ගැන. ඒ කාලේ අපි තරුණයි. ඒක බොහොම සියුම් මතකයක්. දැන් ජපන් ආර්ථිකය ධනවාදයට බරයි. මේ සියල්ල සමනය විය යුතුයි. ඒ වෙනතරු මේ සියල්ල අමතක කරනවා. කියන්න කායෝ ඔෂින් ගැන තොරතුරු."

කායෝ ඔෂින් ගැන තොරතුරු කිව්වා ඉතාම කෙටියෙන්.

ඇයට අවශ්‍ය වුණේ කෝටාගේ අත අල්ලා ගෙන ඇගේ දුක කීමටයි. ඒත් කෝටාගෙන් එවැනි සමීප වීමකට ඉඩක් ලැබුණේ නැහැ. තේ කෝප්පයක් බිව්ව ගමන් ම කෝටා නැගිට්ටා.

"තව ටිකක් ඉන්න කෝටා"

"බැහැ කායෝ මගෙ වැඩ පාඩු වෙනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



කායෝ ඔහු සමඟ ගමනට එක් වුණත් ඔහු ඉක්මන් ගමනින් සෙනඟ අතර නොපෙනී ගියා. කායෝ හැඬුම නවත්වා ගත්තේ අපහසුවෙන්. ඇය ඉක්මනින් ඔෂින් ගෙ ගෙදර ගියා.

"කායෝ කොහොමද කෝටා මුණ ගැහුණ ද?"

ඇය කිසිවක් නෙකියා කාමරයට ගොස් දොර වසා ගත්තා. ටික වේලාවකින් ඔෂින් සෙමෙන් දොර ඇරියා. කායෝ පොරෝනයකින් හිස සිට වසාගෙන නිදාගෙන හිටියා. මේ වෙලාවේ ටකේෂි අඬන්න පටන් ගත්තා. ඒක කායෝ ගේ නින්දට බාධාවක් වෙයි කියලා ඔෂින් දරුවා පිටේ රඳවාගෙන පාර පැත්තට ගියා. ටික වේලාවක් එහෙ මෙහ ඇවිද්දා. ටික වේලාවකින් ඇය ඉදිරියේ සිට ගත්තේ කෝටා.

"කෝටා ඔයා?"

ඔෂින් පුදුමයෙන් කිව්වා.

"දැන් කායෝ ගෙදර ආවේ. ඔයා ගෙදර එනවද?"

"නෑ, මම ආවේ කායෝ මුණ ගැහෙන්න නෙමෙයි ඔෂින්, ඔයයි ඔයාගේ පුතයි බලා ගන්න."

කෝටා ආදරෙන් ටකේෂිගේ මුහුණ අතගෑවා.

"ඔයා සතුටින් ඉන්න නිසා මට ඒක ලොකු සතුටක් ඔෂින්. එදා කායෝ ගේ කාමරයේ දී අපි මුණගැහුණ වෙලාවේ මම හුඟක් කල්පනා කළා. මම ඔයාව පාවා නොගත්තේ ඔයා සතුටින් තියන්න බැරි නිසා. දැන් ඔයා සතුටින්. මම එදා ඒ පරිත්‍යාගය කළේ ඔයාගෙ මේ සතුට වෙනුවෙන්. ආයිමත් මම ඔයා බලන්න එන්නම්. සතුටින් ඉන්න."

කෝටා ඔෂින් දෙස බලා හිටියා. ඒ මුහුණේ මඳ සිනාව, ඒ බැල්ම ඔෂින්ව අතීතයට ගෙන ගියා. කෝටා යන දෙස ඔෂින් බලා සිටියා. කෝටා සමඟ කිසිවක් කතා කිරීමට නොහැකි ලෙස ඔෂින් ගොළු වුණා. එදා දවසෙම කායෝ කිසිවක් කෑවේ නැහැ. කාමරයෙන් එළියට ආවෙත් නැහැ.

"එළියට ආවේ නැද්ද තාම. අසනීපයක් නම් අපි දොස්තර ගෙන්වමු."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ කිව්වා.

"මම කායෝ අඳුනනවා. මේ එයාගේ හැටි."

"ඔෂින් මම අද දවසම ගෙදර ඉන්නවා. උවමනාවක් වුණොත් කතා කරන්න."

"අද ගෙදර ඉන්නවා නම් ඔයාගේ ඔය රැවුල කපාගන්න රූසෝ."

ඔෂින් කීවේ හිනැහෙමින්.

"නෑ නෑ මම ඒක කපන්නේ ෆැක්ටරියේ වැඩ පටන්ගත්ත දවසට තේරුණා ද? ඇයි රැවුල නිසා මම කැත ද?"

"නෑ රූසෝ. රැවුල තිබුණත් ඔයා මට ලස්සණයි."

පසුවදා උදේම කායෝ සාලයට ආවා.

"සමාවෙන්න, මම ඔයාලට කරදර කළා."

"වදවෙන්න එපා. ඒත් ඔයා බඩගින්නේ ඉන්න එක නම් අපට දුකක්. "

"ඔව් ඔෂින්, දැන්නම් මට හරිම බඩගිනියි."

"ඉන්න කායෝ ඔයාගේ සුප් එක නිවිල ඇති. මම ඉක්මනට රත් කරන්නම්."

"ඔෂින්, මම ඊයේ රෑම කල්පනා කළා. මම මහ මෝඩ ගෑනියෙක්. කෝටාට මාව ඕනෑ නෑ. එයාට අවශ්‍ය වෙලා තිබුණේ ඔයා ගැන තොරතුරු දැනගන්න. තවමත් ඔයා එයාගෙ ආදරවන්ත ඔෂින්මයි."

"අනේ කායෝ දැන් ඕවා කියන්න එපා."

"ඒත් මම නිසා පාඩු වුණේ ඔයාට. මට දැන් සත්‍ය තේරෙනවා. මම වද දුන්නා මගේ දෙමාපියන්ට. මගෙ සැමියට. මම මීට පස්සේ හොඳ දුවෙක් වෙනවා. හොඳ බිරිඳක් වෙනවා. මට දරුවෙක් ඕනෑ. දරුවෙක් නැති වුණොත් අර ශේෂා කෙල්ලගේ දරුවටයි කගායා ව අයිති වෙන්නේ. බැහැ එහෙම වෙන්න. කගායා ව මගේ. ඒක කාටවත් අයිති වෙන්න දෙන්නෙ නෑ නෑමයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි ඔයා එහෙම හිතන එක. ඔයාගේ ප්‍රාර්ථනාව ඉටුවෙන්න කියලා මම සුබ පතනවා. කෝටා එක්ක හිටි කාලය හීනයක් කියලා හිතා ගන්න."

"දැන් මගේ හීනය ඉවරයි ඔෂින්. දැන් මගේ හීනය කගායා. මට බඩගිනියි. තව සුප් ගේන්න ඔෂින්."

"ගේනවා, මේ ගේනවා."

ඔෂින් හිනැහෙමින් උයන ගෙට ගියා.

එදා රාත්‍රී දුම්රියෙන් ම කායෝ සකාටා බලා පිටත් වුණා.

"යන්තම් ඇති. මොනව වෙයිද කියලා මම බයේ හිටියේ. කෝටා අමතක කළ එක නම් හොඳයි."

රූසෝ පැවසුවා.

"කොහොමත් මේ වගේ ගැටුම් වලින් ගෑනුන්ගේ ශක්තිය, ධෛර්යය වැඩි වෙනවා."

"හරියට ඔයාගේ වගේ නේද ඔෂින්."

"රූසෝ මම මේ විවේකයක් ලැබෙන කල් හිටියේ. විරුද්ධ වෙන්නේ නෑ මම ෆැක්ටරිය හැදීම ගැන. ඔයාට කැමති දෙයක් කරන්න. වැරදුණොත් අපි මුල ඉඳල පටන් ගනිමු."

"ඔෂින්ගෙ ඔය වචන මට හරි ශක්තියක් ඔෂින්. ඔයා ඒ පාඩම නිතරම කියලා දුන්නා."

"හැම දෙයක්ම අපි දෙන්නම විඳ ගනිමු."

"ඔයා බයවෙන්න එපා ණය ගැන. ඒ ණය මට මාස හයකට ඉස්සරින් ගෙවන්න පුළුවනි."

"මම දන්නවනෙ මගෙ රූසෝ දක්ෂයි කියලා."

"අගෝස්තු මාසේ පළවෙනිදා වෙනකොට අපි ෆැක්ටරිය හදලා ඉවරයි. අපි සැප්තැම්බර් පළවෙනිදා අපේ ෆැක්ටරිය විවෘත කරනවා. එහෙ මෙහෙට වඩා හොඳට ඉඩ තියෙනවා. එළියත් තියෙනවා. සේවකයන්ට විවේක ගන්න වෙනමම කාමරයක්. ඒගොල්ලන්ගෙ දැනුම වැඩිකරගන්න පංති පවත්වන්නත් සැලසුම්

Scanned with CamScanner

sinhalaebooks.com



කරනවා."

"මහන මැෂින්."

එක් සේවිකාවක් ඇසුවා.

"ඒව සේරම විවෘතයට පෙර ලැබෙනවා."

*        *        *        *

1923 සැප්තැම්බර් පළවෙනිදා උදේම රූසෝ රැවුල කපා ජපන් සාම්ප්‍රදායික ඇඳුමෙන් සැරසුණා.

"එහෙම නම් අද විවෘත කිරීමේ උත්සවයට සේරම එන්න."

ගෙන්ජි, ටකේෂිව පිටේ රඳවාගෙන අලුත් ෆැක්ටරියට ගියා. මේ වන විට වැස්සක් පටන්ගෙන තිබුණා.

"රූසෝ මහත්තයා මේ සේවකයන්ගේ කාමරේ මට දෙනවද නතර වෙන්න."

ගෙන්ජි ඇසුවා.

"අලුත් ගේ හදනකොට මම ගෙන්ජිට වෙනම ම කාමරයක් හදනවා. ගෙන්ජි දැන් විවේක ගන්න ඕනෑ."

"අපෝ බෑ. මම මේ ටකේෂි බබාව බලාගන්න ඕනෑ. ජීවත් වෙනකම්ම."

ඔෂින් හා සේවක පිරිස සාදය සඳහා සූදානම් වුණා.

"මැඩම්, මම ටකේෂි බබත් එක්ක ගෙදර ගිහින් එන්නම්. ඒක මැඩම්ලටත් ලේසියි. දරුවාට මෙහෙ නිදාගන්නවත් බැහැනේ."

"කමක් නෑ තේද රූසෝ."

"ඔව් ඔෂින්, ඒක ඔයාට ලෙහෙසියි."

"එහෙම නම් ගෙන්ජි මේ කුඩේ ඉහළගෙන යන්න."

"යන්නම්."

ගෙන්ජි ආපිට හැරී ඔෂින් සමඟ සිනාසුණා.

"ප්‍රවේශමෙන්." ඔෂින් ඔවුන් යන අයුරු බලා සිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



ගෙන්ජි නිවසට පැමිණ දරුවා මෙට්ටය මත තිබ්බා. ඔහු ළඟ දණ ගසාගෙන සුරතල් කළා. ටකේෂි ඔහුගේ ඇඟිලි වලින් ගෙන්ජිගේ රැවුල් ගස් ඇද්දා.

"ටකේෂි ඔයා දැන් නිදාගන්න ඕනෑ. මං ඔයා ළඟටම වෙලා ඉන්නම්."

ටික වේලාවකින් මැඩම් හසකාවා සහ සුමිකෝත් මිතුරියෝත් ඔෂින් ගේ ගෙදරට ආවා.

"ආ එන්න මැඩම්ලා. ඇයි මෙහේ? උත්සවය තියෙන්නේ අලුත් ෆැක්ටරියේ."

"ඔව් අපි ඒක දන්නවා ගෙන්ජි. අපි හිතුවා ඔෂින්ට උදව් කරන්න කියලා."

"අන්න එහෙ නම් මැඩම්ලට වැඩ එහේ. ඉක්මනට එහෙට යන්න."

"ඇයි ගෙන්ජි නොයන්නේ?"

සුමිකෝ ඇසුවා.

"මම එහෙ ගිහිල්ලා ආවේ. මට හරිම සතුටුයි. රූසෝ මහත්තයා ජය ගත්තා. දැන් ඉතින් සාගා වල අයට මූණ දෙන්න පුළුවනි මට. දැන්නම් මැරුණත් කමක් නෑ."

මේ වෙලාවේ ටකේෂි අඬන හඬ ඇසුණා.

"එහෙම නම් මැඩම්ලා ප්‍රවේශමෙන් යන්න. මං ටකේෂි බබාව නිදි කරන්නම්."

"අපි යනවා ගෙන්ජි."

ඔවුන් ඔෂින්ලාගේ අලුත් ෆැක්ටරිය ඇතුළට ගියා.

"ඔන්න අපි ආවා. "

"හොඳයි මැඩම්. සුමිකෝ, ඔයාලා එනකම් බලාගෙන හිටියේ. උඩ කාමරයේ කෑම මේසය සූදානම් කරන්න."

ඔෂින් සේවිකාවන්ට කීවා.

"ඉන්න අපිත් එන්නම් උදව්වට."

Scanned with CamScanner

sinhalaebooks.com



දවල් දොළහට විනාඩි දෙකක් තිබියදී ඔෂින් තරප්පු පෙළ බසින විටම එකවරටම ඇය කැරකී බිම ඇද වැටුණා. ඒ සමගම තරප්පු පෙළත්, උඩ තට්ටුවේ ලෑලිත් කඩාගෙන වැටුණා.

"භූමි කම්පාවක්.......... භූමි කම්පාවක්......."

"සේරම එළියට දුවන්න. ඉක්මන් කරන්න."

"ඔෂින්...... ඔෂින්..... කෝ ඔෂින්." රූසෝ කෑගැහුවා.

"මෙතන බිම වැටිලා. අනේ උස්සා ගන්න."

රූසෝ ඔෂින් උස්සාගෙන එළියට දිව්වා. සෑම පැත්තෙන්ම ඇසුණේ අඳෝනා හඬ.

"කවුරුත් එළියට යන්න. විදුලිය කාන්දු වෙලා ගිනි ගන්නවා."

ඔෂින් බිම තැබූ රූසෝ 'ඔෂින්', 'ඔෂින්' කියමින් ඇයගේ කම්මුල් වලට තට්ටු කළා.

"මොකද වුණේ........" ඔෂින් සෙමින් ඇසුවා.

"භූමිකම්පාවක්."

"භූමි...... රූසෝ ටකේෂි, ගෙන්ජි...........?"

ඔෂින් නැගී සිටියේ රූසෝවත් තල්ලුකරගෙනයි.

"ගෙදර යමු. ගෙදර යමු. අනේ මගේ ටකේෂි........"

ඔෂින් පිස්සියක් වගේ නටබුන් අතරින් දුවගියා. මොන ගෙයක් ද? ගේ බිමට සමතලා වෙලා. විදුලි කාන්දුවෙන් තැන තැන ගිනි ගෙන. ඔෂින් සියල්ල නොතකා ගෙතුළට පැන්නා. රූසෝ විවිධ දේවල් වලින් ගසා ගිනි ගත්ත තැන් නිව්වා. බිම වූ භාණ්ඩ ලී කැබලි බඩු එහා මෙහා කරමින් ඔෂින් කෑගැහුවා.

"අනේ ගෙන්ජි, අනේ ටකේෂි කෝ ඔයාලා."

"එයාලා එළියට යන්න ඇති ඔෂින්, බලාගෙන ප්‍රවේශමෙන්."

ඒත් එක තැනකදී ඔෂින් නතර වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"රූසෝ......... " ඇය යටිගිරියෙන් කෑගැහුවා.

"අර..... අර......" ඇයගෙ ඇඟිල්ල දික්වුණේ බිම වැතිර තිබූ අතක් දෙසටයි.

"ගෙන්ජි නේද?"

රූසෝ එතන වූ දෑ එහාට මෙහාට පෙරළා දැමුවා.

ටකේෂි අඬන්න පටන් ගත්තා. ගෙන්ජි දරුවා මත වැතිර දරුවා බේරාගෙන තිබුණා. රූසෝ ගෙන්ජිව පැත්තකට කළා. ඔහුගේ අප්‍රාණික අත පසෙකට වැටුණා. කටින් ලේ ගලා තිබුණා. ඔෂින් දරුවා වඩා ගත්තා.

"අනේ මගේ ටකේෂි. මගේ පුතා ජීවත්වෙනවා. ගෙන්ජි පුතාව බේරාගත්තා. අනේ ගෙන්ජි නැගිටින්න."

ඔෂින් ගෙන්ජිගේ මුහුණ එසෙව්වා. ඒත් එක්කම ගෙන්ජිගේ මුහුණේ සීතල ඇයට දැනුණා. රූසෝ ගෙන්ජිගේ අත රැගෙන බැලුවා.

"වැඩක් නෑ. අත සීතල වෙලා. ගෙන්ජි මැරිලා."

"ගෙන්ජි මැරිලා........." ඔෂින් ගෙන්ජිගේ මළ සිරුර ළඟ දණ ගහගත්තා.

"නෑ ගෙන්ජි මැරිල නෑ රූසෝ."

"මේ ඔය කට්ටිය එළියට යන්න. හැමතැනම ගිනි ගන්නවා. ඉක්මනට පිට වෙන්න."

"උදව් ඕනෑ." රූසෝ කිව්වා.

"දැන් ඕවා කරන්න බෑ. එළියට එන්න ඉක්මනට."

"ගෙන්ජි දමලා යන්න බෑ රූසෝ."

"ඒත් ඔෂින් අපි එළියට යමු."

රූසෝ ටකේෂිත් වඩාගෙන ඔෂින්වත් ඇදගෙන එළියට ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අනේ රූසෝ ගෙන්ජි අපේ දරුවා බේරාගත්තා."

එදා ඒ සිද්ධවුණේ කැන්ටෝ නම් වූ භූමිකම්පාවයි. සැප්තැම්බර් මස පළවෙනිදා දවල් දොළහට විනාඩි දෙකක් තිබියදී සිදු වූ එම භූමිකම්පාව ජපානයේ සිදු වූ භයානකම භූමිකම්පාව විය. ඔෂින් ටකේෂි හා රූසෝ එදා රාත්‍රිය ගත කළේ රිනෝ නම් වූ උද්‍යානයේ යි. එහි සරණාගතයන් ලක්ෂයක් පමණ විය. එදා ඒ නගරයේ බොහෝ නිවාස ගිනිබත් වූයේ ඒ අවස්ථාවේ දිවා ආහාරය සකසමින් සිටි හෙයින්, විදුලිය කාන්දුවීමෙන්. පසුදින ඔෂින් රූසෝට කතා කළා.

"රූසෝ ගෙන්ජිව එහෙම ගේ ඇතුළේ දමලා ඉන්න එක මට වාවන්නේ නෑ. අපි කොහොම හරි ආදාහනය කරලා අළු ටික ගමු. ස්වේච්ඡා සේවකයෝ අපිට උදව් කරයි."

රූසෝ කල්පනා කළා.

"හොඳයි එහෙම නම් ඔෂින් ඉන්න. මම ගේ ළඟට යන්නම්."

"අනේ බැහැ රූසෝ මමත් එන්න ඕනෑ. මට ආයිම ගෙන්ජිව දකින්න ඕනෑ."

"ඔෂින්, අපි හුඟක් දුර ඇවිදගෙන ආවේ. ඔයාට එච්චර දුර යන්න අමාරුයි. මෙහෙ නතර වෙන්න. බබත් ඉන්න නිසා කෑම ලැබෙයි."

"බැහැ මමත් ඔයත් එක්ක එනවා."

"පොලීසියෙන්, මිල්ටෙරියන් හැමතැනම. අපිට යන්න දෙන එකක් නෑ. අනිත් එක සිදුවෙලා තියෙන විනාශය දැක්කා ම ඔයා බයවෙයි."

"මොනවා උනත් ඔයා එක්කනේ ඉන්නේ. අනේ අපි යමු."

ටකේෂිව වඩාගත් රූසෝ ඔෂින් ගේ අත අල්ලාගෙන පිටත් වුණා. ගිනිගෙන ගේ කඩා වැටී තිබුණා. ඔෂින් එතනම ඉඳගෙන ගෙන්ජි ගැන සිතමින් අඬමින් හිටියා. ටික වේලාවකින් හසකාවා මැඩම් හා ඉට්ෂු එතනට දුවගෙන ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අපි මේ ඔයාලව හොයනවා. අනේ ඔයාල ජීවතුන් අතර ඉන්න නිසා සතුටුයි."

"කොහොමද සාප්පුව." රූසෝ ඇසුවා.

හසකාවා මැඩම් හිස දෙපැත්තට වනා බිම බලාගත්තා.

"අපි ඉන්නේ යාළුවෙක් ගේ ගෙදර."

"අපි හිටියේ රිනෝ පාක් එකේ. මම දැන් යනවා මගෙ ෆැක්ටරිය බලන්න."

"ෆැක්ටරිය?"

හසකාවා මැඩම් හා ඉට්ෂු මූණට මූණ බලාගත්තා.

"ඔව්, ෆැක්ටරිය බේරිලා ඇති. මම දැක්කා සමහර ගෙවල් වලට කිසිම හානියක් වෙලා නැහැ."

"ඔයාලා දන්නේ නැද්ද ඒ ගැන. අපි ඔයාලා බලන්න එහෙ ගියා. ඒ පැත්ත සම්පූර්ණයෙන්ම පිච්චිලා."

"නෑ මං හිතන්නෑ. ඔහෙලට වැරදිලා ඇති. ෆැක්ටරිය කියන්නේ මගෙ ජීවිතේ. මම යනවා. මම යනවා."

රූසෝ දරුවාත් වඩාගෙන ම දිව්වා.

"සමාවෙන්න ඔෂින්. රූසෝ කලබල වුණේ අපි කිව්ව දේවල් වලට. ඔයාගේ සැමියා හැම යෙන් එකම ෆැක්ටරිය හදන්න යෙදෙව්වා. මහන්සිවෙලා හැදුවා. ඔෂින් එන්න අපිත් එක්ක යන්න."

"බැහැ මැඩම්. මම ගෙන්ජි එක්ක මෙතන ඉන්න ඕනෑ."

"ගෙන්ජි?? ගෙන්ජි කෝ?"

"එයා ගේ ඇතුළෙ මැරිලා. මගෙ පුතාව බේරාගත්තේ එයා. මම මෙතනම ඉන්න ඕනෑ. ඇතුළට ගිහින් මිනිය ගන්නකල්."

හසකාවාත් ඉට්ෂුත් එතනම වාඩි වී වැන්දා.

"මොනතරම් යහපත් කෙනෙක් ද? පාටියට යන්න ඉස්සර අපි මෙතනට ආවා. එයා හිටියේ හරිම සතුටින්. රූසෝ ගේ බිස්නස් එක ගැන හරියට ආඩම්බර වුණා. එයා මැරුණේ ඒ

Scanned with CamScanner

sinhalaebooks.com



සතුටින් මයි."

ඔෂින් හඬමින් ගේ දෙස බලාගෙන හිටියා.

"ඔෂින් මේකෙන් පසුබට වෙන්න එපා. දුක්විඳලා තියෙනවනේ මීට වඩා. ඒ නිසා අපි ආයිම ජීවිතේ ජයගන්න ඕනෑ."

ස්වේච්ඡා සේවකයන් ලවා ගෙන්ජිගේ මිනිය දවා අළුටික ගෙන පෙට්ටියක තැන්පත් කළා. සවස් වන විට රූසෝ ආවා. කිසි කතාවක් කළේ නෑ. ලොකු හිතේ අමාරුවකින් හිටියේ. සවස් වීගෙන ආවා. එකවරම

"ඔෂින් ඔයාලා ඉන්නවා නේද?"

ඔෂින් හැරී බැලුවා.

"අම්මා.......... " ඔෂින් ඉදිරියට දුව ගියා.

ෆුජි ඔෂින් ව වැලඳ ගත්තා. දෙන්නාම ටික වෙලාවක් හඬා වැලපුණා.

"මම හිතුවා ඔෂින් ඔයාට කරදරයක් නැතුව ඇති කියලා."

මේ සියල්ල දෙස එක් පුද්ගලයෙක් බලාගෙන හිටියා.

"මේ මගේ දුව. අර බෑනයි දරුවයි. එහෙම නම් ඔබට බොහොමත් ස්තුතියි. මගෙත් එක්ක ආවාට. මම ආපිට යනකොට යශිරෝ මැඩම්ලගේ ගෙදර එන බව කියන්න."

ඔෂින් ගේ මව ඔහුට ආචාර කළා. ඔහුත් ආචාර කර පිට වී ගියා.

"දුව එයත් එක්ක මාව එව්වේ යශිරෝ මැඩම්."

"අම්ම කොහොමද ආවේ." රූසෝ ඇසුවා.

"මේ භූමිකම්පාව ගැන දැනගත්තාම මට හරි වේදනාවක් දැනුණා. මං හුඟක් වෙලා ඇඬුවා. සෝජිටත් දුකයි. එයා මට සල්ලි ටිකක් දුන්නා. මම ඒක අරගෙන යශිරෝ මැඩම්ලාව මුණ ගැහෙන්න ගියා. ඒ ගොල්ලන්ටත් හරිම දුකයි. යශිරෝ මැඩම් මේ ඇඳුම් ටිකයි කෑමයි දීලා අර දැන් ගිය එක්කෙනා එක්ක මාව

Scanned with CamScanner

sinhalaebooks.com



මෙහෙ එව්වා. මිස් කායෝ මේ මුදල් ඔෂින්ට දෙන්න කිව්වා."

ඔෂින් මව ගෙනා රෙදි වලින් එකක් රැගෙන ගෙන්ජිගේ මිනී අළු සහිත පෙට්ටිය ගැටගසා තිබ්බා. ෆුජි පෙරැත්ත කරමින් කෑම කවන්න උත්සාහ කළත් ඔෂින් නම් කිසිවක් කෑවේ නැහැ.

"දැන් මොකද කරන්න හිතන් ඉන්නේ රූසෝ."

පසුවදා උදේ ෆුජි ඇසුවා.

"සාගා යන්න ඕනෑ. වෙන කරන්න දෙයක් නැහැ. මෙහෙ හිටියොත් ඉන්න තැනක් නැහැ. කන්න දෙයක් නැහැ. මොනවද කරන්නේ?"

"නැහැ රූසෝ. අපි සාගා යන්න ඕනෑ නැහැ. මෙහෙ ඉඳලා ආයෙම දියුණු වෙන්න බලමු."

"මොනවද කතා කරන්නේ ඔෂින්. මොනව දියුණු කරන්න ද? හැමදේම අළු වෙලා."

"ඒ උනාට මට බැහැ සාගා යන්න. මම අම්මත් එක්ක යමගාටා යනවා."

"ඒ කියන්නේ අපි වෙන්වෙනවා කියල ද?" රූසෝ ඇසුවා.

"ඔව් සමහරවිට."

"නැහැ ඔයා මගේ බිරිඳ. ඔයා සැමියා කියනදේ අහන්න ඕනෑ."

"ඒ වුණාට මට බැහැ සාගා යන්න. මම කැමති නැහැ. ඔයා මොනවා කීවත් මම සාගා යන්නේ නෑ නැමයි."

"ඔෂින්" ෆුජි ඔෂින්ගේ කම්මුල හරහා හොඳ පාරක් දුන්නා.

"සැමියට ඉහළින් වැඩකරන්න බැහැ බිරිඳකට. ඔයා යන්න ම ඕනෑ සාගා. ඒ සැමියාගේ ගම. එහෙ ගියාම මොකද වෙන්නේ?"

රූසෝ එතනින් ඉවත්ව ගියේ කෝපයෙන්.

නැවතත් හසකාවා හා ඉට්ෂු කෑම සකස් කර ගෙන ඔෂින්ලා සොයා ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ආ.... අම්මත් ඇවිත් නේද? ඇයි ඔෂින් දුකෙන් ඉන්නේ."

"එයා සාගා යන්න අකමැතියි. ඒත් මම පැහැදිලි කළා. දෙන්නා වෙන්වෙලා බැහැ කියලා."

"ඔව් ඒක ඇත්ත. දියුණු වෙන්න දෙන්නම එකතුවුණා වගේ මේ වෙලාවෙත් දෙන්නම එකට ඉන්න. ඒක දෙන්නටම ශක්තියක්. අපි දන්නේ නැහැ ටෝකියේ තිබුණ තත්වයට කවදා ගෙන එයිද කියලා." හසකාවා මැඩම් කීවා.

"මමත් යනවා ඔෂින්."

"මැඩම් කොහෙද යන්නේ?"

"ඉට්ෂුලගෙ ගම පැත්තට."

"ඔව් ඔෂින් එහෙ කොණ්ඩ සැකසුම් කරන්න පුළුවනි." ඉට්ෂු කීවා.

"මමත් සාගා යනවා මැඩම්. අම්ම කියන එක හරි. දුකේ දී දෙන්නා වෙන්වෙන්න හොඳ නෑ. එකට ඉන්න ඕනෑ."

"ඔෂින් මේ තියන දෙයක් ලෑස්ති කර ගන්න. "

අම්මා කීවේ ටකේෂි නිදිකරවන ගමන්.

මේ වෙලාවේ රූසෝ පැමිණියා.

"රූසෝ ඔෂින් යන්න ලෑස්තියි." අම්මා කීවා.

"ආ..... ඇත්ත ද? එහෙම නම් අද රෑම බෝට්ටුවේ යන්න පුළුවනි. අම්මා අම්මට හුඟක් ස්තුතියි. ඔබ උනන්දු කළේ නැත්නම් ඔෂින් එන්නේ නෑ."

"ඔෂින් මැඩම්......." ඒ ආවේ කේන්.

"කේන් ඔයා.?"

"ඔව් ඔයාලා ගැන හෙව්වා. දැනගත්තා මෙහෙ ඉන්නවා කියලා. මේ ඇඳුම් ඔයාට. මේ පුංචි රබාන බබාට."

"ස්තුතියි කේන්."

"කේන් අපි සාගා යනවා." රූසෝ කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇත්ත ද මැඩම්. ඔයත් යනවද?"

"ඔව් කේන් එහෙ තියනවා ඇඩියකේ කියලා පිට්ටනියක්. එහෙ එළවළු වගාකරන්න අමාරුයි. ලුණු පස නිසා. ඒ නිසා එහෙ කපු වවනවා. හරියට හිම වගේ."

ඔෂින් මේ සියල්ල කියා ගත්තේ තමාටමයි. හිත හදාගන්න වගේ.

"කේන් මම ඔයාට පුළුන් එවන්නම්."

"මැඩම් ආයිම එන්න. ආවාම මාව මුණගැහෙන්න එන්න."

සෑම දෙනාගෙම ඇස්වල කඳුළු පිරී තිබුණා. එදා රෑ සරණාගතයන් ගෙනියන යුද නැවකට නගින්න ඔවුන් ගියා. අන්තිම මොහොතේ අම්මා ඔෂින් ව පැත්තකට ගෙන කතා කළා.

"ඔෂින් පිට ගෙදරකට ගිහින් ඔයාට ඕන විදිහට වියදම් කරන්න බැහැ. මිස් කායෝ දුන්න ඔය සල්ලි ඔයා ප්‍රවේශම් කරගන්න. ඔපමණයි ඔයාට තියෙන වත්කම. තේරුණා ද?"

"ඔව් අම්මා."

රූසෝ ඔෂින් හා ටකේෂි ඔවුන්ගෙන් සමුගෙන සාගා යෑම සඳහා නැවට නැග්ගා.

Scanned with CamScanner

sinhalaebooks.com

# දහය

ඔෂින්ට නැව් ගමන වෙහෙසකාරී වුණා. රාත්‍රියේ නින්ද නොගියා වගේම ඔවුන්ගේ කෑම ද අවසන් ව තිබුණා. නිවසට යනතෙක් ඔවුන් ගියේ පා ගමනින්. ඔෂින්ට දැනුණේ සාගා බොහෝ ඈත බවයි. රූසෝ ටකේෂි පිටේ රඳවාගෙන තිබුණා.

"ඔෂින් මෙන්න අපේ ගෙදර."

ඔෂින් හිස ඔසවා ඒ නිවස දෙස බැලුවා.

"යමු ඇතුළට."

ඒත් ඔෂින් ගේ දෙපා එසවුණේ නැහැ. කුඹුරට යන කිප දෙනෙක් ඔවුන් දෙස බලා සිටියා.

"ඔෂින්, මේ මොකද යමු ගේ ඇතුළට."

ඒත් ඔෂින් එහෙම ම ගල් ගැහිලා හිටියා.

"මොකද ඔෂින් වෙලා තියෙන්නේ අර මිනිස්සු බලනවා."

මෙවිටම රූසෝ ගේ පියා පැමිණියා.

"රූසෝ.......... ඔයගොල්ලන්."

"ඔව් තාත්තා, අපි, අපි මැරුණේ නැහැ."

"අපි හරියට වද වුණා. මම හැමදාම ප්‍රාදේශීය කාර්යාලයට ගිහින් තොරතුරු හෙව්වා. ඒත් ඒ අය ළඟත් තොරතුරු තිබ්බේ නැහැ. ඊට පස්සේ අපි හිත හදා ගත්තා. දැන් හරි සතුටුයි ඔයාලා

Scanned with CamScanner

sinhalaebooks.com



ජීවතුන් අතර. ඔකියෝ, ඔකියෝ එළියට එන්න මෙන්න රූසෝ එයාගේ හාමිනෙත් එක්ක ගෙදර ඇවිත්."

ඔකියෝ එළියට ආවා. රූසෝ දෙස පුදුමයෙන් බලාගෙන හිටියා.

"මොනව ඔයා ආවද මගෙ පුතා රූසෝ. මගෙ රූසෝ."

අම්මා රූසෝව වැලඳ ගත්තා. රූසෝ ගේ සොයුරිය හට්ෂුකෝ පැමිණියා.

"අනේ තුන්වෙනි අයියා ඔයා ආවා ද?"

සියලු දෙනා රූසෝ වැලඳ ගත්තා. ඔෂින් පසෙකට වී බලා සිටියා.

"ඔකියෝ... මේ, මෙන්න ඔෂින්. ඔෂින්ට මගෙ හාමිනේ මුණ ගැහිලා තියෙනවා නේද?"

"ඔව් තාත්තා, සමාවෙන්න කියන්නේ නැතිව ආවාට."

ඔකියෝ ඔෂින් දෙස බැලුවේ නොපහන් බැල්මක්.

"මොකද රූසෝ ඔයා ළමයා වඩාගෙන. ළමයි කරගහ ගන්න ඕනෑ ගෑනියි. දෙනවා දෙනවා ගෑනිට."

"ඒවා පස්සේ, එන්න ඇතුළට."

සියලු දෙනා ඇතුළට ගියා. ඔෂින් පසුබා හිටියා.

"එන්න ඔෂින්, එන්න."

තාත්තා ඔෂින්ගේ අත අල්ලාගෙන ගෙට ගෙන ගියා. ඔෂින් මේ වෙලාවේ හිතුවා මේ නිවසේ ඇයගේ ජීවිතය කුමන ආකාරයෙන් ගෙවී යයි ද, එය ඉතාමත් දුෂ්කර විය හැකි බව ඔෂින්ට දැනුණා. පියා සියලු දෙනා සාලයට කැඳෙව්වා. ඔෂින්ට ඔවුන්ව හඳුන්වා දුන්නා.

"මේ ඉන්නේ මගේ වැඩිමල් ම පුතා පුකුටාරෝ. මේ එයාගේ හාමිනේ සුනිකෝ. මේ එයාලගේ පුතාලා තුන්දෙනා."

ඔෂින් සියල්ලන්ට ම ආචාර කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මේ ඉන්නේ මගෙ එකම දුව හට්ෂුකෝ. එයා විවාහ වෙලා එහා ගමෙන්. හැබැයි එයා නිතරම ගෙදර එනවා මෙහෙ පහසුයි කියලා. අන්තිමට නැන්දම්මලා හට්ෂුකෝ පන්නා දමයි කියලයි මම බයේ ඉන්නේ."

"මොනවද ඔය කියන කතා. මොකට ද නැන්දම්මලා පන්නා දමන්නේ අපි හට්ෂුකෝ එන හැම වාරයකට ම එයාලාට තෑගි යවනවා."

"මට නම් පේන්නේ හට්ෂුකෝ නරක් කරන්නේ අම්මා."

රූසෝ සිනාසුණා.

"ඉතින් දැන් අපි සේරම එකම වහලක් යට ඉන්නවා. හැමෝම සමගියෙන් ඉන්න ඕනෑ. තේරුණා ද ඔෂින්."

තාත්තා කිව්වා.

"හොඳමයි."

"දැන් මොනවද මෙයාලා කරන්න හිතාගෙන ඉන්නේ."

පුකුටාරෝ ඇහුවා.

"ෆැක්ටරිය පිච්චුනාට ඉඩම තියෙනවා නේද රූසෝ." පියා ඇහුවා.

"තාත්තා දැන් ඒ ඉඩම අපිට අයිති නැහැ. උගස් කළා. හුඟක් ණය වුණා."

"ඇයි ණය වුණේ?"

"තාත්තා ෆැක්ටරිය සාර්ථක වුණා නම් මාස හයකින් මට ණය ගෙවලා ඉවර කරන්න තිබුණා."

"ඔක්කෝටම වඩා ගෙන්ජි නැති වුණා."

"වැරැද්දක්නේ වයසක මිනිහෙකුයි, දරුවෙකුයි ගෙයි දමලා යන එක. ගෑනු මේවා කල්පනා කරන්න ඕනෑ."

"අම්මා ගෙන්ජි විතරක් නෙමෙයි දහස් ගණනක් මිය ගියා."

"රූසෝ ඉස්සර තනියෙන් හොඳට බිස්නස් කරගෙන ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



ණය වෙවී බිස්නස් දියුණු කරගන්න කියන්න ඇත්තේ ගෑනි වෙන්ඩ ඇති."

"අම්මා, මොනවද ඔය කියන්නේ මේවා මගේ ප්ලෑන්."

"මේ රූසෝ බිරිඳ සුද්ද කරන්න එපා."

"දැන් ඔය කතා වැඩක් නැහැ. තුන්වෙනි පුතා කියලා රූසෝට යෙන් 1000 ක් ණය දුන්නා. එයාට වෙන දෙන්න දෙයක් නැහැ. විශේෂයක් කරන්න අවශ්‍ය නැහැ. එයා බූදලෙන් කොටසක් අරගෙන ඉවරයි නේ. ඒ නිසා ගෙදර ඉන්න පුළුවනි. නමුත් දිවි පැවැත්මට ගොවිතැන් වැඩ කරන්න ඕනෑ. තේරුණා ද රූසෝ. තේරුණා ද ඔෂින්."

"හොඳමයි ඒ විදිහට වැඩ කරන්නම්."

"හොඳයි දැනට විවේක ගන්න."

තාත්තා සිටියේ පුකුටාරෝගේ දේශනයට නොමනාපයෙන්.

"ඔහොම කතා කරන්න අවශ්‍ය නැහැනේ."

"එයාගේ හිතට අමාරු ඇති. එයානේ දැන් පවුල වෙනුවෙන් මහන්සි වෙන්නේ." මව කිව්වා.

"මේ ගොල්ලන්ට මහන්සියි කාමරයක් දෙන්න."

ඔකියෝ ඔවුන් කාමරයකට රැගෙන ගියා.

"මේ කාමරේට හිරු එළියවත් එන්නේ නැහැනේ."

"හිරු එළියට මොකට ද? කාමරේ රිංගලා ඉන්නේ නැහැනේ දවස තිස්සෙම. කුඹුරු වැඩ. ඔෂින් දැන් ඔයා මෙහාට ආගන්තුක නැහැ. මම සැරයි කියලා හිතන්න එපා. නමුත් නමුත් මෙහෙ නීති රීති අනුව හැඩ ගැහෙන්න ඕනෑ. "

"හොඳමයි මට හැකි අයුරින් මම ඒවා ඉගෙන ගන්නම්."

"අම්මා බඩගිනියි. අපි ගෙනාව කෑම ඊයේ ම නැවේ දී ඉවර වුණා."

"මොනවා එතකොට ඔයාලා ඊයේ ඉඳලා බඩගින්නේ. පාන්

Scanned with CamScanner

sinhalaebooks.com



ටිකක් නම් ඇති. ඒක රූසෝ ට දෙන්නම්."

"ඇයි ඔෂින්ටත් දෙන්න."

"එපා රූසෝ කන්න. මට බඩගිනි නෑ."

"බඩගිනි නැත්නම් කමක් නැහැ. එන්න රූසෝ කෑම කන්න."

"මම එන්නම්, අම්මා යන්න."

"ඔෂින්, ඔයා ඊයේ නිදාගත්තේ නැහැ. නිදිමත ඇති ටිකක් නිදාගන්න."

"බබා ගේ රෙදි ටික හෝදන්න තියෙනවා."

"දෙන්න මම ඒ ටික හෝදලා දමන්නම්."

"ඔෂින්, ගෙන්ජි මට ලිව්වා ඔයා ගැන. මගෙ පුතාට හොඳම බිරිඳ ඔයා කියලා ලියලා තිබුණා."

තාත්තා කිව්වා.

"තාත්තා අපිට දුන්න ණය ගෙවන්නත් බැරිවෙනවා."

"ඔෂින් ඒ ගැන තැවෙන්න එපා රූසෝ දක්ෂයි. වෙනදා වගේම බාධක ජයගෙන පෙරට යන්න. තවත් හොඳ කාලයක් උදා වෙයි. අම්මා නපුරුයි කියලා හිතන්න එපා. බැන්නා ම නැහුනා වගේ ඉන්න."

"හොඳමයි තාත්තා."

ඔෂින් එතනම පෙරළී නිදා ගත්තා. රූසෝ ලී බාල්දියට වතුර ගෙන ලෑල්ලක අතුල්ලමින් ටකේෂි ගේ ඇඳුම් හේදුවා.

"ඔය මොකද කරන්නේ රූසෝ."

ඔකියෝ රූසෝ පැත්තකට ඇද දැම්මා.

"ටෝකියෝ වල මේවා කළාට සාගා වල ඒවා බැහැ."

"මොකද අම්මා, තාත්තා දරුවගේ රෙදි හේදුවාම මොකද වෙන්නේ."

"ඔයා බිරිඳව නරක් කරනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



ඇය දරුවාගේ රෙදි සෝදා දමා දරුවාත් නෑවෙව්වා. රූසෝ ඔෂින් ළඟින් ම වැතිරුණා.

"මම කල්පනා කළේ රූසෝ කොහොමද ඔයා ගේ අම්මා සතුටු කරන්නේ කියලා."

"තව කල් තියෙනවා ඔෂින්. අපිට ජීවිත කාලයම ඉන්න වෙන්නේ මෙහේ. වෙන කොහේ යන්නද අතේ සතේ නැතිව. ඔෂින් අම්මා ඔය හැමදේම මූණට කියන්නේ අම්මා අවංක නිසයි. ඔයා ඒවා ගණන් ගන්න එපා."

"ඔව්, මම ඔය බාධක නැතිකරගෙන ඉදිරියට ම යනවා. මම නාගෙන එන්නම්. "

රූසෝ නාගෙන කිමෝනාවක් ඇඳගෙන ආවා.

"කිමෝනාව කාගෙද ලස්සණයි."

"මෙක තාත්තගේ, අම්මා දුන්නා. අම්මා අපේ දුක සැප බලනවා. ඔෂින් ගෙදර අය අපට සාදයක් සූදානම් කරලා. ඔයත් හොඳ ඇඳුමක් ඇඳ ගන්න."

ඔෂින් වෙන කිමෝනාවක් ඇඳගෙන රූසෝ සමඟ ගොස් වාඩි වුණා.

"ඔෂින් අපි එක්ක කන්නේ නෑ."

"අම්මා, මෙක පවුලේ සාදයක්. මොනවද මේ කියන්නේ."

රූසෝ අමනාපයෙන් ඇසුවා.

"කෝ සුනිකෝ එනවද මෙතැන කෑමට නැහැනේ. ඔෂින්ටත් එහෙම තමයි. ඔෂින්, සුනිකො එක්ක කෑම ගන්න උයනගෙට ගිහින්."

"හොඳමයි." ඔෂින් ආචාර කර නැගී සිටියා.

"ඒ වගේම මේ ගෙදර ගැන දැනගන්න තියෙන දෙයක් සුනිකෝ ගෙන් අහන්න."

ඔෂින් සෙමෙන් සුනිකො සොයා ගෙන ගියා.

"ඔෂින් මෙහෙ ගෑනු කන්නේ පිරිමි අය කෑවට පස්සේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"සමාවෙන්න සුනිකො. කුස්සියේ වැඩ වලට උදව් වෙන්න බැරි වුණාට."

"මේ වැඩ අයිති වැඩිමල් සොයුරාගේ බිරිඳට. ඔයා තුන්වෙනි පුතාගේ බිරිඳ. ඔයාගේ වගකීම් වෙනස්. හොඳයි නාගෙන ම එන්න."

ඔෂින් නාන කාමරයට ගොස් නාගෙන එළියට පැමිණියා.

"ස්තුතියි නාන්න ලැබුණට."

"ඔෂින්, මෙහෙ එන්න." ඒ ඔකියෝගෙ කැඳවීම.

"එනවා."

"ඔෂින්ට පුදුම ඇති මෙහෙ වැඩ වලට. ටෝකියෝ වලට වඩා මෙහෙ වැඩ වෙනස්. ඔයාට හැමදාම ආගන්තුකව සලකන්න බැහැ. මෙහෙ ඉන්නවා නම් හොඳට වැඩ කරන්න. කෑමටයි, ඉන්නවාටයි."

"හොඳයි, මම හොඳින් වැඩ කරන්නම්. මට පුළුවනි කොණ්ඩා සැකසුම් කරන්න, මහන්න."

"ඒවා වැඩක් නැහැ. මෙහෙ තියන මුඩු ඉඩමක් වගා කරන්න. මේ කිමෝනාව ඔයා ගෙනියන්න."

"ස්තුතියි."

ඔෂින් කාමරයට ගොස් මේ බව රූසෝ ට කිව්වා.

"මොනවා, අම්මා ඔයාට වගා කරන්න කිව්වා."

" ඔව්, ඔයාටත් එක්කම."

"අපි ඉඩම් හිමියො තමයි, අයියත් වැඩකරන නිසා අපිටත් වැඩකරන්න කියන්න ඇති."

පසුවදා උදේ ඔෂින් උයන ගෙට ගොස් එහි මෙහෙකාරිය වූ සුකි දැක,

"සුබ උදෑසනක්." කිව්වා.

ඇය රවාගෙන ළිපට පිම්බා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔයා මොකට ද කුස්සියෙ වැඩට වද වෙන්නේ.?" සුතිකො ඇසුවා.

"සුතිකො මට බබාගේ රෙදි සෝදන්න සබන් ටිකක් දෙන්න පුළුවන් ද?"

" තමන්ට අවශ්‍ය සබන් තමන් ම ගන්න ඕනෑ. මට දෙන්නේ මුදල් ටිකයි. ඒක ඉවර කරලා මට කරදරේ වැටෙන්න බැහැ."

"කමක් නැහැ කරදර කළාට සමාවෙන්න."

ඔෂින් සබන් නැතිව ටකේෂිගේ ඇඳුම් සෝදා වැලට දැම්මා.

"ඈ.. ඔෂින් ඔයාට අම්මලා මොනවත් දීලා නැහැනේ. බලන්න සුතිකෝගේ දෙමාපියො නිතර අපට තෑගි එවනවා. කෑම එවනවා."

ඔෂින් බත් ගුළියක් ගෙන කන්න පටන් ගත්තා.

"රූසෝ හොඳට කෑම ගන්න. මහන්සි වෙලා වැඩ කරන්න තියෙනවා නේ."

ඔෂින් සෙමෙන් නැගිට ගොස් තවත් බත් ගුළියක් බෙදා ගත්තා.

"පෙනුමෙන් නම් හරිම කෙට්ටුයි. ඒත් කෑමට නම් දක්ෂයි වගේ."

ඔෂින් බත් ගුළිය නැවත ආපසු තබා,

"ස්තුතියි කෑම වලට" කියා තරහින් යන්න ගියා.

"අම්මා, ඇයි එහෙම කීවේ?"

"අම්මා තමයි, එයාට පොඩ්ඩක් කතා කළාම තරහ යන හැටි."

උදේ ෆුකුටාරෝ ඔවුන් වැවිය යුතු ඉඩම පෙන්නුවා.

"මෙන්න ඉන්නවා සාරෝ. එයත් එක්ක එකතුව වැඩ කරන්න."

"සාරෝ, අනේ මගෙ පාසල් යාළුවා. මේ ඔයාගේ බිරිඳ ද

Scanned with CamScanner

sinhalaebooks.com



හරිම ලස්සණයි."

"ඔව් ම තමයි. එයා ලස්සණයි."

"එයා ගේ නම සාවා."

"මේ ඉන්නේ මගේ බිරිඳ ඔෂින්, බබා ටකේෂි."

සියලු දෙනාම ආචාර සමාචාර පවත්වා ගත්තා.

"ඇයි ටනකුරා මහත්තයලා ඔයාලා කුඹුරට එව්වේ."

"සාවාට පුළුවන්නම් වැඩ කරන්න මටත් පුළුවනි."

"ඔයාලා එන බව ආරංචි වෙලා මම වේවැල් කූඩයක් ගෙනාවා බබා තියන්න. කරේ බැඳගෙන වැඩකරන්න අමාරුයිනේ."

දෙදෙනාම එකතුව බබා කූඩයෙන් තිබ්බා. ඔෂින් සාවාගේ කතා බහට වශී වුණා. එහෙම නම් මට හොඳ යෙහෙළියක්. ඇය සිතා ගත්තා. රූසෝ ටිකක් වැඩ කළා.

"මට නම් බඩගිනියි."

"අපෝ කෑමට තව පැය දෙකක් විතර තියෙනවා."

ඔෂින්, රූසෝ දෙස දුකෙන් බලාගෙන හිටියා. කෑම වෙලාවේ හතරදෙනාම කෑමට වාඩි වුණා. රූසෝ කෑම එක දිග ඇරියා. එහි වූයේ බත් ගුළි දෙකක්.

"මෙච්චර ද? මේක විහිළුවක් ද? මේකෙන් දවසම වැඩකරන්නේ කොහොමද?"

සාරෝත්, සාවාත් කෑවේ අලකෑලි ටිකක්.

"රූසෝ ඔයාලා වාසනාවන්තයි. කන්නේ සුදුබත්. අපිට සුදුබත් නැහැනේ."

"රූසෝ ඔයා මේවා කන්න. මට එපා."

"නැහැ, නැහැ ඔෂින් දරුවට කිරි දෙන්න තියෙනවා. ඔයත් කන්න. මම හෙට අම්මට කියන්නම්කෝ."

"එපා රූසෝ එතකොට අම්මා මට බනියි."

Scanned with CamScanner

sinhalaebooks.com



"කොහොමද එක බත්ගුළියෙන් දවස ගත කරන්නේ. බඩගින්නේ මැරෙන්න යනවා."

සවස නිවසට ගිය රූසෝ අම්මාට කතා කළා.

"අද මට සාරෝ මුණගැහුණා. එයාගේ බිරිඳ හොඳ හැඩකාරි."

"ඒ වුණාට නරක එකියක්."

"ඒ වුණාට නරක පාටක් නම් නැහැ. හරිම කරුණාවන්තයි." ඔෂින් කිව්වා.

"නැහැදිච්ච එකියක්" ඔකියෝ කිව්වා.

"ඔෂින් යනවා ගෙට." රූසෝ සැර කළා.

"අම්මා, ඔෂින් මම වගේම ගොවිපළේ මහන්සි වෙනවා. එයා දරුවට කිරි දෙන්නත් ඕනෑ. අම්මා ඇතිවෙන්න කෑම දෙන්න."

"රූසෝ හොඳ වැඩියි ඔයා."

ඔෂින් රෙදි සෝදන තැනට ගිය ඔකියෝ,

"ඔෂින්,"

"ඇයි,"

"උඹ ගෑනියෙක්. ගෑනු මැසිවිලි කියන්නේ නැහැ. ස්වාමියාට කන්න දෙන්න ඕනෑ තමාගේ කොටසෙන්, තේරුණා ද?"

තවත් මාසයක් පමණ ගෙවී ගියා. ඔකියෝ නම් ඔෂින්ට කෙනෙහිලිකම් කළා. එහෙත් සාවා සමඟ දවස ගතකරන විට ඔෂින් හිටියේ සතුටින්. සාවා ලස්සණයි, කරුණාවන්තයි. මෙවැනි පරිසරයක ඇය දෙවියන් දුන් තෑග්ගක් ලෙසයි ඔෂින් සිතුවේ. දිනක් සාවා කොණ්ඩා සැකසුම් උපකරණ සොයාගෙනවිත් ඔෂින් ලවා කොණ්ඩය සකස් කරවා ගත්තා.

"හරිම ලස්සණයි." සාරෝ කිව්වා.

"ඔව්, හැබෑට හොඳයි." රූසෝ කිව්වා.

"මට අම්මා බනියි ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි බනින්නේ සාවා වරදක් කළේ නැහැනේ. ගෑනු ලස්සණට ඉන්න ඕනෑ. අද ඔහොම ම ගෙදර යමු." සාරෝ කිව්වා.

"මම හරි ආශාවෙන් හිටියේ මෙහෙම කොණ්ඩය සකස් කරන්න."

ඔෂින්, රූසෝ සමඟ නිවසට ආවා.

"ඔෂින්, අම්මා ඔයාට කතා කළා." සුනිකෝ කිව්වා.

"හොඳයි." ඔෂින් සමඟ රූසෝ ද ගියා.

"ඔෂින් මෝඩියේ, උඹ ටනකුරා පවුලේ දැලි ගෑවා."

ඔෂින් හා රූසෝ පුදුමයෙන් බලාගෙන හිටියා.

"උඹ මොකටද අර ගෑනිගේ කොණ්ඩය හැදුවේ. ඒ මදිවට ගමේ එකියෝ මෙහෙ එනවා කොණ්ඩා දමන්න."

"ඔය ඇත්තම ද අම්මා." ඔෂින් පුදුමයෙන් ඇහුවා.

"අනේ මට කොණ්ඩා මෝස්තර දමන්න ඉඩ දෙන්න අම්මා. මම කුඹුරෙත් වැඩ කරන්නම්. දවසට එක මෝස්තරයක් දමා ගත්තොත් ඇති. අනේ මට ඉඩ දෙන්න."

"රූසෝ මේකිට පිස්සු ද?"

"ඔෂින් මොනවද ඔය කියවන්නේ?"

"රූසෝ උඹේ ගෑනි මට විහිළු කරනවා ද?"

"අනේ ඉඩ දෙන්න." ඔෂින් හිස නමා ආචාර කළා.

"ඔෂින් යනවා ගෙට."

ඔෂින්ට පුදුමයි ඇයි ඔකියෝට එතරම් කේන්ති ගියේ. ඇය රෑ නිදාගැනීමට ගොස් රූසෝ එනතෙක් වාඩි වී සිටියා.

"ඔෂින්, මම අම්මගේ උරහිස් මිරිකුවා. ඇයට ඒක හරිම සනීපයක්. ඇයි ඇහැරගෙන නිදා ගන්න එපැයි."

"මම ඇහැරලා හිටියේ ඔයා එක්ක කතා කරන්න. ඇයි රූසෝ කොණ්ඩා සකසන්න නොදෙන්නේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින්, කෑගහන්න එපා."

"ඇයි ඒක වැරදි වැඩක්යැ. මට සබන් ගන්න සල්ලි නැහැ. ලියුමක් ලියන්න කොළයක්, තීන්ත ටිකක් නෑ, ඉරුණු ඇඳුමක් මහන්න ඉඳිකටුවක්වත් නැහැ."

"ඇයි මේ ගෙදර ඕනෑ තරම් සබන් තියෙන්නේ."

"ඒ වුණාට සුනිකෝට දෙන්නේ මුදල් ටිකලු."

"ඇයි අම්මාගෙන් නොඉල්ලන්නේ?"

"අපි කන්නේ එයාලගෙන්. වදකරන්න බැහැ."

" ඇයි ඔයාට කායෝ දුන්න යෙන් 100 තියෙන්නේ. ඒකෙන් අවශ්‍ය දේවල් ගන්න."

"ඒක තියා ගනිමු රූසෝ. අපි සල්ලි ඉතිරි කරන්න ඕනෑ. අපි මෙහෙ සේවකයෝ."

"මම අම්මට කියන්නම්."

"එපා එතකොට බැනුම් අහන්නේ මම. අනේ රූසෝ මට කොණ්ඩා දමන්න දෙන්න. සල්ලි ටිකක් හොයාගන්න පුළුවන්නේ."

"ඔෂින්, ඔයාට තේරෙන්නේ නෑ. ඔයා වනකුරා පවුලේ ලේලියක්. අනුන්ගේ කොණ්ඩා දමන්නේ නෑ වනකුරා පවුලේ අය."

"මම නීති විරෝධී වැඩක් යැ කරන්න හදන්නේ."

"ඔෂින්, ඔහේට මෙහෙ ඉන්න බැරිනම් යන එකයි ඇත්තේ."

රූසෝ මේ ටික කීවේ කෝපයෙන් කටහඬත් උස් කරමින්.

"දැන් ඔය කතාව නවත්තනවා. මේ ගෙදර ඉන්නේ ඔය දෙන්නා විතරක් නෙමෙයි."

අම්මා ගේ කටහඬ ඇසෙත් ම රූසෝ පොරෝනයෙන් හිසත් වසාගෙන නිදා ගත්තා.

පසුවදා රූසෝ අම්මා සොයාගෙන ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා මුදල් ටිකක් දෙන්න පුළුවන් ද? මම තාත්තාට කිව්වා ම තාත්තා අම්මාගෙන් ඉල්ලා ගන්න කිව්වා. යෙන් පහක් ඇති. ඔෂින්ට සබන් ගන්ඩ ඔය ඉදිකටුවක්, ලියුම් ලියන කොළයක් එහෙම ගන්ඩ."

"ආ එයාට පිරිමහන්ඩ. මේ රූසෝ මිනිහෙක් වගේ හැසිරියන්. උඹට පිට කොන්දක් නැද්ද හැම වෙලාවෙම ගෑනිගේ පදයට නටන්නේ. හොඳයි මම ඔෂින් හම්බවෙලා මොනවද ඕනෑ අහන්නම්කො."

ඔකියෝ, ඔෂින් හොයාගෙන ගියා.

"මොකද කොච්චර හරි රූසෝට කරදර කරන්නේ අරක ඉල්ලලා මේක ඉල්ලලා. කිමෝනාවක් තිබුණේ නෑ අඳින්න. ඒක දුන්නේ මම. ගුණමකු කෙල්ල. මොකද කොණ්ඩා දමන්න ඉල්ලන්නේ? ඇයි ගමට කියන්න පුළුවන්නේ නැන්දම්මා සලකන්නේ නෑ කියලා."

ඔෂින් සියල්ල අසා සිටියා. ඇයගේ මුහුණේ තිබුණ නොපහන් බව තවත් වැඩි වුණා.

"පේනවා නේ කොච්චරවත් මූණ එල්ලා ගෙන."

කාමරයට ගිය ඔෂින් රූසෝට කතා කළා.

"මම කිව්වා ඔයාට ඕවා කියන්න එපා කියලා. බැනුම් ඇහුවේ මම."

"මට කියන්න වුණා. තාත්තාට සල්ලි දෙන්න බලයක් නැහැනේ."

"ඒක තමයි මම කීවේ කොණ්ඩ දම......."

"තවත් එපා ඔය කතා. නවත්තනවා ඔය කෙඳිරිය. මට නම් දැන් එපා වෙලා ඉන්නේ ඔහේව. කරදරකාර ගෑනු."

රූසෝ තරහින් නින්දට වැටුණා.

Scanned with CamScanner

sinhalaebooks.com

# එකොළහ

ඔෂින් ගොවි උපකරණ සෝදා පිරිසිදු කරමින් හිටියා. එතන ම හුකුටාරෝ වැඩක යෙදී සිටියා. ඔකියෝ මෙතනට පැමිණ හුකුටාරෝට කතා කළා.

"මොකද ඔයා මාව හෙව්වා කීවේ." ඔකියෝ ඇසුවා.

"මොකට ද රූසෝ අර ගොවි සමිතියට ගියේ."

"ආ ඒ...... මේ ඉඩම් ගොඩකරන ව්‍යාපෘතිය ගැන දැනගන්න කීවේ."

"තාත්තා තමයි ඔය මෝඩ අදහස් එයාට දෙන්නේ. ඒත් අම්මා ඒවා කරන්න ඉස්සර එයාලා ඉන්නවටයි, කෑම කනවටයි හිලව් වෙන්න අර කුඹුරේ අල අස්වැන්න ගත්තට පස්සේ ඕවා කරන්න කියන්න."

"රූසෝ ඔය සමිතියට බැඳුණේ බිරිඳගේ වද කිරීමට. දවසම කන් කෙඳිරිය. දුකයි රූසෝ ගැන."

"ඔය ගොඩකිරීම් වලින් වැඩක් නෑ. මුහුදෙන් ලොකු වතුරක් ආවොත් සේරම ඉවරයි. දුක් වින්ද එකේ ඵලයකුත් නැහැ."

"මෙහෙම ගෑනියෙක් ගත්ත නිසා රූසෝට දුක් විඳින්න සිද්ධ වුණා. අනේ දෙවියනේ ඕකිට හොඳක් සිද්ධවෙන්න එපා."

ඔෂින් සියල්ල නිහඬව අසා සිට කාමරයට ගියා. රූසෝ රාත්‍රියේ කාමරයට ආවා. ඔෂින් ලිපියක් ලියමින් සිටියා. ඒ කායෝටයි. ඇය එහි සඳහන් කළේ මේ නිවසේ තමා සතුටින්

Scanned with CamScanner

sinhalaebooks.com



සිටින බවයි. නිවසේ සියලු දෙනාම තමාට කරුණාවන්ත බවත්, එහෙත් නැවත ටෝකියෝ ඒමේ අදහස තිබෙන බවත් ඇය ලිව්වා. මෙවැනි ම ලිපියක් මවට යැව්වේ ගිය සතියේ යි.

"රූසෝ."

"ඇයි?"

"ඔය ඉඩම් ගොඩ කිරිල්ල අමාරු වැඩක් ලු. අම්මයි, අයියයි ඔයා ගැන හරියට දුක් වුණා."

"ඉතින්."

"රූසෝ අම්මා කියනවා ඉඩම් ගොඩ කරන්න කීවේ මම යි කියලා. මටත් දුකයි ඔයා මහන්සි වෙනවට. ලොකු වතුර පාරක් ආවොත් සේරම හේදිලා යනවලු."

"ඔෂින්, මුහුදු ඉඩම් අස්වද්දන එක අපේ යුතුකමක්."

"අපි නගරයට යමු රූසෝ."

"එහෙ හතර අතට ණය. එහෙ ගිහින් මොනවා කරන්න ද?"

"රූසෝ මොනවා හරි කරලා දියුණු වෙමු. අපි එහෙම දියුණු වුණේ නැද්ද, අපි දෙන්නම උනන්දු වෙලා."

"ඕවා කෙරෙන වැඩ නෙමෙයි."

"එහෙම නම් ඉඩම් ගොඩ කිරීමේ අදහස අතඅරින්න. අම්මා මට බනිනවා."

"ඇයටම දොස් කියන්න එපා නිතරම. ඒ මගෙ අම්මා. මට බෑ ඔයාගේ පැත්ත ගන්න."

"ගන්න එපා. එතකොට අම්ම ගෙ තරහ වැඩිවෙයි. අම්මා කියන්නේ මම ඔයාට කෙඳිරි ගානවා කියලා."

"ඔය මෝඩ කතා නොකියා හොඳ ලේලි කෙනෙක් වෙන්ඩ උත්සාහ ගන්නවා."

"හරි මම මොනවත් කියන්නේ නැහැ."

"මහන්සි වෙලා ආවාම නිදාගන්නවත් නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ පොරෝණයෙන් හිස සිට වසා ගත්තා. ඔෂින් වතුර භාජනය ගත්තා. එහි වතුර තිබුණේ නැහැ. ඇය කාමරය ඇර එළියට ගියා. මිටි මේසය ළඟ වාඩි වී සිටි ඔකියෝ සහ සුනිකෝ රස කැවිලි කමින් හිනැහෙමින් සිටියා.

"මොකද හොර බලන්න ආවා ද?" ඔකියෝ ඇසුවා.

"සමාවෙන්න මම උයන ගෙට යන්න ආවේ වතුර ටිකක් ගන්න."

"මේ රස කැවිලි එවලා තිබුණේ සුනිකෝ ගේ අම්මලා. අම්මලා එහෙමයි තමන් ගේ දීග ගිය දරුවන්ට සලකන්නේ. "

ඔෂින් එතනින් ඉවත්ව කාමරයට ගියා.

"මෙලහට සුවඳ වදින්න ඇති කෑම වල. හරිම කෑදරයි කෑම වලට."

දෙදෙනාම නැවත හිනැහුණා.

ඔෂින් රස කැවිලි වලට පමණක් නොවෙයි බත් කෑමට ද අප්‍රිය වී හිටියා. ඇයට නැවත දරු ගැබක්. නිශ්චිතවම දැන නොගත්තත් එසේ විය හැකියි ඇය සිතුවා. ඉන්පසු ඔෂින් හුදකලාව සිටීමට ප්‍රිය කළා. කඩිසරකම පමණක් නොවෙයි ප්‍රිය මනාප බවත් අතුරුදන් වුණා. නිතරම කල්පනා කරමින් නිහඬව සිටියා. ටකේෂි සමඟ කතා කරමින් සෙල්ලම් කළා. එහිදීත් කේන් දුන් කුඩා රබාන හඬවමින් ඇය කල්පනාවට වැටුණා. අම්මා ලිපියක් එවා තිබුණා.

**ඔෂින්,**

*ඔෂින් මම අවුරුදු සමරන්න යශිරෝ මැඩම් ගේ ගෙදර ගියා. මිස් කායෝ තමයි දැන් කගායා ව පාලනය කරන්නේ. යශිරෝ මැඩම් විශ්‍රාම අරගෙන. මීනෝ මැඩම් කියනවා කායෝ ආච්චම්මා වගේ හොඳට කගායාව පාලනය කරනවා කියලා. ඔයාගේ ලිපි ලැබිලා සතුටු වුණා ඔය ගෙදර අයගේ කරුණාව ගැන. මමත් ඒ අයට ස්තුති කළා කියන්න. යශිරෝ මැඩම් කීවේ ඔෂින්ට ඕනෑ තැනක හිත දිනාගෙන ඉන්න පුළුවන් කියලා. මිස් කායෝ දරුවෙකුට ආශා කරනවා. ඒ නිසාම මට දැනුණේ එයාට වෙනත්*

Scanned with CamScanner

sinhalaebooks.com



*විවාහයක් කර දෙන්න දෙමාපියන් උත්සාහ ගන්න බවයි. ටකේෂි, රූසෝ ආදරයෙන් මතක් කළා කියන්න.*

ඔෂින්ට පසුවදා අලුත් අවුරුදු සුබ පැතුමක් සමඟ ලිපියක් ලැබුණා. එය එවා තිබුණේ හසකාවා මැඩම්,

*ආදර ඔෂින්,*

*ඔයාට මගෙ සුබ පැතුම්. කොහොමද අවුරුදු ජය ඇති නේද? මම දැන් ටෝකියෝවේ. ආයිම බිස්නස් පටන් ගන්නවා. සාප්පුව තාවකාලිකව හදා ගත්තා. මාර්තු මාසෙ ඉඳලා වැඩ පටන් ගන්නවා. ඔයා ඉන්නවා නම් හොඳයි. කැමති නම් ඔය දෙන්නම ආපහු ටෝකියෝ එන්න.*

ලිපිය කියවූ ඔෂින් ගේ හිතේ බලාපොරොත්තුවේ පහන් සිලක් දැල් වුණා.

ආයිම ටෝකියෝ යන්න, කොණ්ඩා මෝස්තර දමන්න, මොනතරම් මිහිරි සිහිනද ඈ සිතුවා. ඒ සමඟම ඇය තීරණයක් ගත්තා.

"හොඳයි මම මෙහෙ ඉන්නේ මාර්තු වෙනකල් විතරයි. මාර්තු වෙනතෙක්......." ඇය සිතේ දෝංකාරය දුන්නා. නිවසේ සියලු දෙනා අවුරුදු මේසයට වාඩි වී සිටියා.

"කෝ ඔෂින්." තාත්තා ඇසුවා.

"එයා ඔහෙ හිටපුදෙන්. දැන් කතා බහක් නැහැනේ තනියම ඉන්නවා." ඔකියෝ කිව්වා.

"රූසෝ අපිත් එක්ක අවුරුදු සමරන්නේ කොච්චර කාලෙකට පස්සේ ද? කන්න රූසෝ හොඳට කන්න. ඔයා ආසා දේවල් මම හැදෙව්වා. මෙන්න සකේ."

ඔෂින් කාමරයට ගොස් ටකේෂිව නිදි කළා. කිමෝනාව තුළින් හසකාවා මැඩම් එව් සුබ පැතුම් පත ගෙන එය නැවත කියෙව්වා. සිප ගත්තා. සකේ බී මත් වී කෑගසන රූසෝ ගේ හඬ ඇසෙන විට ඇය තුළ ඇති වුණේ අමනාපයක්. ඇය හැර දමා ඔහු ප්‍රීති වන අයුරු........

ටික වේලාවකින් රූසෝ කාමරයට පැමිණියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින්, මොකද මේ පුම්බාගෙන. අම්මට තරහ ඔයා මූණ එල්ලාගෙන ඉන්නවාටයි."

"ඕන කමෙන් ඉන්නවා නෙමෙයි නේ."

"එහෙම නම් අවුරුදු කෑමට නාවේ මොකද?"

"මම ඔතනට ආවා නම් ඔයාලගේ සතුට නැතිවෙනවා. ඒකයි නාවේ."

"ඔහොම ගියාම ඔයා කොන් වෙයි. උත්සාහ කරන්නේ නැද්ද අම්මගෙ හිත දිනාගන්න."

"මටත් ඕනෑ අම්මගෙ හිත දිනාගන්න තමයි රූසෝ. මොනවද ඒ වෙනුවෙන් මම කරන්න ඕනෑ."

"ඇයි හිත දිනාගන්න පුළුවන්ද ඔහොම ඉන්න කොට."

"එක අතකට දැන් මොනවා වුණත් එකයි. රූසෝ අනේ රූසෝ අපි ආපිට ටෝකියෝ යමු."

ඔෂින් රූසෝ ගේ අත අල්ලාගෙන කිව්වා.

"මෝඩ කතා නවත්වනවා. මගෙ බලාපොරොත්තුව ඉඩම ගොඩකරන එක. තමන්ට ම කියලා ඉඩමක් තියෙනවා නම් ඒක කොයිතරම් වටිනවද?"

"මෝඩකම මගෙ කතාව නෙමෙයි. ඔය හේදී යන ඉඩම් ගොඩකිරීමයි."

"බැහැ මේ ගෑනිත් එක්ක සැනසිල්ලේ ඉන්න නෑ. මම යනවා වෙන කාමරයකට."

රූසෝ මව ඉදිරියට ගියා.

"අම්මා මට වෙන කාමරයක් දෙන්න. අටුව වුණත් කමක් නෑ. මට ඔෂින් ඇතිවෙලා මට ඕනෑ දේ කරන්න දෙන්නේ නෑ."

"රූසෝ මොනවද ඔය කියන්නේ?"

තාත්තා සැරෙන් කතා කළා.

"ඔෂින් එක්ක කරදරයි තාත්තා."

Scanned with CamScanner

sinhalaebooks.com



"වැරදියි රූසෝ ඔයා ඔහොම කියන එක. මට තේරෙනවා සේරමලා ඔෂින් ව කොන් කරලා. දැන් ඔයත් පටන් ගත්තා. ඔයා ඔෂින්ට ආදරේ කළා. ඇයව විවාහ කරගත්තේ ඒකයි."

"රූසෝට වැරදුණේ එතනින්. දැන් එයාට වැරැද්ද තේරිලා. රූසෝ අපේ කාමරයට අල්ලපු කාමරය මම ඔයාට පිළියෙල කරලා දෙන්නම්. මේ ගෑනි බැඳගත්තු නිසා සේරම නැතිවුණා."

අවුරුදු සැමරීමට පැමිණ සිටි හට්ෂුකෝත් එතැනට ආවා.

"රූසෝ තනියම හිටියා නම් ඔහොම වෙන්නේ නෑ. ඔයා තාම පරක්කු නෑ. සාගාවල කෙනෙක් බඳිමු. මගෙ යාළුවෝ ඉන්නවා. මම අයියට ඒ කෙනෙක් අඳුන්නලා දෙන්නම්."

"නවත්ත ගන්නවා ඔය කතා. රූසෝට ඔෂින් ව අතාරින්න දෙන්නේ නෑ මම." තාත්තා කෝපයෙන් කිව්වා.

"කීවේ නෑ මම ඔෂින් අත අරිනවා කියලා. මට ඕනෑ තනියම ඉන්න. එයා හිතුවක්කාර වුණාට ඒ මගෙ බිරිඳ. දරුවෙකුත් ඉන්නවා."

"ඔය දරුවා මම බලාගන්නම්. එයාට ඕනෑ තැනක යන්න කියනවා. සුකි එනවා. අර කාමරයට ගිහින් රූසෝ මහත්තයගෙ මෙට්ටය අරගෙන එනවා."

සුකි සමඟ ඔකියෝ රූසෝ ගේ කාමරයට ගියා.

"ඔෂින්, අපි රූසෝ ගේ මෙට්ටය ගෙනියනවා. එයාට දැන් ඔයාව එපා වෙලා. රූසෝ ගේ අවාසනාව ඔයා වගේ ගෑනියක් බැඳගත් එක. දැන් ඉතින් සැමියා වෙන් වුණා වගේ තමයි. මේ අහන්න තව දුරටත් මේ ගෙදර ඉන්න ඕනෑ නෑ. ඕනෑ වෙලාවක මෙහෙන් යන්න. රූසෝත් ඒකට අවසර දීලා තියෙන්නේ."

ඔෂින් සියල්ල අසා සිටියා. ඇය දැනගෙන හිටියා මේ ඉරණම තමාට අත්වන බව. දැන්නම් තමා පිට වී යෑම අවශ්‍ය ම බව ඇයට සිතුණා. අම්මා, කායෝ, හසකාවා මැඩම්, කෝටා ආදීන්ගේ මුහුණු සෑම අඳුරු මුල්ලකින් ම මතු වී ආවා. වකේෂි පමණක් නොවෙයි නූපන් දරුවාත් රැගෙන පිටව යෑමට ඇය අදිටන් කර ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



මාර්තු වෙනකල් විතරයි...... මාර්තු වෙනකල් විතරයි. ඇයගේ සිතේ දෝංකාරය දුන්නා. ඇය ලේන්සුවක ඔතා තිබූ බෝනික්කා ගෙන ඇය ඉදිරියේ තබා ගත්තා. පුංචි ම කාලේ අම්මා ඇයට අරගෙන දුන් ලී බෝනික්කා.

"අම්මා, මම පසුබට වෙන්නේ නෑ අම්මා. සරත් කාලය ආවාම මම ටෝකියෝ එනවා. අම්මා මගෙ හිතට ධෛර්ය දෙන්න."

විශේෂයෙන් ඔකියෝ ඇයගේ සිත රිදවන විට ඇය බොහෝ විට ගෙන්ජි ගේ සොහොන ළඟට ගොස් තමන් ගේ දුක කියා සිත සනසා ගත්තා.

භූමිකම්පාවෙන් පසු ආපිට නිවසට එන විට ගෙන ආ ගෙන්ජිගේ අළු තැන්පත් කර ඔෂින් ගේ පියා සොහොනක් සෑදුවේ කුඩා කල සිට එම නිවසේ හැදුණ වැඩුණ ගෙන්ජි ඔවුනට කළ සේවයට ගරු කිරීමටයි.

එදත් ඔෂින් කැලෑමල් මිටක් කඩාගෙන ගෙන්ජි ගේ සොහොනට ගියා.

ඇය එතන වූ වල්පැළ අතින් කඩා දමා ඇය ගෙන ගිය මල් එහි වූ උණ බම්බුවක දමා සොහොනට වැන්දා.

"ගෙන්ජි මට ශක්තිය ලබා දෙන්න ආපිට ටෝකියෝ යන්න. මම දන්නවා ඔයා මළවුන් අතර වුණාට මගේ දුක ඔයාට තේරෙනවා."

"අයියෝ කවුරුත් නැද්ද මෙන්න ගෑනු කෙනෙක් විලට පැනලා."

මේ වෙලාවේ විලාප හඬක් ඇසී ඔෂින් දරුවාත් රැගෙන හඬ ආ පැත්තට දිව්වා.

කීප දෙනෙක්ම විලට පැන්න කාන්තාව ගොඩට රැගෙන ඇය දෙස බලාගෙන හිටියා. ඔෂින් ඔවුන් අස්සෙන් රිංගා ගෙන ගියා.

"මොනවා මේ සාවා නේද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"සාවා..... සාවා...... මොකද මේ." ඔෂින් සාවා ගේ කම්මුල් වලට තට්ටු කරමින් කතා කළා.

"අනේ ඉක්මනට රෝහලට ගෙනියන්න."

"රෝහලට ගෙනියන්න ඕනෑ නෑ. කතා කරන්න. සිහිය ආවොත් හරි."

ඔෂින් බොහෝ වාරයක් කතා කරන විට සාවා සෙමෙන් ඇස් ඇරියා. සාවා නිවසට රැගෙන ගියේ ඔෂින්. එය සාවාත් සාරෝත් ජීවත් වූ කුඩා පැල්පතයි. සාරෝ ගේ මවගේ නිවසට ඔවුන් වැද්දාගෙන තිබුණේ නැහැ. සාවා සියදිවි හානි කර ගැනීමට තැත් කළේ ඇයගේ නැන්දම්මා හා සොයුරියන් ගේ කෙනෙහිලි කම් නිසා බව ඔෂින් දැන සිටියා. මුලදී ගේෂා කාන්තාවක් වූ සාවා ගේ අතීතය සිහිපත් කරමින් ඔවුන් ඇයට අපහාස කළා. සාරෝටත් අපහාස කළා. සාරෝ නිතරම තම බිරිඳගේ පැත්ත ගන්න නිසයි ඒ.

ඔෂින්ටත් බියක් දැනුණා. තමාත් මෙවැන්නක් කිරීමට පෙළඹේදැයි ඇයට සිතුණා. ඒ නිසාම මාර්තු මාසයේ ටෝකියෝ ගමන ගැන ඇය දැඩි තීරණයක හිටියා. ඒත් සඳ ඇති රාත්‍රියක ඔෂින් සාවා බැලීමට නිවැසියන්ට හොරෙන් ම ගියා. සාරෝ පැල්පතේ නොසිටි නිසා ඔෂින් සාවා සමඟ කතා බහ කළා නිදහසේ ම.

"ඇයි ඔෂින් රෑ වෙලා."

"දවල් කාලයට එන්න බැහැනේ."

"අනේ ටකේෂිට නින්ද ගිහින්. ඔෂින් මට නම් දැන් මෙහෙ එපා වෙලා."

"මෙහෙ එපා වුණාට ජීවිතයට නම් හානියක් කරගන්න එපා. ඉස්සර ඔයා මාව සැනසුවා. ඉවසීම හොඳයි කිව්වා. ඒක ගෑනුන්ගේ යුතුකමක් බව කිව්වා."

"ඒක ඇත්ත. ඒ වුණාට ඔෂින් මගෙ අතීතය මකා දමන්න බැහැ. මට දුකයි සාරෝට අම්මලා, නංගිලා අපහාස කරන කොට. එයා ඒ ගොල්ලන් එක්ක මම නිසා නිතරම රණ්ඩු කරනවා. එදා

Scanned with CamScanner

sinhalaebooks.com



මම මැරුණා නම් හොඳයි. මම කිව්වා සාරෝට ගෙදර ගිහින් ඉන්න. මම තනියම ඉන්නම් කියලා."

"සාවා සාරෝ ඔයාට ආදරෙයි."

"ඒක ඇත්ත, කොහොමත් මම වැඩිකල් මෙහෙ ඉන්නේ නෑ ඔෂින්."

"සාවා අපි යමුද ටෝකියෝ. එහෙ අපට ඕනෑ දෙයක් කරන්න පුළුවනි. මට කොණ්ඩ සකස් කරන සාප්පුවක නෝනා කෙනෙක් එන්න කියලා තියෙනවා. ඔයාටත් මම රස්සාවක් හොයලා දෙන්නම්."

"ඔෂින් ඇත්තටම ඔයා ටනකුරා ගෙදරින් යන්න ද හදන්නේ?"

"ඔව් සාවා, එහෙම නොගියොත් මමත් ඔයා කළදේම කරයි."

"ඔෂින් මොනවද මේ කියන්නේ?"

"ඒකයි මම ටෝකියෝ යන්නේ. ඔයාටත් එහෙ යන එක හොඳයි. එහෙ අය ඔයාගේ මුල් ජීවිතය දන්නේ නැහැ නේ. රස්සාවක් කරගෙන ඉන්න පුළුවන්. පුළුවන් නම් සාරෝත් ගෙන්න ගන්න පුළුවන් ඔයාට."

"ඔෂින් ඔයා යන්නේ තනියම ද?"

"මම යන්නේ ටකේෂිව අරගෙන."

"එතකොට රූසෝ."

"එයා දැන් මෙහෙ වැඩක යෙදිලානේ. අපි පස්සේ මුණගැහෙනවා. ඔයා යන්න කැමැති නම් මම පස්සේ විස්තර කියන්නම්. ඔයා අනිද්දට පන්සල ළඟ ගහ ගාවට එන්න උදෙන්ම."

"ඔෂින් දැන් හුඟක් රෑ වෙලා. එහෙම නම් ගෙදර යන්න පරිස්සමෙන්."

ඔෂින් ටකේෂිත් රැගෙන සෙමෙන් නිවසට ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"දැන් අපි සද්ද නොකර දොර අරිමු."

එහෙත් නිවසේ ඉදිරි දොර අගුලු දමා තිබුණා.

"දැන් මොකද කරන්නේ. එහෙම නම් එළිවෙනකල් ඇවිද ඇවිද ඉඳිමු නේද පුතේ."

එහෙත් ටික වෙලාවකින් දොර ඇරගෙන එළියට ආවේ රූසෝ. ඔහුගේ අත ලන්තෑරුමක් විය. තාත්තා ද ඒ සමඟ ආවා.

"ඔෂින්."

"ආ මේ ඉන්නේ ඔෂින්, කොහේද ගියේ?"

"සමාවෙන්න කරදර කිරීම ගැන ලස්සණට හඳ පායලා තිබුණා. ටිකක් ඇවිදින්න ගියා."

"හා..... හා...... දැන් එන්න ඇතුළට."

"ආ ඔය ඇවිල්ලා ඉන්නේ. පැනලා ගිහිල්ල ද?" ඔකියෝ කිව්වා.

"හඳ එළියෙ ඇවිදලා." රූසෝ හිනැහුණා.

"අපි දන්නව ද කොහෙ ද ගියේ කියලා."

ඔෂින් කාමරයට ගියා. රූසෝ දරුවා ලිහා මෙට්ටය මත තිබ්බා.

"සමාවෙන්න රූසෝ, මම හිතුවේ නැහැ ඔයා මා ගැන වද වෙයි කියලා."

"ඔය මෝඩ වැඩ නවත්වන්න ඔෂින්. මෙන්න ඔයාට ලිවුමක් මැඩම් හසකාවාගෙන්."

***සාප්පුව තාවකාලිකයි. බිස්නස් පටන් ගත්තා. වැඩ ලැබෙනවා. ඔයා නම් සාගා වලට හුරු වෙලා ඇති. ඒත් ඔයා ආපිට එනවා නම් ආදරයෙන් පිළිගන්නවා.***

මේ ලිපිය ඔෂින් ගේ බලාපොරොත්තු වලට, තීරණ වලට ශක්තියක් ගෙන දුන්නා. ඇය උදේම ගොස් සාවා මුණ ගැහුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මෙතන තියෙනවා යෙන් 30ක්. අපි දෙන්නට ම ටිකට් ගන්න. හැබැයි වෙන වෙනම ඔයා ළඟම තියෙන ස්ටේෂමෙන් නගින්න. අවුරුදු දවසට කාටවත් මාව මතක නෑ. එදාට තමයි අපි යන්නේ."

ඒත් සාවා හිටියේ බියෙන්.

"ඔයා ගියාම ස්වාමියා තනිවෙනවා ඔෂින්."

"නැහැ අම්මා කැමතියි මම යනවට. මේ තාවකාලික සමුගැනීමක් නේ.

ඔෂින් ආපිට යන්න හැරෙන විටම ඇයට වමනය ගියා.

"ඇයි ඇයි ඔෂින්?"

"නැහැ මට නින්ද යන්නේ නෑ. ටෝකියෝ ගමන ගැන තියෙන උනන්දුව නිසා. එහෙම නම් සාවා ඔයාට මතකනේ. උදේ කෝච්චියට මම එනවා."

ඔෂින් දැන සිටියා ඇයට දරුවෙක් ලැබෙන්න බව. ඒත් ඒ දරුවා නිසාවත් ඇය ගත් තීරණය වෙනස් කළේ නැහැ. මේ ගමනින් මට වගේ ම සාවාටත් හොඳක් වෙනවා. ඇය සිතුවා.

එදා අවුරුදු සැමරුම් දිනය. ඔෂින් තමාට අයිති ඇඳුම් කීපය ඉණට තබා පටියකින් බැඳ ගෙන හොඳ කිමෝනාවක් ඇඳ ගත්තා.

"මොකද මේ හොඳම කිමෝනාවකින් සැරසිලා." රූසෝ ඇසුවා.

"අද උත්සව දිනයක් නේ ඒකයි." ඔෂින් හිනැහෙමින් කිව්වා.

"ඔෂින් මගෙ වැඩිමල්ම සොහොයුරා ඇවිල්ලා. කමජිරෝ."

"ආ අර ලුතිනන් ද?"

"ඔව්, එයාට ඔයාව මුණගැහෙන්න ඕනැලු."

"හොඳයි."

රූසෝ දරුවා රැගෙන ගියා. ඔෂින් සාලයට ගොස් සොයුරාට

Scanned with CamScanner

sinhalaebooks.com



ආචාර කළා.

"සතුටක් දැකගන්න ලැබීම."

"මටත් සතුටක්. බොහොම ලස්සණ ළඳක් නේද රූසෝ."

"ඔයාටත් ඉන්නෙ ලස්සණ බිරිඳක්. එයත් එක්කගෙනයි එන්න තිබුණේ." ඔකියෝ කිව්වා.

"එයා කැමති නැහැ මෙහෙ එන්න."

"ඔෂින් මෙන්න ඔයාට පොඩි තෑග්ගක්. සිල්ක් බඳ පටියක්. ඔෂින් ඒක ගන්න."

"ස්තුතියි." ඇය බඳ පටිය අතට ගත්තා.

"මේ ටකේෂි." රූසෝ කිව්වා.

"එහෙම නම් එයා ලොකු වුණාම යුද්ධ භටයෙක් වෙයි. ඒක නෙමෙයි රූසෝ ආපිට ටෝකියෝ යන්නේ නැද්ද? දැන් ටෝකියෝ දියුණු වෙලා."

"මට මෙහෙ හොඳයි."

"එයාලට ආපිට යන්න බෑ කමජිරෝ හතර අතට ණය. මෙහෙ ඉඩම් ගොඩ කරනවා."

"මෝඩ වැඩ."

"ඔෂින් මොකද මෙතන කරන්නේ? හොඳ කිමෝනාවක් ඇඳගෙන. අර බෝංචි වැල් වලට පන්දල් හිටවලා එන්න."

"අද අවුරුදු මොටද වැඩ කරන්නේ."

"අවුරුදු කියලා බෝංචි වැල් නොවැඩී තියෙන්නේ නැහැනේ."

ඔෂින්ටත් හොඳ අවස්ථාවක්.

"හොඳයි මම දැන්මම යන්නම්."

"ලේලිගේ ජීවිතය දුක්ඛිතයි වගේ. මගෙ බිරිඳ නම් ඕවා ඉවසන්නේ නෑ. මෙයාලට යන්න තැනක් නැහැනේ. ඉතින් ඉවසන්න වෙනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"ආ... හට්සුකෝ ඔයා නිතරම මෙහෙද ඉන්නේ. අම්මා අර සුතිකොට නිදහස දීලා මෙයා ගෙන් වැඩ ගන්න."

"අනේ හට්සුකෝ එහෙ හරියට වැඩ. වැඩ වැඩි කමට තවම දරුවෙක්වත් නැහැ."

"නෑ අම්මා මම කියන්නමයි හිටියේ. මට දරුවෙක් ලැබෙන්න යනවා."

"ආ..... ඔය ඇත්තම ද? දුව. මට හරිම සතුටුයි. මේ ඇහුණද ඔන්න ඔයාට තවත් මුණුබුරෙක්."

ඔෂින් කාමරයේ කතා වලට කන් දුන්නා.

"එහෙම නම් ගෙනෙන්න සකේ. අපි මේ ප්‍රීතිය සමරමු. සුතිකෝ ඉක්මන් කරන්න."

ඔෂින් ටකේෂිත් වඩාගෙන එළියට ආවා.

"ඔෂින් මම ටකේෂි බලාගන්නම්." කමජිරෝ කිව්වා.

"නැහැ මට පුළුවනි එයා එක්ක වැඩ කරන්න."

"ඕවා ඔෂින්ලට පුරුදුයි. මොකද අඳ ගොවියෙක් ගේ දුවෙක් නේ."

ඔෂින් ලී කෝටු මිටියක් ඔසවාගෙන ඉක්මනින් ගියා. ටික වේලාවකින් ලී ටික කැලෑවට විසිකර දමා ඇය වෙනත් පාරකින් දුම්රිය පොළට ළඟ ම තැනකට ගොස් දුම්රිය පැමිණෙන තෙක් ගසක් යටට වී සිටියා. මේ අතරතුර තවත් සිදුවීමක් සිදු වුණා. රූසෝට ගොවියෙක් ලිපියක් ගිහින් දුන්නා. ඔහු එය දිග ඇරියා. **හදිසි උවමනාවක් ඉක්මනින් මා හමුවන්න. මම මඟ ඉන්නවා. සාවා.**

රූසෝ ටිකක් වෙලා කල්පනා කර සාවා මුණගැහෙන්න ගියා.

"ඇයි මේ?"

"රූසෝ ඔෂින් ගෙදරින් පැනලා යනවා."

"ඔෂින් පැනලා යනවා? ඔයා දන්නේ කොහොම ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"මට තමයි ප්‍රවේශපත්‍ර ගන්න මුදල් දුන්නේ. එයා දුක් විඳිනවා. ඒ නිසයි ටෝකියෝ යන්න හිතුවේ. ඒත් රූසෝ ඔයා නොදන්නවා වුණාට එයා ගැබිනියක්."

"ගැබිනියක්!"

"ඔව්, කතාකරන්න වෙලාවක් නෑ. ඉක්මනින් දුම්රිය පළට යන්න."

රූසෝ දුවන්න පටන් ගත්තා. ඔෂින් කැලෑවේ අනිත් පැත්තෙන් මතු වුණා. රූසෝ දුටු විට ඇය බය බිරාන්තව නැවතුණා.

"ඔෂින්, ඔෂින්."

එහෙත් ඇය දුම්රිය පළ පැත්තට දුවන්න වුණා. වේගයෙන් දුව ආ රූසෝ ඇය අල්ලා ගත්තා.

"මම ඔයාට යන්න දෙන්නේ නෑ ඔෂින්. මොකක් ද මේ හැදුන පිස්සුව."

"රූසෝ කරුණාකරලා මට යන්න දෙන්න."

"නැහැ යන්න දෙන්නේ නැහැ."

ඔෂින් රූසෝ තල්ලු කර ගෙන යන්න උත්සාහ කළා. රූසෝ ඇයට කම්මුල් පහරක් දුන්නා. ටකේෂිව උදුරා ගත්තා.

"එහෙම නම් ඔයා ටකේෂි දමලා යන්න."

"බැහැ මට ටකේෂි ඕනෑ. මම ටනකුරා පවුලට අයිති නැහැ. කරුණාකරලා මට යන්න දෙන්න. නැත්නම් රූසෝ අපි යමු ටෝකියෝ. ඔයත් එන්න මා එක්ක යන්න."

"මට ඔෂින් ඔහේ ඇතිවෙලා. මම යන්නේ නැහැ ටෝකියෝ."

"ඔව් හරිම බයගුල්ලා. ගෙට වෙලා හැංගිලා. බිරිඳ රකින්නෙ නැති මිනිහෙක්. දරුවා මගේ. දරුවා දෙනවා මට යන්න ඕනෑ."

ඔෂින් දරුවා උදුරන්න ගත්තා. රූසෝට හොඳට ම කේන්ති ගියා. ඔහු ඔෂින්ට හොඳ පාරක් දුන්නා. ඇය කරකැවී අසල වූ

Scanned with CamScanner

sinhalaebooks.com



ගලක් මත ඇදගෙන වැටුණා. හිස ගලෙහි වැදී ඇය සිහිසුන් වුණා. රූසෝ මඳ වේලාවක් බලා සිටියා. අඬන ටකේෂිත් බදාගනම,

"ඔෂින්, ඔෂින්."

රූසෝට දැනුණේ බියක්. ඔහු ටකේෂි බිම තබා ඔෂින් ගේ හිස ඔසවා ගත්තා. ඇයගේ හිසෙන් හා කනෙන් ලේ ගලමින් තිබුණා. රූසෝ ළඟ වූ විලෙන් වතුර ගෙනැවිත් ඔෂින් ගේ මුහුණට දැම්මා. සෙමෙන් දෙනෙත් විවර කළ ඔෂින්,

"මගෙ දරුවා, මට කෝච්චියට නගින්න ඕනෑ." කිව්වා.

"ඔෂින් ඔයාට තුවාල වෙලා. අපි ගෙදර ගිහින් තුවාලයට බෙහෙත් දමමු."

"මට ගෙයක් නෑ. මම ටනකුරා ගෙදරින් පිටවුණා. ආයි යන්න බැහැ."

"එහෙම නැහැ. ගෙදර කවුරුත් දන්නේ නෑ ඔයා ගිය බව. මම කියන්නම් ඔයා කුඹුරේදී වැටුණා කියලා. ඔයත් කියන්න එපා."

එවිටම සාවා ද දුව අවා.

"ඇයි රූසෝ ඔෂින් ට මොකද වුණේ."

"සාවා මම ඉක්මනට කරත්තයක් අරගෙන එන්නම්. ඔයා ටිකක් ඔෂින් එක්ක ඉන්න."

"ඔෂින්, ඔෂින්."

"මට මැරෙන්න දෙන්ඩ සාවා. මම හිතුවේ නැහැ ඔයා මාව පාවා දෙයි කියලා."

"සමාවෙන්න මම ඔයා ගැනයි හිතුවේ. ඔයාට දරුවෙක් ලැබෙන්න. ටකේෂිත් අරගෙන ගිහින් මොනවා කරන්න ද?"

"මිත්‍රයෝ ඉන්නවා මට ටෝකියෝ වල."

"ඒත්, ඒත් ඒ යාළුවෝ විතරයි. යාළුවන්ගෙන් සේරම ඉල්ලන්න බැහැනේ. මෙහෙ සැමියා ඉන්නවා. මේ දරුවත් ලැබුණට පස්සේ ඔයා රූසෝ එක්ක ම යන්නකෝ."

Scanned with CamScanner

sinhalaebooks.com



සාවා කියන කිසිම දෙයක් ඔෂින්ට ඇසුණේ නැහැ. නැවතත් ඇය සිහිසුන් වුණා. රූසෝ ඔෂින් ව කරත්තයක තබා නිවසට ගෙන ආවා. අකමැත්තෙන් වුවත් ඇයට නැවත ආපිට නිවසට පැමිණීමට සිද්ධ වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com

# දොළහ

සියලු දෙනාම කෑම කාමරය ළඟ කමජ්රෝ සමඟ කතාබහ කරමින් හිටියා. රූසෝ ඔෂින් ඔසවා ගෙන ගෙට ආවේ,

"දොස්තර කෙනෙක් ගෙන්වන්න. ඔෂින්ට තුවාල වෙලා."

"තාත්තා කවුරු හරි යවන්න. දොස්තර ගෙන්වන්න. රූසෝ ඔහොම කාමරයට ම ගෙනියන්න." කමජ්රෝ කලබලයෙන් කිව්වා.

"ආ..... මොකද මේ ඔච්චර අමාරු නැතිව ඇති. අර අල්මාරියේ තෙල් බෝතලයක් ඇති ඒකෙන් ටිකක් ගාන්ඩ."

ඔකියෝ කීවේ තරහින්. ටකේෂි හිටියේ රූසෝ ගේ පිට මත.

"කෝ දෙන්ඩ දරුවව. එයා කොහේ ගිහින් ද? මේ දරුවගේ තෙත රෙදි ඉවත් කරලත් නැහැ."

"ඉන්න රූසෝ මටත් ප්‍රථමාධාර කරන්න පුළුවනි. ලොකු තුවාලයක් වගේ. අපි ඒක පිරිසිදු කරමු වෛද්‍යවරයා එනතෙක්."

"ස්තුතියි අයියා."

"කොහොමද මේ තරම් ලොකු තුවාලයක් වුණේ." තාත්තා ඇහුවා.

"ගස් නැග්ගා ද දන්නේ නැහැ. කුඹුරේ වැටෙන්න විදිහක්

Scanned with CamScanner

sinhalaebooks.com



නැහැනේ." ඔකියෝ කිව්වා.

"කෝකටත් දොස්තරට පෙන්වන එක හොඳයි."

"ඔෂින්ට කොහොමද මෙහෙම තුවාල වුණේ. ඈ..... රූසෝ."

ඔකියෝ ගේ ප්‍රශ්න හමුවේ රූසෝ නිහඬව සිටියා.

"කවුරු මොනවා කිව්වත් මේක දැනගන්න ම ඕනෑ. උදේ ගෙදරින් ගියේ. මේක ගැන රූසෝ මොනවා හරි දන්නවා. ඒකයි නිහඬ."

"මම මොනවත් දන්නේ නැහැ."

"එහෙම නම් කොහොමද දන්නේ තුවාල වෙලා කියලා."

"මට කෙනෙක් කිව්වා."

"මේ අම්මා තුවාලෙට ලුණු බඳින්නේ නැතිව ඉන්න." කමජිරෝ කිව්වා.

ටිකකින් වෛද්‍යවරයා පැමිණියා. ඔහු තුවාලයට බෙහෙත් දමා වෙළුම් පටි දැම්මා. අවසානයේ ඔහු කීවේ,

"මේ තුවාලය බරපතළයි. තද උණ හැදිලා වරින් වර සිහිය නැතිවෙයි. මොකද හුඟක් ලේ ගිහිල්ලා. පෝෂ්‍ය කෑම හා විවේකය අවශ්‍යයි ලෙඩාට."

"ඔක්කොම ඔෂින් කරන්නේ අපරාධ. දැන් මේ බෙහෙත් වලට වියදම්. ඒ මදිවට එයා බලාගන්නත් කෙනෙක් ඉන්න වෙනවා."

"මම එයාව බලාගන්නම්." රූසෝ කිව්වා.

"දැන් ටකේෂි බලාගන්නත් එපා යැ. සුනොකුටයි මටයි තමයි වැඩ වැඩිවෙන්නේ. හොඳ වෙලාවට ටකේෂිට කෑඳයි තැම්බූ අලයි දෙන්න පුළුවන් වුණේ. "

සුනිකෝ දරුවා වඩාගෙන ගියා.

"ඔෂින් ඕක හිතලා කළේ නැහැනේ. අපි එයාට උදව් කරමු." තාත්තා කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔය කෙල්ල මොටද කැලේ ගියේ."

"අද අවුරුදු නිසා කුඹුරෙත් කවුරුත් නැහැ. කම්මැළි හිතෙන්න ඇති. එයා ආසයි නේ පරිසරයට. කැලෑව බලන්න යන්න ඇති."

මෝඩ හිනාවක් සමඟ රූසෝ කිව්වා.

"ඔකියෝ කෑ නොගහා එළියට එනවා. ලෙඩාට ඉන්න දීලා." තාත්තා කිව්වා.

දින දෙකක් ගත වුණා. රූසෝ ඔෂින් ගේ හිස අතගෑවා. ඇය සෙමෙන් ඇස් ඇරියා.

"ඔෂින් දැන් කොහොමද?"

"රූසෝ මම හීනයක් දැක්කා. අපි ටෝකියෝ ගියා. ඒත් ඇත්තට ම යන්න බැරිවුණා නේ."

"ටෝකියෝ අමතක කරන්න. හොඳ වෙන්න බලන්න."

"රූසෝ කෝ පුතා."

"අම්මා පුතාව බලාගන්නවා. ඒ ගොල්ලන්ට දුකයි ඔයාට වුන දේට."

"ඔෂින් සමාවෙන්න. මම හිතුවේ නැහැ මෙහෙම වෙයි කියලා. මගෙයි සම්පූර්ණ වරද. මම කීවේ නෑ මොනවත්. ඔයත් කියන්න එපා."

"ඒත් හොඳ වුණාම මම ටෝකියෝ යනවා."

"ඔෂින් සනීප වෙන්න. අනිත් අය ඔයාට පිහිට වෙයි. දැනගන්න අරින්න එපා ඔයා ගේ ටෝකියෝ ගමන ගැන."

රූසෝ උයන ගෙට ගියා.

"සුනිකෝ ඔෂින්ට කැඳ ටිකක් හදන්න හාල් ටිකක් දෙනව ද?"

"ආ රූසෝ ඒ පාර ගෑනිට කැඳ හදන්නත් යනවද? ඔහොම අනුකම්පා කරන්න ගියොත් ඔෂින් තව ටිකක් ඇඳටම වෙලා ඉඳියි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඉන්න මම හදලා දෙන්නම්."

සුනිකෝ කිව්වා.

සුනිකෝ කැඳ කෝප්පයක් සකස් කර දුන්නා.

"ඔෂින් ටිකක් ඉස්සෙන්න."

රූසෝ ඔෂින් කොට්ටය මත රඳවා හැන්දෙන් කැඳ පෙව්වා.

"රූසෝ කෝ ටකේෂි? මට ටකේෂිව ගෙනත් දෙනව ද?"

"දැන් බෑ ටකේෂි ගැන වදවෙන්න එපා. අම්මා ටකේෂිව බලාගන්නවා."

"අම්මයි, තාත්තයි, සුනිකොයි ඔයා ගැන වදවෙනවා. ඒගොල්ලන් ගැන තරහ වෙන්න එපා. අම්මා තරහ වුණේ අපේ කසාදය නිසානේ."

ටික වේලාවකින් ඔකියෝ කාමරයට ආවා. ඔෂින් කතා කළා.

"සමාවෙන්න අම්මා මම කරදර කරනවාට."

"ඔෂින් ඇත්ත කියන්න. ඔයා කොහේ හරි ඇවිදින්න ගියා නේද? මේ මෝඩ රූසෝ රැවැට්ටුවට මාව රවට්ටන්න බෑ. මගෙ ගෙදර ඉඳගෙන මට බොරු කියන්න දෙන්න බෑ. මම ඇත්ත බොරුව හොයා ගන්නම්."

"රූසෝ මෙන්න ඔෂින් ගේ බෙත්." තාත්තා කාමරයට ආවා.

"හැමෝම ඔෂින් ගේ වැඩ." ඔකියෝ කෝපයෙන් ඉවත් ව ගියා.

"මෙහෙ ජීවත් වෙන්න හරි අමාරුයි එයා එක්ක. බැඳපු ගමන් සුනිකෝට ත් එහෙමයි. අවුරුදු දහයක් ගියාට පස්සේ එයාට ගැළපුණේ. ඉවසන්න ඔෂින් එතකොට ඔයාටත් මේ ගෙදර කෙනෙක් වගේ ජීවත් වෙන්න පුළුවනි."

"හොඳමයි." තාත්තා කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



තවත් දින දහයක් පමණ ගෙවී ගියා. ඔෂින් අමාරුවෙන් ඇවිද්දත් දකුණු අත නම් හොල්ලන්න බැරි වුණා. ටකේෂි අඬන හඬ අසා ඔෂින් අමාරුවෙන් එළියට ගියා. සුනිකෝ කෑම රැගෙන ආවා.

"ඔයා විවේක ගන්න. අම්මා හොඳට ටකේෂි බලාගන්නවා. ඔයා වදවෙන්න එපා."

ඔෂින් අමාරුවෙන් කෑම කෑවා. ඇයට තම කුස දෙස බැලුණා. මේ කරදර මැද්දේ දරුවාත් වැඩෙමින් සිටියා. මේ දරුවා ටනකුරා ගෙදරට අනවශ්‍ය බබෙක් බව ඔෂින්ට හිතුණා. ඇයට ඒ දරුවා ගැන දුක හිතුණා. රූසෝ කාමරයට ආවා.

"දැන්නම් තුවාල වේළීගෙන එනවා නේද? "

"ඔයත් වදවෙනවා නේද?"

"ඒක මගේ වගකීමනේ."

"රූසෝ අම්මා ටකේෂිව බලාගන්නවා. සුනිකෝ මට කෑම හදලා දෙනවා. දොස්තරලාටත් වියදම් වුණා නේ. භූමිකම්පාව වෙලාවේ කායෝ එව්ව යෙන් සීයෙන් ටිකක් වියදම් වුණා. ඉතිරි සල්ලි අපි අම්මලාට දෙමු."

"මොනවා ඔෂින් ඒ අයගේ කරුණාවට සල්ලි ගෙවන්න.?"

"නෑ රූසෝ මම ඒගොල්ලන්ට ණය ගැතියි."

"ඔහොම සල්ලි දුන්නා ම හරි ද?"

"නෑ රූසෝ අපි දෙන්නගෙ කෑමටත් වියදම්. දැන් ඔයාටත් කුඹුරට යන්න නෑ. මටත් යන්න ලැබෙන්නෙත් නෑනේ. පස්සෙ දොස් අහන්න වෙයි. ඒකයි."

"තේරෙන්නේ නෑ ඔයාට අනිත් අයගේ කරුණාව."

"අම්මා පස්සෙ දොස් කියයි."

"අම්මටම බනින්නේ නැතිව ඔයා ගේ අඩුපාඩු හදාගන්න."

රූසෝ ඉවත් ව ගියේ කෝපයෙන්.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් සැම විටම දකුණු අත භාවිතා කර වැඩක් කරන්න හැදුවත් ඇයට දැනුණේ ඒ අත නැති බවකි. රෙදි නමන්න වැනි සුළු වැඩක්වත් කරන්න බැරි වුණා.

"මේ රූසෝ ඔෂින් ඔහොම තියාගෙන හිටියොත් එයා කම්මැළි වෙනවා. කුඹුරට අඬගහගෙන යන්න. වල්පැළ නෙළන්න, පෝර දමන්න එහෙම බැරියැ. දැන් එයාට වැඩ නෑ. ටකේෂි බලාගන්නේ මම."

මේ අතර හට්සුකෝ ගේ මාතෘ උත්සවය සූදානම් කෙරුණා.

"ඔය ලොකු උත්සවයක් ඕනෑ නැහැ." ඩයිකොරෝ කිව්වා.

"ඇයි අපට ඉන්නේ එකම දුවයි. ඒ නිසා අපේ නම්බුව ආරක්‍ෂා වෙන්න හොඳ උත්සවයක් ගන්න ඕනෑ."

"වැඩ වැඩියි. ආ ටකේෂි බලාගන්න."

සුනිකෝ ටකේෂිව රැගෙන ආවා. ඔෂින් ආදරෙන් ටකේෂිව අතට ගත්තා. එහෙත් දකුණු අත නුහුරු බව නිසා දරුවා අතෑරෙන්න ගියා.

"වැටෙයි, වැටෙයි." සුනිකෝ අල්ලා ගත්තා.

ඔෂින් කාමරයට ගොස් මෙට්ටය මත වාඩි වුණා. රූසෝ ඇය සොයා ආවා.

"ඇයි ඔෂින්."

"රූසෝ මගෙ දකුණු අතට අංශභාගය වගේ. හොල්ලන්න බෑ. ටකේෂි වඩාගන්නත් බැරිවුණා."

"වදවෙන්න එපා. ඉක්මනට හොඳවෙයි."

"ඔෂින් හෙට හට්සුකෝ ගේ උත්සවය. අම්මා ඒක ලොකුවට ම කරන්නයි යන්නේ. ඔයත් ගිහින් උදව් කරන්න."

"හොඳයි."

ඔෂින් හැකි අයුරින් උදව් කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මට පන්සලට යන්න තියෙනවා. ඔෂින් මේ රසකැවිලි ටික සකස් කරන්න."

"හොඳයි."

එහෙත් ඔෂින්ට එය කිරීමට නොහැකි වුණේ දකුණු අත වැඩ නොකළ නිසයි.

"ඔෂින් මොකද මේ, කිසිදෙයක් දන්නේ නැහැ. සුනිකෝ මේක ඉක්මනට හදලා ගන්න."

ඔකියෝ පන්සල් ගියා. ඔෂින් හා සුනිකෝ පසුගමන් ගොස් දොරකඩදී ඇයට හිස නමා ආචාර කළා.

"මේ අල පොතු අරින්න."

"හොඳයි."

ඒත් අතේ ප්‍රශ්නය එතනදිත් බලපෑවා

"බලාගෙන අත කැපෙයි. "

"මේක මට කරන්න බැහැ."

"කමක් නෑ. අර පිඟන් ටික හෝදන්න."

අවාසනාවට පිඟන් ටික ඇය අතින් අතඇරුණා.

ෆුකුටාරෝ එළියට ආවා.

"මේ මොකද?"

"මට සමාවෙන්න." ඔෂින් හිස නැමුවා.

"ආ.... ඒකට කමක් නෑ."

මේ සියලු දෙයින් ඔෂින් බිය වුණා. ඇයට වුවමනා වුණේ කාමරයට වී සිටීමටයි. රූසෝ ඔෂින් සොයාගෙන ආවා.

"ඔෂින් ඔයා ඇයි මෙතන. මේ තමයි අම්මා ගේ හිත දිනාගන්න හොඳම අවස්ථාව. යන්න ගිහින් වැඩ කරන්න. බැරි නම් මූණ පෙන්නලා එන්න."

"හොඳයි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් නැවත කාමරයෙන් බැහැර උයන ගෙට ගියා.

"පුළුවන් ද මටත් උදව් කරන්න."

"ඔෂින්, මගෙ හොඳම පිඟන් දහයක් ම කැඩුවා නේද? කැඩුණාට කමක් නැහැ. ඒ වුණාට මේ වගේ දවසක එහෙම බාධා වැඩකරන්න එපා. ඔයාගේ උදව් ගත්තොත් උත්සවය විනාශයි. ඒ නිසා කාමරයට වෙලා ඉන්න කරුණාකරලා. එනව මෙතන උදව් කරන්න."

ඔෂින් පසුබැස නැවත කාමරයට ගියා.

"මොකද ඔෂින් මූණ එල්ලාගෙන."

"ඔයා ගේ අම්මා කීවා මගේ උදව් එපා කියලා. ඒක ඇත්ත මේ දකුණු අත පණ නැති නිසා වැඩ කරන්න බෑ."

"හරි වැඩක් නේ, තුවාල වුණේ හිසයි බෙල්ලයි. ඇයි අත පණ නැත්තේ."

"පණ නැති නිසයි කියන්නේ."

"වෙන්න ඇති ඔයානේ කියන්නේ. තමන් ගැන ම හිතල නම් බැරිවෙයි."

හට්ෂුකෝ ගේ උත්සවයේ හඬ කාමරයට ඇසුණා. සිනා හඬ, කෑම පිළිබඳ කතා, සකේ බෙදාගැනීම මේ සියල්ලට සවන් දෙමින් ඔෂින් සිතුවේ තමා ගේ දරුවා ගැනයි. හට්ෂුකෝ ගේ දරුවාට තිබෙන පිළිගැනීමත් තමන්ගේ කුසේ වැඩෙන දරුවා ගේ අනාගතය ගැනත් ඇය සිතුවා.

උත්සවය අවසන් වූවාට පසු දිනක් රූසෝ මව සොයා ගියා.

"අම්මා උත්සවයට ඔෂින්ට උදව් කරන්න බැරි වුණා. ඒ ගැන සමාවෙන්න."

"එයාට මැහුම් පුළුවන් ද?"

"ඔව්, හොඳට පුළුවනි. මුලදී සාප්පුවේ විකුණන්න ළමා ඇඳුම් මැහුවේ ඔෂින් ම තමයි. මුලදී එයා කිමෝනා මැහුවේ අතින්මයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි බලමු."

ඔකියෝ රෙදි කෑල්ලක්, කතුරු හා ඉදිකටු නූල් රැගෙන ඔෂින් ගේ කාමරයට ගියා.

"ඔෂින්, මට රට අඳින්න ගවුමක් මහලා දෙනව ද?"

"හොඳමයි."

ඔෂින් ගවුම මැසීමට නූල් ඉදිකටුවට අමුණන්න බැලුවා. අතේ අප්‍රාණික බව නිසා එය කිරීමට නොහැකි වුණා. ඔෂින් ගේ දෑසින් කඳුළු කඩා හැලුණා. ඒ සියල්ල බත්දේසිය මත තබා ඔකියෝ සිටින තැනට ගෙන ගොස් දණගසා ගෙන එය ඇය ඉදිරියේ තිබ්බා.

"මට සමාවෙන්න මේක බැහැ."

ඔකියෝ පුදුමයෙන් බලාගෙන සිටියා. ඇය ගියේ රූසෝ නිදා සිටි කාමරයට.

"ඈ රූසෝ ඔයා කයිවාරු ගැහුවට ඔෂින්ට මහන්න බැහැ නේ."

"එයා ගේ අතේ අමාරුවක් අම්මා."

"ඒවා වලින් වැඩක් නෑ. එයා හෙට ඉඳලා කුඹුරේ වැඩ. තේරුණා ද?"

රූසෝ සමඟ කුඹුරට ගිය ඔෂින් අපහසුවෙන් වළවල් කැපීමට උත්සාහ කළා.

"මොකද හොල්ලන්න බැරි. අතේ වරදක් නෑ." රූසෝ ඔෂින් ළඟට ආවා.

"අම්මාගෙන් මටත් දොස්. හරි ඔන්න මම ඇල්លුවා. මෙහෙම මෙහෙම."

රූසෝ ඔෂින් ගේ අත අල්ලලා පස් ගොඩ දැම්මුවා.

"අත සොලවලා වැඩ කරන්න. ඉක්මනට හොඳවෙයි."

දිනක් ඔෂින් වැඩ නිමකර ගලක් මත වාඩි වී සිටියා. එතනට ආවේ සාවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"දැන් ඔයාට සනීප ද? මම ආවේ නැත්තේ බය නිසා. දරුවා සනීපයෙන් ද?"

ඔෂින් කිසිවකට උත්තර නොදී ඈත බලාගෙන හිටියා.

"මම ඔයාගේ දරු ගැබ............."

"මේ සාවා කට වහගත්තොත් මට උදව්වක්. ඇති දරුගැබක් නෑ. ඔයා එක්ක කතාවක් නෑ."

"සමාවෙන්න ඔෂින් මම ආවේ ඔයා දුන්න යෙන් 30 දීලා යන්න. ආ ඒක ගන්න."

"දැන් ඕවා වැඩක් නැහැ. ඕකත් අරගෙන යන්ඩ."

"ඔෂින් ඇයි ඔයා සැමියටවත් දරුවා ගැන කීවේ නැද්ද?"

ඔෂින් කිසිවක් නොකියා යන්න ගියා.

එදා රාත්‍රියේ ම ඔෂින් ට නින්ද ගියේ නැහැ. මේ දරුවා ටනකුරා පවුලට අනවශ්‍ය දරුවෙක් බව ඇය දැන සිටියා. ඒ නිසා ඇය එය කාටවත් කීවේ නැහැ.

"ඔෂින් මෙහෙ එනවා."

කුඹුරේ සිට නිවසට පැමිණි විගස ඔකියෝ කතා කළා. හඬ අනුව එහි ගැටුමක් වේ යයි රූසෝත් එතනට ගියා.

"මට ආරංචියි පැනලා යන්න හැදුවා කියලා. මොකටද හොරෙන් යන්නේ. යන්ඩ ඕනෑ නම් පිටවෙලා යනවා."

"මොනවද අම්මා ඔය කියන්නේ. ඕවා බොරු කතා. ඔෂින් එහෙම හිතන්නෙවත් නැහැ. මේක ඊර්ෂ්‍යාවට හදපු කතාවක්. මහ විහිළුවක්."

"රූසෝ තමන් දන්නේ නැතිනම් නිකං ඉන්නවා. මෙයා තනියම නෙමෙයි යන්න හැදුවේ සාවාත් එක්ක. ඒකත් බොරුද කියනවා."

"එයා ඔක්කොම කිව්වද?"

මෙතෙක් නිහඬව සිටි ඔෂින් කලබලයෙන් ඇසුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"සල්ලි වගයක් අහුවෙලා. ඒකෙන් තමයි කතාව ඇදිලා තියෙන්නේ."

සූනිකෝ කිව්වා.

"යෙන් තිහ අහුවෙලා. ඒක කොහෙන්ද කියලා සාරෝ ගේ අම්මයි, සහෝදරියොයි සාවාගෙන් අහනකොට කිව්වාලු ඔෂින් දුන්නා. දෙන්නම පැනලා යන්න හැදුවේ කියලා. දැනුත් බොරු කියන්න ලෑස්ති වෙන්ඩ එපා. මේ කතා ඇත්ත නේද? කියනවා."

ඔෂින් සෙමෙන් හිස සෙලෙව්වා.

"ඇයි ඉතින් අදහස අත් ඇරියේ? යන්නනේ තිබුණේ අපට වද නොදී."

"ඔය ඇති. ඔෂින් ගේ ගමන මමයි නැවැත්තුවේ."

රූසෝ කිව්වා තරහින් ම.

"ඉතින් මෝඩයෝ ගෑනිට උඹ එපා නම් දරුවා එපා නම් ඇයි නැවැත්තුවේ?"

"ඔෂින්ට තව දරුවෙක් ලැබෙන්න ඉන්නවා ඒකයි නවත්වා ගත්තේ."

"මොනවා..... ගැබිනියක් ඔෂින්?"

"එයා එහෙ යන්න හැදුවේ කොණ්ඩා දමලා මුදලක් හොයාගෙන මාවත් ටෝකියෝ ගෙන්වා ගන්ඩයි."

"එතකොට ඔය තුවාලයක් හදාගත්තේ."

"ඔෂින් තුවාල වුණේ මම නිසා. මම ටකේෂි උදුරන්න ගිහින් ඔෂින් ව තල්លු කරලා දැම්මා. එයා ගේ ඔලුව ගලක වැදිලා තිසෙන්, බෙල්ලෙන් ලේ ගලන්න ගත්තා. මම ඇයව ඔසවාගෙන ආවා. ඔච්චරයි. තවත් ප්‍රශ්න එපා. ඔෂින් මගෙ බිරිඳ. ඔෂින් ගේ දරුවා මෙහෙ ලැබෙන්න ඕනෑ. ඔෂින් ගිහින් උණුවතුර නාගන්න. මේක උසාවියක් වගෙයි. ඔය හොඳටෝම ඇති."

ඔකියෝ තරහින් පිට වී ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ ඔෂින් ගේ උරහිසින් අල්ලා නැගිට්ටවා ගත්තා.

"යමු."

සවස ඔෂින් ගේ කාමරය ළඟින්,

"ඔෂින්, ඔෂින්."

ඒ තාත්තාගේ හඬ බව දැනගත් ඔෂින් දොර හැර එතනම දණ ගසා තාත්තාට ආචාර කළා.

"ඔෂින් මට සේරම ආරංචි වුණා."

"මට සමාවෙන්න." ඇය නැවත හිස පහතට නැමුවා.

"ඒ මොනවත් හිතන්න එපා. තේරුණා ද? ඔයා ටනකුරා පවුලට හොඳ නිරෝගී දරුවෙක් එකතු කරන්න. මමයි රූසෝයි ඔයාගේ පැත්තේ. හැබැයි අම්මගෙ ප්‍රහාර වලට නම් මූණ දෙන්න වෙයි. ඒවා අමතක කරන්න. දරුවා ගැන ප්‍රවේශම් වෙන්න. ලස්සන දුවෙක් නම් හොඳයි නේද ඔෂින්."

"ඔව් තාත්තා," ඔෂින් සතුටින් සිනාසුණා. ඔෂින්ට එදා පුදුම සතුටක් දැනුණා. සාගා වලට ආවට පස්සෙම මෙහෙම සතුටක් දැනී නැහැ. රූසෝ ඇය වෙනුවෙන් කතා කළා. ඒකම ඇයට සතුටක්. තාත්තා ගේ සැනසිලි වදන්. මීට පස්සේ මම රූසෝ එක්ක සතුටින් ඉන්නවා. අම්මගෙ ප්‍රහාර නිසා රූසෝත් මූණ එල්ලා ගෙන ඉන්නේ නෑ. එහෙම නම් මේ දරුවාටත් අනාගතයක්. ටකේෂි වගේ ම කරදරයක් නැති දරුවෙක් වෙයි. ඇය සෙමෙන් කුස පිරිමැද්දා.

දෙදෙනාම කුඹුරේ වැඩ කළේ සතුටින්. ඔෂින් රූසෝ සමඟ හරි හරියට වැඩ කළා.

"ඔෂින් හුඟක් මහන්සි වෙන්න එපා. මට වතුර ඕනෑ."

ඔෂින් භාජනයෙන් වතුර ගෙන ගොස් දුන්නා. රූසෝ එතනම වැතිර සිටියා.

"රූසෝ අද පිරිමි ළමයින් ගේ ළමා දිනය."

"ඒත්, ඉතින් අපට ළමා දිනය සමරන්න බැහැනේ. අම්මා ටකේෂි ව අයිති කරගෙන නේ." රූසෝ කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"කමක් නෑ රූසෝ ඒක හිතන්න ඕනෑ මෙහෙමයි. අම්මා ටකේෂිට ආදරෙයි. නැත්නම් ටකේෂිටත් අපිත් එක්ක කුඹුරට එන්න වෙනවානේ. ඒක නිසා ඒ ගැන සතුටු වෙන්න ඕනෑ."

"ඇයි ඔෂින් අපිට නොමිලේ ම ළමයා බලාගන්න කෙනෙක් ලැබුණා කියලා හිතමු. ඔයිට වඩා හොඳ කෙනෙක් හම්බ වෙන්නේ නැහැනේ අපට."

"ඒකත් ඇත්ත." දෙදෙනාම හිනැහුණා.

"ඔෂින්, මම කැමතියි දුවෙකුට. හොඳ ලස්සණ, එයාගේ අම්මා වගෙ ශක්තිය, ධෛර්යය තියෙන දුවෙකුට."

"රූසෝ මම බයේ හිටියේ මගේ මේ දරුවට කවුරුත් නැතිවෙයි කියලා. ඒත් ඔයා දරුවා ගැන ඔහොම කතා කරනකොට මට හරි සතුටක්. මම ටෝකියෝ ගියා නම් අපි වෙන් වෙනවා. දරුවට පියෙක් කෝ? ටකේෂිටත් පියා අමතක වෙයි. ස්තුතියි සාවාට. එයා නිසයි මගෙ ගමන වැළැකුණේ."

"දැන් ගියපු දේ ඉවරයි. සාරෝ කිව්වා සාවා ගෙදර නැහැ කියලා. එයා ඔයාගේ සල්ලි වලින් ටිකට් අරගෙන ටෝකියෝ යන්න ඇති කිව්වා. සාරෝ කියනවා සාවා ගිය එක හොඳයි අම්මයි සහෝදරියොයි ඇයට හුඟක් වද දුන්නා කියලා."

හට්ෂුකෝ නිවසට පැමිණ තිබුණා. ඔකියෝ විවිධ කැවිලි වර්ග සකස් කර තිබුණා හට්ෂුකෝ වෙනුවෙන්.

"ඔෂින්ට දරුවෙක් ලැබෙන්න ඉන්නවාලු නේද? ඒත් මගේ දරුවා ලැබෙන්නේ මේ ගෙදර. එයාට යමගාටා යන්න කියන්න."

"ඒවා මම බලාගන්නම්. තව කන්න ඇතිවෙන්න ම. එහෙ ඔයාට මේවා හදලා දෙන්න කෙනෙක් නැහැනේ."

සවස රූසෝ සහ ඔෂින් නිවසට ආවා.

"ආ ඔයාලා තවම අයියගෙ කුඹුරේ වැඩ ද? කවද ද ඔයාගේ ගොඩකිරීම් පටන් ගන්නේ."

තාත්තා රූසෝගෙන් ඇසුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අයියගෙ කුඹුරේ වැඩ ඉවර වුණාම. අපි කෑම කනවට ඒක ඉවර කර දෙන්න එපා යැ. දැන් අලපැළ හොඳට හැදිලා. ඔෂින් හුඟක් මහන්සි වෙනවා. විවේකයක් ගන්නේ ම නැතිව වැඩ."

"මම දන්නවා. ෆුකුටාරෝ කිව්වා මට. හොඳයි එහෙම නම් අද පිරිමි ළමයින් ගේ දවස නිසා ඔය දෙන්නත් ටකේෂිව අරගෙන ගිහින් විනෝද වෙන්ඩ."

"හොඳයි." ඔෂින් කිව්වා.

"නෑ, නෑ, ටකේෂිට දැන් නිදිමතයි."

ඔකියෝ ටකේෂි රැගෙන කාමරයට ගියා. රූසෝත් ඇය පසුපස ගියා.

"අම්මා, ටකේෂි දෙන්න බැරිද ටික වෙලාවකට ඔෂින් ළඟට." අද කොදොමො නොහි දවසනේ."

"ඒ ළමයා නිදිමතේ. ඒවා වැඩක් නැහැ. මට රූසෝ මුණ ගැහෙන්න ඕනෑ වැදගත් වැඩකට. නාගෙන ම එන්න."

"තාත්තා මොකද අම්මා මට මුණගැහෙන්න කියන්නේ ඔයා දන්නේ නැද්ද?"

"හෝඩුවාවක්වත් දන්නේ නම් නෑ. මොකක් හරි කොනක් හොයා ගෙන ඇති. හම්බ වෙලාම බලන්නකෝ."

රූසෝ නා ගැනීමෙන් පසුව මව සොයාගෙන ගියා.

"ඇයි එන්න කීවේ."

"රූසෝ, ඔයා ඔෂින් ගේ දරුවා ලැබෙන්න එයාව යමගාටා එකතු කරගෙන ගියොත් හොඳයි."

"එච්චර දුරක ඇයි ඒ?"

"හේතුව තමයි හට්ෂුකෝට දරුවා ලැබෙන්නේ මේ ගෙදර. දෙන්නාටම එක කාලයේ එක ළඟ දරුවෝ දෙන්නෙක් ලැබුණොත් එක දරුවෙක් මිය යනවා. ඒකයි මම එහෙම කියන්නේ."

"ඕවා මෝඩ කතා."

"මේවා මෝඩ කතා වුණත් මොන කතා වුණත් ඔෂින් ගේ

Scanned with CamScanner

sinhalaebooks.com



බබා මේ ගෙදර ලැබෙන්න ඉඩ දෙන්න බැහැ."

එවිටම පියාත් එතනට පැමිණියා. ඔකියෝ මේ තත්ත්වය පියාට පැහැදිලි කළා.

"ඕවා මහ අන්ධ විශ්වාස."

රූසෝ කිව්වා.

"ඉතින් හට්ෂුකෝ ගේ දරුවා එයාගේ සැමියාගේ ගෙදර දී ලැබුණම මේ ප්‍රශ්නය විසඳෙනවා නේ."

"එහෙම කරන්න පුළුවන් ද බයකුරා. ඒක අපේ වගකීම. අපේ පවුල් වල කුල සිරිත. මම කියන්නම් ඔෂින්ට."

"අම්මා මේ මොනවත් ඔෂින්ට කියන්න එපා. මගෙ දරුවා ලැබෙන්නෙත් මෙහෙ තමයි."

"රූසෝ මම කිව්ව දේවල් විහිළුවට ගත්ත ද?"

"දරුවා ලැබුණදෙන් මෙහේ. ඕනෑ නෑ ඔබේ උදව්. හැම වෙලාවෙම හට්ෂුකෝට සලකන්නමයි ඕනෑ."

රූසෝ කාමරෙන් පිටව ගියේ කෝපයෙන්. ඔෂින් කාමරයට වී ලිපියක් ලියමින් හිටියා. රූසෝට ඔෂින් දුටු විට දුකක් ඇති වුණා. තමා පවා ඇයට හිරිහැර කළ බව ඔහුට හිතුණා. මීට පස්සේ ඔෂින්ව තනි කරන්නේ නැහැ, අම්මගෙ ප්‍රහාර හමුවේ යයි ඔහු සිතුවා.

"ඔෂින්, මොකද කරන්නේ?"

"කාටද ඔෂින් ලියුම් ලියන්නේ."

"අම්මටයි, කායෝටයි, මැඩම් හසකාවාටයි මම ලිව්වා අපේ දරුවා ගැන. රූසෝ ඇයි අම්මා කතා කළේ? කීවද මම හොඳ නැති බිරිඳක් කියලා."

"ඒවා කෙඳිරිගෑම්......"

"ඔෂින් එක අතකට දරුවා ලැබෙන්න ඔයා යමගාටා යනවා නම් හොඳයි කියලා මට හිතෙනවා. ඔයාව බලාගන්න මෙහෙ කවුරුත් නැහැ. මටත් වැඩ වැඩියි. ඒ නිසා.........."

Scanned with CamScanner

sinhalaebooks.com



"නෑ, රූසෝ මගෙ දරුවා ලැබෙන්නේ මේ ටනකුරා ගෙදරදියි. රූසෝ ඔයා හිතනවද වැඩක් නැති මවක්, වැඩක් නැති දරුවෙක් කියලා."

"නැහැ මම හිතුවේ ඔයාට උදව්වට කවුරුත් නැති නිසා."

"බයවෙන්න එපා රූසෝ. මේ දෙවෙනි දරුවා නේ. මට පුළුවනි මා ගැන බලාගන්න. මම මහන්සි ගත්තොත් මට පුළුවන් වෙයි හොඳ ලේලි කෙනෙක් වෙන්න."

"වදවෙන්න එපා ඔෂින් ඔයාට මම ඉන්නවා."

රූසෝ ඔෂින් ගේ උරහිස සෙමින් මිරිකමින් කීවේ ඔෂින් ගැන දුකෙන්.

ඔෂින් උදේ කෑම ගනිමින් හිටියා. ඔකියෝ උයන ගෙට ආවා. ඇයගේ මුහුණ තරහින් පිරී තිබුණා. ඔකියෝ දුටු ගමන් ම ඔෂින්,

"සුබ උදෑසනක් වේවා. බොහෝම ස්තුතියි කෑම වලට."

හිස නමා ආචාර කර නිවසින් පිටට ගොස් ගොවි උපකරණ රැගෙන රූසෝ සමඟ කුඹුරට ගියා.

සුනිකෝ ඇයගේ සැමියා සොයා ගියා. අම්මා ඔෂින් ගේ දරු උපත සඳහා ඇය යමගාටා යැවීමට උත්සාහ ගන්නා බවත්, ඒ සඳහා වූ මිථ්‍යා විශ්වාසය ගැනත් ඇය පැවසුවා.

"මට හරි දුකයි අම්මා ඔෂින්ට සලකන හැටියට."

"සුනිකෝ කතා එපා, කන්දීම් එපා, ඇඟිලි ගැහීම් එපා, මම ඔයාට කියලා තියෙවානේ. මෙතනටත් ඒකම තමයි. අම්මට ඕවා ඇහුණොත් ඔයාට වෙන දේ විතරක් හිතුවොත් ඇති. "

එවිටම ඔකියෝ එතනට ආවා.

"සුනිකො මොකද මෙතන කරන්නේ? මම මාළු ගෙන්නුවා. හට්ෂුකොට මාළු සුප් එකක් හදන්න ඉක්මනට."

සවස ඔෂින් හා රූසෝ කුඹුරේ සිට නිවසට ආවා. මිදුලේ වූ භාජනයේ කුඩා මසුන් පීනමින් හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් මෙහෙ එන්න. මෙන්න මාළු ගෙනත්. අද අපිට මාළු සුප් ලැබෙයි."

"මට මතක් වුණේ ඔයාට ටකේෂි හම්බ වෙන්න ඉන්න කොට ගෙන්ජි හැමදාම කඩ පිළට ගිහින් මාළු ගේනවා මතක ද?"

ඔෂින් හිනැහෙමින් ගොස් ටකේෂිගේ අපිරිසිදු ඇඳුම් සෝදා දැම්මා.

"ඔෂින්, මම ඔය ටික හෝදන්නම්. ඔයාට මහන්සියි නේද?"

"එපා රූසෝ මට පුළුවනි."

එදා රාත්‍රී ආහාරයට මාළු සුප් බඳුනක් තිබුණා.

"මේ මාළු සුප් එක හට්ෂුකෝට විතරයි."

ඔකියෝ භාජනය රැගෙන හට්ෂුකෝ ළඟින් තිබ්බා.

"මට මෙච්චර කන්න බෑ."

"නැහැ ඔයා ඕවා හොඳට කන්න ඕනෑ. දැන් ඔයා ඕවා කන්නේ ඔයා ගේ බබා ගේ පෝෂණයට."

"අපට කරවලයි, තම්බපු අලයි විතරයි."

ෆුකුටාරෝ කිව්වා.

"සුනිකෝ එතකොට ඔෂින්ට මාළු සුප් නැද්ද? ඔෂින්ටත් දරුවෙක් ලැබෙන්න. ඔෂින්ට තම්බපු අල විතරයි. ඇයි මේ දෙවිදිහක්."

"රූසෝ සුනිකෝට මොනවත් කියන්න එපා. මේ මගෙ තීරණ. මම කිව්වා නේ ඔයාට ඔෂින් යමගාටා යවන්න කියලා."

"නැහැ මම ඔෂින් මෙහෙම තියා ගන්නවා." රූසෝ එතනින් ඉවත්ව ගියේ කෑම කන්නෙත් නැතිවයි.

Scanned with CamScanner

sinhalaebooks.com

# දහතුන

දිනක් සුනිකෝ ඔෂින් මුණ ගැහුණා. මේ වෙලාවේ ඔකියෝ ටකේෂිව නලවමින් හිටියා.

"ඔෂින් මම දන්නවා අම්මා ඔයාට හුඟක් වෙනස්කම් කරනවා."

"කමක් නෑ සුනිකෝ. වද වෙන්න එපා."

"අම්මා ඔයාට වෙනස්කම් කරන්නේ ඇයි කියලා ඔයා දනන්වද?"

"අම්මා අපේ විවාහයටත් අකමැති වුණානේ. ඒකම තමයි හේතුව."

"නැහැ ඔෂින් ගමේ කටකතාවක් තියෙනවා එක ගෙදර එකම දවස්වල බබාලා දෙන්නෙක් හම්බවුණොත් ඉන් එක්කෙනෙක් මිය යනවා කියලා."

ඔෂින් හිනාවුණා.

"ඕවා සේරම බොරු කතා."

"එහෙම ම කියන්න බැහැ ඔෂින්. අපේ ගමේ එහෙම දෙයක් සිද්ධ වුණා. ඒකයි අම්මා ඔයාට වෙනස්කම් කරන්නේ. එයා බයයි හට්ෂුකො ගෙ බබාට කරදරයක් වෙයි කියලා. ඔයාව පන්නා දමන්න ඉස්සර ඔයා යමගාටා යන්න ඔෂින්."

"එහෙම නම් ඒ නිසයි අම්මා මා එක්ක කතා නොකරන්නේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින්, අම්මා ඔයාගෙන් පළිගනියි. මම මෙහෙ ඇවිල්ලා ගතවුණ වසර දහයක් පමණ මම ගත කළේ නිරයක. ඒ තරම් වද දුන්නා."

"සුනිකෝ ඕකට තව හේතුවක් තියෙනවා. එක දවසක් අම්මා කියනවා මට ඇහුණා එයාගේ නැන්දම්මා ඔයාට හුඟක් වද දුන්නා කියලා. දැන් අම්මා නැන්දම්මා වෙලා අපට වද දෙනවා. නේද සුනිකෝ." ඔෂින් හිනැහුණා.

"ඔෂින් මේක විහිළුවක් නෙමෙයි. මට බයයි ඔෂින්, අම්මා දරුණුයි. අම්මගෙ හැසිරීම මට සැකයි. ඔයාගේ දරුවා මරලා දමයි."

සුනිකෝ ඔෂින්ට ළංවෙලා කිව්වා.

"මම මේවා ඔයාට කියන්නේ ඔෂින් අහිංසක නිසයි. මම ඔයාට උදව් කරන්නම්."

"ස්තුතියි සුනිකො ඔයාට."

එදා කුඹුරේ දී ඔෂින් මේ බව රූසෝට කිව්වා.

"සුනිකොට වටින්නේ නෑ ඕවා ඔයාට කියලා බය කරන්න."

"නෑ එහෙම නෑ. සුනිකො හොඳ කෙනෙක්. මම ඕවට බය නෑ රූසෝ. මගෙ දරුවා බිහිවෙන්නේ මේ ගෙදරමයි. ඒක වෙනස් වෙන්නේ නෑ. මම වෙනදටත් වඩා හොඳට වැඩ කරනවා. මම මේ සේරම දැනගත්ත එක හොඳයි. ගෙදරට හුඟක් උදව් කරනවා කුඹුරේ වැඩ කරලා අස්වැන්න අරගෙන දීලා."

ඔෂින් හා රූසෝ නිවසට ගියා.

"ආ රූසෝ ආවද? මහන්සි ඇති නේද? ගිහින් නා ගන්ඩ දැන් හට්ෂුකෝ නාලා ඉවර ඇති."

"එහෙම නම් ඔෂින් ඔයා ගිහින් උණුවෙන් ම වතුර ටිකක් නා ගන්න."

"ආ පිරිමි නැවට පස්සේ ගෑනු නාන්නේ. තව තාත්තාවත්, ෆුකුටාරෝවත් නෑවේ නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"එහෙම නම් හට්ෂුකෝ නැවේ මුලින්ම. යන්ඩ ඔෂින් ගිහින් නාගන්ඩ."

රූසෝ ඔෂින් ව ඇදගෙන ආවා.

"රූසෝ මම පස්සේ නාන්නම්. මට තව ටකේෂිගේ ඇඳුම් හෝදන්න තියෙනවා."

රූසෝ නිවස ඉදිරියෙහි වූ පොකුණ ළඟට වී සිටියේ කේන්තියෙන්. ෆුකුටාරෝ ගේ පුංචි දියණිය රූසෝ ළඟට ආවා.

"හොඳ බාප්පා."

"එන්න හිමරි."

රූසෝ ඇය තුරුලු කර ගත්තා.

"අන්න හොඳයි." ඔෂිනුත් එතනට ආවා.

"හොඳ බාප්ප අපි අද රසකැවිලි කෑවා. හට්ෂුකෝ නැන්දා ගෙදර ඉන්නවා නම් අපි හරිම කැමතියි. එතකොට හැමදාම රසකැවිලි කන්න පුලුවනි."

"ආ හිමචාන් ඔයා ගොඩාක් කෑවද? මේ බඩට" ඔෂින් සිගිතිය ගේ බඩ අතගෑවා.

"වැඩිය කෑවේ නෑ නැන්දා. හට්ෂුකෝ නැන්දට හැදුවේ කිව්වා. අපට දුන්නේ ටිකයි. හොඳ බාප්පටයි ඔයාටයි කියන්න එපා කිව්වා රස කැවිලි කෑවා කියලා."

ඔෂින්ට හිනා ගියා. රූසෝ ඇයගේ මුහුණ දිහා බලාගෙන හිටියා. ඔෂින් හිමරිගේ හිස අතගෑවා.

"මේ වගේ චූටි දුවෙක් හිටියොත් හොඳයි නේද රූසෝ."

රූසෝ හිටියේ කෝපයෙන්.

රූසෝ නාලා අම්මා සොයාගෙන ගියා.

"අම්මා රසකැවිලි තියෙනවා නම් දෙන්න. ඔෂින්ටත් දෙන්න එපා යැ."

"රස කැවිලි? මෙහෙ උත්සවයක් තිබුණා යැ"

"හට්ෂුකෝ නිකම්ම ඉන්නවා. එක එක කෑම හද හදා එයාගේ

Scanned with CamScanner

sinhalaebooks.com



බඩ පුරවනවා. ඔෂින් දවස තිස්සෙම කුඹුරේ නැහෙනවා. එයාට මොනවද දෙන්නේ? එළවළුයි බතුයි. නැත්නම් කැඳ ටිකක්. බත් කන්නේ අන්තිමට. ඒකත් බඩපිරෙන්න නෙමෙයි. අපි අසරණයො තමයි. ඇයි ඒත් එහෙම සලකන්නේ?"

"මේක මගෙ ගෙදර පිටවෙනවා මෙහෙත්."

"මොනවද කිව්වේ කියනවා ආයිත් බලන්න." මේ වන විට ඔෂින් පැමිණ රූසෝ අල්ලා ගෙනයි හිටියේ.

"රූසෝ ඔය ඇති නවත්වන්න, නවත්වන්න."

"අසාධාරණය මට ඉවසන්න බෑ ඔෂින්."

ඔෂින් කෙසේ හෝ රූසෝ එළියට ඇගෙන ආවා. ඔවුන් දෙදෙනාම පොකුණ ළඟ වාඩි වුණා.

"ඔෂින් ඔයා කොහොමද මේවා විඳ දරාගෙන ඉන්නේ. අම්මා හැම වෙලාවෙම හට්ෂුකො ගැන හිතනවා. ඇයි ඔයා ගැනත් ටිකක්වත් නොහිතන්නේ? ඉඳහිටලාවත් කෑම ටිකක් සැනසිලි වචනයක් කියනවද ? නැහැනේ."

"අම්මාට මාව පෙනෙන්නේ පිට කෙනෙක් විදිහට. දුව හොඳයි ලේලි හොඳ නෑ. ඕක තමයි ලෝක ස්වභාවය."

"හොඳයි ඔයාව පෙන්නන්න බැහැ කියමු. අපේ දරුවා ගැනත් හැඟීමක් නැද්ද"

"ඔය මිථ්‍යා කතා නිසයි අම්මා දරුණු වෙලා තියෙන්නේ. මම හොඳට මහන්සි වෙලා වැඩ කරලා නිරෝගී දරුවෙක් බිහිකරනවා. හට්ෂුකෝගේ බබත් නිරෝගීව ඉපදෙයි. එතකොට අම්මට තේරෙයි. මට කමක් නෑ කවුරු ඉස්සර වෙලා නැවත්, මොනවා කෑවත්. රූසෝ රණ්ඩු වෙන්න යන්න එපා."

"ඒ වුණාට අම්මා හැම වෙලාවෙම හට්ෂුකෝ ගැන වද වෙනවා."

"රූසෝ තේරුම් ගන්න. ඒ තමන්ගේ දුව. මම වෙනස්නේ."

"ඒවට අපට ඉපදෙන්න ඉන්න දරුවා පළි නැහැ."

"ආච්චිලා කැමති තමන්ගෙ දුවගෙ දරුවන්ට. ඔයා රණ්ඩු

Scanned with CamScanner

sinhalaebooks.com



නොවී ඉන්න බලන්න."

"ඒත් මගෙ යුතුකම ඔයා ආරක්ෂා කරන එක."

"එහෙම කියලා ඔයා කලබල කළොත් රණ්ඩු වුණොත් අම්මයි මායි අතර පරතරය තවත් වැඩි වෙනවා. ඒ නිසා මම කියන දේ අහන්න."

"හොඳයි මම මේ ගෙදර නිකමා. බිරිඳ රකින්න බැරි සැමියෙක්. ඔයාගේ හිත තදයි මේ නිකමාගෙන් යැපෙන්න එපා. ඔයාම ඔය සේරම බලාගන්න."

රූසෝ ගේ දෑසට නැගෙන කඳුළු හංගාගෙන ගෙට ගියා.

සුනිකෝ ඔෂින් සොයා ආවා. ඔෂින් මෙන්න ඔයාට ලියුමක්.

"හා දෙන්න. ස්තුතියි ඔයාට."

ඇය සුනිකොට ආචාර කළා.

ඔෂින් ඉක්මනට කාමරයට ගොස් ලිපිය කඩා කියෙව්වා. එය එවා තිබුණේ අම්මා යමගාටා වල ඉඳලා.

*ඔෂින්, මම මේ ලිවුමත් රිකිට කියලා ලියන්නේ. මට හරි සතුටුයි ඔයාට දෙවෙනි දරුවා ලැබෙන්න ඉන්න නිසා. ටකේෂි ලැබෙනකොට මම ඔයා ළඟ හිටියා. ඒත් මට සාගා එන්න බැහැනේ මෙවර. මම දන්නවා සාගා වල රූසෝ ගේ අම්මා, ඔයාගේ නෑනලා ඔයාව හොඳට බලා ගනියි. ඒ අයගේ කරුණාවට මම ස්තුති කළා කියන්න. මම මගෙ පරණ කිමෝනාවකින් බබාට ඇඳුම් වගයක් මැහුවා. මම ඒක පසුව එවන්නම්. ඒවා නම් දුවට ඕනැති නැතිවෙයි. අලුත් ඇඳුම් ඇතිනේ. ඒ වුණාට කමක් නැහැ. මේවත් මාව මතක් වෙන්න පාවිච්චි කරන්න. පුළුවන් තරම් මහන්සි වෙලා වැඩකරන්න. එතකොට ප්‍රසූතිය පහසුවෙයි.*

ඔෂින් ඇසෙන් වැටෙන කඳුළු සමඟ ලිපිය පපුවට තදකර ගත්තා.

"ඔෂින් අන්න අම්මා කතා කරනවා." සුනිකො කාමරයේ දොර ඇර කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි. මම එන්නම්."

ඔෂින් ඔකියෝ ගේ කාමරයට ගියේ බියෙන්. ඔකියෝ මෙට්ටය මත වාඩි වී සිටියා. ඔෂින් ඇය ඉදිරියේ දණගසා හිස නමා ආචාර කළා.

"ඔෂින් ඔයා දන්නවා මම මේ ගෙදරින් ඔයාට යන්න කියන්නේ ඇයි කියලා. ඒක ඔය දෙන්නා ගැනම හිතලා. මම ඔයාට වෙනස්කම් කරනවා කියලා හිතන්න එපා. මම ඔයාට එන්න කීවේ සුබ ආරංචියක් කියන්න."

ඔෂින් නිහඬව අසාගෙන හිටියා.

"කෙනෙක් ලැබුණා ඔයාව බබා හම්බ වෙනකල් නතර කර ගන්න කැමති. ඉස්සර අපි ළඟ වැඩ කළ අඳ ගොවියෙක්. එයාට අපි හොඳට සැලකුවා. දැන් එයා ගෙයක් එහෙම හදාගෙන. අපි කියන දෙයකට ඉතාම ඉහළින් සලකනවා. ඔයාව බලා ගනියි."

"රූසෝ දන්නවද?" ඔෂින් ඇසුවා.

"ඔව්, මම කිව්වා. ටකේෂි ගැන වදවෙන්න එපා. මම ටකේෂි බලාගන්නවා. එයා හොඳ ළමයෙක්. වදයක් නෑ. මට ටකේෂි නැතිව ඉන්නත් බැහැ. ඔයා යනවා නේද?"

ඔෂින් වචනයක්වත් කතා නොකර කාමරයට ගොස් දොර වසා ගත්තා. සුනිකො දොර ඇරගෙන ආවා.

"ඔෂින් අම්මගෙ ඔය යෝජනාවට කැමති වෙන්න. බබා ලැබුණාම ආපිට ගෙදර එමු."

ඔෂින් සුනිකෝ ගේ ඇඟේ හැප්පීගෙන ම ඔකියෝගෙ කාමරයට ගොස් නැවත ඇය හමුවේ දණ ගසා හිස නැමුවා.

"මම ටනකුරා බිරිඳක්. මගෙ දරුවා ලැබෙන්න ඕනෑ මෙහෙ. ඔයා කරපු යෝජනාවට මට කියන්න තියෙන්නේ බැහැ කියලයි"

"එතකොට එක දරුවෙක් මැරුණොත්?"

"ඕවා සේරම මෝඩ කතා."

"මම නැන්දම්මා. මම කියන දේ කරන්න ඕනෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔකියෝ කිව්වේ තර්ජනාත්මකව.

"ඔය බොරු කතා වලට මම බය නෑ. මම යන්නේ නෑ කොහේවත්."

සුනිකො මේ හැම විටම ඔෂින් එහෙම කියන්න එපා යයි ඇය දැනුවත් කළා.

"හොඳයි බලමු. ඔයාට මේවට විඳවන්න වේවි. ඔයා මින් පස්සේ මගෙ ලේලි නෙමෙයි."

"ඔෂින් යන්නම් කියන්න."

"සුනිකො ඔයා මා ගැන වදවෙනවට ස්තුතියි."

ඔෂින් නැගිට යන්න ගියා. ඔකියෝ රූසෝ නිදන කාමරයට ගියා.

ඔහුගේ කකුල් දෙක ළඟ වැටී අඬන්න පටන් ගත්තා.

"රූසෝ මම අපහාස විඳිනවා. ඇයි ඔයා මේවා නොබලන්නේ? ඔෂින් ගෙ කිසිම ගෞරවයක් නෑ මා ගැන. මම මගෙ නැන්දම්මාගෙන් අවුරුදු පහළොවක් කරදර වින්දා. ඒත් කවදාවත් මම එකට එක කියලා නැහැ. බලන්ඩ සුනිකො කතා කරන්නෙ නෑ එහෙම කවදාවත්. ඒත් ඔෂින් ළඟ ගෞරවය නැහැ."

රූසෝ කිසිවක් නොකියා ඔෂින් සොයා ගෙන ඇයගේ කාමරයට ගියා. ඔෂින් රූසෝ දෙස බියෙන් බලාගෙන හිටියා.

"ඔයත් හිතන්නේ මම වෙන තැනකට යන්න ඕනෑ කියලද රූසෝ?"

"ඔයා යන්න එපා අකමැත්තෙන්. ඒත් ඒක අම්මට හොඳින් පහදලා දෙන්න එපායැ. ඇයි තදින් කතා කළේ? ඔයා බය වුණා ද මම ඔයාව ආපිට නොගනියි කියලා. නෑ ඔෂින් මට ඔයා නැතිව බැහැ. ඔයා යන්න එපා කොහේවත්. අම්මාට තදින් කතා කරන්න එපා."

"අම්මා කියනවා මාව ලේලි කෙනෙක් විදිහට සලකන්නේ නැතිලු. අම්මා ටකේෂිව මගෙන් ගත්තා. දැන් ඔයා..... ඔයා වෙනම කාමරයක නිදා ගන්නවා. මම තනිවෙලා. මම කුඹුරේ

Scanned with CamScanner

sinhalaebooks.com



නැහෙනවා. කොහේ යන්න ද මම? මම රූසෝ ටනකුරා ගේ බිරිඳ. මේ ගෙදරයි මගෙ දරුවා ලැබෙන්න ඕනෑ."

"අම්මාගෙන් සමාව ගන්න."

"මම හිතන්නේ නෑ මම සමාව ගන්න ඕනෑ කියලා."

"ඔයා වෙලාවකට හරිම හිතුවක්කාරයි."

මේ සෑම දෙයක් ම රූසෝ කීවේ හිනැහෙමින්.

"යැපෙන්නේ නෑ මම මේ පවුලෙන්. මම කාගේ හරි කුඹුරක වැඩ කළා නම් මට කන්නත් ලැබෙනවා. මුදලුත් ලැබෙනවා."

"කුඹුර අපි දෙන්නගෙම. ඔයා මහන්සි වෙන බව තාත්තාත් කියනවා."

"තාත්තා මාව ලේලියක් විදිහට බාර ගත්ත වගෙ අම්මාටත් කවදා හරි බාරගන්න වෙයි. එතෙක් මම ඉවසනවා. ඒක තමයි මගෙ බලාපොරොත්තුව."

ඔෂින් රූසෝ ගේ පිටට හේත්තු වෙමින් කිව්වා.

එදා කුඹුරේ වැඩ අවසන් කර නිවසට පැමිණි රූසෝ උණුවතුර නා පියා හමුවට ගියා. එවිට මවත්, පියාත්, ෆුකුටාරෝත් අස්වැන්න විකුණා මුදල් ගෙන ඒ පිළිබඳ ගණන් ලියමින් හිටියා.

"ආ... අපි පෝසත් වෙලා නේද?"

රූසෝත් එතනම වාඩි වුණා.

"තිරිඟු අස්වැන්න වික්කා." තාත්තා කිව්වා.

"මමයි ඔෂිනුයි හුඟක් උදව් කළානේ. මා ළඟ සල්ලි නැහැ. මටත් යෙන් පහක් විතර දෙන්න අම්මා."

"ඔයාට මොකට ද සල්ලි? ඕනෑ දේවල් කියන්න අරගෙන දෙන්නම්." අම්මා කිව්වා.

"මට නෙවෙයි. ඔෂින්ට. මොනවා හරි කන්න අරගෙන දෙන්න ඕනෑ. දරුවට කිසිම පෝෂණයක් නෑ. මට මාළු දුන්නට එයාට තියෙන්නේ බතුයි අච්චාරුයි විතරයි. බත් ගුළියත් ඇති වෙන්ඩ නැහැ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ලැජ්ජා නැද්ද රූසෝ බත් ගුළියකට රණ්ඩු වෙන්ඩ."

"මම නෙවෙයි අම්මයි ලැජ්ජා වෙන්න ඕනේ. දෙන්න සල්ලි එයාට බිත්තර ටිකක්වත් අරගෙන දෙන්න."

"ඔෂින් කුඹුරේ බොහෝම මහන්සි වුණා. ටෝකියෝවේ කෙනෙක් කියන්නවත් බැහැ. හොඳට වැඩ කළා."

ෆුකුටාරෝ කිව්වා.

"ඔෂින් ගේ තාත්තා අඳ ගොවියෙක් නේ. එහෙ මෙහාට වඩා වැඩ කරන්න ඇති."

"හට්ෂුකෝත් ගොවි පවුලකනේ. එයා නිකම්ම ගෙදරට වෙලා ඉන්නේ."

"ඒ මම එයා විවාහ කරලා දෙනකොට පොරොන්දු කරගත්තා කුඹුරු වැඩ කරවන්න එපා කියලා."

"දෙන්නට දෙවිදිහක්."

"කොහොමත් රූසෝ ට සල්ලි ඕනෑ නෑ."

"ඒක හරි අසාධාරණයි."

රූසෝ තරහින් හිට ගත්තා.

"පුතා, ඉන්න මේ යෙන් පනහ ගෙනිහින් ඔෂින්ට ඕනෑ දෙයක් අරගෙන දෙන්න."

"ඔව් රූසෝ, මමත් හිතුවේ ඔෂින්ට කිමෝනාවක් වත් අරගෙන දෙන්න, මුදල් දෙන්න ඕනෑ කියලා. ඔෂින් බොහොම මහන්සි වුණා කුඹුරට. මම හරියට ගරු කරනවා ඒ මහන්සි වීම වගේම එයාගේ නිර්භීතකමට."

වැඩිය කතා බහ නැති ෆුකුටාරෝ ගේ මේ වචන රූසෝ ට ගෙන ආවේ සතුටක්.

"මොන එහෙකට සල්ලි දුන්න ද?" ඔකියෝ කිව්වා.

"කටවහගන්නවා." තාත්තා සැරෙන් කිව්වා.

රූසෝ ඔෂින් ගේ කාමරයට ගියා. ඔෂින් ටකේෂි ගේ ඇඳුම් නවමින් හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ආ......" රූසෝ යෙන් පතහෙ නෝට්ටුව ඔෂින්ට දිගු කළා.

"මේක මගෙ තාත්තා ඔෂින්ට දුන්නේ ඔයා කුඹුරට වුණ මහන්සියට."

ඔෂින් හිනැහෙමින් නෝට්ටුව අතට ගත්තා.

"මේකෙන් ඔයා කැමති දෙයක් අරගෙන කන්ඩ. දරුවට පෝෂණය මදිනේ."

"මේ ඇත්තට ම මටද?" ඔෂින් පුදුමයෙන් ඇහුවා.

"ඔව්, අයියා නම් කිව්වේ ඔයාට කිමෝනාවක් අරගෙන දෙන්න කියලා."

"අපි මේක දරුවගෙ වැඩට තියාගමු."

"නෑ ඔයා කැමති කෑමක් කන්න."

"අම්මා මට තුන් වේලම කන්න දෙනවනේ. ඒ මදෑ."

"එහෙම නම් අපි හොඳ වින්නඹු අම්මා කෙනෙක් ගේන්නමු."

"වදවෙන්න එපා. මට තනියම පුළුවනි. මගෙ අම්මා පෝෂ්‍ය ආහාර ගත්තේ නෑ. අපිට රාබු බත් දුන්නා ම අම්මට කන්න දෙයක් තිබුණේ නෑ. ඒත් බලන්නකෝ අපට හොඳට කිරිත් දුන්නා. ඒ නිසා ඔය පෝෂ්‍ය ආහාර නැතිවට කමක් නෑ."

පසුවදා ඔෂින් කෑම කා අවසානේ 'ස්තූතියි සුනිකෝ' පවසා එළියට ගොස් කූඩය කරේ එල්ලා ගත්තා.

"ඔෂින් ඔහොම නතර වෙනවා."

ඔකියෝ ගෙයි සිට එළියට ආවා.

"රූසෝ හොඳටෝම වෙනස් වෙලා. එයාට ලැජ්ජා නැද්ද දෙමාපියන්ගෙන් සල්ලි ඉල්ලන්න. ඔයා වද දෙනවා ඇති. ලැජ්ජා නැද්ද මිනිහව හිඟන්නෙක් වගේ එවන්න. ඒ මදිවට කන දේවල් ගැනත් කේලම් කියනවා. සුදුසු නැහැ රූසෝ ගේ බිරිඳ වෙන්ඩ. දැන්ම පිටවෙලා යන්ඩ."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කිසිවක් නොකියා යන්ඩ ගියා. වැහි කාලය උදා වුණා. ඔකියෝ ඉක්මතින් හට්ෂුකෝ ගේ සැමියාගේ නිවසට ගොස් ඇය ගේ ප්‍රසූතිය සඳහා සිරිත් අනුව හට්ෂුකෝ නිවසට ගෙන ආවා. ගෙට පැමිණි විගසම ඔවුන් පැලඳ සිටි මේස් ගලවා සේවිකාව ගෙන ආ උණු වතුරින් හට්ෂුකෝගේත් නැන්දම්මාගේත් කකුල් තැව්වේ සූනිකෝ.

"හොඳ වෙලාව අම්මා මාව එක්කගෙන ආවේ. නැත්නම් ගොයම් පැළ ඉන්දන්න යන්න වෙනවා."

"දෙමව්පියෝ එවන්න සතුටු වුණා ද?" සූනිකෝ ඇහුවා.

"දෙමාපියෝ සතුටු ඇති. එක කෑමක් අඩු වුණානේ."

"එයාලගේ අම්මා කියනවා දරුවා ලැබෙනකල් ගොයම් වැඩ කරනවා නම් හොඳයිලු"

"අම්මා බඩගිනියි."

"ආ......... මම හිතුවා. ඒ නිසා සූනිකෝට ඔයා ආස කෑම හදන්න කියලයි ගියේ. හාන්සිවෙන්නත් ඕන ඇති නේ. යමු කෑම කන්න."

හට්ෂුකෝ අල්ලා ගෙන ගෙට ගියා.

"දන්නවද මම දරුවා හම්බවෙන්න ඉන්නකොට අම්මලා මාව එක්කගෙන යන්න ආවම තව මාසයක් කුඹුරු වැඩ කරලම යන්න කිව්වා. හට්ෂුකෝට ඒ නීති නෑ." සූනිකෝ සෙමෙන් සේවිකාවට කිව්වා. ඇය හිස සෙලෙව්වා.

උදේ ඔෂින් උයන ගෙට ආවා.

"ඔෂින් තදින් වහිනවා. අද ඔයා ගොවි පලට යන්න එපා. අද හට්ෂුකෝ බලන්න නර්ස් එනවා නේ. ඔකියෝ ඔෂින්වත් අද එයාට පෙන්වන්න ඕනෑ ඇහුණ ද?" තාත්තා කිව්වා.

"එයාට වින්නඹු අම්මා බැලුවාම ඇති. අනිත් එක ඒකට මුළු දවසම ගෙදර ඉන්න ඕනෑ යෑ."

"හට්ෂුකෝ නිකම්ම ගෙදර. ඔෂින් ගේ එක දවසට දොස් කියනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"හට්ෂුකෝ කියන්නේ අපේ විශේෂ අමුත්තෙක්. එයා අයිති අපට නෙවෙයි. ඒ නිසා එයා හොඳට බලාගන්න ඕනෑ. ඔෂින් ඒක තේරුම් ගන්න ඕනෑ."

"ආ....... මට අමතක වුණා. යමගාටා වලින් පාර්සලයක් ආවා. ඒකේ පරණ ඇඳුම් වගයක් තිබුණේ. මම ඒක කැඩුවා. ලිවුමක් තිබුණා මටත් ලියලා ඔෂින් ව හොඳට බලාගන්න කියලා."

ඔෂින් පාර්සලය දෑතින් ම ගත්තා.

"මෙයා මොනවා ලියලා අරිනවද දන්නේ නෑ. ඒ මිනිස්සු දන්නේ නැතිව ඇති මෙයා අපිට දෙන කරදර ගැන."

ඔෂින් කාමරයට ගොස් පාර්සලය දිගෑරියා. අම්මා ගේ පරණ කිමෝනාවකින් මසා තිබූ පුංචි ගවුම් තුනක් ඇය සෙමෙන් මුහුණට තබා සිප ගත්තා. ඔෂින්ගේ සිතට ධෛර්යයක් දැනුණා. *ඔව්, මගේ දරුවා ලැබෙන්නේ මේ ගෙදරමයි. දවසක් එයි එයාලට මා ළඟට එන්න. එතෙක් ඉවසලා ඉන්නවා.* එදා කුඹුරේ තිබුණේ වල්පැළ නෙළන්නයි. ඔෂින්ට දැඩි වෙහෙසක් දැනුණා. සවස වනතෙක් ඉවසාගෙන සිටියත් සවස නිවසට පැමිණි විගසම ඇය බිම ඇද වැටුණා.

"ඔෂින් ඇයි මේ නැගිටින්න."

රූසෝ කීවත් ඔෂින් වෙහෙස නිසා බිම වාඩි වී ඇස් පියාගෙන සිටියා. ඔකියෝ පැමිණියා.

"මේ මොකද?"

"අද ඔෂින්ට වෙහෙසයි අම්මා. මුළු කුඹුරේ ම වල්පැළ නෙලුවා. ඒ මදිවට වැස්ස."

"මොනවද මේ කියන්නේ? ගොවියෙක් ගේ බිරිඳකට ඔහොම ඇලවෙලා ඉන්න බෑ. අපට ළිඳක් තිබුණේ නැහැ. කකුල් හෝදලා මෙට්ටයක නිදාගන්න අපට ලැබුණේ නැහැ, මෙයාට වගේ. මෙයාට කිසි වැඩක් නැහැ. හවස ආවාම උයනවා කියල ද? සුනිකො යි මායි සේරම කරන්නේ. ටකේෂිගෙන් කරදරයක් තියෙනව ද? මමයි ඒ ළමයා බලාගන්නේ. මෙයාට

Scanned with CamScanner

sinhalaebooks.com



සැප වැඩියි."

"ඔෂින් නැගිටින්න." රූසෝ ගොවි උපකරණ තැන්පත් කරමින් කිව්වා. ඔෂින් හිටගත්තත් ඇය බිමට ම ඇදගෙන වැටුණා.

"ඔහෙ හිටපුවා වේ. රූසෝ නාගන්න ගිහින්."

ඔෂින් සෙමෙන් ලී බාල්දිය ළඟට ගොස් එහි දමා තිබූ වකේෂි ගේ කිළුටු රෙදි හෝදන්න පටන් ගත්තා. ඒත් ටික වේලාවකින් ඇයට එහෙම ම නින්ද ගියා. කුඹුරේ සිට පැමිණි ෆුකුටාරෝ සෙමෙන් ඔෂින් ළඟට ළං වුණා.

"ඔෂින් ඔෂින්, ඇයි අසනීපයෙන් ද?"

ඒ හඬින් අවදි වූ ඔෂින් රෙදි ලෑල්ලේ ඇතිල්ලුවා.

"ඇයි?"

"නෑ මට ටිකක් නින්ද ගියා. දැන් හරි."

ෆුකුටාරෝ ගෙට ගොස් කතා කළා තාත්තාට.

"තාත්තා ඔෂින්ට වැඩ වැඩියි. දැන් එයාට රෙදි බේසම ළඟ එහෙමම නින්ද ගිහින්. ඒක හොඳ නෑ. එයාට දරුවෙක් ලැබෙන්න."

"ඒක ඇත්ත. අපි ඔෂින්ට නිවාඩුවක් දෙමු."

තාත්තා ඔෂින් සොයාගෙන ගියා.

"ඔෂින්, ඔෂින්."

ඔෂින් සෙමෙන් දොර ඇර පියාට ආචාර කළා.

"ඔෂින් ඔයා හෙට ඉඳලා කුඹුරු වැඩට යන්න එපා. ඔයාට විවේකය ඕනෑ. එතකොට නිරෝගී දරුවෙක් ලැබෙයි. තේරුණා ද?"

ඔෂින් හිස නැමුවා. ඇය මෙට්ටය මත වැතිර හිටියා. ඒත් පසුවදා ඔකියෝ ඔෂින් සොයා ආවා.

"ඔයා ගොවි බිරිඳක්. මොකට ද විවේකය. අනිත් එක මේ පළමු දරුවා නෙමෙයිනේ. මොකට ද වේලාසන වැඩ

Scanned with CamScanner

sinhalaebooks.com



නවත්වන්නේ. කොහොමත් අන්තිම දවස වනතෙක් වැඩ කරන එකයි හොඳ."

"හොඳමයි."

ඔෂින් කුඹුරට අඳින කිමෝනාව ඇඳගෙන රූසෝ සොයා ගියා.

"යමු රූසෝ මමත් එනවා."

"මොනවා" ඔහු ඔෂින් දෙස පුදුමයෙන් බැලුවා.

"මම ඔෂින්ට කිව්වානේ විවේක ගන්ඩ කියලා."

"තාත්තා, මේ තරම් වේලාසන ඕනෑ නෑ විවේකය."

"ඔව් තාත්තා, එයා සනීපයෙන්."

"මෝඩයා, ඔෂින් ඔය යන්න යන්නේ අම්මට බයට. යන්නේ නෑ ඔෂින් ඔහොම ම නතර වෙන්ඩ."

"ඇයි අර ඔෂින් ට කුඹුරට යන්න කීවේ?"

ඔකියෝ නිහඬව හිටියා.

"ඔෂින්ට ගෙදර වැඩ කරන්න කියන්න. කුඹුරට යවන්න එපා."

ඔෂින් ඔකියෝ මුණ ගැහුණා.

"සමාවෙන්න මම උයන ගෙයි වැඩ කරන්නම්."

"එපා, ඒකට සුනිකෝ ඉන්නවා."

මෙවිටම ටකේෂි අඬන හඬ ඇසී ඇය ටකේෂි සිටි කාමරයට යන්න ගියා.

"ඔයා කොහේද යන්නේ?"

"මම ටකේෂි බලාගන්නම් අම්මා."

"එපා මම එයාව මාස අටක් ම බලාගත්තා. ඒ ළමයා ආදරේ මට. ඔයාට විවේකයක් ඕනෑ කීවේ කාමරයට ම වෙලා ඉන්න."

ඔෂින් සෙමෙන් සෙමෙන් කාමරයට ගොස් මෙට්ටය මත

Scanned with CamScanner

sinhalaebooks.com



වැතිරුණා. ටිකකින් හට්ශුකෝ සහ මව කතාකරන හඬ ඇසී ඇය සෙමෙන් ම ටකේෂි නිදන කාමරයට ගොස් ටකේෂි දෙස බලා සිටියා.

"ඔෂින්, ඔෂින්." ඒ සුනිකෝ ගේ හඬ. ඇය ආපිට ගියා.

"සමාවෙන්න, අපි නම් කෑම කෑවා. ඔය පිඟානේ නූඩ්ල්ස් තියෙනවා. ඔයාම හදාගන්න."

"හොඳයි." ඔෂින් ළිපට උණු වතුර තබා එයට නූඩ්ල්ස් දැම්මා.

"නිකම්ම කාමරයට වෙලා වැඩක් නොකර වැතිරිලා ඉන්නකොටත් බඩගිනි එනවද? පුදුමයි." ඔකියෝ කිව්වා.

"මම බඳිනකොට මගෙ නැන්දම්මා හරිම සැරයි. කොච්චර බඩගිනි වුණත් වැඩ නොකර කෑවේ නෑ. මොකද සාගා ගෑනු එහෙමයි."

"සමාවෙන්න සුනිකෝ. මට මේ නූඩ්ල්ස් එපා." ඔෂින් ආපිට යන්න හැරුණා.

"එපා? එපා නම් ඇයි තැම්බුවේ. ඇයි රූසෝ ආවාම කියන්න පුළුවන්නේ කන්න දුන්නේ නෑ කියා කේලම. යන්නේ නෑ ඔහොම නතර වෙනවා. කනවා ඔය නූඩ්ල්ස්. ඉක්මනට."

ඔෂින් නූඩ්ල්ස් කෝප්පයට දමා ගත්තා. ඇය ගේ දෑසින් කඳුළු කඩා හැලුණා.

"බොහොම ස්තුතියි කෑමට." සෙමෙන් කී ඇය ඉක්මනින් නූඩ්ල්ස් ගිල දැම්මා.

සවස තාත්තා ළඟට ගිය ඔෂින්,

"තාත්තා දැන් මට හොඳයි. මෙහෙම ගෙදරට වෙලා නිකම්ම ඉන්න බැහැ නේ මම හෙට ඉඳලා රූසෝ එක්ක කුඹුරට යන්නම්. ඔබේ කරුණාවට බොහෝම ස්තුතියි."

ඇය හිස නැමුවා.

Scanned with CamScanner

sinhalaebooks.com

# දාහතර

ඉදිරි මාසය තුළ ඔෂින්ගේත්, හට්ෂුකෝගේත් ප්‍රසූතිය සිදු වෙනවා. හට්ෂුකෝ නිතරම මෙට්ටයට ඇල වී සිටියා.

"හට්ෂුකෝ නැගිටින්න. ඔහොම කම්මැළි වෙලා බෑ. යන්න නාගන්න. ඊට පස්සේ කෑම කමු."

"අම්මා මට හරිම අමාරුයිනේ. නිදාගෙන ඉන්නත් බෑ. වාඩිවෙලා ඉන්නත් බෑ. හරිම අමාරුයි නේ."

"ඔහොම තමා ඔය අමාරු නිසා තමයි තවත් දරුවට ආදරේ ඇතිවෙන්නේ. කොහොමටත් නර්ස් ගෙන්නා හට්ෂුකො ආයෙම පරීක්ෂා කරන්න ඕනෑ."

දැන්නම් කොහොම හරි ඔෂින් මේ වහලය යටින් පිට කර ගන්න කුමක් කළ යුතු දැයි ඔකියෝ නිතරම කල්පනා කළා. එක් අදහසක් ඇති වූ දවසක සවස ඔෂින් කාමරයේ ඉන්න අවස්ථාවක ඔෂින් ගේ කාමරයට ගියා. ඔෂින් කාමරයේ දොර ඇර ඇයට ආචාර කළා.

"ඔෂින් දැන් ප්‍රසූතිය ළඟයි නේද?"

"ඔව්, මේ මාසේ දවසක"

"ආසාවෙන් බලාගෙන ඉන්නවා නේද?" ඔෂින් හිස වැනුවා.

"ඔයා වගේම හට්ෂුකෝත් ආසාවෙන් බලාගෙන ඉන්නවා. මට මේ දරුවෝ දෙන්නම එක වගේ ම වැදගත්. ඉතින් ඔෂින්

Scanned with CamScanner

sinhalaebooks.com



හට්ෂුකෝ ඉන්නේ බයෙන්. අර කතාව නිසා. මම හිතුවා අපේ අර ගබඩා කාමරය ඔයාට සූදානම් කරලා දෙන්න. එතකොට එක වහලය යට නෙමෙයිනේ. ඔෂින් තේරුම් ගන්න. ඔයයි රූසෝයි මේ ටික දවස එහෙ ඉන්න. අනේ මගෙ ඉල්ලීමට කන් දෙන්න. මේක අම්මා කෙනෙක්ගේ හිතේ තියෙන බයට කරන ඉල්ලීමක්."

ඔෂින් බිම බලාගෙන හිටියා.

තමා ගැන කෙසේවෙතත් හට්ෂුකෝ ගැන ඇය තුළ විශාල බියක් ඇති. අම්මෙක් ගේ හිතේ වේදනාව අඩුකරන්න පුළුවන්නම් කමක් නැහැ. වැඩි ඈත නෙමෙයි නේ.

"හොඳමයි."

ඔකියෝ සැනසුම් සුසුමක් හෙලුවා.

"හෙට ඔයාලා දෙන්නම වැඩට යන්න එපා. ගබඩා ගෙය අස්කරගන්න. ඉස්සර ඔය ගෙයි ගොවි පවුලක් හිටියා. මහ වැස්සටවත් කඩා වැටුණේ නෑ. හොඳ හයියයි."

රූසෝ මේ කතාවට කන් දුන්නේ කෝපයෙන්.

"රූසෝ එහෙම හොඳයි. අපට නිදහසේ ඉන්න පුළුවනි. අපි ටකේෂිත් ගෙනියමු."

පසුවදා ම ඔවුන් ඒ ගබඩා කාමරයට ගියා.

"මෙතන කුණු ගොඩක් නේ. මෙතන දරුවා ලැබෙන්න පුළුවන් ද ඔෂින්?"

"සේරට ම ඉස්සර වෙලා අපි මේව්වා අයින් කරලා පිරිසිදු කර ගනිමුකෝ."

එහි තිබූ බොහෝ ගොවි උපකරණ පිටිපස්සේ ගොඩ ගැහුවා. ඔෂින් ඇයට හැකි අයුරින් එය පිරිසිදු කර සකස් කළා.

දවල් වන විට එය අපූරු ගෙයක් ව තිබුණා.

"ලස්සණයි නේද අපේ අලුත් ගේ. රූසෝගෙයි, මගෙයි, ටකේෂිගෙයි, අලුත් බබාගෙයි නිවහන."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ නම් හිටියේ සතුටකින් නෙමෙයි. ඒ දිනවල රූසෝගේ පියා ඉඩම් ගොඩකිරීමේ වැඩ බිමට ගොස් සිටි නිසා මේ පිළිබඳ කීමට රූසෝට අවස්ථාවක් ලැබුණෙත් නැහැ.

ඔකියෝ පැමිණියා.

"හැමදාම ඉන්න නෙවෙයිනේ."

රූසෝ අහක බලාගත්තා.

"දැන් අපූරුයිනේ." ඔෂින් හිස වනා හිනැහුණා.

"තනියෙන් ඉන්න එපා. රූසෝ ඔයා මේ දවස්වල ඔෂින් එක්ක මෙහාට වෙලා ඉන්න."

"මම විතරක් නෙවෙයි මම ටකේෂිවත් ගේනවා."

"ඇයි ටකේෂි. එයාට සෙම්ප්‍රතිශ්‍යාව හැදෙයි මෙහෙ පිනිබාලා."

"ඒකට කමක් නැහැ. එයා ඒවට පුරුදු වෙන්න එපා යැ."

රූසෝ යන්න ගියා.

"ඔෂින් මම ඔයාට තෙල් කඩදාසියක් ගෙනාවා. හට්ෂුකෝට ගන්න ගමන් මම ඔයාටත් ගත්තා."

"ස්තුතියි." ඔෂින් එය අතට ගත්තා.

"බබාට ඇඳුම් තියෙනව ද?"

"ඔව්, අම්මා එවලා තිබුණා. ඒවා තමයි අන්දන්නේ."

සුනිකෝ ආවා ඔකියෝ ගියාට පසුව.

"ඔෂින් මම ඔයාට පොඩි මෙට්ටයක් හැදුවා. මේක බබාට. මමයි මැහුවේ."

"ස්තුතියි සුනිකෝ. ඔයා මම ගැන වද වෙනවට."

"ආවා නේද බලලා යන්න. ඔය බොරු ආදරයක්. ඔයා මෙතනට එවූ වරදට හිත වදදෙනවා ඇති. තාත්තා හිටියා නම් මෙහෙම කරන්න දෙන්නේ නෑ එයාට."

ඔෂින් බිම බලාගෙන හිනා වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"කවුරු ඉස්සර වෙයි ද දන්නේ නැහැ."

"සුනිකෝ මට ටකේෂි ගෙනැත් දෙනවද?"

"ටකේෂි?"

"ඔව්, මට එයාව හුරතල් කරන්න හිතුණා."

ඒ වන විටත් රූසෝ අම්මාටත් දොස් පවරා ටකේෂි වඩාගෙන ආවා.

ඒ දවස ගෙවුණේ තුන්දෙනාම එකතු වෙලා සතුටින්.

"අපි ටෝකියෝ ඉන්නවා වගේ නේද රූසෝ?"

"ඔව්, ඔව්." රූසෝ ටකේෂිව මෙට්ටය මත දමාගෙන කිති කැව්වා. ටකේෂි ගේ හිනා හඬට රූසෝත් ඔෂිනුත් හිනැහුණා.

මේ සියල්ල දෙස රූසෝ ගේ තාත්තා බලාගෙන හිටියා. ඔහු ඉක්මනට ගෙදර ගියා.

"ඔකියෝ මොකද අර ඔෂින්ලා අර මඩුවේ."

"මේ........ මේ........"

"හොඳට මතක තියාගන්නවා. මම සේරම ඉවසන්නේ අර පවුලේ සතුට නිසයි. ඔෂින් ඒ තරම් හිනාවෙනවා මම දැක්කේ අදයි. දරුවොයි සැමියයි සමඟ හරිම සතුටින්. මෙහෙ එහෙම ඉන්න බෑනේ. හොඳයි දරුවො දෙන්නම නිරෝගීව ලැබුණම මම ඉතිරි ටික බලාගන්නම්."

ඩයිකෝරෝ කෝපයෙන් ඔකියෝ දෙස බලා සිටියා.

දැන් ගොයම් කපන කාලය. ඔෂින් කුඹුරට ගියා. ඒ අවස්ථාවල විතරයි ටකේෂිව ඔකියෝට දුන්නේ. රාත්‍රී කාලයේ ටකේෂි එම මඩුවේ නොතබන ලෙස පියා කළ ඉල්ලීම සලකා රාත්‍රියට ටකේෂිව අම්මාට භාරදුන්නා. අවසන් දවස්වල ඔෂින් කුඹුරට ගියේ මව සිහිපත් කරගෙනයි. ඒක ඔෂින්ට ලොකු ශක්තියක්.

"රූසෝ දරුවා වැඩි සද්දයක් නැහැ."

"අපි වින්නඹුවට පෙන්නමු."

Scanned with CamScanner

sinhalaebooks.com



"කෝකටත් ගෙදර පැත්තේ ගියොත් හොඳයි. ඊයේ ඉඳලා හට්ෂුකෝ කෑම කෑවෙත් නැහැලු අමාරුයි කියලා." රූසෝ ඔෂින්ට කිව්වා.

"මම බලලා එන්නම්. ඔෂින් මොකද කොන්දේ අමාරුව."

"දැන්නම් එච්චර ම නෑ. ඔයා යන්න. වහින්නත් වගේ."

"රූසෝ පාරුවෙන් ගිහිල්ලා හට්ෂුකො ගේ නර්ස් එක්කගෙන එන්න." නිවසට ගිය ගමන් මව රූසෝට කිව්වා.

"හොඳයි."

ඔහු ඒ කාර්යයෙහි යෙදුණා. නර්ස් රැගෙන ආව රූසෝ ආපිට එන්න ලෑස්ති වුණත් ටකේෂි ඔහුට එන්න දුන්නේ නැහැ.

"තාත්තා මම එනවා. කෝ අම්මා."

"මේ වෙලාවේ දරුවා ගෙනියන්න එපා රූසෝ." සුනිකෝ කිව්වා.

"කෑම ටිකක් කවලා නිදි කරවලාම යන්න."

මේ අතර හට්ෂුකෝ වේදනාවෙන් කෑගහන හඬ ඇසී ටකේෂි බයටම රූසෝ ව වැලඳ ගෙන හිටියා.

ගෙයි තිබුණේ කලබල ස්වභාවයක්.

ඔකියෝ අඬාගෙන එළියට ආවා.

"හට්ෂුකෝට බබා ප්‍රසූත කරන්න පණ නෑ. විටින් විට සිහිය නැති වෙනවා. මට බලාගෙන ඉන්න බෑ."

"වෙන දෙයක් නෙමෙයි. බබා ලොකු වැඩියි. ඇයි කව කවා හිටියා කිසිම ව්‍යායාමයක් නෑ."

"නෑ මේක සාපයක්. මේ සේරම ඔෂින් නිසා."

"තාම ඔය විකාර කියවනවද?"

"මොනවා හරි නරක දෙයක වුණොත් ඔෂින් වගකියන්න ඕනෑ."

"වහනවා කට." තාත්තා බැන්නා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මට බලා ඉන්න බෑ. රූසෝ උඹ තමයි ඒ ගැනි ගෙනාවේ."

"මේ ආයිම ඔවා කිවොත් මම උඹව පන්නලා දමනවා බලාගනින්."

ඩයිකෝරෝ ඔකියෝ තල්ලු කරලා දැම්මා. සුනිකෝ දුවගෙන ආවා.

"අම්මා, අම්මා, නර්ස් කියනවා එයාට මේක කරන්න බැහැ දොස්තර මහත්තයව ගෙන්නන්නලු. එයාගේ නම කිව්වම දොස්තර එයිලු. නැතිනම් ජීවිතේ.........."

"අනේ රූසෝ යන්ඩ දුවලා යන්ඩ දොස්තර මහත්තයා ගේන්ඩ."

සුනිකෝ ටකේෂිව වඩා ගත්තා.

"ඔෂින්ට අමාරුවක් වුණොත්."

"අනේ රූසෝ ඔයාට සහෝදරී වටින්නේ නැද්ද? අනේ යන්ඩ පුතේ. දුවලා පලයන් පුතේ."

"එළියේ වැස්ස ආ කුඩේ අරගෙන යන්ඩ." සුනිකෝ කුඩයක් දුන්නා.

"ඔයා මේ වෙලාවේ පිහිට වෙන්න රූසෝ. හවසත් ඔෂින්ට අමාරුවක් තිබුණේ නැහැනේ."

"හොඳයි මම ඔෂින් වෙනුවෙන් මේ ගමන යන්නේ. මොනවා හරි වුණොත් ඒ වරද යන්නේ මගෙ අහිංසක ඔෂින් පිටින්."

රූසෝ වැස්සේම දුවන්න පටන් ගත්තා.

ඔෂින් ලන්තෑරුම පත්තු කළා. එවිටම ඇයගේ කොන්ද දිගේ වේදනාවක් ආවා.

"අම්මා......" ඇය බිම වාඩි වුණා.

"නෑ, මේක සාමාන්‍යයි ඉවසමු. අම්මා.......... මට ශක්තියක් වෙන්න අම්මා." ඒත් දෙවන වර ඒ වේදනාව දෙගුණ වුණා. ඔෂින් කාමරයට දණ ගාගෙන ගියා. තෙල් කඩදාසිය බිම එලූ ඔෂින් ඒ මත වැතිරුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අනේ අම්මේ, රූසෝ එන්න ඉක්මනට, මට අමාරුයි සුනිකෝ අම්මා..........."

ඇයගේ මේ කිසිම හඬක් නෑසුණේ ගෙදර පැවති කලබලය නිසයි. නින්දෙන් අවදි වූ ටකේෂිත් අඬන්න පටන් ගත්තා.

තවත් පැයකින් පමණ රූසෝ දොස්තර රැගෙන ආවා රික්ෂෝවකින්. දොස්තර නිවස තුළට ගියා. තවත් විනාඩි 10 යක් ඇතුළත හට්සුකෝගේ බිලිඳාගේ හඬ ගේ පුරා විසිරී ගියා.

හැමෝම සතුටින් එකිනෙකා අල්ලා ගත්තා.

"ස්තුතියි රූසෝ." ඔකියෝ දුවගෙන විත් රූසෝ ව වැලඳ ගත්තා.

"අම්මට දැන් සතුටුයි නේ. මම ඔෂින්ට කියන්නම්."

රූසෝ මඩුවට දුවගෙන ගියා. මේ වන විට නිවසට යෑමේ බලාපොරොත්තුවෙන් වේදනාවෙන් ම එළියට බඩගාගෙන පැමිණි ඔෂින් වැස්සේ ම මිදුලේ මුහුණ ජලයට යට කරගෙන බිම වැටී සිටියා.

"ඔෂින්..... ඔෂින්......"

රූසෝ කෑගැහුවා. ඔෂින්ව බිම දිගේ ගැලූ වතුරින් නෑවිලා. මුහුණේ රොඩු රැඳී තිබුණා. රූසෝ කෑගහමින් ඔෂින් ව නිවසට ඔසවාගෙන ගියා. ඇයගේ ජීවිතය බේරා ගන්න හැකි වුණේ රූසෝ තම සොයුරියගේ ජීවිතය බේරා ගැනීමට නිවසට ගෙන ආ වෛද්‍යවරයා නිසයි.

රූසෝ හිස බදාගෙන බිම වැටී ඇඬුවා.

"තාත්තා, ඔෂින්ට මොනවා හරි වුණොත් මම ජීවත් වෙන්නේ නැහැ."

"රූසෝ බයවෙන්න එපා. දොස්තර මහත්තයා ඉන්නවානේ."

තව දින කීපයක් ම ඇය සිහිසුන්ව සිටිය හැකි බව පැවසූ වෛද්‍යවරයා පසුවදාත් ඇය බැලීමට එන බව පවසා සිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ නැවත රික්ෂෝවෙන් ඔහු ගෙන ගියා.

පසුදා සිට නිවස උත්සව ශ්‍රීයක් ගත්තා. ගමේ සැම දෙනාම දරුවා බලා ආශිර්වාද කරන්න ආවා. සැම දෙනාටම කෑම බීම සකස් වුණා. අමුත්තන් සමඟ මව හිනැහෙන විට රූසෝට ඇති වුණේ වේදනාවක්, පිළිකුලක්. සිහි නැතිව සිටින ඔෂින්ගේ හිස අතගාමින් රූසෝ,

"ඔෂින් ඔයාට ඉක්මනට සනීප වෙයි." කිව්වා.

සුනිකෝ ආහාර බඳුන් සහිත බන්දේසියක් රැගෙන ආවා.

"තවම සිහිය ආවේ නැද්ද රූසෝ?"

"නෑ," ඔහු කිව්වා.

"මෙතන ඔයාගේ කෑම තියෙනවා කන්න. ඔෂින්ට සිහිය ආවාම රස්නෙන් ම කෑම දෙමු. මම ඒවා රත්කරලා ගෙනැත් දෙන්නම්."

"මට කන්න බෑ."

"රූසෝ ඔයාට වේදනායි කියලා මම දන්නවා. නමුත් ලෙඩා බලාගන්න ඔයාටත් ශක්තිය තියෙන්න එපායැ. කන්න."

ඔෂින්ට එදා රාත්‍රියේ සිහිය ආවා.

"ඔෂින්, ඔෂින්" රූසෝ ඔෂින් ගේ හිස අතගෑවා.

"කෝ දරුවා? මට මතකයි දුවෙක් නේද?"

"ඔෂින් දොස්තර මහත්තයා බෙහෙත් වගයක් දීලා ගියා. ඔයාට සිහිය ආවාම කන්න දීලා ඒ බෙහෙත් දෙන්න කිව්වා. සුනිකෝ කෑම රත්කරලා ගෙනත් තිබ්බා. අපි කාලා බෙහෙත් බොමු."

රූසෝ ඔෂින් ගේ හිස ඔසවා කැඳ ටික ටික පෙව්වා.

බෙහෙත් ටිකත් පෙව්වා.

"රූසෝ, දරුවා බලන්න ගේන්න."

"අම්මා දරුවා බලාගන්නවා. ඔයාට වෙහෙසෙන්න හොඳ

Scanned with CamScanner

sinhalaebooks.com



නෑ කිව්වා නේ දොස්තර මහත්තයා."

"ඒත් බබාට කිරි දෙන්න ඕනෑ."

"ආ එයාට කිරි දුන්නා."

"කිරි දුන්නා?"

"ඔව්, මට කියන්න බැරි වුණානේ හට්ෂුකෝට්ත් දුවෙක් ලැබුණා."

"ඔය ඇත්ත ද? අනේ හොඳයි. එයා මගෙ දුවටත් කිරි දුන්න ද? ස්තූතියි කියන්න අම්මටයි, හට්ෂුකෝට්යි."

"ඔච්චර කතා එපා. දැන් නිදාගන්න."

"මට ලෙඩක් නෑ රූසෝ. මම ගියේ ගෙදර යන්ඩ. ඊට පස්සේ මතක නෑ." ඔෂින් කල්පනා කළා.

"මම හැමෝටම කරදර කළා."

"ඔයා ඔහොම ඉන්න."

"රූසෝ බබාව ගෙනෙන්න."

"හොඳයි."

රූසෝ සුනිකෝ සොයාගෙන ගියා.

"ඔෂින්ට සිහිය ආවා."

එවිටම නිවසට පැමිණ සිටි අයගේ සිනා හඬත්, අම්මා ගේ ප්‍රීතිමත් හඬත් ඇසුණා. රූසෝට ඇතිවුණේ කෝපයක්.

"හිතක්, පපුවක් නැති එවුන්." රූසෝ කෑගැහුවා.

ඩයිකුරෝ හා ඔකියෝ එළියට දුවගෙන ආවා.

"රූසෝ, ඇයි මේ කෑගහන්නේ.?"

"උඹලා මනුස්සයෝ ද මෙහෙම හිනා වෙන්ඩ. අපට දුකක් දීලා උඹලට......."

"රූසෝ නවත්වනවා ඔය කතා." තාත්තා කිව්වා.

"අපට දෛවය වෙනස් කරන්න බෑ රූසෝ."

Scanned with CamScanner

sinhalaebooks.com



"මම දන්න දෛවයක් නෑ. එදා මම දොස්තර ගේන්ඩ නොගියා නම්, මම ගෙදර හිටියා නම්." රෑසෝ වැලපෙන්න පටන් ගත්තා.

"මට එයාගේ මූණ බලාගෙන ඇත්ත කියන්න බෑ. ඇත්ත කොහොම කියන්නද ඔෂින් දරුවා ඉල්ලනවා. මම කොහොමද ඇත්ත කියන්නේ? එයාගෙ පපුව පැළිලා මැරෙයි තාත්තේ."

"රෑසෝ ඔයා දුක්වෙන්න එපා. එයාට වසන් කරන්න එපා. මම කතා කරන්නම්."

ඩයිකෝරෝ රෑසෝ සමඟ ඔෂින් ගේ කාමරයට ගියා.

"ඔෂින් දැන් ඔයාට සනීපද?"

"ඔව් තාත්තා. ඔය ගොල්ලන්ට මම කරදර කළා. සමාවෙන්න ඒ ගැන."

"ඔෂින්ට සනීප වුණ නිසා අපට සතුටුයි."

"රෑසෝ කෝ බබා ගෙනාවේ නැද්ද?"

"ඔෂින් දුක්බර පුවතක්.........." මොහොතක් නිහඬව සිට ඩයිකෝරෝ කතා කළා.

"ඔයාගේ දරුවා ඉපදෙනකොට මිය ගිහින්."

"වෙන්න බෑ." ඔෂින් මෙට්ටය උඩ වාඩි වුණා.

"දුර්වල බබෙක්."

"නෑ වෙන්න බෑ. දරුවා ජීවත් වුණා රෑසෝ. මම එයාව රෙදිකඩක එතුවා. ඇඟ උණුසුම් බව දැනුණා. එයා අඬන හඬ මට ඇහුණා. පොඩියි. ඒත් පණ තිබුණා. හද ගැස්ම මට දැනුණා."

"මේ අහන්න ඔෂින් ඔයා මිදුලේ වැටිලා හිටියේ වතුරේ. දොස්තර නොහිටින්න ඔයා ගේ ජීවිතේ බේරෙන්නේ නෑ. ඔයා තවම තරුණයි. ඔයාට තව දරුවෝ හදාගන්න පුළුවනි. ඔෂින් මම දන්නවා ඔයාගේ හිත ශක්තිමත්."

"ඒ වුණාට රෑසෝ දරුවට පණ තිබුණා මම දරුවා ගන්නකොට."

Scanned with CamScanner

sinhalaebooks.com



"නෑ ඔෂින් දරුවා ඉපදෙනකොට මැරිලා. හරිම පුංචියි. පෝෂණය අඩුයිලු."

"රූසෝ දූවට මම නමක් දැම්මා. නශෝමි. ඒකේ තේරුම කරුණාවන්ත කියන එකයි. දූව අඬනවා. ගේන්න නශෝමිව කිරි දෙන්න ඕනෑ. මගෙ නශෝමි ගේන්න රූසෝ."

ඔෂින් රූසෝව වැලඳ ගත්තා.

ඔෂින් ඒ මොහොතේ සිට දිග කල්පනාවකට වැටිල හිටියා. කිසිවක් නෑසුන ආකාරයට. ඇය ටිකක්වත් අවනත වුණේ සුනිකෝට පමණයි.

"ඔෂින් ඉන්න මම ඔයාගේ මුහුණ සෝදන්න."

සුනිකෝ උණු වතුරින් මිරිකූ තුවා වලින් ඇයගේ මුහුණ අත් සෝදා දැම්මා. සෙමෙන් හිස පීරුවා. සුනිකෝ රෙදි කඩක් ඔෂින් ගේ ළයට තද කර කිරි ඉවත් කළා. ඔකියෝ ඒ දෙස බලාගෙන හිටියා.

"මටත් දුකයි රූසෝ."

"අම්මා එයාට හුඟක් වද දුන්නා. මමත් බැන්නා."

"එයාට කිරි දෙන්න දරුවෙක් නෑ. කිරි ඉවත දමන්න වෙලා. ඒත් හට්සුකෝ ගේ දරුවා බඩගින්නේ අඬනවා. එයාට දෙන්න හට්සුකෝට කිරි නැහැ."

"හොඳ වැඩේ." සුනිකෝ රූසෝට පමණක් ඇහෙන්න කිව්වා.

"රූසෝ අනේ වැරදි විදිහට හිතන්න එපා. අර දරුවා බඩගින්නේ අඬනවා. මට බලා ඉන්න බෑ."

"අම්මට ඒවා නම් බලා ඉන්ඩ බැහැ නේන්නම්."

"අනේ රූසෝ ඔෂින් ගේ කිරි ටිකක් දරුවට දෙමු. කාගේ වුණත් දරුවෙක් නේ."

"ඔයා නම් ගළප ගළප කියයි. මට බෑ ඕවා කරන්න."

"එපා මගෙ දරුවට ඒ ගෑනි ගේ කිරි දෙන්න." හට්සුකෝ කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"කටවහගන්නවා. උඹ හදන්නේ ළමයා මරන්න ද?" ඒ කිවේ හට්ෂුකෝ ගේ සැමියා.

"රුසෝ ඔයා ඔෂින්ට කිරි දෙන්ඩ ඉඩ දෙන්ඩ. නැත්නම් කිරි තද වෙලා ඔෂින්ට උණ ගැනෙයි."

සුනිකෝ සෙමෙන් කිව්වා.

ඔකියෝ දරුවා රෙදි කඩක ඔතා රුසෝ අතට දුන්නා.

රුසෝ දරුවාව ඔෂින් ළඟට ගෙන ගියා.

"ඔෂින්, ඔෂින්... මේ අහන්ඩ දරුවට බඩගිනියි. කිරි ටිකක් දෙන්ඩ."

ඔෂින් බොහෝ වේලාවක් රුසෝ දිහා බලාගෙන ඉඳලා දරුවා දිහා බැලුවා. රුසෝ දරුවා ඇයගේ අතට දුන්නා. ඇය දරුවා දිහා බැලුවා. සුනිකෝ ඔෂින්ට උදව් වුණා. දරුවා කිරි උරා බිව්වා. රුසෝ හිටියේ ඉවත බලාගෙන. ඔකියෝ පුදුමයෙන් ඔෂින් දෙස බලාගෙන හිටියා. දරුවා දිගු නින්දකට වැටී හිටියා.

"අනේ ඉපදුණාට පස්සේ බඩ පිරුණේ අදයි."

ඔකියෝ දරුවා වඩාගෙන ඇය දෙස බලාගෙන හිටියා.

ඔෂින් දරුවට ඇතිවෙන්න කිරි දුන්නා. මුහුණේ තිබුණේ ශාන්ත පෙනුමක්. හරියට දයාවේ දෙව්දුවගේ ප්‍රතිමාව වගෙයි හිටියේ. ඒ ඇගේ දරුවා නෙවෙයි කියලා දැනගත්තාම...........

"හට්ෂුකෝ ඔයා ඔෂින්ට ණය ගැතියි. බලන්න මේ දරුවා දවස් කීයක් ඇඬුවද බඩගින්නේ."

"සුනිකෝ ඔෂින්ට හොඳ පෝෂ්‍ය කෑම දෙන්න ඕනෑ."

"හොඳයි මම ඒවා සූදානම් කරන්නම්."

සාගා වලට ආවට පසු ඔෂින් බඩ පිරෙන්න කෑවේ මේ කිරි දීමට ගත්තාට පස්සෙයි. සුනිකෝ ඔෂින්ට කවන විට අකමැත්තක් නොදක්වා කෑවා. සෑම දිනකම හත් අට පාරක් දරුවට කිරි දුන්නා. දිනක් රුසෝ ඔෂින් ළඟට වී ඇයගේ උර හිසෙන් අල්ලා ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින්....."

"රූසෝ කිරි දෙනකොට එයා මා දිහා බලාගෙන හිටියා. එයා හිතන්න ඇති මම අම්මා කියලා."

"මොනවා ඔයා දැනගෙන හිටිය ද?"

"ඇයි හට්ෂුකෝට කිරි එරිලා නැද්ද? කමක් නෑ මම උදව් කරන්නම් මගෙ නශෝමි වෙනුවෙන්."

"නශෝමිත් හිටියා නම්........."

"නෑ රූසෝ එයා දුර්වල ළමයෙක්. හිටියත් එයා ලෙඩෙක් වෙයි. කිසි පෝෂණයක් නැති එහෙම දුර්වල ළමයෙක් ගෙන් වැඩක් නැහැ."

"ඔෂින්."

"ඔව් රූසෝ, මම වින්ද දුක් වල අවසාන ප්‍රතිඵලය වුණේ මළ දරුවෙක් ප්‍රසූත කරන්න වීම පමණයි."

"ඔෂින්, ඔයා හොඳ සිහියෙන්. මට හරි සතුටුයි ඒ ගැන......"

"නශෝමි අමතක කරනවා. පසුගිය දේවල් සේරම. මගෙ ටකේෂි වෙනුවෙන් මම ජීවත් වෙනවා."

"මට සමාවෙන්න ඔෂින් මම එදා ගෙදර හිටියා නම් මෙහෙම වෙන්නේ නෑ."

"වද වෙන්න එපා රූසෝ. මම ඒක අමතක කරන්නම්. මේ ලෝකයේ අවසානය නෙමෙයි නේ. මට ටකේෂි ඉන්නවා. මම එයා වෙනුවෙන් ඉදිරියටත් වැඩ කරන්නම්. ඉක්මනට සනීප වෙන්ඩ ඕනෑ. මුල ඉඳලා පටන් ගන්න ඕනෑ."

"අන්න හොඳයි. දැන් ඔයාට හොඳයි. ඉන්න මම අම්මටයි, සුනිකෝටයි කියලා එන්නම්."

උයන ගෙට ගිය රූසෝ සුනිකෝට කතා කළා.

"සුනිකෝ දැන් ඔෂින්ට සනීපයි. ඔයාට ස්තුතියි. ඔයයි එයාගේ හෙදකම් කළේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා ඔෂින් දන්නවා ඒ හට්ෂුකෝ ගේ දරුවා කියලා."

"මොනවා ඇත්ත ද? මම ඔෂින්ට කතා කරන්න ඕනෑ."

ඔකියෝ ඔෂින් සොයාගෙන ගියා.

"ඔෂින්, මට සමාවෙන්න. මම ඔයාට හුඟක් කරදර කළා. ඔයා තව දවස් දෙකක් දරුවට කිරි දෙන්න. එයාව පන්සල් ගෙනිහින් පියාගේ ගෙදරට ගෙනියනවා. එහෙත් කිරි අම්මා කෙනෙක් හොයා ගන්නවා. එතෙක් දරුවට කිරි දෙන්න ඔෂින්."

"අම්මා වද වෙන්න එපා. මම දරුවට කිරි දෙන්නම්."

"අපි හැමෝම ඔයාට ණය ගැතියි. ඔයා තවම තරුණයි. ඊළඟ සැරේ මම ඔයාව ආරක්ෂා කරනවා ඔෂින්."

"අම්මා ඔයාට තේරුණා ද? නශෝමි ඉපදෙනකොට එයාට පණ තිබුණේ නෑ. අඬන්න ශක්තිය තිබුණේ නෑ. ඒ එයාට පෝෂණය නොතිබුණ නිසා."

"මින් පස්සේ මම එහෙම කරන්නේ නැහැ ඔෂින්. මාව විශ්වාස කරන්න. මම දිවුරනවා මම ඔයාව හොඳින් බලා ගන්නම්. හෙට බබාට නම දමන උත්සවය. ඔෂින් ඒකට එන්න. දන්නවද එයාට නම දමන්නේ නශෝමි කියලා. ඔයාගේ නශෝමි මතක් වෙන්න."

"පිස්සුද අම්මා මැරුණ ළමයෙක් ගේ නමක් දැම්මේ."

"හට්ෂුකෝ නශෝමි කියන්නේ කරුණාව කියන එකයි. ඔයා ගේ දුව ඔයාට වඩා කරුණාවන්ත වෙයි. මේ දරුවා හරියට කිරි බොනවා. ඔෂින්ට නිතරම කෑම අරින්න සුනිකෝ."

සුනිකෝ ඔෂින් බලන්න ගියා.

"මම ඔයාට හුඟක් කරදර කළා සුනිකෝ."

"ඔෂින්, ඔයා නම් දැමීමේ උත්සවයට එන්න එපා. ඒක ඔයාට දුකක් වෙයි. මට ඔයා ගැන දුකයි. දැන්නම් අම්මා ඔයා ගැන පැහැදිලා. ඔයා ටනකුරා පවුලේ ලේලියක් කියලා භාර අරගෙන. මම දන්නවා ඔෂින් අහිංසකයි කියලා. ඒත් මට ඔයා වෙනුවෙන් කතා කරන්න ඉඩක් නැති බව ඔයාට පේනවානේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"සුනිකෝ මම දන්නවා ඔයා ගැන. ඔයා නැන්දම්මා නිසා සියල්ල ඉවසා කරනවා. මමත් එහෙම හිටියා නම් මේ ප්‍රශ්න නැති වෙන්න තිබුණා. එයා අපේ විවාහයට අකමැතිව නේ හිටියේ."

"ඔන්න ටකේෂි අම්මා බලන්න ඇවිත්."

"එන්න පුතේ, දැන් ඔයා හුඟක් ලොකුයි නේ."

පසුවදා හට්සුකෝ ගේ දරුවා පන්සලට රැගෙන ගියා. ඔෂින් දරුවට කිරි දුන්නා.

"ස්තුතියි ඔෂින් ඔයාට." ඔකියෝ කිව්වා.

එදා ඔෂින්ට ලිපියක් ආවා. එය එවා තිබුණේ සාවා.

***මට සමාවෙන්න ඔෂින්, මටත් ඔයාට ලියන්නත් ලැජ්ජයි. දැන් මම ගිහින් මාස හයක්. මම ඔයාගෙන් සමාව අයදිනවා. ඔයාට දරුවා ලැබෙන්න ඇති නේද? නිරෝගී දරුවෙක් වේවායි පතමි. මම මෙහෙ බොඳුන් හලක වැඩ කරනවා. ඔයා ටෝකියෝ ආවොත් මාව මුණගැහෙන්න.***

පන්සලේ සිට පැමිණි ඔකියෝ ඔෂින් සොයාගෙන ආවා.

"ආ ටකේෂිත් මෙහේ ද? පන්සලේ වැඩ ටික හොඳින් සිදු වුණා. ඔයාටයි ස්තුති කරන්න ඕනෑ."

ටකේෂි ඔකියෝ ගේ ඇකයට පැන්නා.

"ටකේෂි ඔය කවුරු හිටියත් මම ඔයාටයි වැඩියම ආදරේ. ඔයා ටනකුරා කෙනෙක් නේ. ටකේෂි හොඳ දරුවෙක්. වද දෙන්නේ නෑ. එන්න ටකේෂි අපි නාන්න යමු. අම්මා ඔහෙ නිදහසේ හිටපුදෙන්."

ඔෂින්ට තේරුම් ගියා ඔකියෝ මුල සිටම සැලසුම් කර වැඩ කළ සැටි. පළමුවෙන් ඇයගෙන් ඈත් වුණේ රූසෝ. ඔහුට නිදා ගැනීමට වෙනම ම කාමරයක් ලැබුණා. ඉන්පසු ටකේෂිව ඇය ළඟට ගත්තා. මේ සේරට ම පසු නිතර ඔෂින්ට කිව්වේ පිට වී යන්න කියලයි. ඒ සියල්ල ඇයට ඉවසීමට හැකියි. ඔෂින්ට පෝෂ්‍ය ආහාර නොදී නිතර කුඹුරට යැවීමෙන් සිදු වූයේ දුබල මළ දරුවෙක් බිහි කරන්න. ඇයට එය නම් අමතක කිරීමට, නොතකා හැරීමට නොහැකි වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් ළඟට ගිය රූසෝ,

"ඇයි ඔෂින් ඔය කල්පනා කරන්නේ?" සෙමෙන් ඇසුවා.

"රූසෝ මම මේ ගෙදරින් පිටවෙන්න තීරණය කළා."

"මොනවා? ඇයි ඒ සාවා ගේ ලියුම නිසා ද? මොකට ද ඒ ලියුම ගණන් ගන්නේ."

"නෑ රූසෝ ඒ නිසා නෙමෙයි. නශෝමි මළ දා ඉඳලා මට මෙහෙ එපා වුණා."

"මම පිළිගන්නවා ඔෂින්. අම්මා ඔයාට හුඟක් වද දුන්නා."

"ඔව්, රූසෝ දරුවා දුර්වල වුණේ වැඩ වැඩි වුණ නිසයි. වැඩ කළාට පෝෂණය නැහැ. මම වැඩ කළා පැමිණිලි කළේ නැහැ. සේරම දරුවා වෙනුවෙන් ඉවසා ගෙන හිටියා. මම දුක් විඳලා තිබුණේ දුර්වල දරුවෙක් වෙනුවෙන්. අඬන්නවත් පණ නොතිබුණ ප්‍රාණයක්. මගෙ වරද මම හිතුවේ හැමෝම සතුටු කරන්න. මම මීට ඉස්සර යන්නේ. ඒත් අර දරුවාට කිරි දෙන්න ඕනෑ නිසයි නතර වුණේ. දැන් මගෙන් වැඩක් නෑ. නශෝමි මැරුණේ මගෙ වරදින්. මට තව දුරටත් මෙහෙ ඉන්න බෑ රූසෝ. රූසෝ ඔයාට එන්න බැහැ නේද?"

"ඔෂින් ඉඩම් ගොඩ කළා විතරයි. ඒවා දාලා යන්න බැහැ. ඔයා ඉන්න තව අවුරුද්දක්. ඒ ඉඩම් අපේ."

"බැහැ රූසෝ. අවුරුද්දක් හිටියා. ඒක නිරයක්. හුඟක් දරුණුයි. මොකක් ද මට වුණ වාසිය. දුකම විතරයි. අනේ රූසෝ මට උදව් කරන්න. මට මෙහෙන් පිටවෙලා යන්න ඕනෑ. හැබැයි මම යන්නේ මගෙ දරුවා අරගෙන."

පසුවදා ම ඔෂින් ඔකියෝත්, ඩයිකෝරාත් මුණ ගැහුණා.

"සමාවෙන්න මම ඔබ දෙපළ මුණ ගැහෙන්න ආවේ."

ඔෂින් ඔවුනට හිස නමා ආචාර කළා. රූසෝත් ඇය පසෙකින් වාඩි වුණා.

"යන්න කලින් ඔබ දෙපළගෙන් සමුගන්නයි ආවේ."

"යන්න. කොහේ යන්න ද?" ඔකියෝ ප්‍රශ්න කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම හෙට උදේ මෙහෙන් පිට වෙනවා."

"ඇයි ඔෂින් මේ හදිස්සියේ." පියා ඇසුවා.

"තාත්තා ගේ කරුණාව මට හැමදාම මතක තියෙනවා. සමාවෙන්න මට මෙහෙ මොනවත් නැහැ. වින්දේ කරදර විතරමයි."

"මම දන්නවා ඔෂින් ඔයාට මේ ගෙදර අලුත් තැනක් නිසා කරදර තිබුණා. මා අතින් වැරදි සිද්ධ වුණා. මම ඒවා කළේ පෞද්ගලිකව ඔයා එක්ක තරහට නෙමෙයි. ඔයාව හදා ගන්න. දැන් ඒ සේරම ඉවරයි. ඇයි ඔයා වෙන්වෙන්ඩ හිතුවේ."

"මට තේරෙනවා ඔෂින් ඔයා ගේ දුක. ඒත් කොහේ යන්න ද? තියෙනවද සැලැස්මක්."

"රූසෝ ඔයා කැමති වුණා ද ඔෂින් යනවට" තාත්තා ඇසුවා.

"නැහැ මම එකඟ නැහැ." රූසෝ කිව්වා.

"රූසෝ නේනවා නම් මා එක්ක මම තනියම යනවා. ස්තුතියි මට කළ උපකාර වලට. මට බැරිවුණා ඒවා වලට උපකාර කරන්න. මට තනි නැහැ. මම යන්නේ ටකේෂි එක්ක."

"ටකේෂි එක්ක? ඇයි ඒ ළමයත් මරා ගන්ඩ ද? මම දෙන්නේ නෑ ටකේෂිව ගෙනියන්න. එයා ගේ තාත්තා මෙහේ. එයා ටනකුරා කෙනෙක්." ඔකියෝ කිව්වා.

"මමයි එයා ප්‍රසූත කළේ. මම එයාව අරගෙන යනවා."

"ඔයාට පුළුවන්ද ළමයෙක් එක්ක වැඩට වත් යන්න. බැහැනේ." තාත්තා කිව්වා.

"නෑ මට පුළුවනි තාත්තා. අපි පුංචි කාලේ මල්ලිලා නංගිලා වඩාගෙනයි කුඹුරේ වැඩ කළේ."

"ඒ නංගිලා මල්ලිලා වෙනයි. මේ අපේ මුණුබුරා ගෙනියන්න දෙන්නේ නෑ මම. රූසෝ ඔයා දමලා යනවා නම් එයා ගියාවේ. ඒ වුණාට දරුවා ගෙනියන්න නම් දෙන්නේ නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"මම මගේ දරුවා දමලා යන්නේ නෑ."

ඔෂින් කියන විට,

"බලමු ගෙනියන හැටි." ටකේෂිව රැගෙන ඔකියෝ කාමරයට ගියා.

ඔෂින් කාමරයට ගොස් ඇඳුම් සකස් කළා. රූසෝ කාමරයට ආවා.

"ටකේෂි නම් දෙන එකක් නෑ අම්මා. ඔයාම දැක්කනේ අම්මා ටකේෂි එක්කමයි හිටියේ. අනිත් මුණුබුරන් නෙමෙයි එයාට වටින්නේ ටකේෂි. ඔෂින් ටකේෂි තියලා යන්න බැරි ද?"

"බැහැ රූසෝ මට ටකේෂිව ගෙනියන්න ඕනෑමයි. රූසෝ තේරුම් ගන්න මට ඕනෑ ඔයාගෙන් වෙන්වෙන්න නෙමෙයි. මේක තාවකාලික වෙන්වීමක්. දවසක අපි නැවත එක්වෙයි. මගේ පැතුම ඒකයි රූසෝ."

"ඔෂින්, මම දන්නවා ඔයා ගේ හිත තදයි. ඔයාගේ තීරණය වෙනස් කරන්න මට බැරි බව දන්නවා. මම ඉඩම් වවලා ආයිම ඔයාව එක්කගෙන එනවා. ඒ අපේම ගෙදරකට. ඔයා කොහේ ගියත් ප්‍රවේශම් වෙන්න. වැඩිය වැඩකරන්න එපා. මම ඔයාට සල්ලි ටිකක් දෙන්නම්."

"එපා රූසෝ, කායෝ දුන්න සල්ලි වලින් ටිකක් තියෙනවා. ඒ හොඳටෝම ඇති."

"ඔෂින් මට සමාවෙන්න. මෙහෙම තත්වයක් උදාවෙයි කියලා හිතුවේ නැහැ. නැත්නම් මම ඔයාව සාගා ගෙනෙන්නේ නෑ."

"මම දන්නවා රූසෝ, ඔයා මාවයි දරුවයි සාගා ගෙනාවේ ජීවත් කරවන්න. අපේ අනාගතය වෙනුවෙන්. රූසෝ අපේ වෙන් වීම මෙහෙම සිද්ධ වුන එක හොඳයි. දවසක අපි එක්වෙමු. හැබැයි මට ටකේෂිව ඕනෑ ගෙනියන්න."

"ඒත් අම්මා නොදුන්නොත් මොකද කරන්නේ."

ඔෂින් උදයෙන් ම උයන ගෙට ගියා. ෆුකුටාරෝ ඔෂින්

Scanned with CamScanner

sinhalaebooks.com



හමුවට පැමිණියා.

"මේක තියාගන්න ඔෂින්. ඔයා හුඟක් මහන්සි වෙලා වැඩ කළා. ඒකෙන් අපේ අස්වැන්න වැඩි වුණා. මේ ඔයාට අයිති මුදලක්. මේක ගන්න."

ඔෂින් ඔහු දෙස බලාගෙන හිටියා.

"ගන්න ඔෂින්." සුනිකෝ කිව්වා.

ඔෂින් හිස නමා අත් දෙකෙන්ම ඒ මුදල් කවරය ගත්තා.

"ස්තූතියි අයියා ඔබේ කරුණාවට."

"සුනිකෝ මට උදව් කරන්න ටකේෂි අරගෙන යන්න. මම අම්මාගෙන් ඉල්ලන් නෑ."

"ඉල්ලුවාට නම් දෙන්නේ නැහැ. මම කියන්න ද ඔයා අම්මාට යන්නම් කියලා යන්න. ඔයා මඟට වෙලා ඉන්න. මම දවල් වෙලා ටකේෂිව අරගෙන එන්නම්. ඔයා මාව විශ්වාස කරන්න. මම ගේනවාමයි."

"සුනිකෝ මම ගෙන්ජි ගේ සොහොන ළඟ ඉන්නම්."

ඔෂින් ඔකියෝ සොයා ගෙන ගියා.

"මම ගිහින් එන්නම්."

ඔකියෝ ආපිට හැරී කාමරයට ගියා.

"ඉක්මන් කරන්න ඔෂින්. ඉක්මනට මෙහෙන් පිටවෙලා යන්න."

ඔෂින් එළියට ආවා. නැවත කවදාවත් සාගා එන්නේ නෑ ඇයට හිතුණා. ඇයගේ දුක දන්න පිළිකන්නේ වූ උණ පඳුර දෙස බැලුවා. සමුගත්තා.

"ගියා ද?" ඔකියෝ ඇසුවා.

"ඔය ගියේ. මට නම් පේන්න බෑ. කිසිම ගරුසරුවක් නැති ගෑනියෙක්." සුනිකෝ කිව්වා.

"ඒක නම් ඇත්ත. කෝ රූසෝ?"

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ ඔෂින් ළඟට ආවා.

"මේක ඔයාට දෙන්න කිව්වා තාත්තා."

රූසෝ ඔෂින් ගේ අත අල්ලා එහි මුදල් කවරයක් තිබ්බා.

"අයියත් දුන්නා. මේක ඔයා තියාගන්න."

"එපා ඔයා අරගෙන යන්න. ඔෂින් මම ඔයා එක්ක ස්ටේෂමට එන්නම්."

"එපා එතකොට හිතට දුකයි. අපි වෙන් වෙන්නේ තාවකාලිකව නේ. ළඟදීම ඔයාට ටෝකියෝ එන්න වෙනවා. මම ඒ ගැන හුඟක් උත්සාහ ගන්නවා. මම යන්නම් රූසෝ."

දෙන්නාම හිස නමා ගෞරව කළා.

ඔෂින් ගියා. ඇය ගෙන්ජි ගේ සොහොන ළඟට ගියා. සමුගත්තා ගෙන්ජිගෙන්. සුනිකෝ එන තෙක් බලා හිටියා.

"සුනිකෝ මම නාන්න යනවා."

"හොඳමයි."

සුනිකොට සතුටක් දැනුණා. ඇය ටකේෂිව සෙව්වා. ඔහු සිටියේ සුකී සමඟයි.

"එන්න ටකේෂි දැන් ඔයාට ඉන්නේ තාත්තා විතරනේ. ඒත් අපි ඉන්නවානේ. ආ මෙන්න ඔයාගේ යට ඇඳුම් තෙමිලා. එන්න අපි මේවා මාරු කරමු."

ටකේෂි රැගෙන සුනිකෝ දුවන්න පටන් ගත්තා. ඔෂින් ඇය හමුවට මඟට පැමිණියා.

"සුනිකෝ ඔයා මට ලොකු උදව්වක් කළේ."

"ඉන්න ඔෂින් අපි දරුවාව ඔයා ගේ පිටේ බඳිමු."

"ඔෂින් මට ඉරිසියයි ඔයා ගැන. ඔයාගේ හිත හයියයි. ඒ අතින් අපි බය ගුල්ලෝ. අම්මට තව මුණුබුරෝ ඉන්නවා. එහෙම නම් ප්‍රවේශමෙන් යන්න ඔෂින්. "

සුනිකෝ කුඹුරෙන් රාබු කොළ ටිකක් රැගෙන ගෙදර ගියා. ඒ වන විට ඔකියෝ ටකේෂි ව සොයනවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"සුනිකෝ ඔයා ටකේෂිව ඔෂින්ට ගිහින් දුන්නා ද?"

"පිස්සුද අම්මට මට ඒ ගැනි පේන්න බෑ. ඇයි සුකි එක්ක නේ හිටියේ. එහෙම නම් රූසෝ ගෙනියන්න ඇති."

"රූසෝ ඔයා දරුවා ගෙනිච්චා නේද?"

"මම නෑ, ඇයි කෝ ටකේෂි."

රූසෝ සුනිකෝ මුණ ගැහුණා.

"සුනිකෝ ඔයා ටකේෂිව ඔෂින්ට දුන්නා නේද?" රූසෝ ඇසුවා.

"ඔය කටින් අල්ලන්න නේද? ටකේෂි නැතිව ඔෂින්ට සමාජයෙනුත් ගැටලු එයි. ඒක නිසා එයා එක්ක ටකේෂි ඉන්න එක හොඳයි."

"දුන්න එක හොඳයි."

සෙමෙන් කී රූසෝ හිනාවුණා.

Scanned with CamScanner

sinhalaebooks.com

# පහළොව

ඔෂින් ටකේෂිත් තුරුලු කර ගෙන දුම්රියේ ගමන් කළා. ටෝකියෝ ගොස් මැඩම් හසකාවා මුණ ගැසීම ඇයගේ එකම බලාපොරොත්තුව වුණා. නැවතත් කොණ්ඩා සකස් කිරීමට ලැබීම ඇයට සතුටක් වුණා. වෙහෙසකාරී දිගු ගමනකින් පසු ඔෂින් ටෝකියෝ ගියා. මැඩම් ගේ අලුත් සාප්පුව සොයා ගැනීමට ඇයට එවූ ලිපියේ ලිපිනය ඇයට උදව්වක් වුණා. ඇය සාප්පුව ළඟට ගියේ සවස් යාමයේ. ඒ වෙලාවේත් කොණ්ඩා සැකසීමට පැමිණි කීප දෙනෙක් ම සාප්පුව තුළ වූ නිසා ඔෂින් සාප්පුව ඇතුළට ගියේ නැහැ. පාරේ පැත්තකට වෙලා සාප්පුවේ සියලු කටයුතු නිමවන තෙක් හිටියා.

අන්තිම සේවා ලාභියාත් පිටව ගියා. සේවිකාවක් පැමිණ දොර වහන්න හැදුවා. "ඉන්න ඉන්න මට මැඩම්ට කතා කරන්න ඕනෑ." ඔෂින් ඉක්මනින් කිව්වා.

"අදට කොණ්ඩා සකස් කරලා ඉවරයි. ආපිට හෙට එන්න."

"නැහැ මට ඕනෑ මැඩම්ට කතා කරන්න."

"මැඩම් හසකාවා, මේ මම ඔෂින්." දොර අල්ලා ගෙන ඔෂින් කෑගැහුවා.

හසකාවා එළියට දුවගෙන ආවා.

"පුදුමයි ඔයා ඔෂින්? අනේ ටකේෂිත් එක්කම එන්න, එන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



හසකාවා ටකේෂි සමඟ කාමරයට ගියා.

"ඔෂින් ඇයි රෑ වුණේ."

"නෑ මැඩම් මම වැඩ ඉවර වෙනකල් එළියේ හිටියා. සමාවෙන්න කියලා එන්න බැරිවුණාට."

"ආ ඒකට කමක් නැහැ. ඔෂින් හැමදාමත් අනුන් ගැන බලනවානේ."

"නැන්දම්මා එක්ක හොඳින් ඉන්නවා නේද? ඔෂින් ඔයා ලියලා තිබුණ නේ ඒ ගැන."

"මැඩම් අපට කළ සේරම දේවල් වලට ස්තුතියි මැඩම්."

"ඔෂින් ඔයා සාගා ගියාම ආයිම දකින්න ලැබෙයි කියලා හිතුවේ නෑ මම නම්."

"මේ ගේ හොඳට හදලා නේ මැඩම්." ඔෂින් නිතරම සාගා ගැන කතාව මඟ ඇරියා.

"ඒත් තුන් හතර දෙනෙකුට ඉන්න ඉඩ නෑ. මම සේවිකාවෝ දෙන්නයි ගත්තේ. ඔෂින් ඔයා මෙහෙ ආවේ යමගාටා යන ගමන් ද? කරදරයක් ද? රූසෝ සනීපෙන් ද?"

"මෙන්න මැඩම් කෑම ගෙනාවා." සේවිකාව කිව්වා.

"එන්න ඔෂින් කෑම කන්න. ඉස්සර වෙලා ටකේෂිට කවලා ඉන්න. එයා නිදිමතේ වගෙයි."

ටකේෂිට කෑම කවා නිදි කළ ඔෂින් මැඩම් සමඟ කෑම කෑවා.

"ඔෂින් අලුත් බබා දුවෙක් ද? පුතෙක් ද?"

ඔෂින් කිසිවක් නොකියා බිම බලාගෙන හිටියා. ඇයගේ මුහුණේ තිබුණේ දුක්බර බවක්.

"ජීවත් වුණේ නෑ. ඉපදෙන කොට ම මැරිලා. අයින් වුණා මම ටනකුරා පවුලෙන්. කොහොමටත් මම ආපිට සාගා යන්නේ නෑ මැඩම්."

ඔෂින් තමන් විඳි දුක් ගැහැට පිළිබඳ මැඩම් සමඟ කතා කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මට සමාවෙන්න ඔෂින්, මම මේවා ඇහුවාට. ඔයා ලිපිවල ලියලා තිබුණා නේ ඒ ගොල්ලන් ඔයාට කරුණාවන්තයි කියලා. ඉතින් මම ඒවා විශ්වාස කළා."

"නැන්දම්මා මට සතුටු වුණේ නෑ මැඩම්. මේක හැම බිරිඳකටම අත්වෙන ඉරණම."

"ඔයා මෙහේ මාත් එක්ක ඉන්න ඔෂින්. ඔයාට මුලදී ම වෙන්වෙලා එන්නයි තිබුණේ. ඔයා තමයි මගෙ හොඳම සහායිකාව. අපි දෙන්නා එකතු වුණොත් අපිට ඉහළ පෙළේ සාප්පුවක් අරින්න පුළුවනි. මේ කාමරේ ඇති අපි දෙන්නට ම."

මැඩම් ගේ බලාපොරොත්තු ගැන තමාව ඇගයීම ගැන සතුටු වුණත් ඔෂින් ඇයට පොඩි සැකයක් තිබුණා දකුණු අත ගැන.

ඔෂින් වෙනදා මෙන් පාන්දරම අවදි වී වැඩ කළා. සේවිකාව පැමිණීමට පෙර කෑම සකස් කළා. කණ්ණාඩි පිරිසිදු කළා.

"අම්මා කෝ?" ටකේෂි නැගිටලා ආවා.

ඔෂින්, ටකේෂිව පිරිසිදු කර පටියකින් පිටේ රඳවා ගත්තා.

"ඔෂින් උදෙන් ම වැඩ නේද?"

"ඔව් මැඩම් මෙයා එළියට යන නිසා හරිම අමාරුයි."

"ඉස්සර අපි වැඩ කරපු හැටි මතක් වුණා ඔෂින්."

"එහෙම නම් ඔෂින් අද ඉඳලා ඔයා වැඩ කරනවානේ. අපි යශිකෝට දරුවා බලාගන්න කියමු. එයා තාම පුහුණු වෙන කෙනෙක් නිසා ඒක පාඩුවක් නෙමෙයි."

"මැඩම් මගේ හිතේ චකිතයක් තියෙනවා. හුඟක් කාලෙකින් කොණ්ඩයක් සකස් නොකළ නිසා මට දැන් නුහුරු ද කියලා."

"ඒක ඇත්ත. ඔයා හුරුවෙයි. එහෙම නම් එන්නකෝ මගෙ කොණ්ඩය සකස් කරලා බලමුකෝ."

හසකාවා කණ්ණාඩිය ළඟ වාඩි වුණා. ඔෂින් ඇයගේ හිස කෙස් පීරුවා.

"ඔෂින් දකුණු අතේ අමාරුවක් තියෙනව ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් රත් වූ අඬුව ගෙන හිස කෙස් රැළි කළා. පනාවෙන් හිස පීරන විට දකුණු අත වූ අඬුව බිම වැටුණා.

"ආහ්ඃ තව පොඩ්ඩෙන්" මැඩම් පැත්තකට පැන්නා.

"ඔයිට වඩා පරිස්සම් වෙන්න ඕනෑ. ඇයි ඔෂින්?" හසකාවා මැඩම් පුදුමයෙන් බැලුවා. ඔෂින් එතනම දණ ගසා ගෙන දකුණු අත අතින් අල්ලා ගත්තා.

"අහුවෙන්නේ නෑ මොනවත් මේ අතට. මගෙ අත හිරිවැටිලා. මට මගෙ කොණ්ඩයවත් පීරන්න බැහැ. ඉදිකටුව අල්ලන්න බැහැ. මහන්න බෑ." ඔෂින්ගේ දෑසට කඳුළු පිරුණා.

"ඇයි සාගාවලදී කරදරයක් වුණා ද?"

"වැටිලා තුවාලයක් වුණා."

ඔෂින් හිස නමාගෙන ම කතා කළා.

"මට සමාවෙන්න මට ඔයාට උදව් කරන්න බැහැ."

"කෝ බලන්න දෙන්න අත."

හසකාවා මැඩම් ඔෂින් ගේ දකුණු අත සෙමෙන් පිරි මැද්දා.

"ඔයා දුක්වෙන්න එපා ඔෂින්, අපි හොඳ දොස්තර කෙනෙකුට පෙන්වමු. ඔයා මා එක්ක මෙහේ ඉන්න ඕනෑ තරම් කාලයක්. ඒක මට කරදරයක් නෙමෙයි. මම ටකේෂිටත් ආදරෙයි. අපි බලමු ඔයාව සනීප කරගන්න. සාගා වලදී හුඟක් දුක් විඳලා තියෙනවා නේද?"

ටික වේලාවකින් සේවාදායිකාවන් එන්න පටන් ගත්තා. මැඩම් හා සේවිකාවන් කොණ්ඩා සකස් කරන අයුරු ඔෂින් ජනේලයෙන් බලාගෙන හිටියා.

ඈ සේවිකාව වරින් වර ගෙන ආ තුවා සෝදා වැලේ වැනුවා. ඇය කල්පනා කළේ ටකේෂිව නඩත්තු කරන්න රැකියාවක් කරන්න අවශ්‍ය බව.

හසකාවා මැඩම් හැමවිටම ඔෂින් ගේ සිත සැනසීමට කටයුතු කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් ඔයා නිසයි මම වෙස්ටන් ස්ටයිල් පටන් ගත්තේ. දැන් හැමෝටම ඕනෑ ඒවා. ඔයාට මම ණය ගැතියි ඔෂින්."

"ඔෂින් ඔයා හුඟක් වැඩ කරන්න එපා. යශිකොට උදව් කළාම ඇති. ඔයා ටකේෂි ව බලාගන්න.ආ මෙන්න ටකේෂි රසකැවිලි."

මැඩම් ගේ කරුණාව ඔෂින්ට සැනසීමක් වුණා. ඇය දිනක් සාවා ගේ ලිපිනය ගෙන සාවා සොයා ගියා.

සාවා ඔෂින් දැක පුදුම වුණා.

"මම නම් හිතුවා ඔයා කොහොම හරි ටෝකියෝ එයි කියලා."

සාවා ඔෂින්ටත්, ටකේෂිටත් සංග්‍රහ කළා.

"මේවා රසයි." ටකේෂි කිව්වා.

"මේ සල්ලි ඔයාගේ ඔයා තියාගන්න ඔෂින්."

සාවා යෙන් තිහක් ඔෂින්ට දුන්නා.

"මම ඔයාට වැරදි කළා මම..........."

"එපා සාවා, ඒවා අතීතයට. මමත් රැකියාවක් කරන්න ඕනෑ. අතේ අමාරුව නිසා කොණ්ඩා සකස් කරන්න බැහැ."

"ඒත් ඔෂින් ටකේෂි එක්ක කොහොමද රස්සාවක් කරන්නේ?"

"මෙහෙ වැඩ අමාරු නැද්ද?"

"අමාරුයි ඔෂින්, නමුත් සාගාවල වගේ අමාරු වැඩ නැහැ. මම කල්පනා කළේ ඔෂින්ට රැකියාවක් ගැන. ඒත් ටකේෂි කොහේ තියලද එන්නේ."

"එහෙම බෑ සාවා. මම ටකේෂි එක්කමයි එන්නේ. එහෙම නම් මම එන්නම්."

"මම ඔයාට උදව් කරන්න උත්සාහ ගන්නවා." සාවා හිස නමා ආචාර කළා.

ඔෂින්ට මතක් වුණා රූසෝ ගේ පියා කිව්ව දේවල්.

Scanned with CamScanner

sinhalaebooks.com



"දරුවෙකුත් එක්ක රස්සාවක් කරන්නේ කොහොමද ඔෂින්."

ඇත්ත තමයි. ඒක මට කල්පනා වුණේ නැහැ. මට ඕනෑ වුණේ ටනකුරා ගෙදරින් හැකි ඉක්මනින් පිටවෙන්න පමණයි.

ඔෂින් කල්පනා කරමින් හසකාවා ගේ ගෙදර ආවා. එහි සාලයේ සිටියේ කේන්.

"කේන්.......... ඔයා?"

"ආ ඔය එන්නේ. කේන්ට ආරංචි වෙලා ඔෂින් ආවා කියලා. මෙන්න ඔයා බලන්න ඇවිල්ලා. කේන් නිතර ඇවිල්ලා ඔයාගේ තොරතුරු මගෙන් අහනවා ඔයා සාගා වල හිටිය කාලෙදී. ඔයාලා කතා කරන්න මම එන්නම්."

"ඇත්ත ද කේන් එහෙම නම් ඔයාට අපිව අමතක වෙලා නැහැ."

"ඔයා මගේ සොයුරිය වගේ නිසා ඔයා ගේ ධෛර්යය මම හැමදාම අගය කළා."

"කේන් ඔයා අපිට හුඟක් උදව් කළා. භූමිකම්පාව නිසා නොවෙන්ඩ අපි අද හොඳ ව්‍යාපාරිකයෝ."

"ඒවා ස්වාභාවික දේවල් ඔෂින්. හසකාවා මැඩම් ඔයාව බලාගනියි."

"කොණ්ඩා දමන්න බෑ අතේ අමාරුවක්."

"අපි හොඳ දොස්තර කෙනෙකුට පෙන්වමු."

"මම අත අමතක කළා කේන්. මැඩම්ට බරක් වෙන්නත් බෑ. ටකේෂි නිසා මට වැඩකට යන්නත් බෑ. උපන් ගමත් නෑ. වියදමට සල්ලිත් නෑ. මම මේවා ගැන හිතුවේ නැතිව කටයුතු කරලා තියෙන්නේ."

"ඔය කතා කරන්නේ නම් මම දන්න ඔෂින් නෙවෙයි." කේන් කිව්වා.

"හොඳයි ඔයාට විකුණන්න මොනවා හරි තිබුණොත් මම ඔයාට යෙන් සීයක් දෙන්නම්." කේන් ඇසුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"හැබැයි එන්නේ සීත කාලය එළියේ වැඩ කරන්න ඕනෑ."

"ඔයා කියන්නේ බිස්නස් එකක් ද? හරි මම කැමතියි. මම මහන්සි වෙලා වැඩ කරන්නම්."

"ගෑනියෙකුට තනියම ව්‍යාපාර කරන්න අමාරුයි."

"ඇයි කේන් මතක නැද්ද? මම පේව්මන්ට් එකේ රෙදි වික්කේ."

"අන්න ඉන්නවා පරණ ඔෂින්. හොඳයි මම ඔයාට බිස්නස් එකක් බලාගෙන එන්නම් කෝ."

කේන් හිස නමා යන්න ගියා.

"මොකද කේන් කියන්නේ ඔෂින්."

මැඩම් නින්දට ගිහින් කතා කළා.

"මොනවා වුණත් ඔයා ආපිට සාගා යන්න එපා. මම ඔයාව බලාගන්නවා."

"ඒක ඇත්ත මැඩම්. ඒත් ටකේෂියි මමයි ජීවත් වෙන්න ඕනෑ. මම රූසෝ මෙහාට ගෙන්නා ගන්න ඕනෑ මැඩම්."

"සත්‍යයට මුහුණ දෙන්න ඔෂින්. රූසෝ ගෙදර නතර වෙලා ඔයාව තනියම එව්වා."

"ඒත් ඒකට එයාට හේතු තියෙනවා මැඩම්. බොහෝම අමාරුවෙන්, ආශාවෙන් ඉඩම් ගොඩකරනවා එයා."

"ඔෂින් මොකද කේන් කියන්නේ?"

"කේන් මට පේව්මන්ට් එකේ වෙළඳාමක් ලෑස්ති කරලා දෙන්නම් කිව්වා."

"ඔෂින් ඔයාට ඕවා කරන්න පුළුවන් ද?"

"මැඩම්, තේරුම් ගන්න මගෙ දකුණු අත වැඩක් නෑ. මට මෙහේ ඉන්නකොට ඔයාලා කොණ්ඩා සකස් කරන කොට දුකයි. ඒ නිසා රැකියාවක් කරන්න ඕනෑ."

"හැබැයි ඒක නීත්‍යානුකූල වෙළෙඳාමක් ද කියලා බලන්න ඔෂින්."

Scanned with CamScanner

sinhalaebooks.com



"කේන් හොඳ මහත්මයෙක් මැඩම්, මට එයා විශ්වාසයි."

කේන් ටික දවසකින් ඔෂින් වෙනුවෙන් පදික වේදිකාවේ කෑම සාදා විකිණීමේ ව්‍යාපාරයක් සඳහා කැඳවා ගෙන යන්න ආවා.

"දැන් සීත කාලය." කේන් කිව්වා.

"ඔෂින් ටකේෂිට මේ කබාය පොරවා ගන්න. රෑ වෙනකොට සීතල වැඩියි. ළමයා ප්‍රවේශම් කර ගන්න."

"හොඳමයි මැඩම්."

"කේන් මෙයාලව ප්‍රවේශම් කර ගන්න."

"හොඳයි ඔයා ඒ ගැන වද වෙන්න එපා."

පදික වේදිකාවේ තිබූ කුඩා අවන්හලක දෙදෙනෙක් පෑන් කේක් සාදමින් හිටියා. ඔවුන් පදික වේදිකා රෙදි වෙළෙඳාමේ දී ඔෂින් අඳුනන අය,

"මැඩම් ඔෂින් ඔයා."

"දැකීම සතුටක්."

"මටත් එහෙමයි."

"මේ වගේ පෑන් කේක් හදලා විකුණන්න. ඔයා මීට පෙර හදලා තියෙනව ද?"

"නැහැ කේන්. මම හදලා පුරුදු වෙන්නම්."

"මෙහෙම තැටියේ තෙල් ගාලා පිටි ටිකක් දමන්න. ඒක මෙහෙම දෙපැත්ත කරකවලා මේ ගෝවා එක උඩට දමලා තමන්න ඊට පස්සේ ඒකට සෝස් දමන්න."

"හොඳමයි. මට පුළුවනි."

ඔෂින් පෑන් කේක් කීපයක් සාදා පිගානක තබා කේන්ට හා සෙසු අයට දුන්නා. කේන් ටකේෂිව වඩාගෙන හිටියා.

"අද ඔෂින් හදන ඒවා මෙහෙ වෙළෙන්දන්ට දීලා එයාලව හඳුනා ගනිමු."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒක හොඳයි."

පදික වේදිකාවේ බොහෝ වෙළඳුන් හඳුන්වා දුන්නා කේන්.

"මේ සීත කාලය උණු උණුවේ ම පැන් කේක් එකක් කන්න පුළුවන්වේවි හෙට ඉඳල ම."

ඔෂින් සියල්ලන්ටම කිව්වා.

ඔෂින් එදා හසකාවා ගේ නිවසට යන විට රෑ වුණා.

ඇය දොරට ගැහුවා.

"කවුද?"

"මම ඔෂින්."

"ආ... එන්න." මැඩම් දොර ඇරලා ඉක්මනින් දොර වැහුවා.

"අනේ ටකේෂිට සීතල ඇති. හිබචය ළඟට ගේන්න ඔෂින්. හැමදාම මෙහෙම රෑ වෙයිද?"

"ඔව් මැඩම් වෙළෙඳාම පටන් ගන්නේ සවස ඉඳලා."

"හොඳයි හුඟක් මහන්සි වෙන්න එපා. ඉතින් ඔෂින් අද මොනවද කළේ මට කියන්නකෝ."

ඔෂින් විස්තර කිව්වා.

"මැඩම් අද නම් කේන් පිටි, එළවළු සේරම ලෑහැස්ති කරලා තිබුණා. හෙට උදේට ගිහින් මම ම බඩු ගන්න ඕනෑ. ගල් අඟුරු ගන්නත් ඕනෑ නේ මැඩම්."

"ඔෂින් හරිම කැමතියි බිස්නස් වලට නේද?"

"මොනවා කරන්න ද මැඩම්. කොණ්ඩා දමන්න බැහැ. මහන්න බැහැ. මේකවත් කරන්න එපා යෑ."

දින දෙක තුනක් ගෙවී ගියා. රාත්‍රී කාලයේ හසකාවා මැඩම් ගේ නිවසට යෑමට සිදුවීම ගැන ඔෂින් කනගාටු වුණා. ඒ පිළිබඳව කේන් සමඟ සාකච්ඡා කළා.

"හොඳයි මේ පළාතෙන් ම මම ඔයාට පුංචි ගෙයක් හොයලා

Scanned with CamScanner

sinhalaebooks.com



දෙන්නම්."

ඔෂින් පදික වේදිකාවට යෑමට පෙර හසකාවා මැඩම්ට උදව් කළා. කණ්ණාඩි සෝදා රෙදි සෝදා බිම පිරිසිදු කළා. මැඩම් කැමති සුප් එකක් හැදුවා.

ඒ වෙලාවේ කේන් ආවා.

"ඇයි කෙන් හදිස්සියෙන්."

"මම මේ ඔයා ගේ බඩු ගෙනියන්න ආවේ. අදම පදිංචි වෙන්න පුළුවනි."

"පදිංචි වෙන්න ඒ කොහේ ද?" මැඩම් හසකාවා පුදුමයෙන් ඇහුවා.

"මැඩම් මට සමාවෙන්න. මම කියන්නමයි හිටියේ. ඒ වුණාට මේ තරම් ඉක්මනට යන්න වෙයි කියලා හිතුවේ නෑ."

"ඒක හරි මැඩම් හසකාවා. ඔෂින් මට නිකමට කීවේ ගෙයක් හොයන්න කියලා."

"ඇයි ඔයා මෙහෙන් යන්නේ."

"මැඩම් මම එන්න රෑ වෙනවා. සීතලත් වැඩියි. ටකේෂිට නින්ද ගියාම මටත් වෙහෙසයි. ඒ ගැන සමාවෙන්න."

"ඔෂින් මම දන්නවා ඔයා තීරණයක් ගත්තොත් මට ඒක නවත්වන්න බැහැ කියලා. හොඳයි ප්‍රවේශමෙන් ඉන්න. මාව බලන්න නිතරම එන්න."

"හොඳමයි මැඩම්. සුගිකෝ ඔයාටත් ස්තුතියි මෙහෙ ඉන්න කොට මට උදව් කළාට."

කේන් සමඟ ඔෂින් ඇගේ නිවහන බලන්න ගියේ සතුටින්. නිදහසේ ඉන්න තැනක්. ඇයට මතක් වුණේ සාගාවල ටනකුරාලාගේ ගබඩා මඩුව. ඇය එහි සිටියේ සතුටින්.

"මේක තමයි ගේ. හැබැයි පුංචියි. එන්න ඇතුළට."

"ඔන්න ටකේෂි අපි දෙන්න ගෙ මුල් නිවහන. අපි ඉක්මනට තාත්තා ගෙන්නා ගනිමු නේද ටකේෂි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කීවේ සතුටින්.

"තාත්තා කෝ, තාත්තා කෝ." ටකේෂි ගෙතුළ දිව ගියා.

"මේ ගේ භූමිකම්පාවෙනුත් බේරුණ එකක්. වාසනාවන්තයි."

"මම අදම රූසෝට ලිපියක් ලියන්න ඕනෑ."

"හොඳයි එහෙම නම් මම ගිහින් එන්නම්."

"ස්තූතියි කේන් ඔයාට. ඔයාගෙන් ගත්ත උදව් සේරටම ආදායම් ආවාම මම ගෙවන්නම්. "

ඇය හිස නැමුවා. කේන් හිනැහෙමින් පිට වී ගියා.

ඔෂින් ගේ පෑන් කේක් අවන්හල හුඟක්ම ජනප්‍රිය වුණේ ළමුන් අතරයි. ඇය පෑන් කේක් විවිධ අයුරින් සකස් කළා. ඒ සඳහා එළවළු පමණක් නෙමෙයි මස්, ඉස්සෝ, අච්චාරු, බිම්මල් දමා සකස් කළා.

ඒ සමඟම ඇය ටකේෂිවත් බලා ගත්තා. සවස ඉඳලාම හිටගෙන ම ඉඳලා ඇය වෙහෙසට පත් වුණත්, මුදල් ලැබෙන නිසා සතුටු වුණා.

*　　*　　*　　*

ඔෂින් නිවෙසින් ගිය දිනයේ සිට ම රූසෝ සිටියේ දුකෙන්. ඒත් උනන්දුවෙන් ඉඩම් ගොඩ කිරීම් වලට ගියා. ඔහු කා සමඟවත් කතා කළේ නැහැ.

"මේ මොකද රූසෝ පැත්තකට වෙලා කල්පනා කරන්නේ?" ඔකියෝ ඇහුවා.

"රූසෝ ඔෂින් කළ දේ බලන්න. මගෙන් ටකේෂිව උදුරගෙන ගියා නේ. එක අතකට ඒකත් හොඳයි. දැන් ඔයාට වෙන විවාහයක් කරගන්න බාධාවක් නෑ. ඔයා ගේ නම ගෙනියන්න දරුවෙක් එපා යැ."

රූසෝ එතනින් ඉවත් ව උදැල්ලක් අරගෙන කුඹුරට ගියා.

සුනිකෝ ලිපියක් රැගෙන රූසෝ සෙව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"තැපැල් තේද ආවේ. ඔය කාට ද?"

"ඔෂින් ගෙන් රූසෝට."

ඔකියෝ එය උදුරාගෙන ලිපිය කැඩුවා.

"අම්මා ඇයි එහෙම කළේ ඒක රූසෝට." සුනිකො කීවේ අමනාපයෙන්

ඔකියෝ ලිපිය කියවා ගෙන ගියා.

"මෙකි පෑන් කේක් කඩයක් ඇරලා. රූසෝත් ළඟදී ගෙන්නා ගන්නවාලු. ටනකුරා පවුලේ නම්බුව කන්න තමයි ඔෂින්ට ඕනෑ."

ඇය ලිපිය කෑලි වලට ඉරා සුනිකෝ අතට දුන්නා.

"මේක ළිපට දමනවා. කියන්නේ එහෙම නෑ ලියුමක් ආවා කියලා. තේරුණා ද?"

සුනිකෝ කඩදාසි කෑලි දෝතේ රඳවාගෙන බලා හිටියා. ඔකියෝ ගියාට පසු ඇය ඒවා කුඩා පෙට්ටියක දමා රාක්කය යට තිබ්බා.

රූසෝ, ඩයිකෝරෝ සමඟ වැඩ කළා.

"රූසෝ, ඔෂින් ගැන ආරංචියක් නැද්ද ? ලියුමක්වත්............" තාත්තා ඇහුවා. රූසෝ හිස දෙපසට වැනුවා.

"පව් මේ සීත කාලේ ටකේෂිත් එක්ක කොහේ හරි වැඩ ඇති."

"තාත්තා ඒ ගැන කතා කරලා වැඩක් නෑ. එයා මාව අමතක කරලා. අම්මා කිව්ව එක ඇත්ත."

"රූසෝට ඕනෑ නම් ටෝකියෝ ගිහින් ඒ ගොල්ලන් ගැන බලන්න."

"අවශ්‍ය නෑ තාත්තා."

රූසෝ කීවේ අහක බලාගෙන. ඩයිකොරෝට දුක හිතුණා. රූසෝ හිටියේ මුහුණ පුරා රැවුල වවාගෙන. ඔෂින් ගැන කතා කරන විට ඔහුගේ මුහුණ වේදනාවෙන් පිරී ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com



* * * *

"මෙන්න හාල් ටිකක්. මට අඩුගාණට ලැබුණා." කේන් හාල් පාර්සලයක් ඔෂින්ට දුන්නා.

"ඒක හොඳයි. මම ඒකට කේන්ට සල්ලි දෙන්නම්."

"හෙට අනිද්දට ගනිමු."

"පුතේ, ඉක්මනින් තාත්තා ව ගෙන්නා ගනිමු." කේන් ටකේෂිව වඩා ගත්තා.

ඔෂින් බොහෝ විට දරුවන් සමඟ යන තරුණ මවුපියන් දෙස බලා සිටියා. ඇය සිහින මැව්වා තුන් දෙනාම එකට ඉන්න දිනයක් ගැන.

දිනක් හසකාවා මැඩම් ඔෂින් ගේ නිවසට පැමිණියා. මේ වෙලාවේ ඔෂින් හිටියේ ගෝවා සෝදමින්. පුංචි භාජනයකට ටකේෂිටත් ගෝවා කෑලි දෙකක් දීලා තිබුණා.

"ආ..... අම්මයි පුතයි වැඩ වගෙයි."

ඔෂින් හිස ඔසවා බැලුවා.

"අනේ මැඩම් ඔයා? එන්න, එන්න."

"ආ ටකේෂි ඔයාට මෙන්න රස කැවිලි."

"මේවා මටද?" ටකේෂි ඒවා රැගෙන ගෙට ගියා.

"ඉතින් මැඩම්, ඔයා අපේ ගෙදරම ද ආවේ."

"මම මේ ළඟ පරණ යෙහෙළියක ගේ දුවගේ මංගල දිනයට කොණ්ඩා සැරසිලි කරන්න ආවා. ඒ ගමන් ම ඔයාව බලන්න හිතුණා."

"අපි තේ බොමු මැඩම්."

"ටකේෂිගෙන් කරදරයක් නෑ නේද?"

"ඔව් මැඩම්, දැන් එයා මේ ළඟ ළමයි එක්ක සෙල්ලම් කරනවා. එහෙ මෙහෙ යන්නේ නැහැ. ළමයි ආවොත් සෙල්ලම් කරන්නේ. ආච්චම්මා එක්කමනේ එහේදී හිටියෙ."

"දැන් ඔයාට සතුටුයි නේද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"මට දැන් සල්ලි ටිකක් ඉතුරු කරන්න පුළුවනි. පුළුවන් තරම් මේක කරගෙන ගිහින් මුදල් ටිකක් හොයාගෙන රූසෝ ගෙන්නා ගන්නවා."

"ඒ කියන්නේ ඔයා ලිව්වත් එයා ලිව්වේ නෑ කියලා නේද?"

ඔෂින් බිම බලා ගත්තා.

"කෝ ටකේෂි."

ඒ ආවේ කේන්.

"මාමා, මාමා." ටකේෂි කේන් ගේ අතට පැන්නා.

"ආ..... මැඩම් හසකාවා ඇවිල්ලා."

"ඔෂින් කියනවා ඔයා එයාට හුඟක් උදව් කරනවා කියලා." හසකාවා හිනැහෙමින් කිව්වා.

"ඒ තරම්ම නෑ මැඩම්."

"ඔෂින් මෙන්න මම ඔයාට පොඩි තෑග්ගක් ගෙනාවා."

කේන් කඩදාසියක එතූ ඇඳුමක් ඔෂින්ට දුන්නා.

"ස්තූතියි කේන්."

ඔෂින් පාර්සලය දිග ඇරියා.

"ආ කිමෝනාවක්! හරි ලස්සණයි. මම හෙට වැඩට යනකොට අඳින්නම්කෝ."

"එන්න ටකේෂි අපි යමු සෙල්ලම් කරන්න." කේන් ටකේෂි වඩාගෙන ගියා.

ඔෂින් කිමෝනාව හසකාවා මැඩම්ට පෙන්නුවා.

"ඔෂින් කල්පනාවෙන් වැඩ කරන්න. මිනිස්සු මොන හැඟීමෙන් වැඩ කරනවද අපට හිතන්න බෑ."

"අනේ මැඩම්, කේන් කියන්නේ මගෙ සහෝදරයා කියලා මම හිතන්නේ. කේන් බොහොම හොඳ කෙනෙක්."

ඔෂින් සෑම විටම ඇයට ලැබෙන මුදල් වලින් කේන්ට

Scanned with CamScanner

sinhalaebooks.com



ගෙවීම සඳහා කොටසක් වෙන් කළා.

සෑම දිනකම රාත්‍රියට කේන් ඔෂින්ව නිවසට ඇරලුවා. විටෙක ඔහු ඔෂින්ගෙන් තේ එකක් බී යන්න ගියා. එදත් නිදාගන්න ටකේෂිව උස්සාගෙන ආවේ කේන්. ඔෂින් පසුවදාට ගන්න බඩුත් රැගෙන ආවා.

"අද වෙළඳාම කොහොමද ඔෂින් හොඳයි ද?"

"ඔව්, හොඳයි."

"ඔයා ගේ මහන්සියේ ප්‍රයෝජන තියෙනවා. රූසෝ මහත්තයාවත් ළඟදීම ගෙන්වා ගන්න බැරියැ."

"අනේ ඔව් කේන්, ඒක තමයි මගේ ඊළඟ ඉලක්කය."

"තේ එකක් බොන්න කේන්."

එවිටම ගේ ඇතුළට කාන්තාවක් දුවගෙන ආවා.

"හුම්..... මෙයාද උඹේ හොර ගෑනි. මමත් බලන්න හිටියේ උඹලා මෙහෙ රඟපානවා."

ඇය කී වචන වලට ඔෂින් පුදුමයෙන් බලා හිටියා.

"මිඩෝරි කට වහපන්. කවුද උඹට මෙහේ එන්න කීවේ?"

"මෙහෙ එන්නේ නැතිව මම කොහොමද මේවා දැන ගන්නේ. උඹ මහ මායාකාරියක් මගෙ මිනිහා අල්ලා ගෙන."

"කට වහපන් එයාට මොනවා හරි කිව්වොත් බලාගෙනයි."

කේන් ඇයට පහර දුන්නා.

"එපා කේන් නවත්වනවා ඕක."

ඔෂින් කෑගැහුවා.

"දන්නවද ගෑනියේ උඹ. උඹේ ඔය පෑන් කේක් කඩයට හැමදාම කුලී ගෙවනවා. හම්බ කරන සේරම උඹට ම ඉවරයි."

"මම දැන් කිව්වා උඹට කටවහගන්න කියලා." කේන් කෑගැහුවා.

"යන්න ඔය දෙන්නම එළියට යන්න කරුණාකරලා." ඔෂින්

Scanned with CamScanner

sinhalaebooks.com



තරහින් කිව්වා.

"උඹ මේ ගෑනිට ආදරෙයි."

"ඔව්, මම ආදරෙයි. ඒත් මම කවදාවත් එයා ගේ අතින්වත් අල්ලලා නැහැ."

"ඇයි කේන් මට මෙහෙම කරන්නේ." මිඩෝරි ඇසුවා.

"මෙහෙම කරන්න උඹ මගෙ ගෑනි නෙමෙයි නේ."

"ඒත් ඔයා මට ආදරය කළා."

"මේ ඔය දෙන්නම එළියට යන්න කරුණාකරලා."

ඔෂින් කෑගහලා කිව්වා. වටපිට අය කීප දෙනෙක් ගේ දොරකඩින් එබුණා.

ඔෂින් කල්පනා කළා. මැඩම් කීවේ මේක තමයි. මට ඒක තේරුණේ නැහැ. කේන් හොඳ කෙනෙක්. ඒත් සමාජය අපි දිහා බලන්නේ වැරදි විදිහට. අවට අයත් ඇවිල්ලා බැලුවා. විවාහක ගෑනියක් හැටියට මේක හොඳ දෙයක් නෙවෙයි. මම හෙටම මේ රස්සාව නවත්වනවා.

පසුවදා උදේ ම කේන් ආවා.

"ඊයේ වුණදේට මට සමාවෙන්න ඔෂින්."

"ඔයා වද වෙන්න එපා කේන්. මේවා මගේ වැරදි. ඔයා කරන උපකාර පිළිගත්තා. ඉන් එහාට මොනවත් හිතුවේ නැහැ."

"ඔෂින්, ඒ මගේ බිරිඳ නෙමෙයි."

"ඒත් එයා ඔයාට ආදරෙයි. ඒකයි ඔයාව රැකගන්න හදන්නේ. එයත් එක්ක සතුටින් ඉන්න."

ඔෂින් ලියුම් කවරයක් ගෙන එය කේන්ට දුන්නා.

"මේක ඔයා තියාගන්න. ඊයේ නෙමෙයි මම ඒක එකතු කරගෙන හිටියේ කේන්ට දෙන්න. මේක ගන්න."

කේන් එය රැගෙන කිමෝනාවේ රඳවා ගත්තා.

"ඒත් මොනවත් බලාපොරොත්තුව නෙමෙයි ඔයාට උදව් කළේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒකට කමක් නෑ, මේක තියාගන්න කේන්. ස්තුතියි ඔයා කළ හැම උදව්වකටම. මෙහෙම මේක ඉවර වෙයි කියලා හිතුවේ නැහැ."

"ඒ කියන්නේ ඔයා යන්න ද?"

"ඔව්, යන්නම ඕනෑ. රුසෝට මේවා ආරංචි වුණොත් හොඳ නෑ. අපේ ආශ්‍රය බොහෝම අහිංසක වුණාට මිනිස්සු වැරදි විදිහට හිතනවා. එහෙම නම් මම යන්නම්."

"මට ඔයා නවත්වන්න බෑ කියලා මම දන්නවා. එහෙම නම් ඔයා මට ණය ගෙව්වා. මේක මගෙන් ටකේෂිට තෑග්ගක්."

නැවතත් ඒ මුදල් කවරයම ටකේෂි අත තිබ්බා.

"මාමා මේ මට ද?"

"ඔව්, පුතේ තාත්තා බලන්න යන්නකෝ අම්මා සමඟ."

ඔෂින් කේන්ට හිස නමා ආචාර කළා. ඔහුත් ආචාර කර ඔවුන් යන අයුරු බලාගෙන හිටියා.

ඔෂින් හසකාවා මැඩම් මුණ ගැසී සියල්ල ම කිව්වා.

"ඕක තමයි මම බයවුණේ ඔෂින්. ඒක වෙනම ලෝකයක්. කේන් හොඳ කෙනෙක් වුණත් ඒ සමාජය වෙනස් නේ. ඔයා මෙහෙ නතර වෙන්න."

"නැහැ මැඩම්, මම යමගාටා යන්නයි බලාපොරොත්තු වෙන්නේ."

"එහෙ ගිහින් මොනාද කරන්නේ?"

"මම අම්මත් එක්ක කුඹුරු වල වැඩ කරනවා. ටකේෂිව අම්මට බලාගන්න කියලා. මට කුලී වැඩ කරන්න පුළුවනි."

"ඇයි මේ ගෑනු අම්මා ගාවටම ඇදෙන්නේ. ගෑනුන්ට ජීවිතයම කරන්නේ අසාධාරණකම්." හසකාවා මැඩම් කිව්වා.

ඔෂින් මැඩම්ගෙන් සමුගෙන යමගාටා ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com

# දහසය

ඔෂින් යමගාටා ගියා. කන්ද බැහැලා යන විට අම්මා ජල ටැංකිය ළඟ සිටියා අත් කකුල් සෝදමින්. ඒ ඇය කුඹුරේ සිට පැමිණි වෙලාවයි. ඔෂින් අම්මා දෙස බලා සිටියා. කෙට්ටුවෙලා. හිස කෙස් බොහොමයක් පැහී තිබුණා.

"අම්මා.......... අම්මා........."

ඔෂින් ගේ හඬ ඇසී ෆුජී හිටගත්තා. ඒත් ඇයට ඔෂින් අඳුරන්න බැරි වුණා.

"අම්මා මම ඔෂින්..........."

"අනේ ඔෂින් මම මේ දැනුත් ඔයා මතක් කළා. ඇයි ලියුමක්වත් නොඑව්වේ කියලා. අනිත් අතට මට හිතුණා ඔයාට දරුවෝ දෙන්නෙක් නිසා වෙලාවක් නැතුව ඇති කියලා. අනේ ටකේෂි, මගෙ පුතා දැන් ලොකුයි."

අම්මා ටකේෂිව වඩාගත්තා.

"ඔෂින් ඇයි කෝ අනිත් දරුවා."

"අම්මා ඒවා පස්සේ කතා කරමු."

"ඔයා ලියලා එව්වා නම් මට ස්ටේෂමට එන්න තිබුණා නේ. හා යමු යමු ගේ ඇතුළට."

"අම්මා ගම නම් වෙනස් වෙලා නෑ නේද? කෝ සෝජි ඉන්නවාද?"

"ඔව් දැනුයි අපි දෙන්නා ම කුඹුරේ ඉඳලා ආවේ. ඔෂින්

Scanned with CamScanner

sinhalaebooks.com



කෝ දරුවා? දුවෙක් ද? පුතෙක් ද?"

"පුංචි ගැහැනු ළමයෙක්."

"ඇයි එක්කගෙන නාවේ?"

ඔෂින් බිම බලාගත්තා. ඇයට ඉකි ගැසී ඇඬුණා.

"ඔෂින්, ඔෂින් ඇයි?"

"එයා ඉපදුණේ ම මැරිලා අම්මා."

ඔෂින් සාගා වල ඇය විඳි දුක් කරදර ටිකක් කිව්වා.

"අනේ ටකේෂි හම්බ වෙනකොට නම් මම හිටියා නේ. දුක්වෙන්න එපා දුව. ඉන්න මම ඔයාලට කන්න සුදු බත් ටිකක් උයන්නම්."

"අම්මාට මම උදව් කරන්නම්."

"එපා ඔයාට ගමන් මහන්සියි. ඔහොම ඉන්න කෝ."

සෝජි ඔෂින් සොයා ගෙන ආවා.

"කෝ ඔෂින් ආවා කිව්වා නේ. මම මේ බලන්න ආවේ. ආ...... වැඩිය වෙනස් වෙලා නැහැ. ඔෂින් මම නම් ආව ගමන් ම නෑවා. ඔයත් නාගන්න. අපි නම් නාන්නේ දින පහකට සැරයක්. දර නෑනේ හැමදාම වතුර උණුකරන්න. ඔයා ඉක්මනට යන්න ද ආවේ?"

"නෑ, ඔෂින් මින් පස්සේ ඉන්නේ මා එක්ක. එයා ආපිට සාගා යන්නේ නෑ."

"ඇයි ටනකුරාලා එළෙව්වා ද? ඇයි ඔයා තනියම ආවේ. රූසෝ එයා ගේ බිරිඳ බලාගන්න එපා යැ. ඔෂින් ටනකුරා කෙනෙක්, ඔයා ඉන්න ඕනෑ එහේ."

"සෝජිට වැඩක් නෑ ඒවායින්. ඔෂින් නතර කරගත්තේ මම."

"නතර කරගත්තා වගේ නෙමෙයි. කොහෙන්ද කෑම බීම."

"මටයි ටකේෂිටයි වියදම් මම හොයාගන්නම් සෝජි."

"සෝජි මේ ඉන්නේ නංගි. මේ එයාගේ දරුවා. ආව ගමන්

Scanned with CamScanner

sinhalaebooks.com



කෑම ගැන අහන්න ලැජ්ජා නැද්ද ඔයාට." කී ෆුජි ඔෂින් දෙසට හැරුණා.

"ඔය සෝජි මචා පෙන්වන තරම් කෑම හිඟයක් මෙහෙට නෑ. ඔෂින් දැන් ඉඩම් හිමියා සීයට හැට අටක අස්වැන්න දෙනවා අඳ ගොවියාට."

"ප්‍රශ්නය ඒක නෙමෙයි. බඩු ගණන් යනවා දවසින් දවස." සෝජි කිව්වා.

"සාගා වලත් එහෙම තමයි. මම ඔයාලට කරදරයක් වුණා නම් සමාවෙන්න."

"ඔෂින් එපා සමාව ගන්න. මොනවට ද ඔයා සමාව ගන්නේ?" ෆුජි ඇසුවා.

"ටකේෂියි මගෙ පුතයි එක වයස. ඒ ළමයින්ට හොඳට කන්න ඕනෑ. අම්මා නම් කියයි, මහන්සි වෙන්න ඕනෑ මමයි කුඹුරේ. මෙයත් එනවා මෙතන ම වැටෙන්න."

සෝජි ළඟ වූ කුඩයට පයින් ගහගෙන පිට වී ගියා.

"ඔෂින් ඔයා ඔය සෝජි ගේ කතා වලට කන් දෙන්න එපා."

"කමක් නෑ අම්මා. මුළු ජීවිතයම දුප්පත්කම. දුප්පත්කම නිසා දරුණු වෙනවා. ලේසි නෑ මේ කාලයේ ජීවත්වීම ඒකයි ඒ කේන්ති යන්නේ."

"මෙන්න මම සුදු බත් ටිකක් ඉව්වා. ටකේෂිට කවලා ඉන්න."

"හොඳයි. ස්තුතියි අම්මා."

ඔෂින් ටකේෂිට කෑම කැව්වා.

"ඉස්සර අපි කෑවේ රාබු බත් නේද අම්මා."

සෝජි එළියේ වාඩි වී හිටියා.

"සෝජි මටයි ටකේෂිටයි කෑම බීම වලට මුදල් මම හොයාගන්නම්."

Scanned with CamScanner

sinhalaebooks.com



"නෑ හෙට ඉඳලා ඔෂින්ටයි ටකේෂියට මටයි කෑම වෙනම උයා ගන්නවා." ෆුජි කිව්වා.

"එතකොට හාල් කොහෙන් ද?"

"මම කුඹුරු වල නැමීගෙන වැඩ කළා. මගෙ කොටහ දෙන්න."

"කොටහ දෙන්න? එහෙම බෙදන්න ගියොත් අපට වෙන්නේ බඩගින්නේ මැරෙන්නයි." සෝජි තරහින් කිව්වා.

"ඔෂින්, සෝජි කියනව නම් හාල් දෙන්න බෑ කියලා අපි එයාගෙන් ගෙට ගිය වියදම ඉල්ලමු."

"අම්මා........ මොනවද මේ කියන්නේ?"

ඔෂින් බියෙන් මෙන් ඇසුවා.

"ඔෂින් මේ ගේ හැදුවේ තාත්තට. ඔෂින් හිතන්නේ එයා ගැන විතරයි."

සෝජි ගේ බිරිඳ ටෝරා පැමිණ සෝජිව එක්කගෙන ගියා.

"දුව ඔයාට තිබුණේ සාගා ගිය ගමන් ම වද දෙනකෙට ආපිට මෙහෙ එන්න. ඒ ගෑනි මහ යක්ෂණියක් නේ."

"නෑ අම්මා. ඒක මගේ වරද. අපේ මඟුලට එයා විරුද්ධව හිටියේ. මම කවදාවත් හිතුවේ නෑ ඇයට යටත්ව ඉන්න වෙයි කියලා. පරම්පරාගත පවුලකට එකතු වීමේ ආදීනව."

"ඔෂින් ඔයා කේන්තියෙන් ද?"

"නෑ අම්මා කේන්තියක් නෑ කා ගැනවත්. මතකද මම කියලා තියෙනවා අර සංසකු මාමා ගැන. කෙනෙකුට වෛර කළොත් වෛර කළ කෙනාටම දුක ආපිට එනවා කියලයි එයා මට කියලා දුන්නේ." ඔෂින් අම්මා දෙසට හැරුණා.

"සුනිකෝ විතරක් නෙවෙයි අම්මා. රූසෝත් නැන්දම්මා ගේ හිර කාරයෙක්. පව් රූසෝ."

"ඔෂින් ඔයා හිතන්නේ එහෙම නම් රූසෝ ආපිට එනකල් ඔයා මෙහෙ ඉන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් එදා රාත්‍රිය හරිම සතුටින් ගත කළා. ඒත් හරුන් හා ආව්වම්මා සිහි වී ඇයගේ දෑසට කඳුළු නැංගා.

පසුවදා උදේම ඔෂින්ට වතුර ගෙන යෑමට පැමිණි ටෝරා දක්නට ලැබුණා.

"ටෝරා සුබ උදෑසනක් වේවා."

ටෝරා තරහින් රවා බලා යන්න ගියා.

ඔෂින්, ලී බාල්දියට වතුර රැගෙන ගෙට ගියා.

"අම්මා සෝජිලා එක්ක මම එකට ඉන්නම්. අම්මා ඒ අය එක්ක රණ්ඩු වෙන්න එපා. අම්මා මට මෙහෙම දවසම නිකං ඉන්න බෑ. කරන්න පිට තැනක වැඩක් හොයා ගන්න ඕනෑ."

"ඔෂින් එහෙම නම් මෙහෙ තියෙන්නේ සේද හල. එහෙම නැත්නම් පිට ගෙදරක වැඩ කරන්න ඕනෑ. ඒත් ඒ දෙපළටම ටකේෂි අරගෙන යන්නේ කොහොම ද?"

"අම්මා ටකේෂි බලාගන්නවා නම් මට වැඩට යන්න පුළුවනි."

"එහෙම නෙමෙයි ඔෂින්, ළමයා ටිකක් ලොකු වෙනකල් ඔයා ගෙදරට වෙලා ඉන්න."

"ඇයි ඔෂින් ගෙදර නතර කර ගන්නේ?"

වැඩට යන්න සූදානම් වූ සෝජි ඇහුවා.

"උඹේ ටෝරා කරන්නෙත් ගෙදරට වෙලා ඉන්න එකනේ."

මේ වෙලාවේ රිකි නැන්දා ආවා.

"ඔෂින්, ඔයා ආවා කියලා ආරංචි වුණා. ඔයා හොඳින් නේද?"

"ඔව් රිකි නැන්දා."

"කවද ද සාගා යන්නේ."

"එයා සාගා යන්නේ නෑ රිකි. එයා මා එක්ක ඉන්නවා."

ෆුජි තම යෙහෙළියට ඔෂින් ගේ සාගා ජීවිතය පිළිබඳ විස්තර කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් බොහොම කරදර විඳලා තියෙනවා."

"මම ඒ ගැන දුක්වෙන්නේ නෑ රිකි නැන්දා. ඔයාට පුළුවන්නම් මට රස්සාවක් හොයලා දෙන්න. හැබැයි ටකේෂිත් එක්ක ම ඉන්න පුළුවන් එකක්."

"අපි හිතුවේ ඔයා සතුටින් කියලා. මම ගිය මාසෙත් කගායා ගියා. දැන් එහෙ සේරම පාලනය කරන්නේ මිස් කායෝ. මිස් කායෝ ගේ සැමියට නම් ගෙට අඩිය තියන්නත් දෙන්නේ නෑ. ඔෂින් හොඳයි නේ කගායා ගියොත්. කායෝ ඔයාගේ යාළුවානේ."

"ඒත් දැන්ම මට ඒ ගොල්ලන්ට මූණ දෙන්න බෑ. පස්සෙ එහෙ යනවා." ඔෂින් කිව්වා.

"රිකි නැන්දා ඔයා හැමෝම අඳුනන නිසා හොයනවද තැනක්. සල්ලි ටිකක් ලැබුණත් ඇති. හාල් ටිකක්, එළවළු ටිකක් ගන්න තිබුණොත් ඇති."

"මම බලන්නම් ඔෂින්."

මෙවිටම ටකේෂි අඬන හඬ ඇසුණා. ඔවුන් එළියට දුව ගියා.

ටෝරා ටකේෂිට පහර දෙමින් හිටියා.

ඔෂින් ටෝරා තල්ලු කර ටකේෂිව වඩා ගත්තා.

"මොකද මේ." රිකි ඇහුවා.

"මගෙ ළමයට දුන්න සීනිබෝල ටකේෂි උදුරාගෙන."

"එක්කෙනෙකුට විතරද සීනි බෝල දෙන්නේ. පුදුම ගෑනු. ඉන්න ඔෂින් මම ඔයාට හොඳ රස්සාවක් හොයලා දෙන්නම්." රිකි කිව්වා.

ටික වෙලාවකින් ෆුජි ගෙදර ආවා.

"ටෝරා මෙහෙ වරෙන් එළියට. මොකද මගෙ ටකේෂිට ගැහුවේ."

"එපා අම්මා දැන් ඒ ගැන කතා කරන්න ඕනෑ නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"නැහැ මට ඔය ගෑනි මරන්න හිතෙනවා. අහිංසක පොඩි එකාට ගහන්න. හිටපල්ලා."

ෆුජි මල්ලක් රැගෙන ගබඩා කාමරයට ගොස් එහි වූ වී මල්ලක් කපා ඉන් වී ගෙන මල්ලට දමා ගත්තා.

"මොනවද අම්මා ඔය කරන්නේ?"

"මේ මගෙ කොටහ මම ඒක විකුණලා ටකේෂිට රසකැවිලි ගේනවා."

"එපා අම්මා සෝජි අපිව මරයි."

"මම බය නෑ. ඔයා බයවෙන්නත් එපා."

ෆුජි හාල් ටික කඩයට දී ටකේෂිට රසකැවිලි ගෙනාවා.

"එන්න පුතා මේ සීනිබෝල ඔයාට. ආ ඇතිවෙන්න කන්න. මම හොඳ කරවල ටිකක් ගත්තා. මෙන්න ඔෂින් ඔයාට කිමෝනා එකක්. මේක නම් පාවිච්චි කළ එකක්. අඩුගාණට ලැබුණා."

"ස්තූතියි අම්මා. ඒත් ටෝරා......."

"නෑ, ඔෂින් ටෝරාටත් බඩුගන්න ඕනෑ උනාම එයත් එහෙම කරනවා."

"එහෙම ද?" දෙදෙනාම හිනැහුණා.

සවස ඔවුන්ට මිටි පහරවල් ඇසී එළියට ගොස් බැලුවා. සෝජි ගබඩා කාමරයේ දොරට අගුලක් සවිකරනවා දක්නට ලැබුණා.

"මොකද උඹ ඔය කරන්නේ?" ෆුජි ඇසුවා.

"ඇයි පෙනෙන්නේ නැද්ද ගබඩා කාමරයේ දොරට අගුලක් ඇල්ලුවා. ආරක්‍ෂාවටයි ඒක කළේ. අම්මාට හාල් ඕනෑ වුණාම ටෝරාගෙන් ඉල්ලා ගන්න."

"ඔව්, උඹ බයයිනේ. ගෑනී සේරම පාලනය කරනවා. ඔෂින් ආව නිසානේ ඔය."

"අම්මා හැම වෙලාවෙම ඔෂින් ගේ පැත්ත අරන් කතා කරනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා රණ්ඩු වෙන්න එපා. මම ගෙදර ආව එක වැරදියි අම්මා."

"නෑ ඔෂින්, ඔයාව අතරමං කළේ මම. මමයි ඔයාට සාගා යන්න කියලා බල කළේ."

"සෝජි සමාවෙන්න. මම ඔයාලට බරක් වෙන්නේ නැහැ. අනේ අම්මට බනින්න එපා. මම ඉක්මනට රැකියාවකට යන්නම්."

රිකි නැන්දා ඔෂින්ට රැකියාවක් හොයලා දුන්නා.

ඒ සහල් හිමියෙකුගේ වී ගබඩාවේ වී වේළීම හා වී මළු වලට පිරවීමයි. සේවකයෝ කිප දෙනෙක්ම හිටියා. ඔෂින් දිග පටියක් රැගෙන එය ටකේෂි ගේ ඉණට දමා ළඟම වූ ගසක ගැට ගැසුවා. සෙල්ලම් බඩු කීපයක් ම දුන්නා.

"මගෙ පුතා ගස් සෙවණේ ඉන්න. අර හරිය හුඟක් අව්වනේ. ඔයාට අම්මව මෙතනට පේනවා. මටත් ඔයාව පේනවා. ඔහොම වාඩි වෙලා සෙල්ලම් කරන්න."

ඇය වරින් වර පුතා දෙස බැලුවා. දවල් කෑමෙන් පසු ටකේෂි බොහෝ වෙලා නින්දට වැටුණා. ඔෂින් ගෙන ගිය පොරවණයක ටකේෂිව නිදි කළා.

එදා ඔෂින් ගෙදර එන්න රෑ වුණා. ටකේෂිට නින්ද ගිහින් තිබුණා.

"ඔෂින් ඇයි රෑ වුණේ?"

"අම්මා, අද මුදලාලි ගෙ ගෙදර උත්සවයක් තිබුණා. මට කිව්වා පිඟන් කෝප්ප සෝදලා ගේ අස්කරලා දමන්න කියලා. කැවිලි ටිකක් දුන්නා. මෙන්න. වැඩියෙන් යෙන් එකක් දුන්නා අම්මා."

"හෙට ඉඳලා මට ගොයම් වැඩට යන්න වෙනවා."

"අපිත් පටන් ගන්නවා ගොයම් හිටවන්න."

"මම සෝජිට උදව් කරන්න ඕනෑ." ඔෂින් කිව්වා.

"ඕක කරන්න ගියොත් ඔයාගෙ යෙන් පනහ නැති වෙනවා.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔයා ඔය වැඩ කරගන්න. එතකොට ටකේෂි........"

"එතන ගහක බැඳලා තියා ගන්නවා. එයාට තේරෙනවා අම්මා විඳින දුක."

"ඔෂින් ඔයාට මහන්සි නම් වැඩ කරන්න එපා. මට දුකයි ටකේෂිත් දුක් විඳිනවා."

"මට මහන්සි වෙලා පුරුදුයි අම්මා. මට ශක්තිය තියෙනවා. අම්මයි වැඩට මහන්සි වෙන්න හොඳ නැත්තේ."

* * * *

රූසෝ ඉඩම් ගොඩ කිරීම් කටයුතු උනන්දුවෙන් කරගෙන ගියා. එහෙත් ඔෂින් ලිපි නොඑවීම ගැන නම් රූසෝ හිටියේ කනස්සල්ලෙන්. ඒත් රූසෝ දැනගෙන හිටියේ නැහැ ඔෂින් යමගාටා වල බව දන්වා එවූ ලිපියත් පෙර ලිපි මෙන්ම අම්මා කෑලි වලට ඉරා දැම්ම බව. මේ හේතු නිසා ඔෂින් පිළිබඳ අපැහැදීමක් ඇති වෙමින් තිබුණා.

"සුනිකෝ බලන්න මේ ෆොටෝ එක. මේ තමයි මම රූසෝට කතා කරපු පාසල් ගුරුතුමී. දැන්නම් මෙයාට කැමතියි වගෙයි. අර ලියුම් ගැන එහෙම කියන්න එපා. දැන් ඔෂින් එපා වේගන එන්නේ. තාත්තා හරස් වෙනවානේ කෝකටත්. මේ විවාහයට කැමති වුණොත් හොඳයි. හොඳ උගත් කෙනෙක්. අපටත් ඒක නම්බුවක්."

"එයා ඉතින් කොච්චර උගත් වුණත් වැඩක් නැහැනේ. මෙහෙ ආවොත් කුඹුරු වැඩ වලට යන්න එපා යැ."

"එයාගෙන් කවුද කුඹුරු වැඩ ගන්නේ. එයාගෙන් මට ඕනෑ ලස්සණ මුණුබුරාලා."

ඔකියෝ එසේ කියාගෙන ගියා.

සුනිකෝ විමතියෙන් ඇය යන දෙස බලා හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com

# දාහත

"ඔෂින්, ඔෂින්........"

සෝජි ගේ හඬ ඇසී ඇය එළියට ගියා. ඇය රැකියාවට යෑමට සූදානම් ව හිටියා.

"ඔෂින් ගොයම් හිටවන්න ඔයාගේ උදව් ඕනෑ."

"සෝජි, මම වෙන තැනක වැඩනේ. නොගිහින් හිටියොත් රැකියාව නැති වෙයි."

"මොකද ඔෂින් මෙහෙ වැඩ කළාම සල්ලි ලැබෙනවා ද? ටෝරා ගෙදර තියාගෙන ඔෂින් ගෙන් වැඩ ගන්ඩ." ෆුජි කීවේ තරහින්.

"ටෝරාට වැඩ කරන්න බෑ පොඩි දරුවා ඉන්න නිසා."

" එහෙම නම් ඔෂින් ටකේෂිව අරගෙන ගිහින් වැඩ කරන්නේ. අඬගහගතින් ටෝරා ගෙදර තියාගෙන හුරතල් නොකර."

"ටෝරා, ටෝරා....." සෝජි කෑගැහුවා.

"වරෙන් කුඹුරට යන්ඩ. පැළ හිටවන්න තියෙනවා."

"සමාවෙන්න සෝජි ඔයාට උදව් නොකළාට."

සෝජිත්, ටෝරාත් තරහෙන් යන්න ගියා.

"ඔෂින්, ඔෂින්......."

කන්ද උඩින් දුවගෙන ආවේ රිකි.

"මම හිතුවා ඔෂින් වැඩට ගියා ද කියලා."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි රිකි නැන්දා හදිස්සියක් ද?"

"ඔව් ඔෂින්, මම ඊයේ සකාටා ගියා. ලොකු මැඩම්ට හොඳටම අන්තිමයි. ඔයා ගියොත් හොඳයි නේද?"

"ඔව් මම යන්නම ඕනෑ. ඒත් වැඩට එනවා කිව්ව නිසා එහෙ ගිහින් කියලා මම හෙට උදේම සකාටා යනවා රිකි නැන්දා. ස්තූතියි මට මේ පණිවිඩය කිව්වාට."

රාත්‍රියේ සකාටා යෑම සඳහා ඔෂින් සූදානම් වුණා.

"ඔෂින් සල්ලි තියෙනව ද?"

"අම්මා පෑන් කේක් වෙළඳාමෙන් හම්බුන ලාබය කේන්ට දුන්නා. කේන් ඒක ටකේෂිට තෑග්ගක් කියලා ආපිට දුන්නා. ඒ සල්ලි වලින් ටිකක් තියෙනවා."

"ඔෂින්, ඔයා ටකේෂිව තියලා යන්න."

"අම්මා, මම හිතුවා ටකේෂිව ඒ ගොල්ලන්ට පෙන්වන්න ඕනෑ කියලා. නැතත් අම්මට ගොයම් වැඩ කරන්න බෑ ටකේෂි එක්කලා. අම්මා ඔයා සෝජියි, ටෝරා එක්කයි රණ්ඩු කරන්න එපා අම්මා."

"නෑ, ඔෂින්. ඔයා ඉක්මනට එනවා නේද?"

"යශිරෝ මැඩම් ට සනීප වෙනකල් මම ටිකක් උදව් කරන්න හිතුවා. මගෙ ජීවිතේ මෙහෙම හැඩ ගස්වා ගැනීමට පුළුවන් වුණේ මැඩම් මට කියලා දුන්න, උගන්නපු දේවල් නිසයි."

"ඒක ඇත්ත ඔෂින්, එයා ඔයාට දුවෙකුට වගෙ සැලකුවා."

පසුදා උදේම ඔෂින් ටකේෂිත් රැගෙන දුම්රියෙන් සකාටා ගියා.

ඇය දරුවත් අතින් අල්ලාගෙන උයන ගෙය පැත්තෙන් ම ඇතුළ් වුණා.

"අපි ඇතුළට එන්න ද?"

සේවිකාවක් එළියට ආවා.

"මට මිස් කායෝ මුණගැහෙන්න ඕනෑ. කියන්නකෝ ඔෂින් ඇවිල්ලා කියලා."

Scanned with CamScanner

sinhalaebooks.com



එවිටම කායෝ එළියට ආවා.

"ඕ....ෂින්.... ඔෂින් ඔයා මෙහෙ...."

"රිකි නැන්දා කිව්වා මැඩම්ට අසනීපයි කියලා. ඉතින් මම ආවා."

කායෝ ඔෂින්ව රැගෙන දෙමාපියන් හමුවට ගියා.

"අම්මා, තාත්තා මේ බලන්න ඔෂින් ආච්චම්මා බලන්න ඇවිල්ලා."

"සාගා ඉඳලා ඔච්චර දුර ඉඳලා, අනේ ස්තුතියි." මීනු කිව්වා.

"හැබැයි ඔෂින් ආච්චම්මා ඔයාව අඳුරගනීද දන්නේ නෑ. වරින් වර සිහිය එනවා. නැතිවෙනවා. මේක කෝමා තත්වයක් කියලා දොස්තර කිව්වා."

"ඔව්, ඔෂින් අපි හිත හදාගෙන ඉන්නේ. ඔයා දැක්කොත් හරිම සතුටු වෙයි. ගිහින් කතා කරන්න."

යශිරෝ මහත්මිය වැතිර හිටියා. මුහුණ වෙහෙසකරයි. ඇඟ පතත් වැහැරිලා. ඔෂින් ගේ නෙත් කෙවෙනි වලට කඳුළු පිරීගෙන ආවා.

"ආච්චම්මා........ ආච්චම්මා, මේ බලන්න ඔෂින් ඇවිල්ලා. එයාගේ දරුවත් ගෙනැල්ලා ආච්චම්මාට පෙන්වන්න."

එහෙත් කිසිම ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ.

එතැන් සිට රාත්‍රියේ යශිරෝ මහත්මිය ළඟ සිටියේ ඔෂින්. කායෝ සමඟ මිතුරු වූ ටකේෂිගෙන් අවහිරයක් වුණෙත් නැහැ. බොහෝ දවස් වල ඔෂින් මැඩම් ළඟ සිටි සෑම වෙලාවකම,

"මැඩම් මම ඔෂින්....... මේ බලන්න."

කියමින් ඔෂින් යශිරෝ මහත්මියට කතා කළා. එක් දිනක් ඇය ඇස් ඇරියා. ඔෂින් කෑගැහුවා,

"මිස් කායෝ එන්න. මැඩම් ඇස් ඇරියා. මීනු මැඩම් එන්න."

කායෝත්, මවත් දුවගෙන ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මැඩම්, මැඩම් මම ඔෂින්.... ඔෂින්."

ටික වේලාවකින් ඒ මුහුණට මඳ සිනාවක් නැගුණා.

"ඔෂි....න්.... ඔයා මෙහෙ මොනාද කරන්නේ. මම හිතුවා ඔයා සාගා වල කියලා. ඔයා හොඳින් ද?"

"ඔව්, මැඩම්."

"ඔව්, ඔව්, මට මතකයි ඔෂින් ලියුම් ලිව්වානේ ඔයා සතුටින් ඉන්නවා කියලා. "

"අනේ ආච්චම්මා ඔයාට සේරම මතකයි. අපට හරිම සතුටුයි." කායෝ කීවේ හිනැහෙමින්.

"ඒත් ඔෂින් කායෝ මෝඩයි, ඔයා එයාට වටහලා දෙන්න. බිස්නස්කාරියක් වුණත් ඇය ගැහැනියක් බව. කායෝ තනිවෙලා. ඉස්සර වගේම එයත් එක්ක ඉන්න ඔෂින්."

"ආච්චම්මා වැඩිය කතා කරන්න එපා. ඔයාට වෙහෙසයි."

"මම දැන්ම මැරෙන්නේ නෑ කායෝ. මම කායෝ ගේ දරුවොත් බලලා තමයි මැරෙන්නේ. "

එහෙත් කතාබහ වැඩි වෙලාවක් නොපැවතුණි. නැවත ද සිහිසුන් බවට පත් ඇය පාන්දරම ජීවිතයෙන් සමුගත්තා. හැත්තෑපස් හැවිරිදි ඇය මිය ගිය පසු ඔෂින්ට දැනුණේ මුල් යුගය අවසන් වූවා සේය.

ඔෂින්ටත් සෙසු අයටත් කාර්ය බහුල දින කීපයක් වුණේ අවමංගල්‍යට එන අයට කෑම බීම සකස් කිරීමෙහි නිරත වූ නිසාය. අවමංගල්‍ය කටයුතු ඉතා ඉහළින් සිදු වුණි.

"ස්තුතියි ඔෂින්, ඔයා හුඟක් මහන්සි වුණා. අම්මා ඔයාට උගන්වලානේ තිබුණේ මේවා නේද?" මීනු ඇසුවා.

"ඔව්, මැඩම්ට මම සදා ණය ගැතියි."

"කෝ කායෝ." තාත්තා කායෝ සෙව්වා.

"කායෝ අන්න මසාවෝ ඇවිල්ලා ගිහිල්ලා කතා කරන්න."

"එයා මොකටද මෙහෙ එන්නේ. එයාට මේ ගෙදරට අඩිය

Scanned with CamScanner

sinhalaebooks.com



තියන්න අයිතියක් නැහැ." කායෝ තරහින් කෑගැහුවා.

ඔෂින් සෙමෙන් ඇය ළඟට කිට්ටු වුණා.

"කායෝ, ඔයාගේ කේන්තිය ඉවරද? කායෝ තේරුම් ගන්ඩ. ආච්චම්මා කීව දේ මතකද? එයාට ඕනෑ වුණේ ඔයා ගේ දරුවෙක් දකින්න."

"යන්න ඔෂින්, ඔයා ගේ අවවාද මට ඕනෑ නෑ."

කායෝ කෝපයෙන් අනිත් පැත්ත හැරුණා.

"මම දන්නවා. ඒත් මැඩම් මට අන්තිමට කීවේ ඔයාට පහදලා දෙන්න කියලයි."

"අර මිනිහාගෙන් දරුවො හදන්න මොකද මම මැෂිමක් ද?"

"ඒ වුණාට ඒ ඔයාගේ යුතුකම. ඔයා ගේ ආච්චම්මාගේ ඉල්ලීම ඉටු නොකළොත් එයාට සසරේ සැනසීමක් නැහැ. තව එක පාරක් මම කිව්වට සැමියාට සමාව දෙන්න."

කායෝ ආච්චම්මා වෙනුවෙන් ඉටිපන්දම් දැල්ලුවා.

"ඇයි ආච්චම්මා අපිව අත ඇරලා ගියේ?"

"කායෝ ඔයා සැමියා සමඟ එකතු වෙන්න. කගායාවල අනාගත හිමිකාරයා ලබා දෙන්න."

"එක අතකට මොන මිනිහත් එක වගෙයි. මට මතකයි රූසෝ ඔයාට ආදරය කළා. දැන් එයා ඔයාව එළවලා දමලා."

"කායෝ...... ඔයා මේවා........."

"මම දන්නවා. රිකි මට විස්තරය කිව්වා. මම කාටවත් කීවේ නැහැ. ඒත් ආච්චම්මා මළේ ඔයා සතුටින් කියලා හිතලා."

"කරදර ගොඩක්. අයියයි හාමිනෙයි එක්ක අම්මා මා වෙනුවෙන් රණ්ඩු වෙනවා." ඔෂින් දුකින් කිව්වා.

"ඒක ඔයාට ප්‍රශ්නයක් නේද?"

"පුළුවනි ඉවසන්න. සෝජිලාගේ කතා මට වැඩක් නෑ. අම්මටයි ඉවසන්න බැරි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් ඔයා ආපිට යන්න එපා. මෙහෙ ඉන්න."

"ඒත් මම.... මෙහෙ මොනවද.........."

"ඔෂින් එන්න ඔයාට පෙන්වන්න දෙයක්."

කායෝ ඔෂින් ව ඇදගෙන ගියා.

"වැටෙයි මම වැටෙයි."

ටකේෂි හිනැහෙමින් කෑගැහුවා.

"ඔෂින් කොහොමද මෙතන. මෙහෙ වැඩ කරන්න. මේ ගෙයි අයිතිකාරයා මට ණය වුණා. ණය ගෙවන්න බැරිව මේක මට දීලා යන්න ගියා."

"මම මොනවද කරන්නේ."

"ඔයා මොකක් හරි බිස්නස් එකක් කරන්න. අපි කල්පනා කරමු ඔයාට කරන්න බිස්නස් එකක් ගැන."

බිස්නස්, බිස්නස්. ඔෂින්ට දැනුණේ සිහිනයක් සැබෑ වුණා වගෙයි. ඔෂින් හැමදාම හිතුව දෙයක්. දැන් අනපේක්ෂිත ලෙස ඇයට අවස්ථාව ලැබිලා. මේ මගෙ ජීවිතේ සන්ධිස්ථානයක්.

"එන්න අපි තාත්තා ගෙන් අහලා බලමු."

"තාත්තා අර කඩය අපි ඔෂින්ට කුලියට දෙමු."

"ඔෂින්ට මෙහෙ ඉන්න බැහැනේ. එයා ටනකුරා පවුලේ." මිනු කිව්වා.

"නෑ අම්මා ඔෂින් ටනකුරා පවුලෙන් වෙන් වෙලා. රූසෝ පොඩි බබා වගේ අම්මගෙ තුරුල්ලට වෙලා ඔෂින් පිටමං කරලා."

"නෑ, ඒක මගෙත් වරද" ඔෂින් කිව්වා.

"ඔෂින් කොහේද හිටියේ?"

"අම්මා ළඟ හිටියා ටික කලක්." කායෝ උත්තර දුන්නා.

"ඉතින් හොඳයිනේ අම්මා ළඟ ඉන්න එක." මිනු කිව්වා.

"ඒ වුණාට සෝජි නේ ඒ පවුලේ ප්‍රධානියා. එයාට නංගී ව

Scanned with CamScanner

sinhalaebooks.com



ඕනෑ නෑ." කායෝ නැවත කිව්වා.

"ඒ වුණාට ඔෂින්, ඔයා ගේ හදන්න වියදම් කළා නේද?"

"මම ඒවා කළේ මැඩම් මගෙ තාත්තා වෙනුවෙන්."

"අම්මා, තාත්තා, අහන්න ආච්චම්මා හිටියා නම් එයත් කරන්නේ මම කරන දේමයි."

"ඔව් කායෝ ඔෂින් එක සැරයක් ඔයාව අපි ළඟට එව්වා. අමතක කරන්න බෑ එව්වා. ඔයාලට හොඳ දෙයක් කරන්න."

"ස්තූතියි, මම ඔයගොල්ලන්ට ණය ගැතියි."

ඔෂින් හිස නමා ආචාර කළා.

ඔෂින් හා කායෝ පටන් ගත යුතු ව්‍යාපාරයක් ගැන කල්පනා කළා.

"මට හිතෙනවා මෙතන අවන්හලක් පටන් ගන්න. මොකද ඔයා හිතන්නේ."

"හොඳයි ඔෂින් ඒක හොඳ අදහසක්."

"මෙතන වෙන් කරලා උයන ගෙය හදමු. මොකද උයනවා රෙස්ටුරන්ට් එකටත් පේන්න ඕනෑ."

"වරාය ළඟ නිසා කම්කරුවන්ටයි නාවිකයන්ටයි කෑම දෙන්න පුළුවනි. කායෝ එයාලා වැඩිපුර ගත කරන්නේ මුහුදෙනේ. ඒ නිසා අපි ගෙදර උයනවා වගෙ රස කෑමක් දෙමු. මෙතන මේස තුනක් දමන්න පුළුවනි. එතකොට මේසයි පුටුයි ගන්න වෙනවා."

"ඔෂින් ඒවා අපේ ගබඩාවේ තියනවා. පරණයි අපි පිරිසිදු කරලා ගනිමු."

"එතකොට උදේම නැගිටලා මාර්කට් ගිහින් බඩු ගේනවා. අපිට වළං පිඟන් ටිකක් සල්ලි දීලා ගන්න වෙනවා."

"හරි මම ඔයාට ණයට සල්ලි දෙන්නම්."

"තව ඕනෑ වෙනවා දර. දර නේද? හරි මුහුදු වෙරළට දර කොට ගොඩ ගහනවා නේ. මම ඒවා එකතු කර ගන්නවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"අන්න ඉන්නවා ඉස්සර මට අභියෝගයක් වුන ඔෂින්. දැන් මම බය නෑ."

"ඒත් කායෝ මට බයත් හිතෙනවා. වැරදුණොත් ඔයා මා එක්ක තරහ වෙයි."

"නෑ. අපි බයවෙන්න ඕනෑ නෑ. කගායා බංකොලොත් වෙලා නැහැනේ. අපි වඩුවා ගෙන්වලා වැඩ පටන්ගනිමු අදම. ඔෂින් එහෙම නම් ඔයා ගෙදර ගිහින් අම්මට කියලා ඉක්මනට එන්න."

"බෑ කායෝ ගෙදර ගියොත් ආපිට එන්න බැහැ. මොකද අම්මට ඕනෑ අපි තුන්දෙනා එකට ඉන්නයි. එතකොට ආයිම අම්මා ව තනිකරලා එන්න බෑ. මම දන්නවා අම්මා මේ හැම දවසම හැන්දෑවට ගෙදර ආවාම දොර ඇරලා බලනවා ඇති අපි ඇවිල්ලද කියලා. ඒ නිසා මම විස්තර කියලා අම්මට ලියුමක් අරින්නම්. අම්මා මට හරස් වෙන්නේ නෑ. මට සුබ පතයි හදවතින්ම."

ඒ 1926 සරත් කාලයයි. ඔෂින් හා කායෝ අවන්හලේ මේස, පුටු පිරිසිදු කළා.

"කායෝ මේ හෝටලයට මම නම දාන්නේ රෙස්ටුරන්ට් කගායා කියලා."

"හොඳ නමක්, ඒකට මමත් කැමතියි. මොකද දන්නවද ආච්චම්ම සතුටුවෙනවා ඒ නමට."

සවස මිනු හෝටලය බලන්න ආවා.

"මෙන්න ඔෂින් ඔයාට පොඩි තෑග්ගක්."

ඔෂින් එය දිහගැර බැලුවා.

"රෙස්ටුරන්ට් කගායා" හෝටලයේ නම ලියූ බැනර් එකක්.

"අනේ මැඩම් ස්තුතියි."

"ඔෂින් ඔයා නිසා දැන් කායෝ මසාවෝ එක්ක කතා කරනවා ටිකක්. අපි මසාවෝ ගේ දෙමාපියෝ ගෙන්නුවා. ඒ ගොල්ලත් වද වෙනවා මසාවෝ ගේ වැරදි ගැන. ආයිම එහෙම

Scanned with CamScanner

sinhalaebooks.com



වැරදි කරන්නේ නෑ කියලා මසාවෝ එයාලගේ අම්මල ළඟයි, අපි ළඟයි පොරොන්දු වුණා. අපිත් කගායා ව එයාට පාලනය කරන්න දෙන්න පොරොන්දු වුණා."

"හොඳයි මැඩම්, ලොකු මැඩම් ගේ ප්‍රාර්ථනාව එතකොට හරියයි."

පසුවදා පාන්දරම කායෝ හෝටලයට ආවා.

"ටකේෂි නිදි ද?"

"ඔව් කායෝ මම එළවළු, මාළුයි, ගෙනාවා."

"ඔයා ලැයිස්තුවක් ගහලා මේ බිලත් දමලා තියන්න."

"ඔව් උදේ කෑමක් යෙන් විස්සට දෙමු. දවල් කෑම යෙන් තිහට දෙමු."

"හැබැයි ඔෂින් ණයට නම් දෙන්න එපා."

"බලන්නකෝ මම අපේ රෙස්ටුරන්ට් එක දියුණු කරනවා."

"මට ඔයා ගැන ඉරිසියයි ඔෂින්. ඔයාට හිතුණ දෙයක් ඔයා කරනවා. ඔයා නිදහස්. මට මතක් වෙනවා ටෝකියෝ ඉන්න කොට වේටර් කෙනෙක් විදිහට අවන්හල් වල වැඩකරපු කාලය. ඒ මතක හරිම මිහිරියි. දැන් මගෙ ජීවිතය කගායා වලට කැප වෙලා."

"කායෝ දැන් ඕවා ගැන කතා කරලා වැඩක් නෑ. ඔයාට දරුවෙක් ඕනැමයි. ඒක ආච්චම්මගෙ ප්‍රාර්ථනය කියල හිතලා වැඩ කරන්න."

"කායෝ ඔන්න ඔයා අද ගෙදර ඉන්න ඕනෑ. අද මසාවෝ ඔයාලගෙ ගෙදරට එනවා කියලා මිනු මැඩම් කිව්වා."

"ඒවා පස්සේ බලමු."

ඔෂින් ටකේෂිව රෙදි පටියකින් ගැට ගහලා තිබුණා. ටකේෂි ලී කැලි ගෙන විවිධ හැඩතල හැදුවා. ඔෂින් ඉක්මනින් කෑම හැදුවා. වරින් වර එළියට ගොස් එතනින් යන අය දැනුවත් කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"එන්න, එන්න අඩු ගානට හොඳ කෑම එකක්. උණුවෙන්ම රස බලන්න පුළුවනි එන්න."

එහෙත් කිසිවෙක් ඇයගේ කතා ඇසුවේ නැහැ. බොහෝ කම්කරුවෝ එතනින් ගියා.

"එන්න කෑම කන්න එන්න. ගෙදර හැදුවා වගේ කෑම."

දවල් වන තෙක්ම කිසිවෙක් පැමිණියේ නෑ. ඔෂින් බත් ගුළි ඔතා ගත්තා. ටකේෂි සමඟ වරාය පැත්තට ගියා. එක තැනක නතරව බත් පාර්සල් විකුණන්න උත්සාහ ගත්තා. ඒත් එක් අයෙකු දෙන්නෙකුට වඩා ඒවා මිලට ගත්තේ නැහැ.

මොකද මම මේවට කරන්නේ? අපරාදේ කෑම අහක දමන්න ඕනෑ නෑ. මම මේවා නිකම්ම බෙදලා දෙනවා.

ඔෂින් එතනින් ගිය අයට බත් ගුළි බෙදා දී ටකේෂිව වඩාගෙන ගෙදර ආවා.

රාත්‍රියේ කායෝ රෙස්ටුරන්ට් කගායා ළඟට ගියා. අවන්හල වසා දමා දොර අගුල් දමා තිබුණා. කායෝ දොරට තට්ටු කළා.

"ඔෂින් මම..."

"එන්න කායෝ ඇතුළට."

ඔෂින් ටකේෂිව තුරුලු කරගෙන ඉඳගෙන හිටියා.

"ඔෂින් මොකද වුණේ?"

"එක්කෙනෙක්වත් රෙස්ටුරන්ට් එකට ආවේ නෑ. බත් ගුළි හැදුවා ඒත් විකුණුනේ නෑ. මම මිනිස්සුන්ට සිද්ධිය කියලා නිකම්ම බෙදලා දුන්නා. අද බත් වලට යෙන් අසූවක් වියදම් වුණා. මේක වැරදි බිස්නස් එකක්."

"ඔහොම හිතලා බැහැ. බිස්නස් එක පටන් අරන් එක දවසයි. ඔෂින් මතක තියාගන්න මම ඔයාට ණයට මුදල් දුන්නේ. ඒක ආපහු ගෙවන්න ඕනෑ බවත්."

කායෝ එහෙම කිව්වේ සැබෑවටම නොවේ. ඔෂින්ව දිරිමත් කිරීම සඳහායි.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කල්පනා කළා. මේ වෙනුවෙන් කුමක් කළයුතු දැයි සිතුවා. ඇය පසුදින අවන්හල වසා දැම්මා. කායෝ අවන්හල අසලට ගියා. අද එය විවෘත නොවන බව එහි දැන්වීමක් තිබුණා. කායෝ ට ඇතිවුණේ කේන්තියක්. ඇය ආපිට ගෙදර ගියා.

“මොකද කායෝ ආපිට ආවේ.” මිනු ඇසුවා.

“ඔෂින් අවන්හල වහලා දැම්මා.”

“ඇයි ඒ?”

“ඒක තමයි අම්මා. කෝ ඔෂින් තුළ තිබුණ ශක්තිය. අභියෝග භාරගැනීම. මම යාළුවෙක් විදිහට උදව් කළා. ඉතිරි ටික එයා කරපුදෙන්.”

“ඕක බරපතළ වැඩක් කායෝ. එහෙම ඔෂින් තනිකරන්න එපා.”

“අම්මා මට කගායා වල ගිණුම් පොත් මාසාවෝට දෙන්න තියෙනවා.” කායෝ අසුනින් නැගිට ගියා.

ඔෂින් අවන්හල වසා දමා අවන්හල තුළට වී පත්‍රිකා ලියන්න පටන් ගත්තා. එහි උදේට කෑම එකක් යෙන් විස්සක් බවත්, දවල් කෑම එකක් යෙන් තිහක් බවත් ලොකු අකුරින් ලිව්වා. ඇය දින දෙකක් ම ඒවා ලියා පසුවදා ඒවා නගරයට ගෙන ගොස් බෙදුවා.

“මේ අලුත් අවන්හලක්, ඇවිත් බලන්න ගෙදර වගේම කෑම එකක්. උණුවෙන්ම කන්න පුළුවනි. ඇවිත් බලන්න. අඩු මුදලකට හිත පිරෙන්න කෑම එකක්.” කියමින් ඇය පත්‍රිකා බෙදුවා. සමහර තැන්වල පත්‍රිකා කීපයක් ඇලෙව්වා.

කායෝ පොත් වල ගණන් සාදමින් හිටියා. මිනු ඇය ළඟට වී මැහුම් වැඩක යෙදී සිටියා.

මසාවෝ පත්‍රිකාවක් ගෙනැවිත් කායෝට දුන්නා.

“මේ පත්‍රිකා ටවුමේ හැමතැනම බෙදලා.”

“කෝ අනේ මේ ඔෂින් ගේ අවන්හල ගැන. එහෙම නම් ඔෂින්ට අවන්හල එපා වෙලා නැහැ.” කායෝ කීවේ සතුටින්.

Scanned with CamScanner

sinhalaebooks.com



මාළුවක්, අච්චාරුවක්, තෝෆු කැලිවලින් සුප් එකක්, මුහුදු පාසිවලින් ඇය රසවත් ආහාරයක් සකස් කළා.

"ඔෂින් මම කතා කරනවා. ඔයා වැඩ කරනවා. ඔෂින් ඔයා හාල් හේදුව ද? මේ තරම් හාල් ගොඩක්? ඉතුරු වුණොත්."

"අපි බත් ගුළි හදමු." ඔෂින් හිනාවුණා.

"කායෝ ටික ටික රහ බලන්නකෝ." ඔෂින් කෝප්පයක දමා හෂි කුට්ටමක් සමඟ කායෝට දුන්නා.

"හොඳ සුවඳයි. ම්.... හරිම රසයි."

"ලොකු මැඩම් තමයි මට උයන්න ඉගැන්නුවේ."

"ඒක තමයි ඔයා ආච්චම්මගෙන් උපරිම ප්‍රයෝජන ගත්තා."

එදා උදේ වන විට අවන්හලට කීප දෙනෙක් පැමිණියා.

"එහෙනම් මෙතනයි තැන."

"සුබ උදෑසනක් වේවා. අපි ඕගොල්ලන්ව ආදරයෙන් පිළිගන්නවා."

ඔෂින් හා කායෝ ඉදිරියට පැමිණ හිස නමා ආචාර කළා.

"එදා ඔයා අපට නිකන් දුන්න බත් ගුළි හරිම රසයි. එදා අපට හරියට දුක හිතුණා අපේ පාටියේ එකොළොස් දෙනෙක් ඉන්නවා. අපි හාබර් එකේ වැඩ. වෙනදනම් උයා ගන්නවා. මොනරහක් වත් නෑ ඒවා."

ඔවුන් මේසයට වෙමින් එක එක විවිධ ප්‍රකාශ කළා.

"හොඳයි අපේ කෑම කාලා බලන්නකෝ. ඔයාලගෙ ගෙදර කෑම මතක් වෙයි."

"ගෙදරත් අමතක වෙයි ද?"

"මේ වගේ ලස්සණ අය ඉන්නව නම් හැමදාම එන්නම්."

ඔෂින් හා කායෝ ඔවුන්ට විහිළු කරමින් කෑම මේසය මතට ගෙන ගොස් තැබුවා. ටික වේලාවකින් තවත් පිරිසක් ආවා. ඒ නාවිකයෝ.

Scanned with CamScanner

sinhalaebooks.com



"ගාණ අඩු නිසා හොඳට තියනවද දන්නෑ."

එක් නාවිකයෙක් කිව්වා.

"කාලා බලන්න කොහොමද කියලා."

මුල් දවසේ කිසිවෙක් පැමිණියේ නැතත් එදානම් වැඩියත් එක්ක ආවා.

ඔෂින්ට වඩා කායෝ හිටියේ වෙහෙස නිසාම අමාරුවෙන්.

"කායෝ ඔයා ටිකක් මහන්සි ඇරගන්න. මම මේවා කරන්නම්."

"ඔව් ඔෂින් මට හරිම මහන්සියි."

මේ වෙලාවේ කායෝ ගේ පියා කායෝව සෙව්වා.

"තවම ආවේ නැද්ද?"

"මොකට ද කලබල වෙන්නේ. එයා ඔෂින්ට උදව් කරනවා ඇති. ඒක එයාගේ යුතුකම. අමතක කරන්න එපා ඔෂින් නිසයි කායෝ ගෙදර ආවේ කියලා. "

"ඒත් මසාවෝ මොනවා හිතයි ද?"

"එයා මොනවා හිතන්න ද? හොඳයි මම ළමයෙක් යවන්නම් ස්ටෝර්රුවෙන් කායෝ එක්ක එන්න කියලා."

ළමයා කායෝ සොයාගෙන ගියා.

"මැඩම් ට එන්න කියන්න කිව්වා ලොකු මහත්තයා."

"ඔයා ආව එක හොඳයි. මෙහෙ වැඩ හරියට. හොඳ ළමයා වගේ ඔයා එළියෙන් දර කැලි ටිකක් දාලා ලිප පත්තු කරන්න."

එදා රෑ කෑමටත් සමඟ හතළිස් එක් දෙනෙක් සිටි බව ඔෂින් කිව්වා.

සියලු වියදම් අඩු කළ විට යෙන් පහක වාසියක් වත් තිබුණේ නෑ.

"ඔෂින් අපි මෙච්චර මහන්සි වුණේ මේ යෙන් හතරක් ලබාගන්න ද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"කායෝ මට සමාවෙන්න. මම ඔයා මහන්සි කළා."

"ඒ ගැන නෙමෙයි මම කතා කළේ. කෝ ලාභය. මේක හරියන්නේ නෑ. ලාභය ලබන ක්‍රමයක් අපි හොයා ගනිමු."

කායෝ ආපිට නිවසට යන විට රාත්‍රී එකොළහත් පසු වූවා.

"දන්නවා ද දැන් වෙලාව කීයද කියලා?" මිනු දොරකඩට වී සිට ඇසුවා.

"මම කොල්ලා එව්වේ ඔයාව එක්කගෙන එන්න."

"අම්මා හොඳ වෙලාවට කොල්ලා එව්වේ. එයා අපට හුඟක් උදව් කළා."

"අන්න මසාවෝ ඇවිල්ලා."

කායෝ කාමරයට ගියා. මසාවෝ මෙට්ටය මත වැතිර සිටියත් නින්ද ගිහින් හිටියේ නෑ. කායෝ ආච්චම්මා ගේ පින්තූරය මත ඉටි පන්දමක් පත්තු කර එය රඳවනයේ රැඳෙව්වා.

"ආච්චම්මා ඔෂින් ගේ බිස්නස් එක දියුණු කරන්න." ඇය එය තුන්පාරක් කිව්වා.

"කායෝ ඔෂින්ට හුඟක් ළැදියි වගේ."

"ඔව්, මට ඔෂින්ට ටිකක් උදව් කරන්න ඕනේ. එයා මගේ ජීවිතයට කරල තියෙන උපකාර වලට මමත් උපකාර කරන්න ඕනේ."

"ඒකට කමක් නෑ. ඒත් රෑ වෙන්න ඉස්සර එන්න. ඔයා එනතෙක් මට නින්ද යන්නේත් නැහැ."

"සමාවෙන්න මට, අවසර දුන්නට ඔයාට හුඟක් ස්තූතියි." කායෝ කීවේ හිසක් නවා ආචාර කරමින්.

Scanned with CamScanner

sinhalaebooks.com

# දහඅට

ඔෂින් සෑම දිනකම උදෙන්ම මාළු වෙළෙඳ පළට ගොස් මාළු මිලදී ගත්තා. ඒ ගියේ පාන්දර. එවිට ටකේෂි හිටියේ තද නින්දක. ටකේෂි අවදි වීමට පෙර කෑම පිළියෙල කිරීමට ඔෂින් මහන්සි ගත්තා.

"ඔෂින්.........."

"කායෝ ඔයා උදෙන්ම."

"ඔව්, ඔන්න මට බනින්න එපා. මට මසාවෝ අවසර දුන්නා ඔයාට උදව් කරන්න කියලා."

"ඒත් කායෝ මතක තියාගන්න ඔයා කගායාවේ ස්වාමි දුව මිසක් කුලීකාරයෙක් නෙමෙයි. අනිත් එක ඔයා මට පොරොන්දු වුණා හොඳ බිරිඳක් වෙනවා කියලා. මෙහෙම මාත් එක්ක දවසම ගත කළාම මසාවෝ මොනවා නොහිතයි ද? ඔයා කගායා වලට උදව් කරන්න ඕනෑ."

"නෑ, ඔෂින් ඒ සේරම අම්මලා මසාවෝට භාර දුන්නා නේ. මම දැන් නිදහස්. ඔෂින් ඇති ඇති කියවිල්ල. ඉක්මනට බත් ටික උයමු."

කායෝ වැඩ කිරීමට උනන්දු වුණා.

"මෙහෙ කෑම බොහෝ ම රසයි කියනවා. ඇත්ත ද බලමු."

"මේ මට කෑම එකක් ගේන්න. අච්චාරුත් ගේන්න."

"මට මාළුත් එක්ක හොඳයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි මේ ගේනවා."

ඔෂින් හා කායෝ එහෙ මෙහෙ දුවමින් මේස වලට අඩුපාඩු තිබ්බා.

එක් අයෙක් කායෝ ගේ අතකින් ඇල්ලුවා. ඇය අත ගසා දැම්මා.

"මේ ගේනවා සකේ."

"සකේ මෙහෙ නෑ. අපි මත්පැන් විකුණන්නේ නෑ."

ඔෂින් කිව්වා.

"මට දෙනවා සකේ."

වෙරිමතින් ඔහු කෑගැහුවා.

"අපි සකේ විකුණන්නේ නැහැ කිව්වානේ."

මේ අතර ගෙට ගිය කායෝ සකේ බෝතලයක් සහ කෝප්පයක් ගෙන ආවා.

"ආ.... මේන්න කරදරකාරයා. හැබැයි සකේ කෝප්පයක් යෙන් පහළොවයි." කායෝ කිව්වා.

"හරි....... හරි........ මේ දෙනවා."

"ඉස්සර වෙලා සල්ලි මේසේ උඩ තියනවා."

ඔෂින් ඒ දෙස පුදුමයෙන් බලාගෙන හිටියා.

"එහෙම නම් ඉතින් කෑම ටික පත්තියන් වෙන්න අපිටත් සකේ ගේන්න."

කායෝ සෑම දෙනාටම සකේ දුන්නා.

ඔෂින් ගේ හිතට ලොකු දුකක් දැනුණා. ඇය සිහිනෙන්වත් නොසිතුවක්. මෙහෙම ව්‍යාපාරය දියුණු කරගන්න මට ඕනෑ නෑ. ඇය තනියම සිතුවා. ඉන්පසු ඇය අවන්හල පැත්තට වත් ගියේ නැහැ. ආහාර බඳුන් සෝදා පිරිසිදු කර පිස දමමින් හිටියා.

"කෑම තුනක්......."

"කෑම ඉවරයි." ඔෂින් කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"සමාවෙන්න කෑම ඉවරයි. දැන් අපි අවන්හල වහන්ඩයි යන්නේ."

කායෝ සකේ විකුණූ මුදල් වෙන වෙනම එකතු කළා. ඒවා යෙන් කොළ හා කාසි ලෙස පිළිවෙළකට ගොඩ ගැහුවා.

"ඔෂින්, ඔෂින්, මේ බලන්න සකේ වලින් හොඳට ම ලාබයි. යෙන් එකසිය පනහක් විතර ශුද්ධ ලාබය."

ඔෂින් කිසිවක් නොකියා වැඩ වල යෙදුණා. කායෝ ඇයගේ උරහිසින් අල්ලා ගත්තා.

"ඔයා තවම තරහද මා එක්ක."

"මේ අවන්හල බාර් එකක් කරන්න මම කැමති නැහැ. "

"ඔෂින්, මෙහාට එන්නේ හාබර් එකේ මහන්සි වෙලා වැඩකරන කුලීකාරයෝ. ඒ ගොල්ලන් සකේ ටිකක් බොන්නේ මහන්සිය නැති කර ගන්න. ඉතින් අපි සකේ ටිකක් වික්කාට මොකක් ද තියන වරද?"

"ඒ වුණාට ඒක නීති විරෝධියි."

"ඔෂින් මේ අහන්න බාර් වල සකේ දෙන්නේ කෝප්පයෙන් බාගයයි. ඒ වුණාට මෙහෙ වගේ තුන් ගුණයක් අය කරනවා. අපි කෝප්පය පුරවලා දෙනවා."

"ඒත් මේ මිනිස්සු මත් වුණාම අපට හසුරුවා ගන්න බැරි වෙනවා."

"ඔෂින්, ඒක අපි දැනගන්න ඕනෑ. "

"කොහොමත් සකේ විකුණනවාට මම විරුද්ධයි."

"හොඳයි ඔෂින් ඔයා මේ රෙස්ටුරන්ට් එක විවෘත කිරීමේ මූලික හේතුව මොකක් ද? රූසෝ ටෝකියෝ ගෙන්වන එක නේද? ඉතින් දවසට යෙන් හතරක් හම්බ කරලා කොහොමද රූසෝ ගෙන්වන්නේ. ඔයා හිතන්න ඕනෑ සල්ලි ටිකක් වැඩිය හොයා ගන්නේ කොහොමද කියලයි. තේරුණා ද ඔෂින්."

ඔෂින් කිසිවක් නොකියා සියල්ල අසාගෙන හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔය දේවල් ගැන ඕනෑවට වඩා හිතන්න එපා ඔෂින්."

"කායෝ දැන් හොඳටම රෑ වෙලා. යමු මම ඔයාව ගෙදරට ඇරලවන්නම්."

"බැහැ අද මම මෙහෙ නිදාගන්නවා. අද ඔයාගේ හිතත් හරි නැති නිසා ඔයා තනි කරන්න බෑ. මට ඔයාගේ මෙට්ටේ පැත්තක් ඇති. අද මමයි ටකේෂිව තුරුලු කරගෙන නිදා ගන්නේ."

"ගෙදර ගියා නම් තුරුළු කර ගන්න බැරියැ."

ඔෂින් හිනැහෙමින් කියන විට කායෝ ඇය තල්ලු කර දැම්මා. දෙන්නාම හිනැහෙමින් රාත්‍රී කෑම ගත්තා.

"මෙච්චර රෑ වෙලා තවම ආවේ නැද්ද කායෝ." කායෝ ගේ තාත්තා ඇහුවා.

මසාවෝ කෑම ගනිමින් හිටියා.

"මම හිතන්නේ ඔෂින් ගේ අවන්හලේ ඇති." මිනු කිව්වා.

"දැන් ඒ ගමන නතර කරන්න වෙයි වගේ." තාත්තා තරහෙන් පවසන විටම,

"නෑ කමක් නෑ, එයා මගෙන් අවසරය ගත්තා. ඔෂින්ට ටිකක් උදව් කරන්න ඕනෑ කියලා. එයා එක්ක ගෙන යන්න අවශ්‍ය නම් මම යන්නම්." මසාවෝ කිව්වා.

"නෑ එහෙම ඕනෑ නෑ. කායෝට ඔෂින් සහෝදරියක් වගෙයි. දෙන්නා පුංචි කාලේ ඉඳලා එකට හැදුණේ. අද ඔහෙ එහෙ හිටපුදෙන්."

මිනු කියන විට තාත්තා තරහින් යන්න ගියා.

පසුවදා උදෙන් ම මසාවෝ ඔෂින් ගේ අවන්හලට ගියා. දෙන්නාම කෑම පිළියෙල කරමින් හිටියා.

"සුබ උදෑසනක්."

"ආ..... අද උදෙන්ම. තවම අපි උයනවා."

ඔෂින් ඉදිරියට ගියා. එහි හිටියේ මසාවෝ.

"සුබ උදෑසනක්. ඊයේ මමයි කායෝ නතර කර ගත්තේ. මට

Scanned with CamScanner

sinhalaebooks.com



සමාවෙන්න. මම එහෙම නොකරන්නයි තිබුණේ."

"නෑ මමයි හිතලාම නතර වුණේ." කායෝ කිව්වා.

"නෑ, හුඟක් රෑ වුණ නිසා මමයි නතර වෙන්න කීවේ." ඔෂින් නැවත කිව්වා.

"ඒකට කමක් නෑ. මම කායෝ ගැන දන්නවා. කායෝ වැඩ කරන්න කැමතියි. ඒත් අම්මයි තාත්තයි ඔයා නැතිවුණාම වද වෙනවා."

"ඒ ගොල්ලන් හැමදාම එහෙමයි." කායෝ කිව්වා.

"කායෝ, කගායා වල වැඩට මටත් උදව් වෙන්නකෝ."

මසාවෝ කීවේ හිනැහෙමින්.

"බෑ, ඒක ඔයාට හාරයි. ඔෂින් ටිකක් හුරුවෙනකල් මම මෙහෙ ඉන්නම්."

"ඔයාට ඕනෑ ඒක කරන්න නම් මගෙන් බාධාවක් නැහැ. මහන්සිවෙලා වැඩ කරලා ලෙඩ වෙන්න එපා. කොහොමත් මම එදා ඔයාට කිව්වනේ ඔයා කාමරේ නොහිටියොත් මට නින්ද යන්නේ නෑ කියලා."

මසාවෝ කීවේ හිනැහෙමින්.

"සමාවෙන්න මම අද කායෝ එක්කගෙන එන්නම්." ඔෂින් ඉක්මනින් කිව්වා.

"මාව බලන්නත් ඉඳහිටවත් එන්න."

මසාවෝ විහිළුවට මෙන් කියා දෙන්නාට ම ආචාර කර යන්න ගියා. කායෝ පුදුමයෙන් බලාගෙන හිටියා.

"එයා හුඟක් වෙනස් වෙලා."

"ඔයත් වෙනස් වෙන්න. බලන්න කොයි තරම් හොඳ මහත්මයෙක් ද කියලා. එයා ඔයාට ආදරෙයි. මේ එයාට රෑට නින්ද යන්නේ නැතිලු ඔයා ළඟ නැති නිසා."

"එහෙම කීවේ නෑ බොරු කියන්න එපා."

"බොරු නෙවෙයි මසාවෝ, ඔයාට ආදරෙයි. අනේ මැඩම් හිටියා නම්" ඔෂින් කායෝ ගේ උරහිසින් අල්ලා ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මේ කායෝ අද ඉඳලා ඔයාට මෙහෙ ඉන්න තහනම් හොඳ ද?"

"තහනම්, එහෙම නම් මම අඬනවා."

"කොයි තරම් ඇඬුවත් මම ඔයාව ගෙදර යවනවාමයි."

"නෑ.... නෑ..... යන්නේ නෑමයි."

කායෝ ඔෂින් ගේ උරහිසින් වැලඳ ගත්තා. දෙන්නාගේම හිනා හඬ අවන්හල පුරා පැතිර ගියා.

ඔෂින් ගේ උත්සාහය සාර්ථක වුණා. රෑ වීමට පෙර කායෝ නිවසට යැවීමට ඔෂින්ට හැකි වුණා.

ඔෂින් ගේ අවන්හලට පැමිණෙන පිරිස වැඩි වුණා. ව්‍යාපාරය දියුණු වුණා. ඔෂින් ගේ දෛනික ජීවිතය අවන්හලේ වැඩ කිරීමට කැප වුණා. එහෙත් ටකේෂි වඩාගෙන සුරතල් කිරීමට ඔෂින් කෙසේ හෝ කාලය වෙන් කර ගත්තා. ටකේෂි කරදරයක් නැති දරුවෙකු වීම ඇයගේ වාසනාවක් ලෙස ඔෂින් සිතුවා.

එදා අවන්හලේ කෑම මේස පිරෙන්න ම සෙනඟ හිටියා.

"අද මාළු අච්චාරු නැද්ද?"

"මේකයි සර්, මේ දවස්වල මාළු හරි ගණන්. ඒ නිසා ඒවා හදලා මේ ගානට විකුණන්න අමාරුයි. " කායෝ කිව්වා.

"මෙන්න ඉල්ලපු සුප් එක." ඔෂින් සුප් බඳුනක් ගෙනාවා.

මේ වෙලාවේ අවන්හලට හැඩිදැඩි පුද්ගලයන් දෙදෙනෙක් ආවා.

"ආ එන්න ඔය දෙන්නටත් කෑම ඕනෑ ද? ඉඩ තියෙන මේසෙක වාඩිවෙන්න."

"කවුද ඔෂින් කියන්නේ, ඔහේ ද?"

"මම කායෝ, මම ඔෂින් නෙමෙයි."

"අපි අහන්නේ මේකේ අයිතිකාරිය ඔෂින් ද?"

කායෝ බයෙන් පැත්තකට වුණා. උයනගෙයි හිටිය ඔෂින් ඉදිරියට ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම තමයි ඔෂින් ඇයි?"

"මිනිස්සු රවට්ටන අහිංසක මුහුණක්." එකෙක් පැවසුවා.

"ඉතින්, මොනවද කියන්නේ."

"මේක රෙස්ටුරන්ට් එකක් නම් මේකේ දෙන්න ඕනෑ කෑම විතරයි. ඇයි සකේ විකුණන්නේ?"

"ඇයි අපි වික්කාම මොකද වෙන්නේ." ඔෂින් ඇසුවා.

"එතකොට බාර් වලට සමාජ ශාලා වලට පාඩුයි."

"ආ මම හිතුවා හරි. උඹලා බාර් කාරයන්ගේ සමාජ ශාලා අයිතිකාරයන්ගේ වක් ගෝලයෝ. උන් සල්ලි දීලා උඹලව එවලා."

"ගෑනියේ කට වැඩියි."

"මේ තමුසෙලා හිතුවද මේ දුවනගිරියක් කියලා. මේක කගායාවෙන් පාලනය වෙන්නේ දැනගන්නවලා."

"කගායා, අපි මොකට ද කාගායා අණසකට යටත් වෙන්නේ. අර ලොකු අම්මණ්ඩි ඉන්න කාලේ නම් අපිටත් සලකනවා. ඒකට දැන් ඉන්න උපාධිකාරයා දැලි රැවුලවත් ඇවිල්ලා නැහැ. උපාධියේ උස්නය ගහලා අපිට සලකන්නේ නැහැනේ. හැබැයි පාලනය එයා අතේ නම් කගායා ළඟදීම ඉවර වෙනවා. "

"උඹලට ඕනෑ සල්ලි නම් මෙන්න ගනිල්ලා."

කායෝ කාසි ගෙනැත් හැඩිදැඩි පුද්ගලයාට දුන්නා. ඔවුන් එය විසිකර කායෝ තල්ලු කර දැම්මා. ඔෂින් කායෝ අල්ලා ගත්තා.

"සල්ලි ගන්ඩ අපි හිඟන්නෝ කියලා හිතුවද? මීට පස්සේ සකේ විකුණලා තිබුණොත්."

"තිබුණොත්, ඉතින් මොකද මම උඹලට බය නෑ. අහිංසකයන්ට කරදර කරන එක තමයි උඹලා වගේ උන්ගේ රස්සාව."

"සකේ විකුණලා තිබුණොත්."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි මොනවා කරන්න ද?"

"කරන්නේ මෙන්න මේවා."

ඔවුන් මේස කීපයක් පෙරළා දැම්මා. කෑම ගැනීමට පැමිණි අය මේ දෙස බලාගෙන හිටියා.

"අවුස්සා ගන්න එපා මාව. දැන ගනිල්ලා මම ටෝකියෝවේ පේව්මන්ට් කඩයක් කළා."

"ඔෂින් ඕක නවත්වන්න." කායෝ ඔෂින් අල්ලා ගත්තා.

"වරෙල්ලා උඹලා නියම පිරිමි නම් එළියට. මම ලෑස්තියි."

ඔෂින් එළියට ගියා. කායෝ ඔෂින් අල්ලා ගත්තා. ඔෂින් කායෝ ඇත්කර කකුලේ දමා සිටි සෙරෙප්පු ගලවා දැම්මා. අවන්හල තුළ සිටි හැඩිදැඩියෙක් එළියට ආවා. ඔෂින් දෙපා දෙපසට දමා කරාටේ සටනකට මෙන් සැරසුණා.

"මම යමගාටාවෙන්. නකසාවා කේන් අපේ පරම්පරාවේ ප්‍රධානියා. මගේ නම ඔෂින්. මගේ විවාහක නම ටනකුරා. දැනගනිල්ලා උඹලා නකසාවාලාට තියෙන ගෞරවයෙන් මටත් සලකන්න ඕනෑ. දැන් වරෙල්ලා."

"මේ මේ කේන් කීවේ."

"කේන් කීවේ යමගාටා වල කේන්. දැන් ඉන්නේ ටෝකියෝවල."

"අනේ මැඩම්, අපි දැනගෙන හිටියේ නෑ කේන් ගෙ පවුලේ කෙනෙක් කියලා. සමාවෙන්න කරදරයක් කළා නම්. අපි යන්නම්. අපිට සමාවෙන්න. මේවා කේන් ගේ කනට යන්න අවශ්‍ය නැහැ."

කායෝ විමතියෙන් බලාගෙන හිටියා.

"කමක් නැහැ නොදැනනේ මෙහෙම හැසිරුණේ. ඒ ගැන තරහක් නැහැ. යමු මගේ රෙස්ටුරන්ට් එකේ කෑම ටිකක් කාලා යන්න. කායෝ සකේ රත්කරලා ගන්න."

"හොඳයි." කායෝ ගේ තොල් වෙළිලා.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කිසිවක් සිදු නොවූ ආකාරයට ඉක්මනින් විවිධ කෑම වර්ග සකස් කර මේසයට ගෙන ආවා. කායෝ සකේ බෝතල් ගෙනාවා. ටික වේලාවකින් හැඩිදැඩියන් දෙන්නා ම මත් වුණා.

"අපි දැනගෙන හිටියේ නැහැනේ මැඩම් ටෝකියෝවේ කඩයක් දාලා හිටියා කියලා."

"දැන් ඔය ගොල්ලෝ ආවේ බාර් කාරයෝ කීව නිසානේ." ඔෂින් ඇසුවා.

"එවුන් වැඩක් නෑ. මැඩම්ට ඕනෑ තරම් ඕනෑ ගාණකට සකේ විකුණන්න."

"ඕ...ව්... ඕව් ඒක අපට ප්‍රශ්නයක්.. නෙ...මෙයි... නැද්ද."

"තව කන්න, තව කන්න." කායෝ කිව්වා.

"අනේ... මැඩම් හො..ඳ..ට ම ඇති. අපි දැන් යන්න.... ඕනෑ."

"හොඳයි කෑම ටිකක් කාලා යන්න ආයිම මෙහෙ එන්න."

"එනවා..... අපි...... එ...න....වා."

කෑම මේස පෙරලූ හෙයින් සමහර අයට කෑම ලැබුණේ නැහැ. ඒත් ඒ අය තම බිල ගෙවීමට සූදානම් වුණා.

"එපා, සමාවෙන්න සිද්ධ වුණ දේ ගැන. ඔය මුදල් අපට ගන්න බැහැනේ."

"නෑ, අපි හරියට පැහැදුණා ඔයා ගැන. අභියෝවලට මුහුණ දුන්න හැටි අපි අගය කරනවා. ඒ නිසා එහෙම නම් මේ තෑග්ග භාර ගන්න."

ඔවුන් යෙන් නෝට්ටු දෙකක් මේසය මත තිබ්බා.

"ආයිම එන්න. බොහෝම ස්තුතියි."

"අපි ඕසකා ගිහිල්ලා ආපහු යනකොට එන්නම් කො." නැව්යෝ කිව්වා.

"හොඳයි සුබ ගමන්."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් උයන ගෙට ගියා. කායෝ වාඩිවෙලා හිටියා.

"කායෝ ඔයාට මහන්සි ද?"

"ඔෂින් මට පුදුමයි ඔෂින් ඔයා ගැන. ඔයා ඇත්තට ම නකසාවා කෙනෙක් ද?"

ඔෂින් හිනාවෙන්න පටන් ගත්තා.

"කායෝ ඔය මට කේන් කියලා දුන්න පාඩමක්. මම ජේව්මන්ට් එකේ වෙළඳාම් කළානේ. එතකොට තමයි කේන් ඕවා මට කියලා දුන්නේ. ඇත්තට ම නකසාවා කියන්නේ මැරයෝ. මම නකසාවා කීවේ බොරුවට කායෝ."

"බළලා මැටියෙන් වුණාට මොකද මීයෝ අල්ලනවා නම්."

කායෝ ඔෂින් වැලඳ ගෙන දෙන්නාම හිනාවුණා. ඒත් හිනාව අවසන් වුණේ ඔෂින් ගේ ඇඬුමෙන්.

"මම කවදාවත් හිතුවේ නෑ කප්පන් කාරයෝ එක්ක හැප්පෙන්න වෙයි කියලා." ඔෂින් කිව්වා.

"වානේ පන්තරය ලබන්නේ ගින්දරින් වගේ මම දන්නවා ඔෂින් තනිවුණු කාන්තාවක් තුළ මහා ශක්තියක් ගොඩ නැගෙනවා. විශේෂයෙන් ම ඔයා පුංචි කාලේ ඉඳලම අභියෝග වලට මුහුණ දුන්න කෙනෙක්. ඒ අභියෝගය ම ඔයාගේ ජීවිතයට පන්තරයක් වෙලා. ඔයා හරිම දිරිය කාන්තාවක් ඔෂින්. මට හරි ආඩම්බරයි ඔයා ගැන. ඔෂින් මම ඔයාව කවදාවත් තනි කරන්නේ නෑ ඔෂින්. මොන ප්‍රශ්න ආවත් මම ඔයා එක්ක ඉන්නවා." කායෝ කිව්වා.

දෙදෙනාම වැලඳගෙන හිනා වුණා. නැවත දෙන්නාම ඇඬුවා.

"මොනවාද ඔය අතේ තද කරගෙන ඉන්නේ."

"ආ.... මම අර නාවිකයන්ට බිල එපා කිව්වා ම ඒ ගොල්ලන් මට තෑග්ගක් දුන්නා."

"ආ එතන තියෙනවා බිලට වඩා නේද?" කායෝ කිව්වා.

කායෝ සහ ඔෂින් පිඟන් කෝප්ප සෝදමින් කතා කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම කගායා ගැන කිවේ බය වෙයි කියලා හිතලා. ආච්චම්මා ඉන්න කාලේ අවුරුදු වලට තෑගි ගන්න එනවා. හැබැයි ආච්චම්මා ඔවුන් ආශ්‍රය කළේ අතේ දුරින්."

"ව්‍යාපාර ගැන එයාට හොඳ අවබෝධයක් තිබුණා."

"අම්මා........ අ...ම්....මා"

ටකේෂි ගේ සිඟිති කටහඬ ඇසුණා. කායෝ ටකේෂි ගේ කාමරයට එබී බැලුවා.

"ඔෂින් එන්න ඉක්මනට ටකේෂිට සනීප නැහැ වගෙයි."

"කො...... කෝ......" ඔෂින් ඉක්මනට කාමරයට ගිහින් බිම වැතිර සිටි ටකේෂිව වඩා ගත්තා.

"ඇයි මගෙ පුතේ. හොඳටම උණ නේද?"

"මම දොස්තර ගෙන්නන්න ද?"

"එපා කායෝ, ටකේෂිට සරම්ප හැදිලා. මේ මූණේ ලප තියෙන්නේ. මම දැකලා තියෙනවා නංගිලා මල්ලිලාට සරම්ප හැදුණාම. ළමයා උණුසුමින් තියන්න ඕනෑ. රෙස්ටුරන්ට් එක ටික දවසකට වහන්න වෙනවා."

"ඇයි ඒ."

"මට ටකේෂි එක්ක මේ දවස් ටික ඉන්න ඕනෑ. පව්නේ අහිංසකයා. එහෙම දරුවා වෙනුවෙන් ඉන්නේ නැත්නම් මම අම්මා කෙනෙක් ද?"

"කායෝ කීප දවසකට ඔයා මෙහෙ නැවිත් ඉන්නවා නම් හොඳයි."

"එහෙම බෑ මම හෙට එනවා."

කායෝ නිවසට ගොස් මවට ඒ බව කිව්වා.

"රෙස්ටුරන්ට් එක දවස් ගණන් වැහුවාම බිස්නස් කැඩෙනවා නේ." කායෝ කිව්වා.

" මම කියන්ඩ ද, එහෙම නම් ඔෂින් වෙනුවෙන් මම ටකේෂිව ගෙනැල්ලා බලා ගන්නම්. සේවකයොත් ඉන්න නිසා මට වැඩි

Scanned with CamScanner

sinhalaebooks.com



වැඩකුත් නැහැනේ. කායෝ බැරිවෙලා ඔෂින් වෙන කෙනෙක් බැන්දොත් අපි ටකේෂිව හදාගන්ඩ ගනිමු."

"ඒ මොකට ද?" කායෝ ඇසුවා.

"මට මුණුබුරෙක් ඕනෑ. ඔෂින් ගේ දරුවා අපට ආගන්තුක නැහැනේ. ආච්චම්මත් කගායාව ටකේෂිට අයිති වෙනවට විරුද්ධ වෙන්නේ නෑ."

"මොනවද අම්මා මේ කියවන්නේ?"

"ඔයාට දරුවොත් නෑ........."

කායෝ එතනින් නැගිට යන්න ගියා. ඇය කෑම ටිකක් සකස් කරවා ගෙන ඔෂින් බලන්න ගියා.

"ඔෂින්, ඔෂින්."

"ඉන්න කායෝ, මම එළියට එන්නම්."

"අම්මා ඔයාට කෑම හදවලා දුන්නා. මේ ඇඳුම් ටකේෂිට."

"ඔයාලා නොහිටියා නම් මම මොනවා කරන්න ද?"

"ඔෂින් අම්මා කියනවා එයා ටකේෂිව බලාගන්නම්ලු. රෙස්ටුරන්ට් එකේ වැඩ ඔයාට කරන්න කියලා."

"ස්තූතියි ඔයාලට. ඒත් කායෝ ටකේෂිව නැතිව එක මොහොතක්වත් මට ඉන්න බෑ. මට හිතෙනවා මේ වෙලාවට ටකේෂිගෙ තාත්තා අපි ළඟ ඉන්නවා නම් කොයි තරම් හොඳද කියලා. මම රූසෝට ලියුමක් ලිව්වා. ඉක්මනට එන්න කියලා."

"උත්තර එවයි ද?"

"මේ සැරෙත් උත්තර නැති වුණොත් සේරම ඉවරයි. මම නම් ප්‍රාර්ථනා කරන්නේ අපි තුන්දෙනාට එකට ඉන්න ලැබෙන්න කියලා."

ඔෂින් කීවේ දුක්බර හඬකින්.

Scanned with CamScanner

sinhalaebooks.com

# දහනවය

ඔකියෝ, රූසෝට ඔෂින් එවූ ලිපිය මෙවරත් විවෘත කළා:

"හුම්.... සකාටා වල රෙස්ටුරන්ට් එකක් ඇරලාලු. සල්ලි එකතු කරනවලු රූසෝ ගෙන්නා ගන්න. හු...ම්.. අපි සමුරායි පෙළපතින් පැවත එන්නේ. ඔෂින්ට ඕනෑ අපේ පෙළපතේ දැලි ගාන්න."

ඔකියෝ ලිපිය කෑලි වලට ඉරා ළිපට දැම්මා.

"ඒත් මොනවා වුණත් ඔෂින්ට හොඳ ධෛර්යයක් තියෙනවා. ටකේෂිව බලාගන්නවනේ." සුනිකෝ කිව්වා.

"ඔය රෙස්ටුරන්ට් කිව්වාට ඔය ගෑනි සල්ලාලකමේ යනවා ඇති."

ඔකියෝ ගිය පසු සුනිකෝ ළිපට දැමූ ලිපියේ කෑලි අතට රැගෙන පෙට්ටියට දැම්මා.

"සුනිකෝ."

ඔකියෝ නැවත උයනගෙට ආවා.

"හෙට ටකේෂිගේ නැන්දම්මා එනවා කිව්වා. මොනවා හරි රස කැවිලි ටිකක් හදමු නේද?"

"හොඳයි." සුනිකෝ හිස නැමුවා.

පසුවදා ඔවුන් ටනකුරාලා හමුවුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි මේ කසාදය කල් දමන්නේ. දැවැද්දේ ගැටලුවක් ද?"

"ආ... නෑ එහෙම නෑ. දැන් රූසෝ එයි. අපි කතා කරමු." ඩයිකෝරා කිව්වා.

මේ වෙලාවේ වෙනත් කාමරයක වාඩි වී සිටි රූසෝ සමඟ අම්මා කතා කළා.

"රූසෝ වචනයක් දෙන්න. ඒ ළමයා ඔයාට ගැළපෙනවා. ඉතින් ඇයි සරත් කාලය එනතෙක් කල්දමන්නේ?"

"කවුද කල් දමන්න කීවේ. මම කීවේ මට විවාහ වෙන්න බෑ කියලා. ඔයා හදන්නේ අම්මා මගෙ ජීවිතේ අවුල් කරන්න."

මෙවිට ඩයිකෝරාත් එතනට විත් ඔවුන් සමීපයේ වාඩි වුණා.

"රූසෝ, මම ඔයාගේ අම්මා, මට දුකයි ඔයා ඔය ඉන්න විදිහට. බලන්ඩ දැන් ඔෂින් ගිහිල්ලත් අවුරුද්දකට වැඩියි. ඔයාට එක ලියුමක්වත් එව්ව ද?" ඔකියෝ රූසෝ දෙස බලාගෙන සිටියා.

"එයා වෙන ජීවිතයක් ගත කරනවා ඇති. ඔයා දැන් ඔයාගේ ඉදිරිය ගැන හිතන්න ඕනෑ."

"මට මඟුල් එපා."

"රූසෝ ඔයා සාගා වල ඉන්නවා නම් අපේ වචනය පිළිගන්න ඕනෑ තේරුණා ද?"

ඩයිකෝරෝ රූසෝට කිව්වා.

"ඔකියෝ, යන්ඩ සාලෙට, අර මිනිස්සු හිතයි අපි මහ නැහැදිච්ච අය කියලා. ඒ මිනිස්සු තනියෙන් තියන්න එපා."

ඔකියෝ නැගිට ගියා. තාත්තා රූසෝට ළං වුණා.

"රූසෝ, ඔයාට ඔෂින් එක ලියුමක්වත් එව්වා නම් මම මෙහෙම කතා කරන්නේ නැහැ. ඔයාට ලිපියක් ලැබුණේ නැද්ද?"

"නෑ තාත්තා."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔයා ලිව්වෙත් නැද්ද? අර කොණ්ඩා සැකසුම් සාප්පුවට හරි යමගාටා වලට හරි ඔයාට ලියන්න තිබුණානේ. පව් ඔෂින් ගේ අතේ අමාරුව වැඩිවෙලා ලෙඩෙක් වෙලා ද දන්නෙත් නෑ."

"දැන් පරක්කුයි තාත්තා. මම ඔෂින්ව අමතක කරනවා."

රූසෝ නැගිට යන දෙස ඩයිකොරෝ බලා හිටියා.

* * * *

ඔෂින් කෑම සූදානම් කරමින් හිටියා.

"ඔෂින්..........."

"එන්න කායෝ, ඔයා වැඩ පටන් අරගෙන නේද?"

කායෝ කිමෝනාවේ පටි ගැට ගසා ගත්තා.

"ඒක නෙමෙයි ඔෂින්, රූසෝ ඔයාට ලීවේ නැහැ නේද?"

ඔෂින් හිස දෙපැත්තට වැනුවා. ඇයගේ මුහුණ දුක්මුසු වන අයුරු කායෝ බලා හිටියා.

"ඔෂින් ඔයා දන්නවද වැඩක්. කෝටා සකාටා ඇවිල්ලාලු."

"ඔයා කොහොමද දන්නේ?"

"එයා අඳුරන මමත් දන්න කෙනෙක් කීවේ. ගොවි සංගමයක සභාපතිලු. එයාලා මෙහෙ ඇවිල්ලා තියෙන්නේ සාකච්ඡාවකටයි කිව්වා."

"එහෙනම් හරි. ඒ අපි අඳුනන කෝටා ම තමයි. එයාගේ ජීවිතයම ගොවියන් වෙනුවෙන් තමයි." ඔෂින් කිව්වා.

"මොනා වුණත් දැන් අපි අතරේ කිසි සම්බන්ධයක් නැහැ. මම ඒවා සේරම අමතක කරලා ඉන්නේ." කායෝ පැවසුවා.

"එයාගේ ලෝකය අපේ ලෝකයට වඩා වෙනස්."

"කෝටා බැඳලද දන්නේ නැහැ."

කායෝ ගේ ඒ වචන වලින් ඔෂින් ගේ හිතට දුකක් දැනුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



කෝටා පිළිබඳව කතා කරන විට ඇයගේ හිත උණුසුම්වයි තිබුණේ. ජීවිතය මේ තරම් වෙනස් වුණේ කෝටා ජීවිතයට එකතු නොවූ නිසයි.

එදා රාත්‍රියේ නින්දට ගිහින් ඇය ටකේෂිට කතා කළා.

"පුතේ, තාත්තා අපිව අමතක කරලද? නෑ නේද අපිව හොයාගෙන කවදා හරි ඒවිනේ. එතකල් අපි දුක් විඳගෙන ඉඳිමු නේද පුතේ. ඒත් ඇයි ලියුම්වලට පිළිතුරු නැත්තේ නේද පුතේ."

ඔෂින්ට දැඩි පාළුවක් කාන්සියක් දැනුණා.

පසුවදා කායෝ ආවේ කෝටා පිළිබඳ තවත් තොරතුරු රැගෙනයි.

"ඊයේ නිදාගන්න ගිහින් මසාවෝ කෝටා ගැන කිව්වානේ."

"මොනවද කිව්වේ."

"මේ සැරේ සාකච්ඡාවට ගොවි සමිතියෙන් කෝටා, ව්‍යාපාරික සමිතියෙන් මසාවෝ."

"ඇත්ත ද? පුදුම හමුවීමක් නේ. කෝටා මසාවෝ ව අඳුරගෙන ද?"

"අඳුරගන්න ඇති. මසාවෝ කිව්වලු කගායා ව පාලනය කරන්නේ එයා කියලා. මසාවෝ කියනවා බොහෝම බුද්ධිමත් මනුස්සයෙක් අපරාදේ විප්ලව කරන්නේ, ව්‍යාපාර කළා නම් එහෙම හොඳ ව්‍යාපාරිකයෙක් වෙයිලු. වාද කරලත් දිනන්න බෑ කිව්වා. හැබැයි ඉස්සරහට නම් එයා කරදරයක වැටෙයි කිව්වා."

"ඒත් කෝටා කරන්නේ මහජන සේවයක්."

කායෝ කෑම බඳුන් රැගෙන ගියා.

"මේ අද මාළු නැද්ද?"

"තියෙනවා ගල් මාළු. ඔෂින් ගෙනෙන්න මාළු."

"හොඳයි ඉක්මනට හදලා ගේන්නම්."

Scanned with CamScanner

sinhalaebooks.com



මේ අතර තවත් අමුත්තෙක් අවන්හලට පැමිණියා.

"වාඩිවෙන්න සර්. කෑමට..............."

"කෝටා ඔයා?" කායෝ විමතියෙන් ඇහුවා.

"කායෝ ඔයා මෙහෙ වැඩ ද?" කෝටාත් ඇසුවේ පුදුම වෙමින්.

"ඔයා මම මෙහෙ කියලා දැනගෙනද ආවේ?"

"නෑ, මෙහෙ කෑම හොඳයි කිව්වා. ලාබයි කිව්වා. මම එදා වගේම දුප්පත්. ඒකයි කෑමට මෙහෙ ආවේ."

"ඔයා, ඔෂින් ගැන දන්නේ නැද්ද තවම."

"ඔෂින්, ඔෂින්........"

ඔෂින් ඉක්මනින් ටකේෂි සිටි කාමරයට ගොස් ටකේෂිව වඩා ගත්තා. ඇයට ලැජ්ජාවක් ඇති වුණා. මේ අයුරින් කෝටා මුණ ගැසීමට සිදු වීම ගැන. සැමියාගෙන් වෙන් වීම ගැන.

කායෝ සහ කෝටා කාමරයට ආවා.

"ඔෂින්."

ඒ ආදරණීය හඬට ඔෂින් හැරී බැලුවා.

"ඔයා දැක්කේ හුඟක් කාලෙකින්. ඔයා හොඳින් නේද?"

"ඔෂින් මේ පුතා ද? දැන් එයා ලොකුයි."

"සමාවෙන්න මම කඩේට එන අය ගැන බලන්න එපා යෑ." ඔෂින් කෝටා මගහැර ගියා.

"සකේ ගේන්න."

"මාළු කෑම එකක්."

"අද මැකරල් නැද්ද?"

කෝටා පසෙක වාඩි වී ඔෂින් දෙස බලාගෙන හිටියා. ඔෂින් වැඩ කළේ නොසන්සුන්ව. ඒ අතර ම කෝටා කෑම බන්දේසියක් ඔහුගේ මේසය මත තිබ්බා.

"මේ කෑම ඔයාට හොඳද දන්නේ නැහැ. සමාවෙන්න අද

Scanned with CamScanner

sinhalaebooks.com



මෙච්චරයි මම හැදුවේ."

විවිධ වැඩවල නිරත වෙමින් කෝටා සමඟ කතා බහෙන් වැළකීමට ඔෂින් උත්සාහ ගත්තා. ඒ බව තේරුම්ගත්ත කෝටා අවන්හලේ සැම දෙනාම පිටවන තුරු බලා සිටියා.

"ඔෂින් භූමිකම්පාවෙන් ඔක්කොම විනාශ වුණා ද?"

"ඔව්, සේරම විනාශ වුණා."

කෝටාගේ ප්‍රශ්න වලට උත්තර දුන්නේ කායෝ. ඔෂින් ලී බාල්දියට කෝප්ප දමා සෝදමින් හිටියා.

"ඊට පස්සෙ ද සාගා ගියේ."

"සාගා ගියා තමයි නැන්දම්මා ඔෂින්ට පිස්සු නොහැදෙව්වා විතරයි."

"නැහැ ඒ තරම් නරකට සැලකුවේ නැහැ." ඔෂින් කිව්වා.

"මට පුදුම හිතුණා ඔෂින් අවන්හලක් කරනවා දැක්කම." කෝටා කිව්වා.

"කායෝ ගේ උදව් නිසා තමයි මේ සේරම. එයා නැත්නම් මේ මොනවත් නෑ."

"දැන් රූසෝ කොහේ ද?"

"එයා අම්මා ළඟට වෙලා බබා වගේ නැළවෙනවා. නැන්දම්මගෙ නපුරුකම් වලට රූසෝ ගන්නේ අම්මගෙ පැත්ත."

කායෝ කිව්වා.

"රූසෝ ගේම වැරැද්ද නෙමෙයි. මගෙත් වැරැද්ද. මම මුණු මුණු ගානකොට එයාට එපා වෙන්න ඇති."

"ඒ නිසාද ඔයයි මේ පුංචි ටකේෂියි එළවා ගත්තේ." කායෝ ඇසුවා.

"එළවා ගත්තේ නෑ. මමයි ටකේෂිව අරගෙන ආවේ."

"ඒ වුණාට රූසෝ දන්නවා ඔයාට සල්ලි නැහැ කියලා. හොඳයි මොනවත් ඕනෑ නෑ, ඔයා ලිව්ව එක ලියුමකටවත්

Scanned with CamScanner

sinhalaebooks.com



උත්තරයක්වත් එව්වද?"

"එයා ආදරේ පෙන්වන්නේ වෙන විදිහකට. එයා ඉඩම් ගොඩ කරනවා. ගෙයක් හදනවා කිව්වා. ඊට පස්සේ අපිව ගෙන්නා ගනියි."

"මේ ඔෂින් පරණ යාළුවන්ගෙන් ඇත්ත හංගන්න හදන්න එපා. රූසෝ හරි මිනිහෙක් නම් ඔයත් එක්ක ආපිට එන්න ඕනෑ." කායෝ කිව්වා.

"වෙනත් හේතුත් ඇති සමහරවිට." ඒ කෝටා ගේ අදහස.

"මම නම් හිතුවේ ඔෂින්ට කවුරුත් ආදරය කරයි කියලා. කොහේ ගියත්, කොහේ හිටියත්, ඔයාව අගය කරයි කියලා." කෝටා ඔෂින් දෙස බලාගෙන කිව්වා.

"දෙවියෝ අපට හොඳ සැමියෝ දීලා නෑ කෝටා."

"කායෝ, මේ අහන්න ඔයාගේ සැමියා හොඳ ව්‍යාපාරිකයෙක්. ඔයා ගෙදර ඉඳලා හොඳ බිරිඳක් වෙන්න. මෙතන නිකං බලා ඉන්නේ නැතිව. "

"නිකං ඉන්නේ කවුද? මම මෙහෙ වැඩ."

කායෝ පිඟන් ටිකක් ඔසවාගෙන සේදීමට ගියා.

"මට සමාවෙන්න, කතා කරන්න වෙලාවක් නැහැ."

"මට පේනවා ඔයාට හුඟක් වැඩ. හෙටටත් ලෑස්ති වෙන්න එපා යැ. මෙන්න කෑම මිල."

"එපා කෝටා එපා, අපි යාළුවෝ එහෙම සල්ලි ගන්න බැහැ."

"එතකොට කොහොමද වෙන දවසක ඇවිල්ලා කෑම කන්නේ."

"හොඳයි එදාට ගන්නම්. අද නම් එපා."

"කෝටා, මම වැඩ ඉවරයි. මාව ඇරලනවද ගෙදරට."

කායෝ අලුත් කිමෝනාවකින් සැරසී පැමිණියා.

"අපි යනවා ඔෂින්."

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳයි, ප්‍රවේශමෙන්."

කායෝත්, කෝටාත් යන දෙස ඔෂින් බලා හිටියා. ඇයගේ සිතට දැනුණේ දුකක්, වේදනාවක්. ඒ හැඟීම ගැන ඇයට හිතන්න බැරිවුණා.

කෝටා කැටුව අවන්හලකට ගිය කායෝ ඔෂින් පිළිබඳ තොරතුරු බොහොමයක් පැවසුවා.

"කෝටා ඔයා විවාහ වෙලාද? මට කියන්න."

කායෝ එකවරම ඇහුවා.

"නැහැ තවම නැහැ." කෝටා කිව්වා.

"කෝටා අපි තරුණ කාලේ ඔයාගේ හිත ඔෂින්ට ගියා. මගෙ හිත ඔයාට ගියා. එහෙම නොවෙන්න ඔයයි ඔෂිනුයි විවාහ වෙලා අද කොයිතරම් සතුටින් ඉන්නවද? මමයි ඔයාලට හරස් වුණේ. ඒ ගැන මම හැමදාම තැවෙනවා, දුක්වෙනවා. කෝටා ඔයාට පුළුවනි ඔෂින්ට උදව් කරන්න. එයා දුකින් ඉන්නේ. ඔය මොනවා කිවත් රූසෝ ඔෂින්වයි, ටකේෂිවයි අත ඇරලා තියෙන්නේ. ඔයා ඔෂින්ට පිහිට වෙන්න කෝටා."

කායෝ කී දේවල් කෝටා නිහඬව අසා සිටියා. කිසිවක් කීවේ නැහැ. එහෙත් නවාතැනට ගිය ගමන් බොහෝ දේවල් ඔහුට සිතුණා. ප්‍රථම ආදරයේ උණුසුමින් ඔහු ප්‍රබෝධමත් වුණා. පසුවදා උදේම ඔහු ඔෂින් සොයා ගියා. ටකේෂි කෑම ගනිමින් හිටියා. ඔෂින් ළිප පත්තු කිරීම සඳහා අවන්පතකින් ගිනි අඟුරුවලට පවන් ගසමින් හිටියා.

"ආයුබෝවන්......"

"ආ........... කෝටා ඔයා? ඇයි උදෙන් ම?"

"ඔයා එක්ක කතා කරන්න මේක හොඳ වෙලාව කියලා හිතුණා."

"තියෙනවද මට කියන්න දෙයක්."

"කායෝ මට ඔයාගේ තත්වය ගැන කිව්වා. ඔෂින් ඔයා ගේ ස්වාමියා සමඟ එකතු කරන්න මම මොනවද කරන්න ඕනෑ."

"එපා කෝටා ඔයා මේකට පැටලෙන්න එපා. මම ටකේෂිව

Scanned with CamScanner

sinhalaebooks.com



බලාගෙන මෙහෙම ජීවත් වෙන්නම්."

"ඒත් තරුණ කාන්තාවක් දරුවෙක් එක්ක තනියම."

"මට අනුකම්පා කරන්න එපා."

"මේක අනුකම්පාවක් නෙමෙයි."

කෝටා කීවේ දැඩි හඬින්. ඔෂින් තිගැස්සී ගියා. ඇය කෝටා ගේ මුහුණ දෙස බලාගෙන හිටියා.

"ඔයා දුටුවා ම මෙහෙම ඉන්නවා දැක්කාම උදව් වෙන්න හිතුණා. ඔෂින් මේ බලන්න. පොඩි ටකේෂිට පියෙක් වෙන්න මට ඉඩ දෙන්න. රූසෝ අකමැති වෙන එකක් නැහැ. මම රූසෝට ලියනවා මේ ගැන. එයා ඔයයි දරුවයි අත ඇරලා නම් මම ඔයාලා භාර ගන්න බව මම එයාට ලියනවා. ඔයා මේ ගැන තවත් හිතන්න. මම වෙන දවසක එන්නම්."

"හොඳයි ප්‍රවේශමෙන්."

ඔෂින් හිස නමා ආචාර කළා.

ටික වෙලාවකින් කායෝ පැමිණියා.

"මම දන්නව ඔෂින් කෝටා ඇවිල්ලා ගියා නේද? කොහොමද මංගල්‍යයට දිනයක් වෙන් කර ගත්තා ද?"

"මේ කායෝ විහිළුව ඇති, මම තාම ටනකුරා පවුලේ."

"ඔයාලා බඳින්න තිබුණේ බොහෝම ඉස්සර. දැන් හරි කමක් නෑ ඔයාලා දෙන්නා එකතු වෙනවා නම්. දන්නවද ඔෂින් මම හරියට තැවුණා මා අතින් සිද්ධ වුණ වැරැද්ද ගැන. දැන් ඒ දුකින් මිදුණා. කෝටාට කවුරුත් නැහැ ඔෂින්............ ඔයාටත්..."

"මට නම් තනි නැහැ. මගෙ තනියට ටකේෂි ඉන්නවා නේ."

"ඔයා තාමත් රූසෝට ආදරෙයි ද?"

"කායෝ අන්න කස්ටමස්ලා ඇවිල්ලා. ඔයා මගෙන් ප්‍රශ්න අහ අහ ඉන්නවා. ඔයා අද මට උදව් කරන්නේ නැද්ද?"

"හරි හරි කෝ දෙන්ඩ ඔය කෑම ටික ගෙනියන්ඩ."

දෙන්නාම හිනැහුණා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විස්ස

ඔෂින් තම ව්‍යාපාරය හොඳින් දියුණු කර ගත්තා. ඇයට කායෝ බෙහෙවින් උදව් කළා. නැවත කෝටා පැමිණියේ මසක් පමණ ගත වූවාට පසුය. ඔහු සමඟ ඔහුගේ සංවිධානේ කීප දෙනෙක් ම. අවන්හලට පැමිණ ආහාර ගැනීමට පැමිණි අය වගේ ඔවුන් ආහාර ගනිමින් වැදගත් කතාවක නිරතව සිටියා. එහෙත් ඒ ඉතා සෙමෙන් කතා කරමින්.

"අර ගොල්ලන් මොනවා හරි වැදගත් කතාවක්." කායෝ ඔෂින්ට කිව්වා.

ඔෂින් ලී පෙට්ටියෙන් බත් කෝප්පය බැගින් ගෙන සකස් කළා.

"කතාව මොනවා ගැනද?" ඔෂින් ඇසුවා.

"තේරෙන්නේ නැහැ මට නම්, අන්න එයාලා යන්නයි හදන්නේ."

"මොනවද එයාලා කියන්නේ?" කායෝ කෝටාගෙන් ඇසුවා.

"නෑ, මොනවත් නෑ. කෑම රසයි කිව්වා. කෝ ඔෂින්."

"එයා කෑම හදනවා."

කෝටා ඔෂින් සොයාගෙන ගියා. ඔහු ගියේ ටකේෂි ළඟට.

"අනේ, ටකේෂිව බලු පැටියෙක් වගේ බැඳලා දමලා. ඉන්න මම ඔයාව ලෙහන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"එපා කෝටා එයා හැම තැනම දුවනවා." ඔෂින් කිවේ හිනැහෙමින්.

"ඒ වුණාට පොඩි එකා ආසා ඇතිනේ නිදහසේ ඉන්න."

"කෝටා මොකක් හරි ප්‍රශ්නයක් ද?"

"ඔව්, ඔෂින් ඔයා දැනගන්න ඕනෑ මේවා ගැන. රජය ඉදිරියේ දී, ගොවි, කම්කරු සමිති තහනම් කරනවාලු."

"ඔයාට ආයිම හැංගිලා ඉන්න වෙයි ද?

"ඔව් ඉදිරියේ කරදර ඇති වෙයි. මෙහෙ ඉන්න බැහැ. මම කොහොමද ඔයයි ටකේෂියි බලා ගන්නේ. සමාවෙන්න මට."

"මට ඕවා තේරෙනවා. ඔයාට ඕවා අත ඇරලා බැහැ. ඒ වගේම අපි නිසා ඔයාගේ වැඩ අත අරින්නත් එපා."

ඔෂින් කෝටා ගේ මුහුණ දෙස බලාගෙන කිව්වා.

"කෝටා ඔයා මා ගැන හිතුව එක සතුටක්. ඒත් ඔයා ගේ අරමුණ බෙදෙනවා මට පිහිට වෙන්න ආවොත්. අපි මුලදී හමුවුන දවස ගැන මම නිතර මතක් කළා. මම දන්නවා මම ඔයාට ආදරේ නම් ඔයාගේ නිදහස දෙන්න ඕනෑ."

කෝටා ඔෂින් ගේ මුහුණ දෙසම බලාගෙන හිටියා.

"කෝටා ඔයා කිව්වා ටකේෂිව ඔයාගේ දරුකමට භාරගන්නම් කියලා. ඒ වචන මට හරි සතුටක්. කෝටා ඔයාට මගෙ තිබුණ ආදරය නිසා මම කායෝට ඉර්ෂ්‍යා කළා. ඔයා මට කිව්වා මට ආදරෙයි කියලා. මමත් ඔයාට ආදරෙයි. අපි නිසා ඔයා ගේ වැදගත් අරමුණු අත්හරින්න එපා. ඒවා ඉටුකර ගන්න. මම ඒ ගැන සුබ පතනවා."

"ඔෂින්, සකේ බෝතල් තුනක්."

"හරි මේ ගේනවා."

"ඔෂින්, මම රූසෝට හොඳ ලිපියක් නම් ලියනවා. එයාගෙන් ස්ථිර වචනයක් අහලා."

"ටකේෂි, අවුරුද්දත් ළඟයි නේද? මම ඔයාට තෑග්ගක්

Scanned with CamScanner

sinhalaebooks.com



ගෙනත් දෙන්නම්කෝ හොඳ ද?"

"හොඳ මාමා." ටකේෂි කෝටා ගේ ගෙල වටා අතක් දමා ගත්තා.

*    *    *    *

1926 අවුරුද්දේ ආරම්භයයි. ඔෂොගත්සු නමින් හැඳින්වෙන අලුත් අවුරුදු උත්සවය දෙසැම්බර් 31 වෙනි දින සවස ඇරඹුණි. ඔෂින් අවන්හලේ ඒ සඳහා දිවා ආහාර වේලක් දීමට සූදානම් වුණා. ඒ අවන්හල දියුණු කිරීමට අත හිත දුන් කායෝ ට සහ පවුලේ අයටයි, ඇය මේ සඳහා කෝටා ට ද, ආරාධනා කළා.

"ඇයි කායෝ මැඩම්ලා නාවේ."

"අද මසාවෝ ගේ අම්මලා එනවා කිව්වා. ඒකට සූදානම් වෙනවා. හවස එන්නම් කිව්වා."

"ඔයා ගෙදර ඉන්න එපා යැ."

"ඊට වඩා ඔයා එක්ක ඉන්න එක මට සතුටක්. අවුරුදු කියන්නේ සතුටනේ. ඉතින් මම මෙහෙ ආවා."

කෑම මේසය පිළියෙල කර තිබුණා. කෝටාත්, කායෝත්, අහාර ගත්තා. කෝටා ටකේෂිට කෑම කැව්වා.

"ඔෂින් ඔයත් එන්නකෝ. ඔයත් අපිත් එක්ක කෑම ගන්න." කායෝ කිව්වා.

"ඔව් ඔෂින් දැන් විවේක ගන්න." කෝටා කිව්වා.

"මම මේ ඔයාලා කැමති කෑම හදනවා. ඒක මට සතුටක්."

"මේ ඒක නෙවෙයි, රූසෝට යැව්ව ලියුමට උත්තරයක් ආවේ නෑ නේද කෝටා."

"දැන් ඕවා ඕනෑ නෑ කෝටයි මමයි විවාහ වෙන්නේ නැහැ."

"ඔෂින්ව නොබැන්දට මම ඔෂින්ට උදව් කරනවා කොහේ හිටියත්."

"ඔෂින්.... ඔෂින්...."

Scanned with CamScanner

sinhalaebooks.com



"කවුද ඇවිත්" කායෝ කිව්වා.

"ඉන්න මම බලන්න."

දොර ළඟ හිටියේ රිකි නැන්දා.

"අනේ රිකි නැන්දා. එන්න, එන්න...."

"ඔෂින්, සුබ අලුත් අවුරුද්දක් වේවා. මම ආවා ඔයාව බලලා යන්න. ෆුජිත් මට කිව්වා ඔයාව බලලා එන්න කියලා."

"කායෝ මේ බලන්න රිකි නැන්දා ඇවිත්. එන්න එන්න කෑම ටිකක් කමු."

රිකි කාමරය දෙස බැලුවා. ඇය කෝටා දුටු විටම,

"ඔයා ද එහෙම නම් ඔෂින් ගෙ ස්වාමියා. ඔයා ටික දවසකට ඉස්සර වෙලා ලියුමක් එව්වා නේද? ෆුජිට. ඒ ලියුමට උත්තර ලිව්වේ මම. මොකද ෆුජිට ලියන්න කියවන්න බැහැ නේ. එහෙම නම් ඔයා මගෙ ලියුම දැකලා එන්න ඇත්තේ නේද? ඔයා ඔෂින් එක්ක ඉන්නවා දැක්කම ෆුජි හරි සතුටු වෙයි."

රිකි නොනවත්වා ම කියවන විට කෝටා අපහසුවෙන් ඔෂින් දෙස බැලුවා.

"නෑ, නෑ, රිකි නැන්දා මේ රූසෝ නෙමෙයි. මේ අපේ හොඳ යාළුවෙක්." ඔෂින් ඉක්මනින් කිව්වා.

"රිකි නැන්දේ මොකක් ද ඔයා කීවේ රූසෝගෙන් ලියුමක් ආවා කියලා."

"ඔව්, දැන් මාසෙකට ඉස්සර වෙලා ලියුමක් ආවා. ඔයා යමගාටා වල ද කියලා අහලා. ඇයි ඔයා රූසෝට නොලීවේ?"

"මොකද නොලීවේ? ඔෂින් ලිපි කීපයක් ම යැව්වා නේ රූසෝට." කායෝ කිව්වා.

"හරි පුදුමයි ලිපි වලට මොකද වුණේ."

ඔෂින් තවත් කෑම බඳුන් කීපයක් ම සූදානම් කළා. ඇයගේ හිතේ තිබුණේ ඇයි රූසෝට ලිපි නොලැබුණේ යන ප්‍රශ්නයයි. මොනවා වුණත් ඔෂින්ට දැනුණා ඇය ලොකු වරදක් කර ඇති

Scanned with CamScanner

sinhalaebooks.com



බව. ඒත් ඒ කුමන වරදක් දැයි ඇයට නිශ්චිතව හිතුණේ නැහැ. ඔෂින් කෑම බඳුන් මේසය මත තිබ්බා.

"දැන් ඔය කතා නවත්වමු. අද අවුරුද්දනේ අපි සතුටු වෙන්න එපා යැ."

ඔෂින් එතන වූ කුඩාම කෝප්ප වලට සකේ දමා සියලු දෙනා අතට ම දුන්නා. ඇයත් කෝප්පයක් ගත්තා.

"සියලු දෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා."

සුබ පතමින් සකේ බිව්වා.

"ඔෂින් අම්මා හුඟක් සතුටු වෙයි. ඔයා මෙහෙම දියුණු වෙලා ඉන්නවට. එහෙ ෆූජිට කරදර. ලේලි බොහෝම ලෝබයි."

"රිකි නැන්දා මම ගෙවලා ඉවර වුණාම කගායාවේ ණය, යවනවා අම්මාට මුදල් ටිකක්. අම්මාව මෙහෙ ගෙන්නා ගන්නවා."

"ඔෂින්, ඔයාලා මට අම්මා වෙනුවෙන් සලකනවා නේද?"

"රිකි නැන්දා මට හුඟක් උදව් කරලා තියෙනවා. පුංචිම කාලේ කගායාවේ මේ රස්සාව හොයලා දුන්නෙත් ඔයා. අම්මට ලිපි ලියලා දෙන්නෙත් ඔයා. ඔයාට මම ණය ගැතියි." ඔෂින් හිස නැමුවා.

"ලියුම ආවේ කොයි කාලෙද?" කෝටා ඇසුවා.

"දැන් මාසෙකට වැඩියි."

"එහෙම නම් ඔෂින් සැමියා ඔයා අතහැරලා නැහැ. පුදුමයි ලිපි වලට මොකද වුණේ?"

"කෝටා අපි ඔය කතාව නවත්වමු. ඔයා හෙට දුර ගමනක් යනවා. ඉතින් අද අපිත් එක්ක සතුටින් ගත කරන්න. තව සකේ ගන්න කෝටා." ඔෂින් කිව්වා.

ඔෂින් රිකි නැන්දාගෙන් ගම ගැන තොරතුරු ඇසුවා. ටකේෂි ගේ සුරතල් බලමින් කෝටා සතුටු වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



* * * *

ඔෂොගත්සු උත්සවය වෙනුවෙන් ටනකුරා පවුලේ සැමටම රූසෝ ගේ මනමාලිය ගේ නිවසින් දවල් කෑමට ආරාධනා කර තිබුණා. මේ වෙලාවේ රූසෝත් ඩයිකෝරාත් මිටි මේසය ළඟ වාඩි වී සකේ බොමින් හිටියා. ඔකියෝ කීප වරක් රූසෝට රැවුළ කපා සූදානම් වන ලෙස ඉල්ලීමක් කළත් රූසෝ ඒවාට කන් දුන්නේ නැහැ.

"රූසෝ දැන් ඇති සකේ බිව්වා."

"කමක් නෑ අවුරුද්දනේ. අද නිවාඩු දවස ඔහෙ බීවා වේ."

"මොනවද ඩයිකෝරෝ කියන්නේ. අර මිනිස්සු බලාගෙන ඇති අපි එනකල්. රූසෝ ඔය රැවුල කපා ගන්න."

"බෑ මම යන්නේ නෑ. මට ඕනෑ නැති කසාදයක් නැහැ."

"ආ ඒ කියන්නේ තාම ඔෂින් ගැනමයි හිතන්නේ, එහෙම ද?"

"ඔව්, ඔෂින් මගෙ බිරිඳ, ටකේෂි මගෙ දරුවා."

"එහෙම නම් හිතන්නේ මම ඇත්තම කියන්නම්. ඔයා ගේ ඔෂින් වෙන කෙනෙක් එක්ක සම්බන්ධයි."

"අම්මා ඔෂින්ට මොනවද නොකීවේ. දැන් එහෙම කතාවකුත් හදාගත්ත ද?"

"හදාගත්ත කතාවක් නෙමෙයි රූසෝ. මම ඔප්පු කරන්නම්."

ඇය ගෙට ගොස් ලිපියක් රැගෙන ආවා.

"මේ තියෙන්නේ සාක්ෂි. ඔෂින් බඳින්න ඉන්න මිනිහා මේ ලියුම රූසෝට එවලා තිබුණේ. ඔයා ඔෂින්ව අත ඇරලා නම් එයා ඔෂින් ව බඳිනවාලු."

"මම මේ ලියුම දෙන්න නෙමෙයි හිටියේ. ඒත් ඔයා දුක් විඳිනවා රූසෝ. මට ඒක විඳ දරාගන්න බෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



රූසෝ තමා අතට ගෙන ලිපිය කියෙව්වා. එය කෝටා විසින් රූසෝට එවූ ලිපියයි. රූසෝ ලිපිය කියවන අතර ඔකියෝ,

"ඔය ලියුමේ කියලා තියෙනවා ඔෂින් ලිපි එව්වා කියලා. බොරු, කවදාවත් මෙහාට ලියුමක් ආවේ නැහැ. පේනවා නේද ඔෂින් ඒ මිනිහාවත් මුළා කරලා. කපටි ගෑනි නේද රූසෝ."

රූසෝ ලිපියත් රැගෙන එළියට දුව ගියා.

"මොකක්ද ඔකියෝ ඔයා ඒ කළේ. මහ දරුණු වැඩක් නේ."

"ඔයාට තේරෙන්නේ නැද්ද ඩයිකොරෝ රූසෝ ඔෂින්ට රැවටිලා ඉන්නේ. ඒකයි එයා මේ විවාහය පමා කරන්නේ. මම අම්මා, මට ඉවසන්න බෑ. දැන් ඔෂින් ගිහින් අවුරුදු දෙකකටත් ළඟයි. රූසෝ තනිවෙලා. ඉන්ඩ මම පහදලා දෙන්න."

"යන්නේ නෑ ඔකියෝ එළියට. එයාට තනියම ඉන්න දෙනවා."

තාත්තා කෝපයෙන් කිව්වා.

රූසෝ පොකුණ ළඟ වාඩි වී ලිපිය බලමින් කල්පනා කළා. මේ සියල්ල අසා සිටි සුනිකෝ සෙමෙන් රූසෝ ළඟට ආවා.

"රූසෝ මෙහෙ එන්න.. " ඇය තමාගේ කිමෝනාව තුළින් පත්තර වල ඇලවූ ලිපි කීපයක් ම රූසෝට දුන්නා.

"ඔෂින් එව්ව ලියුම්, අම්මා මේවා ඉරුවා. මම ඒවා අලවලා තිබ්බා."

රූසෝ විමතියෙන් සුනිකො දෙස බලා සිටියා මොහොතක්. ඉන්පසු ඔහු ඒ ලිපි එක එක කියවන්න පටන් ගත්තා. හරිම හදිසියෙන් සියල්ල කියවන්න ඔහුට අවශ්‍ය වුණා. සුනිකෝ දිගටම කතා කළා.

"ඕවා ඔයාට පෙන්වන්න නෙමෙයි මම ඇලෙව්වේ. මට හිතුණා ඔය ලියුම් තියෙන තෙක් අම්මා මට යටත් කියලා. ඒත් අද මට ඔෂින් ගැන දුක හිතුණා. පව් දුප්පත් ඔෂින්, දරුවෙකුත් එක්ක තනිවුණා. ලෙහෙසි නැහැ තරුණ ගෑනියෙකුට තනිව ම ඉන්න සිද්ධ වුණාම. එයා ටකේෂි නිසයි වෙන දෙයක් කරන්න

Scanned with CamScanner

sinhalaebooks.com



හිතන්න ඇත්තේ. ඔෂින් හොඳ ගැනියෙක් රූසෝ. මම මේ ලියුම් පෙන්නුවේ නැත්නම් ඔයා ඔෂින්ට වෛර කරයි."

"අම්මා මට මෙහෙම කළානේ." රූසෝ කිව්වා.

"එපා රූසෝ එහෙම හිතන්න. අම්මා ඔෂින්ට හොඳට සලකන්න හැදුවා. ඔෂින් ටකේෂිව අරගෙන යන්න ගියා. ඔයා තනි කළ නිසා අම්මා ඔෂින්ට වෛර කළා. ඒකයි ලියුම් ඉරුවේ. ටනකුරා පවුලේ හොඳ නමට කැළලක් ඇති කළ නිසා අම්මා ට ඔෂින් පෙන්නන්න බෑ. ඒකයි මේ සේරම කළේ."

"රූසෝ ඔයා තවම පමා නැහැ. ඉක්මනට ඔෂින්ට හොඳ ලිපියක් ලියලා අරින්න. පව්, අහිංසක කෙල්ල. මම මේවා දන්නා කියලා අම්මට නම් කියන්න එපා රූසෝ. ඔය දන්නවනේ ඇතිවන තත්ත්වය."

* * * *

අවන්හලේ මේස පිරී කෑම ගනිමින් හිටියා.

ඇතුළට පැමිණියේ තැපැල් කරුවාය.

"ආයුබෝවන් එන්න ඇතුළට." කායෝ කිව්වා.

"අද නම් ආවේ කෑමට නෙමෙයි. ඔෂින් ටනකුරාට ලිපියක් තියෙනවා. රෙජිස්ටර් ලිපියක්."

"රෙජිස්ටර් ලිපියක්. ඔෂින් එන්න මෙන්න ඔයාට ලියුමක්."

"මේ එනවා."

ඔෂින් ඉක්මනින් මුද්‍රාව රැගෙන දුවගෙන ආවා. ලිපිය සහිත වූ රිසිට් පතට මුද්‍රාව තබා ලිපිය ගත්තා.

"සාගාවෙන් නේද?" කායෝ ඇසුවා.

"රූසෝගෙන්." ඔෂින් සහ කායෝ ලිපිය රැගෙන උයනගෙට දුව ගෙන ගියා.

ලිපිය විවෘත කරන විට යෙන් විස්සක චවුචරයක් එහි තිබුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මගේ කෑම ඉක්මන් කරන්න. මට යන්න හදිස්සියි." එක් අයෙක් කෑගැසුවා.

"ගේනවා, මේ ගේනවා." කායෝ කෑම බඳුන රැගෙන ගියා.

බොහෝ කලකට පසුව රූසෝ ගෙන් ලිපියක්. ඔෂින් ගේ සිත සතුටින් පිරී ගියා. අදම එයට පිළිතුරු ලිවීමට ඇය සිතා ගත්තා.

මෙවර කෝටා අවන්හලට ආවේ මාස දෙකකට පසුවයි. හිම වැටෙමින් තිබුණා. කෝටා අවන්හලට ඇතුළු වී හිම ගසා දැම්මා.

"ආ කෝටා ඔයා?" කායෝ කිව්වා.

"යමු ඇතුළටම. මෙතන ඉඩක් නෑ. අපිට කතා කරන්නත් පුළුවනි."

"කෝටා කොහොමද ඔයා හොඳින් නේද?"

"ඔෂින්, හොඳට කෑම ටිකක් හදන්න. එහෙදි හොඳ කෑම ලැබෙන්නෙත් නැතිව ඇති නේ." කායෝ පැවසුවා.

"හොඳයි. වාඩි වෙන්න මෙතැනින්."

"කෝටා රූසෝගෙන් ලියුමක් ආවා." කායෝ කිව්වා.

කෝටා ටකේෂි කාමරයේ නිදා සිටින අයුරු බලා සිටියා.

"ටකේෂි නිදි. නැගිට්ටා ම එයාගේ තෑග්ග දෙන්න ඕනෑ."

"ඔව් කෝටා ටකේෂි ඔයාව මතක් කළා. ඔයාගේ ආදරය එයාට වටිනවා. පුංචි දරුවානේ."

"කෝටා, ඔයාලට කරදරයක් නෑ නේද?" ඔෂින් සෙමෙන් ඇසුවා.

"මේ පාර ගොවියෝ විරුද්ධ වෙන්න සූදානම් වෙලා ඉන්නේ. මට දිගටම සකාටා වල ඉන්න බැරිවෙයි. බොහෝම භයානක තත්ත්වයක්."

"කෝටා ප්‍රවේශමෙන්."

"ඔය වැඩේට ආණ්ඩුව හරස් වෙයිද?"

Scanned with CamScanner

sinhalaebooks.com



"අපිත් බය ආණ්ඩුවට තමයි."

"මේ කෑම කාලා ඉන්න, කෝටා රස්නෙත් ම කන්න."

"ඔෂින් ලියුමක් ආවා ද රූසෝගෙන්."

"ඔව්."

"හොඳයි මගෙන් සුබ පැතුම්. දැන් ඔයා ගැන මම වද වෙන්න ඕනෑ නැහැ. ඇයි ලියුමක් එවන්න පමා වෙලා තියෙන්නේ. ඔයාගේ ලියුම් වලට මොකද වෙලා තියෙන්නේ."

"ඒවා අම්මගෙ වැඩ. එයා ලියුම් හංගලා."

"තවමත් විරෝධතා. මට දුකයි ඔයා ගැන."

"ඒක දිග ලියුමක්. යෙන් විස්සක් එවලා තිබුණා."

"ඔව් ඉතින් එයා ටකේෂි ගේ තාත්තා නේ. ඉතින් කවදද එයා මෙහෙ එන්නේ."

"රූසෝ කියනවා එයා ඉඩම් ගොඩ කරන නිසා දැන්ම එන්න බැහැලු."

"දෙවියනේ කොයි තරම් කල් බලාගෙන ඉන්න ද?"

"එයා අපිව එක්කරගෙන යන්න එයි. මම ඒ මොහොත එනකල් මේක කරගෙන ඉන්නවා. මම දන්නවා එයයි මමයි ළඟදීම එකතු වෙනවා."

"ඔෂින් අර මිනිස්සු දෙන්නෙක් රණ්ඩු වෙන්න හදනවා. මටත් අරවා මේවා කියනවා. තව සකේ ඉල්ලනවා."

"හොඳයි. මේ බෝතල් දෙකත් දෙන්න. අපි ඒ ගොල්ලන් පිටත් කරමු."

"හොඳයි." කායෝ සකේ බෝතල් රැගෙන එළියට ගියා. එකවරම අවන්හලේ මේස පුටු පෙරලෙන කෑගසන හඬ ඇසුණා. කෝටා කලබලයෙන් එළියට යන්න හැදුවත්,

"එපා කෝටා ඔයා යන්න එපා."

මිනිස්සු දෙන්නෙක් පිහි රැගෙන එකිනෙකාට එල්ලකරගෙන හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මේ මෙහෙ මරාගන්න දෙන්න බෑ. පලයල්ලා එළියට."

ඔෂින් කෑගැහුවා.

"මම ඉන්නකල් මෙහෙ ඕවා බෑ. පලයල්ලා එළියට. හැසිරියව් මිනිස්සු වගේ."

ඔවුන් දෙදෙනා කෝපයෙන් කෑම බඳුන් බිම දැම්මා.

"මගේ බිල ගෙවලා පලයල්ලා." ඔවුන් යෙන් කාසි කීපයක් බිමට දමා ගසා යන්න ගියා.

අවන්හලේ සිටි සියලු දෙනාම හිනාවෙන්න පටන් ගත්තා.

"නියම කතාව."

"එහෙම තමයි ඉන්න ඕනෑ. බයවෙන්න හොඳ නෑ."

"ඔෂින් ඔයා හරිම වටින ගෑනියෙක්. මම කැමතියි ඔයාව විවාහ කරගන්න."

එක් තරුණයෙන් ඔෂින් ව වැලඳ ගත්තා. ඔෂින් කෙසේ හෝ ඔහුගෙන් ගැලවුණා.

"මේ කියන්නද එකක්. මගේ සැමියා කැමති නෑ ඕවට."

මේ සියල්ල දෙස කෝටා බලා සිටියේ කෝපයෙන්. ඔෂින් හිනැහෙමින් උයන ගෙට විත් භාජන සේදුවා.

"මම දන්නවා බය නෑ කියලා. ඔය බීපු අයත් එක්ක කතාවට යන්නේ මොකටද? උන් අතේ පිහි. ඔයාට තුවාල වෙන්නත් තිබුණා. තේරෙන්නේ නැද්ද ඔයාට. මේ වගේ තැනකට ඔයා හොඳ වැඩියි."

"වද වෙන්න එපා. ඕක සුළු දෙයක්. "

"ඔෂින්." එවර කෝටා ගේ උස් හඬට ඔෂින් හැරී බැලුවා.

"ඔෂින් බීපු එවුන් බදාගන්න ඒවා මට පේන්න බෑ. සැමියා සමඟ එක් වෙනවා නම් අනාගතය ගැන හිතන්න ඕනෑ. නම ආරක්ෂා කර ගන්න ඕනෑ. බේබද්දන්ට කෑම බීම අල්ලන එකට ඔයාගේ සැමියාවත් කැමති වෙන එකක් නෑ. මේ අවන්හල අතඅරිනවා නම් හොඳයි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් හිස පහතට නමාගෙන අහගෙන හිටියා.

"මම එන්නම්." කෝටා යන්න ගියා.

"ඇයි ඔෂින් කෝටා තරහෙන් වගේ යන්න ගියේ." කායෝ ඇහුවා.

"කෝටා කියනවා මේ අවන්හල අත ඇරලා වෙන රස්සාවක් කරන්නලු."

"ඒ මොන විහිළුවක් ද? මෙච්චර දියුණු කර ගත්ත එක."

ඔෂින් කෝටා කී දේවල් ගැන කල්පනා කළා.

ඒක හැබෑව. ඒත් මම කියලා වෙන මොන රස්සාවක් කරන්නද?

ඔෂින් තමාට ම කියා ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විසි එක

වසන්ත කාලය නිමා වී ශීත කාලය එළඹුණා. ඔෂින් ටකේෂි නින්දේ සිටිය දී මාළු වෙළඳපොළට ගොස් මාළු රැගෙන ආවා. ඒ හිම වැස්සේම. ඇය ඒවා වලින් අච්චාරු හදමින් හිටියා.

"ඔෂින්"

ගෙය තුළට ආවේ කායෝ ගේ මව මීනුයි.

"ඔෂින් වැඩ නේද? සමාවෙන්න කරදර කළාට. මම මේ කායෝ එන්න ඉස්සර වෙලයි ඔයා මුණ ගැහෙන්න ආවේ."

"ඇයි ප්‍රශ්නයක් ද? මැඩම්."

"කායෝ මෙහෙ වැඩ කරනවට මම කැමති නැහැ ඔෂින්. මේ විදිහට ගියොත් ආයිම මසාවොයි, කායෝයි වෙන් වෙයි."

මෙවිටම කායෝ දොර ඇරගෙන පැමිණියා.

"මම හිතුවා අම්ම මෙහේ කියලා. මොනවද අම්මා කියන්නේ. ඕවා ඔයා ගණන් ගන්න එපා ඔෂින්."

ඔෂින් දෙදෙනාම දෙස බලමින් හිටියා.

"කායෝ ආයිම විවාහය කඩා ගන්න ද හදන්නේ."

"එහෙම වෙන්නේ නෑ අම්මා. අනේ අම්මා මට මගේ පාඩුවේ වැඩ කරන්න දීලා අම්මා ගෙදර යන්න."

මීනු පිටව ගියේ කේන්තියෙන්.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇත්ත මගෙයි වැරැද්ද. මම හිතුවේ මුල දී විතරක් ඔයාගෙන් උදව් ගන්න. දැන් මාස හයක් ගෙවිලා. ඒත් ඔයා වැඩ කරනවා."

"මම මෙහෙ සතුටින් වැඩ කරන්නේ."

"ඒත් සැමියා ගැනත් හිතන්න කායෝ."

"ඔෂින්, කොටින්ම කියන්න ඔයාටත් මම එන එක වදයක් ද?"

"වැඩක් නෑ, ඔයාගේ හිත වෙනස් කරන්ඩ අමාරුයි."

"ඔෂින්, උදෙන්ම ගෙදරින් පැන ගත්තා. දැන්නම් හොඳටම බඩගිනියි."

"යමු, යමු කෑම හදලා තියෙන්නේ."

දවස ගෙවී රාත්‍රිය එළඹී විට ඔෂින් කල්පනා කළා. මේ අවන්හල නිසා කායෝ ගේ විවාහ ජීවිතයට ප්‍රශ්න ඇතිවෙන බව ඇය දැනගත්තා. එවිට යශිරෝ මැඩම් ගේ අන්තිම ඉල්ලීම ඉෂ්ට කරන්නේ කෙසේද? ඔෂින් එක තීරණයකට පැමිණියා.

ඔව් කෝටා, වෙන රැකියාවක් හොයා දුන්නොත් මම ඒක කරනවා. කායෝ වෙනුවෙන් මේ අවන්හල අත් අරින්න මට පුළුවනි.

එදා සිට ඔෂින් නැවත කෝටා එනතෙක් බලා සිටියා. එක දිනක කෝටා පැමිණුණා.

"ඔන්න මම ඔෂින්ට හොඳ රස්සාවක් හෙව්වා. මගෙ නැන්දා කෙනෙක් ඉන්නවා ඉසේ වල. එයා බෝට්ටු කුලියට දෙනවා. ධීවරයෝ අල්ලන මාළු වෙන්දේසියේ විකුණනවා. ගෙදර ඉන්නේ නැන්දා විතරයි. ළමයි ලොකුයි. ඒ ගොල්ලන් ඕසකාවල රැකියාවල. මම නැන්දට ඔයා ගැන කිව්වා. ඔයාට හොඳ ගෙයක් හොයලා දෙයි. එහේ ශීත කාලය මෙහෙ තරම් තදට නැහැ."

"මොනවද මම එහෙ ගිහින් කරන්නේ?"

"නැන්දා ඔයාට රැකියාවක් හොයලා දෙයි."

එදා රාත්‍රියේ ඔෂින් තීරණය කළා ඉසේ යන්න. ඇය පසුවදා කායෝ ඒමට පෙර කගායා ගොස් දෙමහල්ලන් හමු වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් එහෙම නම් ඉසේ යනවද?" කායෝ ගේ පියා ඇසුවා.

"එහෙමයි."

"ඉසේ ගිහින් තියෙනවා මම තරුණ කාලේ. එහෙ බොහෝම ප්‍රසිද්ධ පන්සලක් තියෙනවා. කොබේ වෙරළ හරිම ලස්සනයි."

"ඔෂින් එහෙ ගිහින් මොනවද කරන්නේ?" මීනු ඇසුවා.

"තවම දන්නේ නැහැ මැඩම්."

"ඔෂින් මේ අහන්න, මම ඔයාට කීව දේ ගැන හිතලා නෙවෙයි නේද ඔයා මේ වගේ තීරණයක් ගත්තේ."

"නෑ, මැඩම්. ඔයා නිසා නෙමෙයි. පස්සෙ පස්සෙ ආව මිනිස්සුන්ගෙන් මට කරදර ඇති වුණා මැඩම්."

මේ වෙලාවේ කාමරයේ දොර ඇරගෙන කායෝ කාමරයට ආවා."

"ඔෂින්, ඔයා මෙහෙ. ඇයි අවන්හල වහලා තියෙන්නේ?"

ඔෂින් හිස නමාගෙන හිටියා.

"එයා මෙහෙ ආවේ ඉසේ යනවා කියන්න."

"මම කියන්නයි හිටියේ කායෝ."

"ඔෂින්, ඔයා මේක කරන්නේ මම නිසා නේද? කියන්න මට."

"නැහැ කායෝ, මම කොහොමටත් ඔය කඩේ කඩන්න හිටියේ. ඒක පරණ වැඩියි. මසාවෝ නිතරම කියනවා ගබඩාව ලොකු කරන්න කියලා." තාත්තා කිව්වා.

කායෝ හඬමින් ම කාමරයෙන් ඉවත් ව ගොස් ඇයගේ කාමරයට වැදී දොර වසා ගත්තා.

ඔෂින් දොර ළඟට පැමිණ කතා කළා.

"කායෝ මම ඔයාව අත අරින්නේ නෑ කායෝ. ඔයා ගේ හිතට දුකයි කියලා මම දන්නවා. ඔයා හොඳ බිරිඳක් වෙන්න. මම කොහේ හිටියත් ඔයා බලන්න එන්නම් ඉඳ හිටලාවත්. මම

Scanned with CamScanner

sinhalaebooks.com



ඔයාට සැප හා ජය පතනවා."

ඔෂින් අවන්හලට ගොස් එහි වූ බඩු මුට්ටු, පිඟන් කෝප්ප සියල්ල අසුරා තැබුවා. සවස් වන විට කෝටා ආවා.

"කෝ කායෝ?"

"කායෝ අකමැතියි මගෙ තීරණයට. මගෙ අතින් කායෝ ගේ හිත පෑරෙනවා. මට දුකයි කායෝ ගැන."

"වෙන්වීම දුකක්." කෝටා කිව්වා.

මෙවිටම කායෝ දොර ඇරගෙන බලාගෙන හිටියා.

"කායෝ ඔයා ආව එක මට ලොකු සතුටක්. අපි සතුටින් වෙන්වෙමු."

කායෝ පැමිණ ඔෂින් වැළඳ ගත්තා.

"ඔෂින්, මම ආවේ ඔයාගේ ගමනට සුබ පතන්න."

"ඔයා ආව එක මට ලොකු සතුටක් කායෝ."

ඔෂින් කෑම සකස් කළා. තුන්දෙනාම කෑම ගනිමින් කතා කළා. කායෝ තමා ගෙන ආ සකේ බෝතලය විවෘත කර තුන්දෙනාටම කෝප්ප වලට දමා පිරි නැමුවා.

"අපි තුන්දෙනා මුණ ගැහුණේ මීට අවුරුදු දහයකට ඉස්සර වෙලා මේ සකාටා වල දීමයි. මම අද සමාව ඉල්ලන්න ඕනෑ කෝටා ඔයාගෙන්, ඔෂින් ඔයාගෙන්. එදා මම කෝටාට බොරු කීවා ඔෂින් විවාහ වුණා කියලා. මම එහෙම කීවේ කෝටා මගේම කර ගන්ඩයි. මට සමාවෙන්න."

"ඕවා සේරම පරණ කතා කායෝ, බාධක හමුවේ නැගිටින්න ඕනෑ. එතකොට ජීවිතය රසවත්. පුරුදු වෙන්න ඕනෑ ලද දෙයින් සතුටු වෙලා ජීවිතය ගෙනියන්න කායෝ. ඔයා ගේ සතුට කොහේ හරි තියෙනවා. හොයා ගන්න බලන්න."

කෝටා පැවසුවා.

"ඔයා හොඳ බිරිඳක් වෙන්න කායෝ."

"අපි තුන්දෙනා මිතුරන් වෙමු. දෛවය මුලින්ම අපිව මුණ

Scanned with CamScanner

sinhalaebooks.com



ගැස්සුවේ මේ ගමේ. අපි දැන් වෙන් වෙන්න යන්නේ. ආයිම මුණ ගැහේද දන්නේ නැහැ."

"කායෝ ඔයා දැන්වත් ඔයාගේ විවාහය සාර්ථක කරගන්න." කෝටා කිව්වා.

පසුවදා හිම වැස්සේම ඔෂින් කගායා ආයතනයට ගිහින් කායෝගෙන් හා ඇයගේ දෙමාපියන්ගෙන් සමුගත්තා. ඔවුන් ඇයට සුබ පතා මුදල් ටිකක් දුන්නා. ඔෂින් එය භාර ගත්තේ බල කිරීමෙන් පසුවයි.

"ගන්ඩ ඔෂින්, මගෙ අම්මගෙ තාත්තගෙ සතුටනේ."

"ස්තුතියි." ඔෂින් මුදල් කවරය අතට ගත්තා.

ඇය සියල්ලන්ගෙන්ම සමුගෙන මඳ දුරක් ගොස් ආපසු හැරී කගායා ආයතනය දෙස බැලුවා. කගායා ආයතනයට ආවේ අවුරුදු නවයේ දී. ඇය තරුණියක් ව හැදුණේ වැඩුණේ මේ නිවසේ. ඒ සියල්ලම ඇයට සිහි වුණා. ඒත් ඔෂින් දැනගෙන හිටියේ නෑ ඇය කගායාව දකින අවසන් අවස්ථාව මෙය බව.

දින දෙකක දුම්රිය ගමනකින් පසුව ඇය ඉසේ ගමට ආවා. ලස්සණ මුහුදු වෙරළක්. ඇය වෙරළ දිගේ ඇවිදගෙන ගියා. දැඩි කුසගින්නක් තිබුණත් ඔෂින් ළඟ කෑමට කිසිවක් තිබුණේ නැහැ. බඩගින්න හා වෙහෙසත් ටකේෂි වඩාගෙන යෑම නිසාත් ඇය හොඳටම හෙම්බත් වී සිටියා. ඇය ලිපිනය සොයමින් ගියා. එහි ලිපිනයට අනුව ඇය නිවස සොයා ගත්තා. ඇය එහි වූ ධීවර ආම්පන්න ගොඩේම වාඩි වුණා වෙහෙස නිසාම.

"ආ මේ......... මේ ඔතන ඉඳ ගන්න එපා. ඔය ධීවරයන් ගේ දැල් ආම්පන්න."

ඔෂින්, නැගිටින්න හැදුවත් ඇයට එය අපහසු වුණා.

"ඇයි මොකද?"

"සමාවෙන්න. මම සකාටා වලින්."

"ඔයා ද ඔෂින්. මම කෝටා ගේ නැන්දා. මගෙ නම කමසාමා. මෙහෙ අය කියන්නේ හීසා කියලා. ඔයාට හොඳටම මහන්සියි වගෙයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇවිද්දා හුඟක්. කෑමත් නැතිව."

"යමු ගේ ඇතුළට. ඉන්න මම ඔයාට උදව් කරන්න."

හීසා, ඔෂින්ටත්, ටකේෂිටත් උණු උණුවේම කෑම සකස් කර දුන්නා.

"මේ කෝටා ඔයාව මෙච්චර දුර තනියම එව්වානේ."

"එයාට හුඟක් වැඩ මැඩම්."

"වැඩ තමයි, දෙමාපියන්ට දුක් දෙනවා. තාත්තා ඉඩම් හිමියෙක්. මන්ත්‍රීවරයෙක්. කෝටා උපාධිය ගත්තට පස්සේ තමයි ඔය වැඩක් නැති සංවිධානයට බැඳුණේ. කෝටා ගේ අම්මා මගෙ සොයුරියක්. එයාලා පොහොසත්. මගෙ සැමියා නම් ධීවරයෙක්. ඒ නිසා අපිව ඒ තරම් ගණන් ගන්නේ නැහැ. කෝටා එහෙම නැහැ. එයාට නිවාඩුවක් ලැබුණොත් මාව බලන්න එනවා."

"එයා දුප්පතුන් ගේ සුබ සිද්ධියට වැඩ කරන කෙනෙක්."

"කෝටා ට පොරොන්දු වුණා මම ඔයාට උදව් කරන්නම් කියලා. දැන් වෙහෙස නිවාගන්නකෝ."

වෙහෙස නිසා ඔෂින්ට පසුදා උදේ වන තෙක් ම නින්ද ගියා. ඇය ඇස් ඇර බැලුවා. ඇයට හිතාගන්න බැරි වුණා ඉන්නේ කොහේද කියා. හදිසියේ ම ඇයට මතක් වුණා ඉසේ ආව බව. මේ තමයි ඉසේ වල ඇයගේ මුල්ම දවස. ඒ වගේම ඇයට අද සිට අලුත් ජීවිතයක් අරඹන්න වෙන බව. එය කෙබඳු ස්වරූපයක් ගනීදැයි ඇයට බියක් දැනුණා. ටකේෂි තමා ළඟ නොවූ බව දැනගත් ඔෂින් ටකේෂි සෙවීමට ගියා.

මැඩම් හීසා ටකේෂිත් වඩාගෙන ආවා.

"අපි ගියා මූද බලන්න නේද ටකේෂි"

"සමාවෙන්න මට ටිකක් නින්ද ගියා. මම ඔයාට උදව් කරන්නම්. මට පුළුවනි උදේ කෑම හදන්න."

"එපා ඔෂින් දැන් ඔයාට ඔයා ගේ වැඩ තියෙනවා කරන්න."

"හොඳයි මැඩම් මට වැඩක් දෙන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින්, ඔයාටත් මාළු බිස්නස් තමයි තියෙන්නේ."

"ඒ කියන්නේ මාළු වෙළඳාම් කරන්න ද?"

"මම ඔයාට තොග ගානට මාළු දෙනවා. ඔයා ඒවා වැඩි ගානට විකුණනවා."

"මැඩම් මම මීට ඉස්සර මාළු විකුණලා නැහැ."

"ආ ඒක හරි ලෙහෙසියි. දැන් අපි වෙරළට යමු. අන්න මම ඔයාට පුංචි අත් කරත්තයක් වෙන් කළා."

"ස්තුතියි මැඩම්."

හීසා ඔෂින්ව වෙරළට කැඳවාගෙන ගියා. ඒ වෙලාවේ ධීවර බෝට්ටු වෙරළට පැමිණෙමින් තිබුණා. වෙළෙන්දෝ සහ වෙළෙන්දියෝ කත් සහ කූඩ රැගෙන පැමිණ මාළු වෙන්දේසියෙන් ගන්නා අයුරු ඔෂින් හොඳින් බලා සිටියා. ඇයට අවශ්‍ය මාළු හීසා මැඩම් රැගෙන දුන්නා. ටකේෂිත් කරත්තයේ පැත්තක වාඩි කරගෙන ඔෂින් මාළු වෙළඳාමේ ගියා.

"මාළු, අලුත් මාළු."

"මැඩම්, මාළු ගන්නවා ද?"

"ඔයා අලුත් කෙනෙක් ද? අපි වෙනදා ගන්න වෙළෙන්දීගෙන් ම ගන්නවා. "

ඔෂින් ගෙන් කිසිවෙක් මාළු ගත්තේ නැහැ. දවාලත් ගෙවී ගෙන යනවා. ඔෂින් හැම තැනම කරත්තය තල්ලු කරගෙන ගියා. ඇය දුටුවා අල වගා කරන ගෙවිලියක්.

"මැඩම්, මාළු ගන්නව ද?"

"ඔයා මීට ඉස්සර දැකලා නැහැනේ. මගෙ සැමියා ලෙඩින්. මේ දවස්වල මාළු ගන්න හැටියක් නෑ."

"මමත් ඔයාට උදව් කරන්න ද?"

"පුළුවන්නම් හොඳයි. ඔයා ගොවිතැන් වැඩ දන්නව ද?"

"ඔව්, මම අඳගොවියෙක් ගෙ දුවක්. මේ පස්වල සුවඳ."

ඇය ටකේෂිව කරත්තයෙන් ගෙන බිම තිබ්බා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔයා ටිකක් බිම ඉන්නකෝ."

ඇය කුඩෙන් අල රැගෙන ඒවා කුඩේ අතුල්ලා එක එක පස් යට කළා.

"මම මේ ටික කරන කල් මැඩම් ඔයා ඔයාගේ අහල පහල අය අඬගහගෙන එන්නකෝ. මම මේ මාළු අද නොමිලේම දෙනවා."

"ඔය ඇත්තම ද?"

ඔෂින් හිනැහී හිස වැනුවා. ගෙවිලිය ළඟ ගෙවල් වල අය කැඳවා ගෙන ආවා.

"මෙයා මාළු නිකං දෙනවලු."

"ඔව්, ගන්න, ගන්න හැමෝම අරගෙන බෙදා ගන්න."

ඔෂින් කීවේ හිනා වේවී. ඇය ඉක්මනින් ගෙදර ගියා.

"අපි ආවා."

"ඔය තරම් ඉක්මනට." හීසා මැඩම් එළියට පැමිණියා. කරත්තය දෙස බැලුවා.

"මොනවා ඔයා මාළු සේරම වික්ක ද?"

ඔෂින් කිසිවක් කීවේ නෑ. නළ ළිඳෙන් වතුර ගෙන අත් පා සෝදා ගත්තා.

"ඔෂින් කෝටා නම් මට කීවා ඔයාට ඉන්න ගෙයක් හොයන්න කියලා. ඒත් මේ ගෙදර ඉන්නේ මම විතරයි. ළමයි ඕසකා වල ඉගෙන ගන්න ගිහින්. ඉතින් මම කැමතියි ඔයා මා එක්ක ඉන්නවා නම්."

කෑම කනවිට හීසා මැඩම් කීවා.

"ස්තුතියි මැඩම් ඔබේ කරුණාවට. මමත් කැමතියි මැඩම් හීසා එක්ක ඉන්න."

පසුවදා ඇය ලෙල්ලමට ගියා. ඇය විවිධ මාළු වර්ග වෙන්දේසියෙන් රැගෙන වෙළඳාමේ ගියා. ඇයගේ කරත්තයේ කුඩා දැන්වීමක් තිබුණා. ඕනෑම මාළුවෙක් යෙන් පහළොවයි එහි

Scanned with CamScanner

sinhalaebooks.com



ලියා තිබුණා.

"ආයුබෝවන් ගන්නවද අලුත් මාළු. ඕනෑම මාළුවෙක් යෙන් පහළොවයි."

"ඇත්ත ද? හරි ලාබයි නේ. කෝ බලන්න."

ඔෂින් කරත්තයේ පියන ඇර පෙන්නුවා.

"ඔව්, ඔව් අලුත් මාළු. මට මාළු කුරි තුන්දෙනෙක් ම දෙන්න."

"මටත් ඕනෑ හතර දෙනෙක්."

කාන්තාවන් ඔෂින් වටකර ගත්තා.

"දෙන්ඩ මැඩම් මම කපලා දෙන්නම්."

"ඔයා මාළු කපලත් දෙනව ද? හරි හොඳයි නේ."

මෙවිට ම මාළු වෙළෙන්දියෝ දෙදෙනෙක් පැමිණ ඔෂින් දෙස බලා සිට කෝපයෙන් යන්න ගියා.

අඩු මුදලට දුන්න නිසා ඔෂින් ගේ මාළු ඉක්මනින් ඉවර වුණා.

පෙර දිනටත් වඩා වේලාසන ඇය ගෙදර ගියා.

"අපි ආවා."

"ඇයි ප්‍රශ්නයක් ද? මේ තරම් වේලාසන."

"නෑ මැඩම් මාළු ඉවරයි. මම හෙට මීට වඩා අරගෙන යන්න ඕනෑ."

"කොහොමද ඔය තරම් ඉක්මනට වික්කේ. හරි මම අහන්නේ නෑ. ඔයාටත් ක්‍රම ඇති නේ."

"මම නාලා එහෙම ඇවිත් මැඩම් ට විස්තර කියන්නම්කෝ. යමු ටකේෂි."

ඔෂින් මැඩම් ට උදව් කළා. වතුර බාල්දියක් රෙදි කෑල්ලක් ගෙන ගෙබිම අතුල්ලා පිරිසිදු කළා.

"ඔයා සකාටා වල ආපන ශාලාවක් කළා කියලා කෝටා කිව්වා." ඔෂින් හිස වැනුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"හැබැයි ඔයා ආපන ශාලාව කරනවට කෝටා අකමැතියි කිව්වා."

"ඒක ඇත්ත මැඩම්. පස්සෙ පස්සේ බෙබද්දන්ගෙන් කරදර ආවා."

"මැඩම් හීසා, මැඩම් හීසා."

හීසා ඉදිරිපස මිදුලට ගියා. ඔෂින් ඒ පිටිපස්සෙන් ගියා.

එතන හිටියේ මාළු වෙළෙන්දියන් දෙදෙනෙක්.

"මැඩම්, මෙයා මොනවද මෙහෙ කරන්නේ?"

"කා ගැනද ඔය කතා කරන්නේ."

"ඔය පිටිපස්සේ ඉන්නේ. ගැතියේ උඹ අඩු ගාණට මාළු දුන්නාම අපි කොහොමද වෙළඳාන් කරන්නේ. අද හැමෝම මගෙන් මාළු ගත්තේ නැහැ මගෙ මාළු ගණන් කියලා. අපි කොහොමද මැඩම් ජීවත් වෙන්නේ?"

"මම විකුණුවේ මට හිතෙන විදිහට." ඔෂින් කිව්වා.

"දන්නවද මැඩම්, මෙයා ඊයේ සේරම මාළු ටික නොමිලේ ම බෙදලා දුන්නා."

"අහගන්නවා, ආයිම උඹට මාළු වෙළඳාන් කරන්න දෙන්නේ නැහැ අපි."

"ඒවා කොහේද? මට පේන්නේ නෑ ඔෂින් වරදක් කරලා කියලා. ඕකයි බිස්නස් කියන්නේ. ඔය දෙන්නත් එයා එක්ක තරග කරනවා. යනවා යන්ඩ මෙතනින්."

"හොඳයි බලමුකෝ අපි, මොකද වෙන්නේ කියලා."

වෙළෙන්දියන් දෙදෙනා තරහින් පිට වී ගියා.

ඔෂින්, හීසා මැඩම් ළඟට ගිහින් හිස පහතට නැමුවා.

"මැඩම් මට සමාවෙන්න. මෙච්චර කරදර කළාට. ඊයේ මාළු ගත්තේ නෑ කවුරුවත් ම. ඒවා කුණුවෙලා අහක දමනවට වඩා ඒවා ගම්මුන්ට බෙදලා දෙන්න හිතුවා. එතකොට ගම්මුන්ට මාව මතක හිටියි කියලා හිතුවා. අද මම මාළුවෙක් යෙන් පහළොව

Scanned with CamScanner

sinhalaebooks.com



ගානේ වික්කා. ඊයේ නොමිලේ මාළු ගත්ත හැමෝම මගෙන් මාළු ගත්තා."

"ඒක හොඳ ක්‍රමයක්. ඉස්සර වෙලා පාඩුවට. ඊට පස්සේ ලාබෙට."

"මැඩම්, මම මේ මාළු බිස්නස් එක දියුණු කරගන්නවාමයි."

පසු දින ඔෂින් ලෙල්ලමෙන් ගත් මාළු ප්‍රමාණය දැක මැඩම් හීසා පුදුම වුණා.

"මොකටද ඔෂින් ඔය තරම්, දැන් මදෑ."

"නෑ, මැඩම් අඩුවට දෙනවා නම් ගැනුම්කාරයන්ට තෝරලා ගන්න හැම ජාතියේ ම මාළු තියෙන්න ඕනෑ."

"මෙන්න ලොකු ඉස්සෝ. ලන්සුවක් තියන්න."

"යෙන් හතලිහයි. හතලිස්......"

"යෙන් පනහයි. මට දෙන්න."

ඔෂින් එයත් මිල දී ගෙන කරත්තයට පටවා ගත්තා.

"මගෙ ආච්චම්මාට අසනීපයි. එයාට දෙන්න හොඳ මාළුවෙක් දෙන්න."

"ඉන්න. ආ... මේ පරා මාළුවා. ආච්චම්මට දෙන්න. ඒකට මුදල් එපා. ඒක මම ගානේ. මගෙ ආච්චම්මා මතක් වුණා."

"ස්තුතියි ඔෂින්. එහෙම නම් මට ගෙදරට මාළු ටිකක් දෙන්නකෝ."

ඔෂින් ගම්මුන්ගේ බොහෝ අවශ්‍යතා වලට උපකාර කළා.

"පුතාගේ විවාහ උත්සවය ළඟයි.මට උත්සවයට ඉස්සෝ. පොකිරිස්සෝ ඕනෑ. ඒත් මිල ගණන් වැඩි ඇති නේද?"

"මැඩම් මෙහෙම කරන්න. වියදම් කරන්න පුළුවන් ගණන කියන්න. මම ඒ ගාණට අරගෙන දෙන්නම්. මම කෑම හදන්නත් දන්නවා. මම ඇවිල්ලා කෑම හදලා දෙන්නම්."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇත්තද ඔෂින්, ඒක කොච්චර දෙයක් ද?"

"ඔෂින්, මටත් තියෙනවා දානයක්."

"හොඳයි ඒ දවස්වලට කියන්නකෝ."

ඔෂින් නිවසට ගිය විට මේ සෑම දෙයක් ම හීසා මැඩම්ට කිව්වා.

"මෙච්චර මහන්සියෙන් කිලෝමීටර් දහයක් විතර කරත්තය තල්ලු කරලා තව එක එක්කෙනාට උදව් කරන්නත් යනවද ඔෂින්."

"මම කැමතියි මැඩම් උදව් කරන්න. එයාලා නිසානේ මම මාළු බිස්නස් කරන්නේ."

ඔෂින් කියන්නේ හිනැහෙමින්.

"ඔයාව බලන්න යාළුවෙක් ඇවිත්. අපි යමු ටකේෂි."

ඔෂින් සාලයට ගියා.

"කෝටා ඔයා?"

"ඔව්, අවුරුද්දක් ම ගියා නේ. මට හිතුණා ඔයයි, ටකේෂියි බලලා යන්න ඕනෑ කියලා."

"ඔයා තාම සකාටා වල ද?"

"ඔව්, මධ්‍යස්ථානය එහෙනේ. මෙහෙ හොඳයි ද? නැන්දා කිව්වා බිස්නස් එහෙම දියුණුයි කියලා."

"ඔව්, මැඩම් හීසා මට උදව් නොකරන්න මට මෙහෙම ඉන්න ලැබෙන්නේ නෑ."

"කොහේද? ඔෂින්ලා ගැන විස්තර ලියන්නවත් ඔයා එක තැනක ඉන්න කෙනෙක් යැ. ඔයා තැනින් තැන දුවනවා නේ."

මැඩම් හීසා කිව්වා.

"දැන් මොකද තත්ත්වය?" ඔෂින් ඇසුවා.

"අද ගොවියෝ කැමතියි ගොවිපළ දියුණු කර ගන්න. ඒත් ඉඩම් හිමියෝ හදන්නේ ගොවියෝ එළවන්ඩ. මේ ප්‍රශ්නය විසඳන්න අමාරුයි."

Scanned with CamScanner

sinhalaebooks.com



"කෝටා ඔෂින් බොහෝම හොඳයි. මෙහෙ ඉන්නවටත් මුදල් ගෙවනවා. මිනිස්සුන්ට උදව් කරනවා. දන්නවද මුල දී වෙළෙන්දියෝ විරුද්ධ වුණා එයාට. දැන් ඒ හැමෝම ගරු කරනවා."

"සතුටක් අහන්න ලැබීමත්. ඔයා සකාටා වල අර බේබද්දොත් එක්ක හිටියා නම් මට ඒක හරි වදයක්."

"කෝටා මම ඔෂින්ට කිව්වා මාළු කඩයක් පටන් ගන්න කියලා. මට පුළුවනි ඒකට මුදල් දෙන්ඩ."

"නෑ මැඩම්, මම කැමතියි මැඩම් එක්ක මෙහෙම ඉන්න."

"ඒත්, ඔෂින් ඔයා කඩයක් පටන් ගත්තොත් සැමියා මෙහාට ඒවි. ඔයයි, සැමියයි දෙපැත්තක ඉඳලා බැහැ. ටකේෂිට තාත්තා කෙනෙක් ඕනෑ. ඔය තුන්දෙනා එකට ඉන්නවා නම් මගෙ හිතට දුකක් නෑ."

කෝටා ගෙනා බෑගය අතට ගත්තා.

"නැත්දේ මම යන්න ඕනෑ."

"ඔයා රැම යනවද කෝටා." ඔෂින් කෝටා පිටුපසින් ගියා.

"ඔෂින්." කෝටා සෙමෙන් කතා කළා.

"අද තත්වය අනුව මම ඉන්නේ හැංගිලා."

"ප්‍රවේශමෙන්."

"ඔයාට ඉක්මනින් සැමියා මුණගැසෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා."

"ස්තූතියි, ඔයා කළ සේරම උදව් වලට මම ණය ගැතියි." ඔෂින් හිස නැමුවා.

"එන්නම්." කෝටා වේගයෙන් අඩි තබමින් යන්න ගියා. ඔෂින් පිටුපසින් ඉකි බිඳින හඬක් ඇසුණා. ඔෂින් ආපිට බැලුවා.

"මහ මෝඩයෙක්. මොනවට ද සටන් කරන්නේ? පෝසත් පවුලක දරුවෙක් වෙලත්. ඔය ව්‍යාපාර මහ මෝඩ වැඩ."

මැඩම් හීසා කඳුළු පිස දමමින් කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විසි දෙක

ඔෂින් ලිපියක් එවූ දින ගණනක් රූසෝ හිටියේ කල්පනා කරමින්. ඔහු ගෙමිදුලේ පොකුණ ළඟ වාඩි වී කල්පනා කරමින් සිටියා.

"රූසෝ මෙහෙ ඉඳලා දවල් හීන බලනව ද? පැළ හිටවන්න යන්නේ නැද්ද? ෆුකුටාරෝට තරහ යයි ඔහොම ඉන්නවා දැක්කම."

රූසෝ කිසිවක් කීවේ නැහැ.

"මේ රූසෝ මාළුකාරයෙක් වෙන්න නම් හිතන්න එපා. දැන් ඔෂින් මාළු කඩයක් ඇරලා ඇතිනේ."

"ඔය ඇති. ඔෂින් අරින මාළු කඩේ අයිතිකාරයා වෙන්නේ නෑ මම ගෑනිට යටත් වෙන්නේ නෑ. මට ඉඩමක් තියෙනවා. මම ඔෂිනුයි, ටකේෂියි මෙහෙ එක්කර ගෙන එනවා."

රූසෝ උදැල්ල ගෙන කුඩයට දමා එය කරේ එල්ලා ගෙන යන්න ලෑස්ති වුණා. එවිටම තාත්තා ආවා.

"ඔය කුඹුරට යන්න ද හදන්නේ."

"ගෙදර ඉඳලා ඇනුම් පද අහන්න බෑ තාත්තා."

ඔකියෝ තරහින් ගෙට ගියා.

"අම්මා කියන කතාවත් ඇත්ත නේ රූසෝ. ඒක නෙමෙයි ඔයා ඔෂින්ට ලිව්ව ද?"

"හැම ලිපියකටම උත්තර ලියන්න ඕනෑ නෑ. මම ලිපි

Scanned with CamScanner

sinhalaebooks.com



කිපයකට ලිව්වා එයාට. ඉක්මනින් මෙහෙ එන්න කියලා. එන්න කැමති නැහැ වගෙයි."

"රූසෝ ඔය වැඩේ තේරුම මොකක් ද ? එහෙම නම් ඔයා ඔෂින්ගෙන් නිදහස් වෙන්න."

"දැන් තාත්තත් එහෙම කියනව ද?"

"රූසෝ මේ අහන්න ඉඩම් ගොඩ කිරිල්ල ලේසි නැහැ. අවුරුදු දහයක්වත් යනවා නේ."

"තාත්තා දැන් අවුරුදු හතරක් ම ගියානේ. තව......."

"රූසෝ බොහෝම කැතයි ඔයා ගේ වැඩ. ඔෂින්ව දරුවෙක් එක්ක තනිකර දමලා ඔයාගේ ජීවිතෙත් අපතේ යනවා. ඇයි කල්පනා නොකරන්නේ? මම නම් කියන්නේ ඔයා ඉසේ වලට යන්න."

"තාත්තා මම ටකේෂිව මාළු කාරයෙක් ගේ පුතෙක් කරන්නේ නෑ. එයාට ඉඩමක් හදනවාමයි. ලියනවා ඔෂින්ට මගෙ අන්තිම තීරණය. මම එහෙ එන්නේ නෑ කියලා."

* * * *

"ඔෂින් ඔයා හැමදාම බලාගෙන හිටියේ ලියුමක් එනතෙක් නේ. දැන් ඔයාගේ හිතට සතුටු ද? මොනවද රූසෝ ලියලා තියෙන්නේ."

හීසා මැඩම් ටකේෂිට කෑම කවන ගමන් ඇසුවා.

"අදහසක් නැතිලු මෙහෙ එන්න."

"ඒ කියන්නේ ඔයාව අත අරිනවා කියල ද?"

"එයා කියනවා තව අවුරුදු හයක් බලා ඉන්න කියලා."

"පුදුම ආත්මාර්ථකාමී මිනිහෙක් නේ. තව අවුරුදු හයක්." හීසා පුදුමයෙන් කිව්වා.

"නෑ මැඩම්, දැන් අවුරුදු හතරක් ගියා. මම ඒ අවුරුදු හයත් බලාගෙන ඉන්නවා. මට පිහිට වෙන්න ඔයා ඉන්න නිසා මට පුළුවනි මෙහෙ ඉන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔය පිට කොන්දක් නැති මිනිහෙක් ගැන ඔයා මොනවට වද වෙනවද ඔෂින්."

"නෑ, මැඩම් එයා හොඳයි. ටිකක් හිතුවක්කාරයි. ඒ වුණාට මම ආදරෙයි."

ඔෂින් ගේ මුහුණේ තිබූ සෝබර බව දෙස මැඩම් හීසා බලාගෙන හිටියා. ඇයටත් ඇති වුණේ කනගාටුවක්.

එදා ලෙල්ලමට ගියත් වැහිබර ගතිය අඩු වුණේ නැහැ.

ඔෂින් වෙළෙන්දියන් සමඟ බෝට්ටු එනතෙක් බලාගෙන හිටියා.

"අර බලන්න අහස දිහා. හොඳ කුණාටුවක් එන්නයි හදන්නේ. අද නම් මාළු අරගෙන විකුණන්න යන්න ලැබෙන්නේ නැතිවෙයි."

"ඒක නම් ඇත්ත. යමු ද ආපහු."

වෙළෙන්දියන් එකා දෙන්නා ආපිට ගියා.

"ජේනවද මන්දාරම. ඉතින් ගෙදර ඉන්න තමයි වෙන්නේ."

"මැඩම් වැස්ස දිගටම තියේ ද?" ඔෂින් මැඩම් හීසාගෙන් ඇහුවා.

"ඔව් ඔෂින්, මුහුද රළු වී ගෙන එනවා. වාරකන් කාලය. මේ තමයි ධීවරයන්ගේ නිවාඩුව."

ඔෂින් ටිකක් වෙලා කල්පනා කළා.

"ඔය බෝට්ටුවේ මාළු සේරම මම ගන්නවා."

මැඩම් හීසා තිගැස්සුණා.

"ඔෂින්, ඔය මාළු විකුණන්න යන්න බෑ."

"නෑ මැඩම්, මම මේ මාළු වලින් අච්චාරු දමනවා. එතකොට මගෙ ගැණුම්කාරයන්ට වැහි කාලෙත් මාළු කන්න පුළුවනි."

ඔෂින් වැස්සේම මාළු කරත්තය තල්ලු කරගෙන ආවා.

කුණාටුව ඇරඹුණා. ඔෂින් මාළු වලින් විවිධ කෑම වර්ග හැදුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"හොඳ සුවඳක් එනවා."

මැඩම් ගේ බෝට්ටු පදවන ධීවර තරුණයෝ කීප දෙනෙක්ම මේ නිවසේ පදිංචිව සිටියා.

"මම මේ, මැකරල් මාළු තම්බනවා."

ඔෂින් කීවේ හිනැහෙමින්.

"මේ මාළු ලුණු ගොරක දමලා තම්බලා ගත්තාම හුඟක් දවස් තියා ගන්න පුළුවනි. මගෙන් මාළු ගන්න අයට විකුණනවා. ගනුදෙනු කාරයෝ සතුටු කරන්න එපායැ. ආ කාලා බලන්න."

ඇය දීසි වලට දමා ඔවුන් අතට දුන්නා.

"හරිම රසයි."

"හැබැයි මේ කුණාටුව නම් වෙනදාට වඩා වෙනස්. හරිම දරුණුයි වගෙයි."

වැස්සේ වුණත් ඔෂින් අච්චාරු දැමූ මාළු තම ගණුදෙනුකාරයන්ට ගෙන ගොස් දුන්නා. ඇය ආපසු නිවසට පැමිණි ගමන් ම මැඩම් හීසා කතා කළා.

"ඔෂින් දැන් රේඩියෝ එකේ කිව්වා සාගා වල බැම්මක් කඩාගෙන ගිහින් ගෙවල් දොරවල් යටවෙලා කියලා. මේක විශාල කුණාටුවක්."

එදා මුළු රාත්‍රියේ ම ඔෂින්ට නින්ද ගියේ නැහැ. රූසෝට, ටනකුරා පවුලේ අයට කරදර වෙලා ඇති ඇය සිතුවා. හිතින් දුක්වුණා.

* * * *

ඔකියෝ ගේ තුළම එහෙ මෙහෙ දිව්වා.

"සුනිකෝ, අනේ තාත්තයි, රූසෝයි ඊයේ රෑ ආවේ නැහැනේ. මට බයයි."

"අම්මා, මම උදේම කුඹුරට ගියා. වතුරින් පිරිලා. අනේ ඒ වතුර ටික බස්සවා ගත්තොත් නම්."

Scanned with CamScanner

sinhalaebooks.com



"පිස්සු කතා කරනවද සුනිකෝ. අනේ කවුරු හරි යවන්න, රූසෝයි, තාත්තයි බලන්න."

දවල් වන විට රූසෝත්, තාත්තාත් ගෙදර ආවා. දෙන්නාගේම ඇඟපුරා මඩ තැවරී තිබුණා.

"තාත්තා, අනේ කුඹුර බේරා ගනිමු."

"අමතක කරන්න සුනිකෝ. අපි ගොඩකරපු ඉඩම් විනාශයි. හෝදාගෙන ගිහින්."

"ඔයාලා රෑ තිස්සේ බඩගින්නේ. එන්න ඇඟ හෝදාගන්න. රූසෝ එන්න."

ඔකියෝ වතුර බාල්දියක් රැගෙන ආවා.

රූසෝ ආපිට හැරී එතනම බිම වැතිර අඬන්න පටන් ගත්තා.

"රූසෝ ඇයි මේ?"

"කුණාටුවට වඩදිය ඇවිල්ලා ඉඩම් හෝදාගෙන ගිහින්. අවුරු හතරක් මහන්සි වුණා. ඔක්කොම ඉවරයි."

තාත්තා කීවේ වැලපෙන රූසෝ දිහා බලාගෙන.

කෑම කන අතර ෆුකුටාරෝ කතා කළා.

"අපේ කුඹුරුත් විනාශ වෙලා. වියදම් අඩු කර ගන්න වෙයි."

"බැරි වුණොත්, ගෙදර බඩු විකුණමු. ජීවත් වෙන්නත් එපා යැ."

"මම කිව්වා මේ තාත්තටයි, පුතාටයි. ඒත් මම කීව දේ ඇහුවේ නැහැ. මොකද අන්තිමට වුණේ. සුන් වුණා සේරම. ගිය කාලේ කොහොම ගන්න ද?"

"දැන් ඔය කතා වලින් වැඩක් නෑ. ආයිම කුඹුරු වැඩ කරමු. රූසෝ උදව් කරන්න ඕනෑ."

රූසෝ එක වචනයක්වත් කතා කළේ නැහැ. නිහඬව

Scanned with CamScanner

sinhalaebooks.com



අහගෙන හිටියා.

පසුවදා උදේම සුනිකෝ සාලයට එන විට එහි මිටි මේසය මත ලිපියක් තිබුණා. රූසෝ ගේ අකුරු.

"අම්මා," සුනිකෝ ඔකියෝ සෙව්වා.

"සුනිකෝ, මම අද ඉඳලා කුඹුරේ වැඩ. කුස්සියේ වැඩට මට උදව් කරන්න බෑ."

"නෑ අම්මා, මේ බලන්න රූසෝ ගෙන් ලියුමක්. "

"රූසෝගෙන්............"

ඔකියෝ ලිපිය කඩා කියෙව්වා.

ආදරණීය අම්මේ, තාත්තේ,

පසුගිය වසර හතර පුරාවට මම කරදර කළාට සමාවෙන්න. මාව බලාගත්තාට ස්තූතියි. ඔය ඉඩම් ගොඩ කිරීම මත තමයි මගේ ජීවිතය රැඳුණේ. මම තවදුරටත් සාගා වල ඉන්න එකේ තේරුමක් නැහැ. මම මෙහෙන් පිට වෙනවා. සුනිකොයි, ෆුකුටාරොයි මට දැක්වූ කරුණාවට හා මා පිළිබඳ ඉවසීම ගැන ස්තූතියි.

ඔකියෝ අඬන්න පටන් ගත්තා.

"ජපානයේ ආර්ථිකය හොඳ නෑ මේ දවස්වල. මේ මෝඩයා කොහොමද කොහේද ජීවත් වෙන්නේ? බඩගින්නේ මැරෙන්නයි වෙන්නේ."

ඔකියෝ කාමරයට ගොස් මෙට්ටය මත වැටී අඬන්න වුණා.

මාළු වෙළඳන් කර ආපසු එන විට ඔෂින් ටකේෂිට ගීත කියා දෙනවා.

"ටකේෂි, මේ තමයි අපේ ජාතික ගීය. ඔයා ඒකත් ඉගෙන ගන්න ඕනෑ. ඔන්න මම කියන කොට කියන්න.

Scanned with CamScanner

sinhalaebooks.com



කුඩා ගල් කැට කලක් තිස්සේ
එකට එක් වී පාසි පොදි බැඳ
මහා පර්වතයක් සෑදෙන තුරු
රජතුමනි ! ඔබගේ දැහැමි පාලනය
වසර ගණනක් වැජඹෙයි. දිනේවා ! දිගුකල්

ටකේෂි හැකි අයුරින් ඔෂින් කී ගායනා කළා.

මේ හඬ ඇසී හැරී බැලුවේ මෙතෙක් මඟට වී ඔෂින් හා ටකේෂි දැක ගැනීමට පැමිණ සිටි රූසෝයි.

රූසෝ ඉසේ පැමිණ සිටියේ මැන්චූරියාවට යෑමට පෙරයි. රූසෝ ගේ බොහෝ මිතුරන් මැන්චූරියා වේ සිටි හෙයින් එහි ගොස් කොරියාවට යෑමට ඔහු බලාපොරොත්තු වුණා. යෑමට පෙර ඔෂින් හා ටකේෂි බලා යා යුතු යැයි ඔහු සිතුවා. ඒ අනුව ඉසේ පැමිණි රූසෝ අසා දැනගත් පරිදි මැඩම් හීසාගේ නිවසට යන පාරේ රැඳී හිටියා සවස් වනතෙක්ම.

රූසෝ, ඔෂින් හා ටකේෂි දෙස බලා සිටියා.

ටකේෂි ගීතයේ වචන වරද්දන විට ඔෂින් හිනැහුණා. ටකේෂි ඊටත් වඩා හයියෙන් හිනා වුණා. කරත්තය නතර කළ ඔෂින් වටපිට බැලුවා. රූසෝ ඔවුන් දෙස බලාගෙන. ඒ ඉන්නේ රූසෝ බව ඇඳින ගැනීමට ඔෂින්ට තවත් ටික වෙලාවක් ගත වූවා.

"රූසෝ........."

ඔෂින් තොල් මැතුරුවා. රූසෝ සිහි එළවා ගත්තාක් මෙන් ඔෂින් එතැනට පැමිණීමට පෙර වෙරළ දිගේ දුවන්නට වුණා.

"රූසෝ........ රූසෝ....... යන්න එපා."

ඔෂින් රූසෝ පිටුපස លුහුබැන්දා. බොහෝ දුර දෙදෙනාම දුව ගියා. ඔෂින් එකවරම රූසෝ ගේ කකුලේ එල්ලුණා. රූසෝත්, ඔෂිනුත් වැල්ල මත ඇදගෙන වැටුණා. ඔෂින් රූසෝ ව වැළඳ ගත්තා.

"ඇයි රූසෝ දුවන්නේ?"

"ඔයාගෙන් සමුගන්න. ඔයයි ටකේෂියි හොඳින් ද බලන්න මම ආවේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි රූසෝ ඔයා කොහේද යන්නේ?"

"මම මැංචූරියාවට යනවා. එහෙ මගෙ යාළුවෝ ඉන්නවා. දැන් ජපානය ඉවරයි. ආර්ථිකය ඉවරයි. ඔයයි ටකේෂියි බලලා යන්න ආවේ. මට ලැජ්ජයි ඔෂින්. මම දවසක ඔයාලා එක්ක යන්න එනවා."

"අනේ රූසෝ යන්න එපා. ඇයි අපිව දමලා යන්නේ? අපි මෙහෙ එකට ඉමු රූසෝ. ටකේෂිට තාත්තා කෙනෙක් ඕනෑ. අනේ රූසෝ."

"බැහැ ඔෂින් මම යන්නම ඕනෑ. මම ඔයාට ලියන්නම්."

ඔෂින් ගෙන් ඉවත් වූ රූසෝ, බෑගයත් කුඩයත් අතට ගත්තා.

රූසෝ වේගයෙන් අඩිය තියා මඳ දුරක් ගියා. ඔහු ඉදිරියේ සිටියේ ටකේෂි. දරුවා ඔහුගේ දෑත් පස්සට බැඳගෙන පියාට මුහුණ දී සිටියා.

"තාත්තා කොහේද යන්නේ?"

ඒ ප්‍රශ්නයත් සමඟම ටකේෂි රූසෝ ළඟට දුවගෙන ගියා.

රූසෝ දරුවා වැළඳ ගෙන එතැනම දණගහ ගත්තා.

මැඩම් හීසා ලෙල්ලමේ සිට මෙතනට ආවේ ඔෂින්ට කරදරයක් යැයි ආරංචි වූ නිසයි.

"ඔෂින්."

"මැඩම් ඒ ඉන්නේ රූසෝ."

"ටකේෂි ගේ තාත්තා ද?"

"ඔව්, මැඩම්."

හීසා රූසෝට කතා කළා.

"ටනකුරා මහත්තයා යමු ගෙදර."

ඇය රූසෝට කෑම බීමෙන් සංග්‍රහ කළා. රාත්‍රියේ රූසෝ ඔෂින් සමඟ සාකච්ඡාවක යෙදී සිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"ටකේෂි හොඳටම උස ගිහින් ඔෂින්, ඔයා හරියට දුක් විඳින්න ඇති කරදර මැද දරුවෙකුත් හදාගන්න."

"රූසෝ මේ අහන්න. අපි තුන්දෙනාම මෙහෙ ඉඳිමු. ටකේෂිට තාත්තා කෙනෙක් ඕනෑ."

"ඔෂින් මම හීන මැව්වේ ඉඩම ගැන. ඒක ඔයාගේ, ටකේෂිගෙ. ඒත් ඒ හීනය විනාශ වුණා. ඔයා තවත් දුක් විඳින්න එපා. මම ඉක්මනට ඔයාලව එහෙ එක්ක යන්නම්."

"මම ඒ වෙනුවෙන් අවුරුදු දහයක් ම ඉවසන්න සූදානම් වෙලා හිටියේ රූසෝ. "

"ඔෂින් මම හොඳ සැමියෙක්වත්, ටකේෂිට හොඳ තාත්තෙක් වත් නෙමෙයි. මම ඉක්මනින් ආපහු එනවා. මම පොරොන්දු වෙනවා."

ඔෂින් පාන්දරින්ම අවදි වී රූසෝට ගෙන යෑමට කෑම සකස් කළා.

"ඔෂින් ඔයා මොකද කරන්නේ දැන් පාන්දර හතරයි."

"සමාවෙන්න මැඩම් ඔයාගේ නින්දට බාධා වුණා නම්. රූසෝට යන්න ඕනැලු. මම එයාට දවල්ට කන්න කෑම ටිකක් හැදුවා."

"තාමත් යන්න ඕනෑ කියනව ද?"

"බල කරන්න බෑ මැඩම්. එයාට මෙහෙ ඉන්න බැරි නම්."

ඔෂින් රූසෝට කෑම සකස් කරදී මැඩම් හීසා සමඟ ලෙල්ලමට ගියා. රූසෝ ටකේෂි වඩාගෙන ගියා.

ඔෂින් වෙන්දේසියෙන් මාළු රැගෙන කරත්තයට දමා ගත්තා. රූසෝ කරත්තය තල්ලු කළා. ඔෂින් රූසෝ ගේ බෑගයත්, කූඩයත් රැගෙන පිටු පසින් ගියා.

"අද හොඳයි. තාත්තා හයියෙන් තල්ලු කරනවා."

ටකේෂි හිනාවෙවී කිව්වා.

රූසෝ වෙහෙසට පත්ව හිටියා. ඔෂින් ලේන්සුව දුන්නා.

"මෙන්න දාඩිය පිහගන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



"දෙන්න මම ගන්නම්. මට නම් මේක පුරුදුයි."

"කොච්චර දුර ද ටවුමට." රූසෝ ලේන්සුවෙන් දහඩිය පිස දැම්මා.

"පැයක් ම යනවා."

"ඔයා පැය දෙකක් කරත්තය තල්ලු කරනවද?"

"ටකේෂි ඉන්න නිසා මට මහන්සියක් දැනෙන්නේ නෑ රූසෝ."

"එහෙම නම් රූසෝ ඔයා කෙලින් ම මේ පාරේ යන්න. දකුණු අත පැත්තේ ස්ටේෂමට මම යන්නම්. පරක්කු වුණොත් මගෙ ගැනුම්කාරයෝ වෙන අයගෙන් මාළු ගනියි."

රූසෝ ඔෂින් යන අයුරු බලා සිටියා.

"මාළු අලුත් මාළු, වැල්ලෙන් මේ දැන් ගෙනාව මාළු."

කාන්තාවන් කීප දෙනෙක් පැමිණ ඔෂින් වට කර ගත්තා.

"දැල්ලෝ තියෙනවා. මේ මැකරල් මාළු."

ඔෂින් ටික දුරක් යන විට වහින්න පටන් ගත්තා. ටකේෂිට වැහි කබාය අන්දා තොප්පියක් හිසට දැමූ ඔෂින් ඇයගේ හිසට තොප්පියක් දමා ගෙන වැස්සේම කරත්තය තල්ලු කළා. රූසෝ කුඩය ඉහලාගෙන ඔෂින්ට නොපෙනී පිටුපසින් ගියා. සමහර අවස්ථාවල ඔහුගේ දෑසින් කඳුළු වැටුණා. දවල් වන විට ඔෂින් කඳු බෑවුමක කරත්තය නවත්වා ටකේෂිට කෑම දුන්නා.

"මේ බත් රසයි නේද අම්මා, මට තව ඕනෑ."

ඔෂින් තවත් බත් ගුලියක් ටකේෂිට දුන්නා. ඇයත් එකක් රැගෙන සෙමෙන් හැපුවා.

"ඔෂින්."

ඒ රූසෝ ගේ හඬ. ඔෂින් හිට ගත්තා.

"රූසෝ මම හිතුවේ ඔයා ගිහින් කියලා."

"ඔෂින්, මාළු වෙළඳාමත් ලෙහෙසි නැහැ නේද? අද දවසම

Scanned with CamScanner

sinhalaebooks.com



මම ඔයා පිටිපස්සේ ආවා. මම හිතුවේ නැහැ මාළු වෙළඳාම මේ තරම් කරදරයි කියලා."

"ඔව්, රූසෝ අපි එකට වැඩ කළොත් එච්චර අමාරු නැහැ. ඒත් ඔයා මැන්චූරියා ගියත් දුක් වෙන්නේ නෑ. ඔයාට ඕනෑ නම් මැන්චූරියා යන්න."

"නෑ, ඔෂින් මම කොහේවත් යන්නේ නැහැ. මම මෙහෙ මාළු වෙළෙන්දෙක් වෙනවා."

"ඔය ඇත්ත ද රූසෝ...."

ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා.

"මට හරි සතුටුයි. අපි තුන්දෙනා ආයිම එකට. මේක හීනයක් ද?"

ඔෂින් සිතුවා. රූසෝ ටකේෂි සමඟ මුහුදු වෙරළේ සෙල්ලම් කළා.

නැවතත් ටකේෂි ව කරත්තයේ තබා තල්ලු කරගෙන ගියා.

"හෙමින් වංගුව ගන්න. තාත්තාට තවම පුරුදුත් නැහැනේ."

ඔෂින් හා රූසෝ හිනැහුණා.

"අපි ආවා."

"ආ ටකේෂි මහන්සි ද එන්න මගෙ අතට."

එවිට ම රූසෝ ලැජ්ජාවෙන් මෙන් එතැනට පැමිණියා.

"ටනකුරා මහත්තයා යන වෙලාව වෙනස් කළා ද?"

"එයා යන්නේ නෑ මැංචූරියා."

"ඇත්තට ඒක හොඳ අදහසක්." මැඩම් හීසා කිව්වා.

"මමත් අද ඉඳලා ඔයාට වද දෙනවා මැඩම්."

"නෑ, නෑ ඒක එහෙම නෙමෙයි. මට හරිම සතුටුයි. මේක ඔෂින් ගෙ ජයග්‍රහණයක්."

මැඩම් හීසා හිනැහෙමින් කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විසි තුන

එදා රාත්‍රී කෑම ගන්න අතර මැඩම් හීසා ඔෂින්ට කතා කළා.

"ඔෂින් මම ඔයාට හැමදාම කිව්වානේ මාළු කඩයක් දමන්න කියලා. ඔන්න දැන් පුළුවනි ඔයාට සැමියා එක්ක එකතු වෙලා මාළු කඩයක් දමන්න."

"ඒක ඇත්ත." ඔෂින් කිව්වා.

"සල්ලි හුඟක් ඕනෑ නේ." රූසෝ සෙමෙන් කිව්වා.

"මුල් සල්ලි මම දෙන්නම්."

"ස්තුතියි මැඩම්, මම ළඟත් මුදල් ටිකක් තියෙනවා."

"හොඳයි අපි හෙට ගෙයක් බලන්න යමු."

නගරයේ තිබූ වසා දමා තිබුණ පැදුරු කඩයක් ඔෂින්ලාට කුලියට ගැනීමට හැකි වුණා.

"අපි මේකේ පීප්ප තියා ගනිමු. අපට එතකොට අලුත් ම මාළු ගැණුම්කරුවන්ට දෙන්න පුළුවනි."

"මම ගැණුම්කාරයෝ ළඟට ගිහින් ඕඩර්ස් ගන්නවා. ලෙල්ලමට ගිහින් මාළු ගෙනෙන්නෙත් මමයි."

රූසෝ ගේ මේ උනන්දුව ඔෂින්ට ලොකු සතුටක් ගෙන දුන්නේ. ඔෂින්ලාට අවශ්‍ය බොහෝ බඩු මුට්ටු හීසා මැඩම් ඔෂින්ට දුන්නා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මැඩම් ඔයාට බොහෝම ස්තුතියි. මේක ලොකුම උදව්වක්."

"එහෙම තමයි ඔෂින්. අපිට අනුන්ගෙන් උදව් ගන්න සිද්ධ වෙනවා. ඒ වගේ තමයි ඔයාටත් උදව් කරන්න කාලයක් එනවා."

ඔෂින් හා රූසෝ මාළු කඩේට ම පදිංචියට ගියා. පසුවදා රූසෝ හීසා මැඩම් දුන් ලොකු කරත්තය තල්ලු කරගෙන ලෙල්ලමට යාමට සූදානම් වුණා.

"රූසෝ ඔයා යන්න ද ලෑස්ති. මේ ඇඳුම්..........."

"ඔෂින්, මම අද ඉඳලා මාළු කාරයෙක්."

"රූසෝ අමාරුයි කියලා හිතුණොත් මහන්සි වෙන්න එපා."

"ඔයාට වඩා මට ශක්තිය තියෙනවා ඔෂින්."

"පරිස්සමෙන්." ඔෂින් රූසෝ පිටුපස ගියා.

"හනික එන්න."

රූසෝ කරත්තය තල්ලු කරගෙන ලෙල්ලමට ගියේ හරිම සතුටින්. වෙන්දේසිකාරයන්ගෙන් හා මාළු වෙළෙන්දියන් ගේ හඬ ඈතට ම ඇසුණා.

"සුබ උදෑසනක්."

රූසෝ, මැඩම් හීසාට සුබ පැතුවා.

"ආ ටනකුරා මහත්තයා උදේම ඇවිල්ලා. මම හිතුවේ නෑ මෙච්චර දුරක් එයි කියලා. මම ඔයාලට අවශ්‍ය මාළු ටික ගත්තා. මේ පෙට්ටිවල ගණන් ලියලා තියෙනවා. කඩේ විවෘතයට නම් එන්න වෙලාවක් නැති වෙයි. මේ කිරිබත් ටික ඔෂින්ට දෙන්න."

"හොඳමයි, බොහෝම ස්තුතියි."

රූසෝ පරක්කු වන විට ඔෂින් බිය වුණා.

"මොකද පුතේ තාත්තා නැත්තේ." ඔෂින් මඟට ම ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



ටිකකින් රූසෝ කරත්තය තල්ලු කරගෙන ආවා.

"රූසෝ ඔයා ආවාද? මම බයේ හිටියේ. මහන්සියි නේද? මේ බලන්නකො කඩේ නම හොඳයි ද කියලා."

"ආ.... ටනකුරා මත්ස්‍ය හල. හරි අපූරුයි නේ. එහෙම නම් අපට ම කියලා මාළු කඩයක්. මම මේක හොඳට ම දියුණු කරනවා. මේ නගරයට ම මාළු දෙන්නේ අපි. මම දැන් යනවා මාළු ඕඩර්ස් භාර ගන්න."

"එපා රූසෝ, ඔයාට මහන්සියි. මේ දවස් ටිකටත් මම යන්නම්. අපේ ගණුදෙනුකාරයෝ දැනුවත් කරන්න එපා යැ."

ඔෂින් මාළුන් පීජ්ප වලට දැම්මේ රූසෝ ගේ කැමැත්ත අනුවය.

"මෙතන හොඳයි මාළු කපලා දෙන්න. එහෙම හොඳයි නේද රූසෝ."

"හොඳයි මෙතන ලිපක් හදාගන්නත් ඕනෑ මාළු බදින්න."

"ඔව්, එහෙම හොඳයි."

සුපුරුදු පරිදි ඔෂින් මාළු කරත්තය තල්ලු කරගෙන ගොස් තමන්ගේ ගැණුම්කාරයන් මුණ ගැහුණා.

"මට බල මාළු තුන්දෙනෙක් ඕනෑ."

"අනේ සමාවෙන්න බල මාළු නම් ඉවරයි. ඒත් මම හවසට ගෙනැත් දෙන්නම් අපේ කඩේ තියෙනවා."

"ඔයා කඩයක් දැම්මා ද?"

"ඔව් අර පැදුරු කඩේ ඒක තමයි අපි ගත්තේ."

"හොඳයි අපි නගරයට ආව වෙලාවට ඔයාගේ මාළු කඩයට එන්නම්."

"ඒක හොඳයි. හුඟක් මාළු ජාති තියෙනවා."

"ඔෂින්, මට මේ මාළුන්ගේ නම් කියලා දෙන්න. අද කාන්තාවක් ඇවිත් මටත් බැනලා ගියා. මාළුන්ගේ නම් දන්නේ නෑ කියලා. අනිත් එක මාළු කපන හැටිත් මට කියලා දෙන්න."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින්ට දැනුණේ ලොකු සතුටක්. රූසෝ මේ සියල්ල කැමැත්තෙන් ම කරන එක ගැන.

ඔෂින් පීප්ප වලින් මාළු ගෙන නම් කියා දුන්නා. ඉන්පසු මාළුවෙක් රැගෙන කපන අයුරු පැහැදිලි කළා.

"කපන්න රූසෝ හරි. මෙහෙම අත තද කරගන්න."

එහෙත් රූසෝට නිවැරදි ලෙස මාළු කැපීමට අපහසු වුණා.

"ඒකත් වැරදුණා. දැන් මාළු කී දෙනෙක් කැපුවද, අපරාදේ මේ මාළු."

"රූසෝ ඔයා ඒ ගැන හිතන්න එපා. මාළු කුරියෝ සීයක් කපලා හරි කමක් නෑ ඔයා නිවැරදිව කපන්න ඉගෙන ගන්නකෝ. මේ මාළු වලින් මම අච්චාරු දමන්නම්. ඔයා වද වෙන්න එපා."

රාත්‍රී කෑම මේසයේ දී රූසෝ කීවේ,

"මේක හීනයක් ද ඔෂින්. මම ඔයයි ටකේෂියි එක්ක කෑම කනවා. හිතුවේවත් නැහැ. අපේම කඩයක්."

"මේ සේරටම මැඩම් හීසාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ." ඔෂින් කිව්වා.

"ඔව් ඒක නම් ඇත්ත. මගෙ අම්මාවත් මෙහෙම උදව් කරන එකක් නෑ."

"රූසෝ අපට මෙහෙම ඉන්න උදව් කළ අය හුඟක් ඉන්නවා. යශිරෝ මැඩම්, හසකාවා මැඩම්, කායෝ, කායෝ ගේ දමාපියෝ, ඇතැන්ස් හෝටලේ සුමිකොයි, අනිත් යාළුවොයි. ඇයි ගෙන්ජි මේ සේරම අපට උදව් කළ අය."

"ඒ අය සේරටම ස්තුතියි. නේද? ඔෂින්."

"ඔෂින්, මම හිතුව තරම් කඩේ මාළු විකුණුනේ නම් නැහැ. නින්දට ගොස් රූසෝ කිව්වා.

"ඒ ගැන වදවෙන්න එපා රූසෝ. මට පුළුවනි මාළු අච්චාරු දමන්න. නැත්නම් වේළන්නත් පුළුවනි. අද දානයකට මාළු අච්චාරු ඉල්ලුවා. අපට පිඟන් ටිකක් ගන්නත් වෙයි."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් මේ සියල්ල කියන විට රූසෝට තදට ම නින්ද ගිහින් තිබුණා.

"පව් මහන්සි ඇති." ඔෂින් රූසෝ ගේ පොරෝණය සකස් කළා.

පසුවදා උදේම මැඩම් හීසා ඔෂින් සොයා ආවා.

"ඔෂින්, රූසෝ ඕඩර්ස් ගන්න යනවා මම දැක්කා. ඒකයි මම ඔයා හොයාගෙන ආවේ."

"එන්න මැඩම්, වාඩිවෙන්න."

"ඔෂින් ඔයාගේ සැමියාට වෙළඳාම තේරෙන්නේ නෑ. ඔහොම ගියොත් ඔයාලට ගැණුම්කාරයෝ නැතිවෙයි. ඔයා වෙළඳාමේ යනකොට මාළු හුඟක් වික්කා. ඔෂින් ඔයා විතරක් නෙමෙයි මාළු විකුණන්නේ. මේකට තරගයක් තියෙනවා. ටිකක් වට පිට බලන්න. "

බැරෑරුම් ලෙස හීසා මැඩම් කියවාගෙන ගියා.

"ඉන්න මැඩම් තේ ටිකක් බීලා ඉමු."

ඔෂින් දෑත සෝදා හිබචය තබා වතුර උණු කළා. තේ කෝප්පයක් වත්කරගෙන මිටි මේසය ළඟට ගියා.

"මම මේවා කියන්නේ ඔයාගේ හොඳට ඔෂින්."

"ඔයා කියන එක හරි මැඩම්. නමුත් සැමියා කියනවා එයා බිස්නස් කරන්නම් කියලා. ඉතින් මැඩම් මම තීරණ ගත්තොත් එයාගේ හිත රිදෙයි. බිස්නස් අඩුයි තමයි. ඒත් කමක් නෑ. රූසෝ ගේ ආශාවයි, උනන්දුවයි දිගටම තියා ගන්නයි ඕනෑ. අපතේ ගිය කාලය ගැන හිතනකොට අපි තුන්දෙනා එකට ඉන්න එකයි මැඩම් මට වැදගත්. මට ඕනෑ මම එයාට උදව් කරනවා කියලා හැඟෙන්න වැඩ කරන්නයි. සල්ලි නැතත් කමක් නෑ මැඩම්. අපි මේ එකතු වෙලා ඉන්නේ අවුරුදු හතරකට පස්සේ. මට වටින්නේ ඒකයි. ඕකයි හේතුව මැඩම්." ඔෂින් විස්තර කළා.

මැඩම් හීසා අසා සිටියා.

"ඇත්ත තමයි. ඒක මට වැටහුණේ නැහැ. දෙන්නා හොඳින්

Scanned with CamScanner

sinhalaebooks.com



ඉන්න එක තමයි වැදගත් ම දේ."

මෙවිට ම රූසෝ පැමිණියා.

"ඔෂින්."

"ආ.. රූසෝ ඔයාට හරියට මහන්සියි වගෙයි."

"මෙන්න අද ගත්ත ඕඩර්ස්. හැබැයි ඔයා ගන්න තරම් නැහැ."

"නැත්තේ ඇයි? මෙහෙම හොඳයි නේද මැඩම්."

"ඔව්, ඔව් දැන් ටනකුරා මහත්තයා ප්‍රසිද්ධ මාළුකාරයෙක්."

තුන්දෙනාම ටික වේලාවක් කතා කරමින් හිටියා.

රාත්‍රියේ නින්දට ගිය රූසෝ හදිසියේ ම ඇහැරුණා.

"කෝ ඔෂින්."

ඔහු සාලයට ගියා. ඔෂින් යමක් ලියමින් සිටියා.

"ඔෂින් මොකද කරන්නේ."

"දන්නවද රූසෝ ඔයා ගමට ලියුමක් ලීවේ නැහැ. දෙමාපියන්ට ලියන්න ම එපා යැ. නැත්නම් එයාලා වද වෙයි. මම මේ ලියුමක් ලිව්වා සමාව ඉල්ලලා."

"ඔයා හරි. එයාලා අපි ගැන දැනගන්න ඕනෑ."

"රූසෝ ලියන්නම් අපි දෙන්නා එකටම සතුටින් ඉන්නවා කියලා."

ඔෂින් ලිපිය ලිව්වා.

* * * *

ඔකියෝ ඔෂින් එවූ ලිපිය කෑලි වලට ඉරා දැම්මා.

"ඩයිකොරෝ අනේ රූසෝ ගෙන්වා ගනිමු. ඔයා ම හිතන්න අපි රූසෝ මාළුකාරයෙක් කරනවද ? මම හිතුවේ කොහේ හරි ගිහින් දියුණු වෙයි කියලා. ඒත් ගිහින් තියෙන්නේ ඔෂින් හොයාගෙන."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඉතින්, මාළුකාරයෙක් වුණාම මොකක් ද තියෙන වරද? අපි සුබ පතන්න ඕනෑ ඒ දෙන්නා සතුටින් නම්. මේ ඔකියෝ ඔයා ලියුමක් ලියන්න ඒ දෙන්නට සුබ පතලා. ඔයා රූසෝට ආදරේ නම් එයාලට සුබ පතන්න. දෙමාපියෝ කරන්න ඕනෑ එයාලට උදව් කරන එකයි. ඔයයි ඒ දෙන්නා වෙන් කළේ. වැරදුණේ ඔයාට ඔකියෝ."

"ඒත් මම රූසෝව ගෙන්නා................"

"මේ ඔකියෝ, මම ජීවත් වෙලා ඉන්නකල් ඒ දෙන්නට ඒ දෙන්නගෙ පාඩුවේ ඉන්න දෙන්න. "

ඔකියෝ එතැනින් බැහැරව ගියා. සුනිකො ඇය පසුපස ආවා.

"අම්මා අපි රූසෝ ගේ ඇඳුම් එහෙම යවමු නේද?"

ඔකියෝ කිසිවක් කීවේ නැහැ. ඇය මිදුලට ම ගියා.

"රූසෝ මට ආදරේ නැහැ. එයා ආදරේ ඔෂින්ට. වැඩක් නෑ කොල්ලෝ හදලා." කී ඔකියෝ සුසුමක් හෙලුවා.

* * * *

"මිස්ට ටනකුරා මෙන්න ඔයාලට තැපෑලෙන් පාර්සලයක්."

"බොහෝම ස්තුතියි." තැපැල් හලේ නිලධාරියාට රූසෝ, ඔෂිනුත් ආචාර කළා.

"රූසෝ මේක සාගා වලින් "

රූසෝ පාර්සලය විවෘත කළා.

"මගෙ ඇඳුම්, මේ මගෙ සපත්තු."

"මෙන්න ලියුමක් ඒක ඇතුළේ. බලන්න රූසෝ අම්මගෙ අකුරු වගෙයි."

"ඔව්, ඔෂින් අම්මා එවලා තියෙන්නේ."

දෙදෙනාම එයට නැඹුරුව කියෙව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



*රූසෝ,*

*ඇත්තටම මට දැන් රූසෝ ගැන කනස්සල්ලක් නෑ. ඔයා ආපිට සාගා එන්න අවශ්‍ය නැහැ. ඔෂින්ටත් මම සමාව දෙනවා. ටකේෂි බලන්නත් ආසයි. ඔය තුන්දෙනාට ම සතුට ලැබේවා. ඔබේ බිස්නස් දියුණු වේවා පතනවා.*

"රූසෝ අම්මා මට සමාව දීලා. මම ඔයා එනකල් ඉවසලා හිටිය එක හොඳයි. මහන්සිවෙලා වැඩ කරලා අපි දියුණු වෙමු. එතකොට ඒ ගොල්ලන් සතුටු වෙයි."

ඔෂින්ලාගේ මාළු ව්‍යාපාරය එතරම් දියුණු වුණේ නැහැ. නමුත් ඔෂින් හිටියේ සතුටින්. ටකේෂිට අවුරුදු හය ලැබුවා. ඔහු ප්‍රාථමික පාසලට යාමට ඇතුළත් කළා. ඔෂින්ට දැනුණේ පුදුම සතුටක්. තමා පාසල් යෑමට කොතරම් ආශාවෙන් සිටියා දැයි ඇයට සිහි වුණා. ටකේෂි පළමුවෙන් ම පාසල් යන දිනයට තම මව ගෙන්වා ගැනීමට ඔෂින්ට අවශ්‍ය වුණා.

"රූසෝ තවම ඔයාලාගේ අම්මලා නම් අපිට ඉසේ ගෙන්වා ගන්න බැරිවුණා. මගෙ අම්මට එන්න කීවොත් ටකේෂිට පාසලට යන දවස අම්මටත් බලා ගන්න දෙන්න. ඔයා තරහ වෙනවද?"

"එහෙම නෑ ඔෂින්. ටකේෂි ඉපදුන දවස් වල අම්මා කොයි තරම් උදව් කළා ද?"

"එහෙම නම් මම අම්මට දුම්රියෙන් එන්න කියලා සල්ලි අරින්නම්."

"ඔව්, අම්මා ආවාම අපි ඉසේ පන්සල බලන්න එක්ක යමු."

ඒ 1927 අවුරුද්දයි. සරත් සමයේ මුල් භාගයේ ම ටකේෂි පාසල් යන්න සූදානම් වුණා. මේ වන විට ඔෂින් තුන්වන වරටත් ගැබ්ගෙන තිබුණා. රූසෝත්, ඔෂිනුත් ඒ පිළිබඳ හුඟක් සතුටු වුණා. මේ අතර අම්මා ආවා.

"ටකේෂි අද ආච්චම්මා එනවා. ආච්චම්මා අපට වැදගත් කෙනෙක් තේරුණා ද?"

ඉුජිව දුම්රිය පළට ගොස් එක්කරගෙන ආවේ රූසෝ.

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා," ඔෂින් ටකේෂිත් සමඟම ඉදිරියට ගියා.

"අම්මා හුඟක් කෙට්ටු වෙලා. මූණත් සුදුමැලි වෙලා."

"දැන් මම වයසයි නේ ඔෂින්. මගේ මුණුබුරා දැන් ලොකුයිනේ."

ෆුජිට දැඩි මහන්සියක් දැනුණා.

"අම්මා ටිකක් හාන්සිවෙලා ඉන්න." රූසෝ කිව්වා.

ටකේෂි ප්‍රාථමික පාසලට භාර දීමට ඔෂින් සමඟ ෆුජිත් ගියා.

"මගෙ පුතා හොඳට ඉගෙන ගන්න. අපි දුප්පත් නිසා ඔයාගෙ අම්මව පාසල් යවන්න අපට බැරි වුණා පුතේ."

ෆුජි ටකේෂිගේ හිස අතගාමින් කිව්වා.

දින දෙක තුනකින් ෆුජිට ආපිට යන්න අවශ්‍ය බව කිව්වා.

"ඇයි අම්මා, අම්මා මෙහෙ ඉන්නවා නම් අපි කැමතියි."

"ඒත්, ඔෂින් මම දැන් වයසයි. ඔයාලට උදව් කරන්නත් මට බැහැනේ. මම ගෙදර යන්නම්."

"ඇයි අම්මා, අම්මා මේ සැරේ බබා ලැබෙනකල් ඉන්නේ නැද්ද. අපට හුඟක් සැප දෙන්න නම් අමාරුයි. ඒත් ඔෂින් වෙනුවෙන් ඉන්න අම්මා."

රූසෝ ෆුජි හමුවේ හිස බිමට නවාගෙනම සිටියා.

"ඒත් වැඩක් නොකර නම් ඉන්න අමාරුයි ඔෂින්."

"හොඳයි අම්මා උයන ගෙයි වැඩ බලාගන්න. මම රූසෝට උදව් කරන්නම්."

"ඔෂින් ඔයා ප්‍රවේශම් වෙන්න ඕනෑ. මට ගිය වතාවේ ඔයාව ආරක්ෂා කර ගන්න බැරිවුණා. ඒත් මෙදා අපට නිරෝගී දරුවෙක් ඕනෑ."

රූසෝ කිව්වා.

කායෝගෙන් ලිපියක් ආවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා මේ බලන්න කායෝට දරුවෙක් ලැබෙන්නලු."

"ඇත්තට අනේ කොයි තරම් හොඳ ද? අවුරුදු කීයකට පස්සෙ ද? කායෝ විවාහ වෙලා අවුරුදු දහයකට පස්සේ. අනේ යශිරෝ මැඩම් ගේ ආත්මයට සැනසීමක්. පුතෙක් ම ලැබෙන්න ඕනෑ කගායාවට අයිතිකාරයා වෙන්න."

"කායෝ ගෙයි ඔයාගෙයි දරුවෝ එක මාසේ නේද?"

ඔෂින් අම්මාගේ මුහුණ දෙස බලාගෙන හිටියා.

"අම්මාගෙ මුහුණ සුදුමැලියි. අසනීප ගතියක් දැනෙනවද?"

"නෑ ඔෂින්, මම ළඟක් වෙනකල් ගෝනි දෙක තුනක් හාල් ගෙනිච්චානේ. ඒත් දැන්නම් බෑ."

ෆුජි හැකි අයුරින් ඔෂින්ට උදව් කළා. ඔෂින් විවිධ කෑම සාදා අම්මාට දුන්නා. විවිධ මාළු වර්ග වලින් සුප් සාදා දුන්නා.

ඔෂින්ට දරුවා ලැබුණා. ඒ පුතෙක්.

"රූසෝ, අන්න ටකේෂි වගේ ම ලස්සණ පුතෙක්. ගිහින් බලන්න. "

"එහෙමද? පුතෙක් නම් හොඳයි."

රූසෝ කාමරයට දුවගෙන ගියා.

"ඔෂින්, අපි පුතාට මොකක්ද දාන නම?"

"අපි එයාට හිටෝෂි කියමු. එහෙම හොඳ ද රූසෝ."

ඔෂින් කුඩා හිටෝෂි ගේ හිස පිරිමැද්දා.

මේ අතර දිනෙක වැඩ කරමින් සිටි ෆුජි ලිප ළඟම සිහිසුන්ව ඇද වැටුණා. රූසෝ වෛද්‍යවරයා ගෙන්නුවා.

වෛද්‍යවරයා ෆුජි පරීක්ෂා කළා.

"මේ ලෙඩා රෝහලට ඇතුල් කරන්න ඕනෑ. පරීක්ෂණ කීපයක් ම කරන්න තියෙනවා."

"හොඳමයි."

රූසෝ හීසා මැඩම් සොයා ගොස් ෆුජි ගේ අසනීපය ගැන කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මේ ගැන ඔෂින්ට දැනගන්න අරින්න එපා." හීසා මැඩම් කිව්වා.

"කොහොමද රෝහලේ නවත්වන්නේ."

"හොඳයි මම කියන්නම් අපේ ගෙදර ආව ගමන් දවස් දෙක තුනකට නතර වුණා කියලා."

"ඒක හොඳයි."

අම්මා හීසා මැඩම්ල ගේ·නිවසේ නතර වූ බව අසා ඔෂින් පුදුම වුණා.

"මේ දවස්වල ඇයි අම්මා එහෙ නතර වුණේ."

"ඒක හොඳයි ඔෂින්. අම්මා ටිකක් මහන්සියෙන් හිටියේ. එහෙ ටික දවසක් නිදහසේ හිටපුදෙන්. මම ඔයාට උදව් කරන්නම්කෝ."

හීසා මැඩම් ඔෂින්ටත් දරුවාටත් ඇප උපස්ථාන කළා.

එදා ෆුජි රෝහලෙන් ගෙදර ආවා. වෛද්‍යවරයා කීවේ ඇයට ලියුකේමියා රෝගය වැළඳී ඇති බවත් ඉතා ඉක්මනින් ඇය මිය යා හැකි බවත් ය.

රූසෝ ඔෂින් සිටි කාමරයට ගියා.

"දැන් ඔයාට සනීප ද?"

"ඔව් රූසෝ, මට දැන් ඔයාට උදව් කරන්න පුළුවනි."

"ඔෂින්, මේක අහලා කලබල වෙන්න එපා. අම්මා අසනීපයෙන්."

"අම්මා" ඔෂින් මෙට්ටය මත ඉඳගත්තා.

"මම අම්මා බලන්න යනවා."

"ඉන්න ටිකක්. අම්මට ලියුකේමියාව හැදිලා. වැඩි දවසක් ජීවත් වෙන්නේ නෑ කිව්වා."

ඔෂින් ඉක්මනින් ෆුජි සිටි කාමරයට ගියා.

"අම්මා........ අම්මා."

Scanned with CamScanner

sinhalaebooks.com



ෆූජි දැඩි නින්දක.

"ඕක බොරුවක් රූසෝ. මගෙ අම්මට එහෙම වෙන්නේ නෑ."

"ඒත් ඒක ඇත්තක් ඔෂින්. අපි අම්මව හොඳට බලා ගනිමු."

ඔෂින් එදා සිට සෑම විටම අම්මාට පෝෂ්‍ය ආහාර සාදා දුන්නා. ඇයම එම ආහාර හැන්දෙන් කැව්වා.

"ඔෂින්, මම ඔයාලට වදයක් වුණා. මට සමාවෙන්න ඒ ගැන."

"නෑ, අම්මා අම්මා මට කොයි තරම් උදව් කළා ද? එදා ටෝකියෝ එන්න අම්මා මාව තාත්තාගෙන් නිදහස් කරලා යැව්වේ නැත්නම් මට මේ වගේ සතුටින් රූසෝයි දරුවොයි එක්ක ඉන්න වෙන්නේ නැහැනේ අම්මා. අම්මා මොනවත් හිතන්න එපා. ඔයා සනීප වෙන්න බලන්න."

"ඔෂින් මට තේරෙනවා. මම සනීප වෙන්නෙ නෑ. මට යමගාටා යන්න ඕනෑ. මගෙ ගෙදර මැරෙන්න ඕනෑ."

"අම්මා මොනවද මේ කියන්නේ? එච්චර ඈත යන්න අම්මට තවම සනීප නැහැ."

"මට දුකයි ඔෂින්, ඔයාලට මම කරදර කරනවා නේද?"

ඔෂින් කල්පනා කළා. ඒ අම්මගෙ ආසාව. කොහොමද ඉටු කරන්නේ.

"අම්මා මේ සුප් එක බොන්න. කට අරින්න."

"ඔෂින්, මට යමගාටා යන්න ඕනෑ නෑ. මට ඇස් දෙක වහගත්තාම පේනවා ඔයාගේ ආච්චම්මා, තාත්තා, හරුන්, ගේ වටේට හිම වැටිලා. මම හිතා ගන්නම් මම ඉන්නේ යමගාටා වල මගෙ ගෙදර කියලා. ඔයා වදවෙන්න එපා."

ඔෂින් ඇඳුම නවත්වාගෙන රූසෝ සොයා ගියා.

"රූසෝ, මට සමාවෙන්න, මම ඔයාට කරදර ගේන නිසා. අම්මාව යමගාටා ගෙනියන්න ඕනෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඒත් ඔෂින් අම්මව එච්චර දුර ගෙනියන්න තරම් සනීපයක් නැහැනේ."

"ඒත් එයාගේ ජීවිත කාලය කෙටියි කියලා ඔයා දන්නවානේ."

"හොඳයි ඔෂින් ඔයා අම්මා වෙනුවෙන් ඔයාට ඕනෑ දෙයක් කරන්න."

"හිටෝෂි ගෙනියන්න බැහැනේ.ඒ නිසා මම මැඩම් හීසාට කියන්නම් කිරි අම්මා කෙනෙක් හොයන්න කියලා."

හීසා මැඩම් මෙහිදීත් ඔෂින්ට පිහිට වුණා. කිරි අම්මා සමඟම හිටෝෂිව ඇයගේ නිවසේ නතර කර බලාගැනීමට.

යමගාටා ගමන ඉක්මන් කළා. මාළු ගෙනියන ලොකු කරත්තයට මෙට්ටයක් දමා ෆුජි එහි තබාගෙන රූසෝ දුම්රිය පළට රැගෙන ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විසි හතර

යමගාටා දුම්රිය පළේ ඔෂින් හා ෆූජි වාඩි වී සිටියා.

"මම සෝජිට ලිව්වා. අපි එනවා කියලා. අපි තව ටිකක් බලමු."

ඔෂින් ජනේලයෙන් එපිට බලාගෙන හිටියා.

සනට හිම වැටෙමින් තිබුණා. පැය ගණනක් ගියා. සෝජි ආවේ නැහැ.

"අම්මා, අපි යමු. සෝජිට වැඩ ඇති. හිම තිබුණට කමක් නෑ."

ඔෂින් අම්මාව කරේ රඳවා ගත්තා. ෆූජිගේ කකුල් දෙක දෙපැත්තෙන් අල්ලා ගත්තා.

"හරි අම්මා, අම්මා මාව හයියෙන් අල්ලා ගන්න. අම්මගේ ඇගේ උණුහුමට මගෙ ඇඟත් රත්වෙනවා. හරි යමු."

"ඔෂින් මට සමාවෙන්න. ඔයාට කරදර කරනවාට."

"නෑ අම්මා, ඔයා අපට කොයි තරම් උදව් කරලා තියෙනව ද? ගෙවන්න බෑ අම්මා ඒවාට වන්දි."

ඔෂින් අපහසුවෙන් කන්ද නැංගා. වෙනදාට වඩා බොහෝ වේලාවක් ඒ සඳහා ගත වුණා.

"අම්මා, ඔන්න අපි ගේ ළඟට ම ආවා. අර බලන්න අම්මා."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් මවත් ඔසවාගෙන ඔවුන් ගේ පැරණි නිවසට ගියා. ඒ තුළ තිබුණේ එහෙ මෙහෙ විසි කළ පරණ බඩු රැසක් පමණයි.

ඔෂින් මවත් ඔසවාගෙන සෝජි ගේ නිවසට ගියා.

හිබච්ය ළඟ දරුවන්, ටෝරා හා සෝජි කෑම ගනිමින් හිටියා.

"සෝජි, ඉක්මනට මෙට්ටයක් දමන්න. හිමේ ඇවිල්ලා අම්මා සීතල වෙලා."

"මොකක් ද කීවේ. ඇයි මෙහෙ ගෙනාවේ. අමාරුයි නේද? කොයි වෙලාවෙද දන්නේ නැහැ. ඇ ඔෂින්, අම්මට ශක්තිය තියෙනකම් වැඩ ගන්නවා. ලෙඩ වුණාම මෙහෙ ගේනවා."

"සෝජි අම්මට මහන්සියි. ඉක්මනට මෙට්ටයක් දමන්න. බැරි නම් මම ම ඒකත් කරගන්නම්."

ඔෂින් කාමරයට ගියා. සෝජි පැමිණ මෙට්ටයක් බිම අතුරා මව එහි තැබීමට ඔෂින්ට උදව් කළා.

"අම්මා, දැන් හරි. අපි පරණ ගේ අස් කරලා එහෙට යමු. එතකල් ඉන්න."

ඔෂින් ටෝරා සොයා ගියා.

"ටෝරා පරණ ගේ අස්කරලා දෙනවා. නැත්නම් අපි අලුත් ගෙදරම ඉන්නවා."

"ඉක්මනට පලයං ගෑනියේ. පරණ ගේ සුද්ද කරපං. නැත්නම් මොවුන් මේ ගෙයිම ලගියි." සෝජි ටෝරාට කිව්වා.

ටෝරාත්, සෝජිත් පරණ ගේ අස්කළා.

"ජේනවානේ ඔෂින් අණ දෙන්න ඇවිත් අපට."

ටෝරා ඔෂින්ට බැනවදිමින් බඩු එක ගොඩකට දැම්මා.

එතෙක් ඔෂින් අම්මට සුප් එකක් සූදානම් කළා.

"මොකට ද මෙච්චර දර නාස්ති කරන්නේ."

ටෝරා බැන වැදුණත් ඔෂින් නිහඬව ම මවට කෑම සූදානම් කළා.

Scanned with CamScanner

sinhalaebooks.com



"අම්මා, පරණ ගේ ලෑස්තියි. අපි එහෙ යමු." ඔෂින් මව එසවීමට තැත් කළා.

"ඉන්නවා ඔහොම."

ඔෂින් පැත්තකට තල්ලු කළ සෝජි මව ඔසවා ගෙන ගොස් මෙට්ටය මත තැබුවා.

"ස්තුතියි සෝජි."

ෆුජි මිමිනුවා. සෝජි එළියට ගියා. ඔෂින් ඒ පසුපස දුවගෙන ගියා.

"මොකක් ද ලෙඩේ." සෝජි ඇසුවා.

"අසාධ්‍ය එකක් ද?" නැවතත් සෝජි ඇසුවා.

ඔෂින් සෙමෙන් හිස වැනුවා.

"අහන්න සෝජි. අම්මට කරුණාවන්ත වෙන්න. ඔයා උස්සාගෙන ගියාම ඒක අම්මට සතුටක්."

කිසිවක් නොකී සෝජි යන්න ගියා.

ඔෂින් සුදු බත් කෝප්පයට දමාගෙන හැන්දක් රැගෙන මව ළඟ දණ ගසා ගත්තා.

"අම්මා සුදු බත් ටිකක් කමු නේද?"

එහෙත් ෆුජිට ආහාර ගැනීමේ අපහසුතාවයක් තිබුණා. ඇය හිස දෙපසට වනා කෑම ප්‍රතික්ෂේප කළා.

"අම්මා, මේ අහන්න. පොඩි කාලේ ඉඳලම මට ඕනෑ වුණේ ඔයාටයි අනිත් අයටයි සුදු බත් දෙන්නයි. ඒ සිහිනය සැබෑ කරගන්න මම මහන්සි වෙලා වැඩ කළා. අවුරුදු හතේ දී ගෙවල් වල වැඩට ගියා. අන්තිමට මට ඒ සිහිනය සැබෑ කරගන්න පුළුවන් වුණා. ඒත් අන්තිමට අම්මට සුදු බත් කන්න බැරිවෙලා."

ඔෂින් ගේ දෑසින් කඳුළු කඩා වැටුණා.

"කන්න බැරි වුණාට මම හරි සතුටින් ඔෂින්. මාව ගෙදර ගෙනාවට ඔයාට බොහෝම ස්තුතියි. පහුගිය කාලේ මම මේ ගෙදර තනියෙන් හිටියේ. ඒත් මට තනියක් දැනුණේ නැහැ.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔයාගේ ආච්චම්මා, ඔයාගේ තාත්තා, හරුන් සේරම මෙහෙ ඉන්නවා. අපි ඔක්කොම මෙහෙ හිටියා."

ෆුජි වෙහෙස නිසා කතාව නැවැත්තුවා. ඒ මොහොතෙම ඇය නින්දකට වැටුණා. සිහිනෙන් ඇයට පෙනුණා ඔෂින් කුඩා කාලයේ ඔවුන් සියලු දෙනා රාබු බත් කෑ ආකාරය. බත් දමා තිබුණ ලී භාජනය වටේට ආච්චම්මා, සැමියා හා දරුවන් පස් දෙනා වාඩි වී කෝප්ප වලට දැමූ රාබු බත් හෂි කෝටු වලින් කෑ අයුරු ඇය බලා සිටියේ හිහැහෙමින්.

නැවත නින්දෙන් පිබිදුන ෆුජි තමා දෙස බලා සිටින ඔෂින් දෙස බැලුවා.

"අපි ඔක්කොම මෙහෙ හිටියා. ඔයා, සෝජි, හරුන්, හට්ෂු, ආච්චම්මා, තාත්තා ඔය සේරම. මම ඒ ගොල්ලන් එක්ක හැමදාම මෙහෙ ඉන්නවා ඔෂින්. මේ මගෙ ගේ. ඕනෑ කෙනෙකුට තමන්ගේ ගෙදර එන එක, ඉන්න එක සතුටක් ඔෂින්."

"අම්මා වැඩිය කතා කරන්න එපා. අම්මට වෙහෙසයිනේ."

ඔෂින් මවගේ හිස පිරිමැද්දා.

දින දෙක තුනක් ගෙවී ගියා. කෑම ගැනීමේ අපහසුතාවය නිසාම ෆුජි එන්න එන්නම දුර්වල වුණා.

"කවුද ගෙදර, ෆුජි ගෙදර ආවාලු නේද?"

ඔෂින් එළියට ගියා.

"ඔෂින් ඔයා මෙහේ ද?"

"ඔව්, රිකි නැන්දේ මම අම්මාව එක්ක ගෙන ආවා."

"ඒක හොඳයි. ෆුජි දැන් ඔයාට සනීපයි නේද?"

ෆුජි හිස වැනුවා.

රිකි යෙහෙළියගේ හිස පිරිමැද්දා.

"නැන්දා එන්න තේ එකක් බොන්න."

රිකි තේ කෝප්පය රැගෙන ඔෂින් ළඟින් ම වාඩි වුණා.

"රිකි නැන්දා කොහොම ද? කගායා ගියේ නැද්ද ළඟදී.

Scanned with CamScanner

sinhalaebooks.com



කායෝ මට ලියුමක් එවලා තිබුණා. එයාගේ දරුවා ගැන ලියලා තිබුණා."

"ඔෂින් මම මේ කියන්නමයි හිටියේ. මම ළඟදී කගායා ගියා. මට තේරුණේ එහෙ බොහෝම ප්‍රශ්න තියෙනවා කියලා. කායෝ ගේ මහත්තයා හුඟක් ණය වෙලාලු. මට වැඩිය විස්තර නම් දැන ගන්න ලැබුණේ නැහැ. එහෙ මහත්තයායි මැඩම් එහෙම බොහෝම කනසල්ලෙන් හිටියේ."

"එහෙම ද?" ඔෂින් කල්පනාවට වැටුණා.

"ඔෂින්, එළියෙ හිම වැටෙනව ද?"

ෆුජි ඇසුවා.

"ඔව් අම්මා, බොහෝම තදේට හිම වැටෙනවා."

"ඔෂින් ඔය දොර අරින්න. මට හිම බලන්න ඕනෑ."

"ඒත් ෆුජි ඔයාට ශීතල වැඩිවෙයි."

"නෑ රිකි මට හිම බලන්න ඕනෑ. රිකි මට උදව් කරන්න."

ඔෂින් හා රිකි මව ඔසවා දොර ළඟට ගෙන ගියා. ඔෂින් මව තමාගේ උරහිසට හේත්තු කර ගත්තා. ෆුජි ද ඔෂින් ගේ උර හිස මත හිස තබා ගෙන හිම දෙස බලා සිටියා. ටික වෙලාවකින් ඇයට හීනයක් පෙනුණා.

ඇය හිම කන්දක් උඩ හිටගෙන හිටියා. පහළ වූ ගඟේ පහුරක ඔෂින් වාඩි වී සිටියා. එකවරම ඇය පහුරෙන් පනින්න හැදුවා. එවිටම එහි සිටි පුද්ගලයෙක් ඔෂින් ව අල්ලා ගත්තා. ඔෂින් කෑගහන්න පටන් ගත්තා.

"අම්මා, අම්මා......... අම්මා............"

ඔෂින් කෑගහන හඬ දිගටම ඇසී නැසී ගියා.

ෆුජි, ඔෂින් ගේ උර හිස මතම අවසන් සුසුම් හෙළා තිබුණා. ඔෂින් මවගේ දේහය වැළඳගෙන අඬා වැලපුණා. ඇයට අවශ්‍ය වුණේ ගමේ සැමටම දන්වා අවමංගල්‍ය උත්සවය පැවැත්වීමටයි. එහෙත් සෝජි දැඩි ලෙස එයට විරුද්ධ වුණා.

Scanned with CamScanner

sinhalaebooks.com



"බොරු සල්ලි නාස්තියක්. ඕනෑ නෑ ඕවා."

සෝජි ගේ ඒ අදහස් නිසාම ඔෂින් අවමංගල්‍ය කටයුතු සෝජිට අවශ්‍ය ලෙස සිදු කිරීමට මුදල් දුන්නා.

සියල්ල අවසන් වුණා.

ඔෂින් පසුවදාම ඉසේ යන්න හිතුවා. ඇය අවසාන වශයෙන් ඇගේ මහ ගේ දෙස බලාගෙන හිටියා. ඇයට පෙනුණා රාබු බත් සහිත ලී පෙට්ටිය වට කොටගෙන තාත්තා, ආච්චම්මා, සෝජි, හරුන්, මිට්ෂු, තමා සිටි ආකාරය. අම්මා සියල්ලන්ගේ ම අතට රාබු බත් සහිත කෝප්පය බැගින් දුන්නා. පසු කාලයක නංගීත්, මල්ලීත් ඒ පවුලට එකතු වුණා. පුංචිම නංගී දරුකමට හදා ගන්න දුන්න හැටි සිහි වී ඔෂින් ගේ දෑස කඳුළින් පිරුණා. අම්මා....... අම්මා..... සමුගන්නම් මම අම්මගෙන් වගේ ම අපේ මහ ගෙදරින්. ඔෂින් තමාට ම කියා ගත්තා.

සෝජි මේ නිවස කඩා දමයි. ඔෂින්ට හිතුණා. ඇය දුම්රියේ නැගී ආපිට ගමන ආරම්භ කළා.

"අම්මා." ඔෂින් දුටු ටකේෂි දුවගෙන ආවා.

ඔෂින් ටකේෂිව වැළඳ ගෙන,

"ඔයා දඟකළේ නැහැ නේද?"

"නැන්දා මෙන්න අම්මා ආවා."

මැඩම් හීසා දුටු ගමන් ම ඔෂින් හිස නමා ආචාර කළා.

"ස්තුතියි මැඩම්, ඔයා මට කළ උදව් වලට. ඔයා නොහිටින්න මට අම්මා අරගෙන යමගාටා යන්න වෙන්නේ නැහැ. ගෙදර ගියාම අම්මා හරියට සතුටු වුණා. මට අම්මා වෙනුවෙන් මොනවත් කරන්න බැරි වුණා. මේ ගමන යන්න ලැබුණ එක මට සැනසුමක්. අනේ මැඩම් මට සමාවෙන්න කරදර කළාට."

"දුක් වෙන්න එපා ඔෂින්, එයා මැරුණේ සතුටින්. ඔයාලගේ සමගිය දැක්කා. ඔයාලගේ දියුණුව දැක්කා. "

"මගෙ අම්මා හිම පළාතට ම සින්න වෙච්ච ගෑනියෙක්. මම අවමංගල්‍ය ගමේ අයටත් කියලා හොඳට ගන්න හිටියේ. ඒත්

Scanned with CamScanner

sinhalaebooks.com



සෝජි කැමති වුණේ නෑ. බොරු සල්ලි නාස්තියක් කියලා කිව්වා. සෝජි මහ නපුරා."

රූසෝත් එතැනට පැමිණ අසා සිටියා.

"ඔෂින්, සහෝදරයා එක්ක තරහ ගන්න එපා. සෝජිට මුදල් හදල් තිබුණා නම් සහෝදරියකට වාගේ ඔයාට සලකයි. අම්මට සලකයි. දුප්පත් වෙන කොට කුහකකමත් වැඩි වෙනවා ඔෂින්."

මාළු වෙළඳාමෙන් එතරම් ආදායමක් නොලැබුණත් ඔෂින් සිටියේ සතුටින්. ඇය වරින්වර සාගාවල සිටින දෙමාපියන්ට මාළු අච්චාරු දමා දුම්රියෙන් යැව්වා.

කාලය ගත වී ගියා. ටකේෂි ප්‍රථමික අධ්‍යාපනය අවසන් කළා.

"අම්මා, මෙන්න මගෙ රිපෝට් එක."

"කෝ බලමු. රූසෝ මේ බලන්න."

ඔෂින් හිටෝෂිව පිටේ රඳවාගෙන වැඩ කරමින් හිටියේ.

"බොහෝම හොඳයි. හොඳ ලකුණු තියෙන්නේ."

රූසෝ ටකේෂිගේ හිස පිරිමැද්දා. ඔෂින් ටකේෂි ළඟ දණ ගසාගෙන ඔහු වැළඳ ගත්තා.

"ඊළඟට ඉහළ ප්‍රාථමිකය. ඉන් පස්සේ ජ්‍යෙෂ්ඨ පංතියට. ඊළඟට සරසවියට. මම ඉගෙන ගන්න ආශාවෙන් හිටියේ. ඒත් මගෙ දෙමාපියෝ දුප්පත් නිසා මට පාසල් යන්න ලැබුණේ නැහැ පුතේ. ඔයා හොඳට ඉගෙන ගන්න. ඔයාගේ තාත්තා ඔයාට කොහොම හරි වියදම් කරයි."

"තැපැල්, තැපැල්..."

"ඔෂින් ටනකුරා."

"දෙන්න. ස්තුතියි."

"මේවා නම් ඔයාට වුණාට ඔයා යැව්ව ලිපි ආපිට ඇවිල්ලා."

ඔෂින් ලිපි දෙක තුනම අතට ගත්තා.

Scanned with CamScanner

sinhalaebooks.com



"බලන්න රූසෝ මම කායෝට යැව්ව ලියුම්. සේරම ආපිට ඇවිල්ලා." ඔෂින් කල්පනා කළා.

"ඔෂින්, ඔයා ලිපිනය හරියට ලියල ද?"

ඔෂින් හිස දෙපසට වැනුවා.

"රූසෝ, රිකි නැන්දා යමගාටා වලදී මාව මුණ ගැහුණ වෙලාවේ කිව්වා, කගායා වල බිස්නස් ප්‍රශ්න කියලා. මසාවෝ හුඟක් ණය වෙලා කියලා."

"එහෙම ද?" රූසෝත් නිහඬව කල්පනා කළා.

"ඔෂින් ඔයා ගිහින් ටෙලිෆෝන් කරලා බලන්න. දැන්මම යන්න."

තැපැල් කන්තෝරුවට ඉක්මනින් ගිය ඔෂින් හෙමින් හෙමින් ආපිට ආවා.

"රූසෝ, ටෙලිෆෝන් කරන්න බැරි වුණා. තැපැල් කන්තෝරුවෙන් කිව්වා එහෙ ටෙලිෆෝන් කපලලු."

ඔෂින්ට දැඩි බියක් දැනුණා. කුමක් හෝ සිදුව ඇති බව ඇය සිතුවා. දින දෙකකට පසු මැඩම් හීසා පණිවිඩයක් එවා තිබුණා ඔෂින්ට හැකි ඉක්මනින් ඇයගේ නිවසට එන ලෙස දන්වා.

"දැන්ම ම යන්න ඔෂින්. මම මේ වැඩ ටික කරගන්නම්. ටකේෂි උදව් කරයි. ඔයා යන්න."

ඔෂින් හුඟක් කාලෙකට පසු මැඩම් හීසා ගේ නිවසට ගියා.

"මම ආවා."

ඔෂින් ගේ හඬ අසා හීසා මැඩම් එළියට ආවා.

"ඔෂින්, අන්න කෝටා ඇවිල්ලා. ඔයාව ගෙන්වන්න කිව්වා. කරදර කළාට සමාවෙන්න."

"නෑ මැඩම්, මම කෝටා මුණගැහෙන්න ඕනෑ කියලා හිත හිතා හිටියේ."

කෝටා මිටි මේසය ළඟ තේ බොමින් හිටියා.

Scanned with CamScanner

sinhalaebooks.com



"දෙන්නා කතා කරන්න. මම කෝටා ට කෑම ටිකක් හදන්නම් ගෙනියන්න."

"මම එහෙ එන්න හිටියේ. ඒත් මාව පොලිසියෙන් හොයන නිසා එහෙ එන එක හොඳ නැහැ හිතුණා. ඔෂින් අම්මා මළා ලු නේද?"

"ඔව්, අම්මා මුළු ජීවිත කාලයම දුක් වින්දා."

"එහෙම තමයි ඔෂින් අඳ ගොවියන්ගේ ජීවිතේ දුකේමයි. අපේ සංවිධානය තහනම් කරන්නයි රජය මාන බලන්නේ. ඉතින් ඔෂින් ඔයා මොනවද කායෝ ගැන දන්නේ?"

"මම මේ ඔයාට කියන්නයි හිතුවේ. මම කායෝට යැව්ව ලියුම් සේරම ආපිට ආවා. ටෙලිෆෝන් කරන්න ගියා. ඒත් ටෙලිෆෝන් කපලාලු."

"එහෙමද? ඔෂින් කලබල වෙන්න එපා. මම සකාටා ගියා. කගායා ආයතනය වහලා."

"වහලා?" ඔෂින් පුදුමයෙන් ඇහුවා.

"වහලා නෙමෙයි සීල් තියලා. ඔයා දන්නවද? කායෝ ගේ මහත්තයා සියදිවි නසා ගත්තා."

"සිය දිවි නසා ගත්තා? මසාවෝ ! !"

ඔෂින් කෝටා දෙස බලාගෙන හිටියා විමතියෙන්.

"ඒ....එතකොට කායෝ? දෙමාපියෝ."

"කවුරුවත් එහෙ නෑ ඔෂින්. සේරම අතුරුදහන්. සකාටා වල මිනිස්සු කතා වෙන්නේ කගායා ගැනම තමයි. ලැජ්ජාව නිසා කායොයි දෙමාපියොයි, කොහේ හරි යන්න ඇති කියලයි මිනිස්සු නම් කියන්නේ."

"ඇයි සැමියා සියදිවි නසාගත්තේ?"

"එයා හුඟක් ණය වෙලා. බිස්නස් වලට සල්ලි හිර කරලා. ගේ දොර ඉඩ කඩම් කගායා ආයතනය උකස් තියලා. අන්තිමට සියදිවි නසාගත්තා."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඇයි මසාවෝ එහෙම බිස්නස් කළේ."

"කායෝ ගේ සැමියා පොහොසත් කෙනෙක් නෙමෙයි. කායෝව බැන්දෙත් සල්ලි නිසා. එයා ඉක්මනට පෝසත් වෙන්න හිතුවා. වස්තුව වැඩි කර ගන්න හිතුවා."

"කායෝ මුලදී මසාවෝ එක්ක හිටියේ සතුටින් නෙමෙයි. දැන් මට හිතෙනවා මුල් වැරැද්ද සිද්ධ වුණේ මගෙන් කියලා."

"ඔයාගෙන්?"

"ඔව්, කායෝ හැම විටම කීවේ ඔයා එයාගේ කාමරයට ආවොත් මට කියන්න කියලා. මම එදා ඇත්ත කිව්වා නම් මෙහෙම වෙන්නේ නෑ."

"එහෙම නෑ ඔෂින්."

"නෑ, කෝටා මේවා වලට මම වග කියන්න ඕනෑ. කායෝ මසාවෝ බැන්දේ නැත්නම් එයාගේ ජීවිතයම වෙනස් වෙනවා. මට සමාවෙන්න කායෝ."

ඔෂින් හිස පහතට නවාගෙන හිටියා. ඇයගේ දෑසින් කඳුළු බිඳු ගලා ගියා.

"ඔෂින්, එහෙම නම් මම කායෝට ඉස්සර වෙලානේ ඔයාව මුණ ගැහුණේ."

"අනේ කෝටා අපි කායෝ හොයමු."

"හොඳයි මම අදම සකාටා යනවා. මම කොහොම හරි කායෝ හොයනවා. ඒක මගෙත් වගකීම."

"මට විශ්වාසයි ඔයාට කායෝ හොයාගන්න පුළුවන් වෙයි කියලා. මම එයාලා සේරම බලාගන්නවා කෝටා."

ඔෂින් නිවසට පැමිණ රූසෝට සියලු විස්තර කිව්වා. ඔෂින් සමඟ එක්ව රූසෝත් දුක් වුණා.

මේ සිදුවීමෙන් පසුව වසරක් පමණ ගත වී ගියා.

1930 වසර උදා වුණා. ඔෂින් සෑම දිනකම කෝටාගෙන් පණිවිඩයක් හෝ කෝටා හෝ බලාපොරොත්තුව හිටියා. ඒ

Scanned with CamScanner

sinhalaebooks.com



කායෝ ගැන දැන ගැනීමට රිකි තැන්දාට ලිව්වා කායෝ ගැන සොයන ලෙස ඉල්ලා. මැඩම් හීසා ගේ නිවසට ගොස් කෝටා ගැන තොරතුරු ඇසුවා. එක් දිනක් කෝටා, ඔෂින්ගේ මාළු කඩය ළඟ සිටින අයුරු ඔෂින් අහම්බෙන් දුටුවා.

කෝටා හිස වනා ඉදිරියට ගියා. ඔෂින් කෝටා පිටුපස ගියා. කෝටා ගමන් කළේ වේගයෙන්. පාළු තැනක ඔහු නතර වුණා.

"කායෝ හම්බවුණා. මෙන්න එයාගේ ලිපිනය. ඒක අවන්හලක්. ඔයා එයාව බලන්න යන්න. මාව මුණගැහෙනවාට වඩා එයා ඔයා දකින්න කැමති වෙයි. මේ යෙන් සීය එයාට දෙන්න. මට පරක්කු වෙන්න බැහැ."

කෝටා ඉක්මනින් අඩිය තබමින් ගියා.

"කෝටා.........." ඔෂින් ගේ හඬින් කෝටා නතර වී ආපිට බැලුවා.

"මම ඔයාගේ සුබ පැතුම් කායෝට දෙන්නම්. ඔයාට සුබ ගමන්. ප්‍රවේශමෙන්...."

කෝටා ටික වේලාවක් ඔෂින් දෙස බලාගෙන සිට ඇයට ආචාර කළා.

ඔෂින් හිස නැමුවා. කෝටා නොපෙනී ගියා. ඔෂින් නිවසට ගියා.

එදා කඩේ වැඩ නිමාකර මාළු ලෑලි සෝදා දැමූ පසු රාත්‍රී කෑම මේසයේ දී රූසෝට සියල්ල විස්තර කළා. යෙන් සීයේ නෝට්ටුව සමඟම කායෝ සේවය කරන අවන්හලේ ලිපිනය ලියූ කොළය දුන්නා.

"රූසෝ සමාවෙන්න මම කරදර කරනවාට. මම කායෝ බලන්න යන්න ඕනෑ."

රූසෝ ලිපිනය දෙස බලා කලබලයෙන් කතා කළා.

"ඔෂින්, මේ හරිය මම දන්නවා. වැඩිය හොඳ තැනක් නෙමෙයි. මෙතන ඉන්නේ වැඩිපුරම ගේෂා කාන්තාවෝ."

"නෑ, රූසෝ කායෝ ඔය තරම් පහත් තත්වයට වැටෙන්නේ නෑ."

Scanned with CamScanner

sinhalaebooks.com



"ඔෂින් ඔයා යනවා නම් මේ තත්ත්වය දැනගෙන යන්න. තනියම මෙහෙම තැන්වලට යන්න නම් එපා. ඔය පළාත් නපුරුයි. කෝටා දැනගන්න ඇති කායෝ ගත කරන ජීවිතය. ඒකයි එයාට යෙන් සීයක් දුන්නේ. හොඳයි ඔයා ගිහින් කේන් හොයා ගන්ඩ බලන්ඩ."

ඔෂින්, කායෝ දැක ගැනීමේ බලාපොරොත්තුවෙන් පසුවදා ම ටෝකියෝ ගියා.

Scanned with CamScanner

sinhalaebooks.com

# විසි පහ

ඒ 1931 සරත් කාලයයි.

ඔෂින් ටෝකියෝ වේ පිහිටි හසකාවා මැඩම් ගේ සාප්පුව සොයා ගියා.

“මැඩම්, මැඩම්, මම ඔෂින්.”

“ඔෂින් ඔයා? එන්න, එන්න ඇතුළට.” හසකාවා මැඩම් ඔෂින්ට දොර ඇර දුන්නා.

“මැඩම්, සාප්පුව අලුත් වෙලා.” ඔෂින් කීවේ වට පිට බලමින්.

“ඔෂින් දැන් මිනිස්සු බලන්නේ පිට ඔපේ. ණයට මුදල් අරගෙන සාප්පුව අලුත් කළා.”

“කෝ මැඩම් සේවිකාවෝ.”

“ඒ ගොල්ලන් ඔයාලා වගේ නෙමෙයි. වෙලාවට වැඩට ආවා. වෙලාවට ආපිට ගියා. හරිම ආඩම්බරයි. ඇති දක්ෂකමකුත් නැහැ. දන්නේ වෙස්ටන් ස්ටයිල්. ඒවාට ඒ තරම් පුහුණු වෙන්න ඕනෑ නෑ. ”

මැඩම් හසකාවා මිටි මේසය මත තේ කෝප්ප හා කේතලය තබා ඔෂින්ට තේ බීමට ආරාධනා කළා.

“මැඩම් මෙතන තියෙනවා මාළු අච්චාරු. මම ඔයාට හදාගෙන ආවා.”

“බොහෝම ස්තුතියි. ඇයි ඔෂින් මොකක් හරි ප්‍රශ්නයක් ද?

Scanned with CamScanner

sinhalaebooks.com



මොකද ඔයා මෙහෙ එන හැම දවසකම ප්‍රශ්නයක් තිබුණ නිසා ඇහුවේ."

"මැඩම් මතකයි නේද මම පුංචි කාලේ සේවය කළ කගායා ආයතනය. කායෝ මගෙ යාළුවා එහෙම."

"ඔව්, ඔයානේ එයාව ආපිට සකාටා ඇරියේ?"

ඔෂින් කායෝ ගැන සියල්ලම මැඩම්ට කිව්වා. ඇය ටෝකියෝ වේ සිටිනා බවට ලැබුණ ආරංචියකට මෙහි පැමිණි බවත් පැවසුවා.

"කෝ බලන්න ලිපිනය?"

ඔෂින් අතින් ලිපිනය ගත් හසකාවා ඒ දෙස බැලුවේ විමතියෙන්.

"ඔෂින්, ඔයාට තනියම එහෙ යන්න බෑ. ඒක නරක පළාතක්."

"ඒත් මම හෙටම එහෙ යන්න ඕනෑ මැඩම්. කායෝ දකින කල් මට ඉවසුම් නැහැ මැඩම්."

පසුදින කේන් පැමිණියා.

"අනේ කේන් ඔයා?" ඔෂින් විමතියෙන් කේන් දෙස බලා සිටියා.

"ඔෂින් හුඟ කාලෙකින්. ඔයා ආවා කියලා දැනගත්තා ම මම ඉක්මනට ආවා."

"මම නොලිව්වාට සමාවෙන්න කේන්. ටිකක් කරදර සිද්ධ වුණා."

"ඔෂින් කේන් නිතර මාව මුණ ගැහිලා ඔයාලා ගැන අහනවා." මැඩම් හසකාවා කිව්වා.

"ස්තුතියි කේන්."

"ඔෂින් ඔයා කායෝ බලන්න කේන් එක්ක යන්න. ඒක තමයි මම කේන්ට එන්න කියලා පණිවිඩයක් යැව්වේ. කේන් ඔය ඕනෑ කෙනෙක් අඳුනනවා නේ."

Scanned with CamScanner

sinhalaebooks.com



"එහෙම නම් මම ඉස්සර වෙලා ගිහින් බලන්නම්." කේන් ඔෂින්ට කිව්වා.

"අනේ කේන් මාවත් ඔය එක්කම එක්කගෙන යන්ඩ. මම කායෝටයි නගෝමිටයි කෑම ටිකක් ඉක්මනින් සූදානම් කර ගන්නම්."

ඔෂින් හසකාවා මැඩම් සමඟ කෑම සූදානම් කළා.

"ඔෂින් එහෙම නම් මේ විස්කෝතු නගෝමිට ගෙනියන්න. මේ කෙසෙල් ගෙඩිත් හොඳයි."

ඔෂින් හසකාවා මැඩම්ගෙන් සමුගෙන කේන් සමඟ පිටත් ව ගියා. පැය දෙක තුනක ගමනකින් පසු ඔවුන් බෙන්තෙන්චෝ ප්‍රදේශයට ළඟා වුණා.

"ඔෂින්, ඔයා දකින දේවල් ගැන බයවෙන්න එපා." ඔෂින් හිස සෙලෙව්වා.

කේන් එහි වූ අවන්හල ඇතුළට ගොස් එහි කාමර දෙස බලමින් ගියා. කාමර වලින් පිට වූ සමහර මිනිසුන් ඔෂින් දෙස කෑදර දෑසින් බලා සිටියා. තරප්පු පෙළක් ළඟ නතර වූ ඔෂින් එහි උඩ වූ කාමර දෙස බැලුවා. එවිට ම කුඩා දරුවෙක් අඬන හඬ ඔවුන්ට ඇසුණා.

"ඒ නගෝමි වෙන්න ඇති." ඔෂින් රහසින් මෙන් කේන්ට කිව්වා.

කේන් හිස වැනුවා. එවිටම තරප්පු පෙළ බැස්සේ කායෝ,

"මගේ දරුවා අඬනවා. කෝ කිරි හැදුවේ නැද්ද?"

ඇය තරප්පු පෙළ බැස ආවේ එසේ කියමින්. ඔෂින් පුදුමයෙන් කායෝ දෙස බලා සිටියා. මොහොතකට ඇය ගොළු වුණා.

"කායෝ........"

ඔෂින් ගේ කටහඬ ඇසුණු විගස කායෝ හැරී බැලුවා. ඇය විමතියෙන් දෑස් මහත් කර ගත්තා. ආපිට හැරී හැකි වේගයෙන් තරප්පු පෙළ නැංගා.

Scanned with CamScanner

sinhalaebooks.com



"යන්න එපා කායෝ. ඔහොම ඉන්න."

ඔෂින් තරප්පු පෙළ නැගීමට සූදානම් වන විටම හැඩි දැඩි දෑතකින් ඇය තල්ලු කර දැමුණා. කේන් ඔෂින්ව අල්ලා ගත්තා.

"ආ කේන් මම තමුසෙ දැක්කෙ නැහැ. මේ ෂෝක් කෙල්ල මෙහෙ නවත්වන්ඩ ද?"

"කටවහගන්නවා. මෙහෙ ඉන්නවද කායෝ කියලා කෙනෙක්."

"නැහැ මෙහෙ නැහැ."

කේන් හැඩි දැඩි පුද්ගලයාගේ උරහිසින් අල්ලා ගත්තා.

"කියනවා එයාට මෙහෙට එන්න කියලා."

"මේ කේන් තමුසෙ නීතිය දන්නවානේ. අන්න ඒ ක්‍රමයට එනවා."

කේන් මුදල් පසුම්බියෙන් නෝට්ටු කීපයක් රැගෙන ඔහුගේ අත්ල මත තැබුවා.

"පැයයි දෙන්නේ."

"කට වහපං උඹලා කරන වැඩ මම දන්නවා. යන්න ඔෂින් උඩට. ඔයාට ඕනෑ තරම් කතා කරන්න. මම මෙතනම ඉන්නවා. බය වෙන්න එපා."

ඔෂින් අතින් බිම වැටුණු කෑම පෙට්ටියත් රැගෙන පඩිපෙළ දිගේ දිව්වා. ඇය කාමර කීපයක් ඉදිරියේ නතර වුණා. එහි එක කාමරයක කුඩා දරුවා නොනවත්වාම අඬන හඬ ඇසුණා. ඔෂින් එතන දොර ළඟ දණ ගසා ගත්තා.

"කායෝ, මේ මම ඔෂින්. මම ඇතුළට එන්න ද?"

නිහඬව ටික වේලාවක් ගත වුණා. ඔෂින් සෙමෙන් කාමරයේ දොර තල්ලු කළා. කායෝ අඬන දරුවා තුරුලු කරගෙන කාමරයේ දොරට පිටු පා අඬමින් හිටියා.

ඔෂින් කායෝ පිටුපස සිට

"කායෝ මම දරුවාට විස්කෝතු ගෙනාවා. මේවා දෙන්න.

Scanned with CamScanner

sinhalaebooks.com



මේ කෙසෙල් ගෙඩිත් තියෙනවා." කිව්වා.

මෙවිටම කාමරයේ දොර ඇරගෙන කාන්තාවක් පැමිණියා.

"කායෝ, දෙන්න බබාව මම එයාට කිරි හැදුවා."

ඇය දරුවා රැගෙන ගියා. කායෝ කාමරයේ මුල්ලට වී අඬමින් සිටියා.

"කායෝ, අපි ඔයා ගැන වද වුණා. ඇයි මට කලින් නොකීවේ."

කායෝ නිහඬව සිට සෙමෙන් කතා කළා.

"කියලා වැඩක් නෑ ඔෂින්."

"කෝටා මට කිව්වා සැමියා දිවි නහගත්තු බව. කගායාව සීල් තියලා කිව්වා. අවුරුද්දකට ළං වෙන්න එයා ඔයාලව හෙව්වා. අන්තිමට එයා තමයි ඔයා මේ අවන්හලේ වැඩ කියලා හොයා ගත්තේ. මේ යෙන් සීය ඔයාට දෙන්න කිව්වා."

"ඔෂින්, දැන් ඔයා ආපිට යනවා නම් හොඳයි."

"කායෝ කෝටා ඔයා ගැන හුඟක් වද වුණා. මේ සල්ලි ගන්න."

"කිසි තේරුමක් නෑ. එයා මට සල්ලි දෙන එක."

"නෑ තේරුමක් තියෙනවා. අපි ඔයා ගැන වද වෙනවා. ඔයා දැන් මාත් එක්ක එන්න ඕනෑ. කෝ අම්මා, තාත්තා. මම සේරම එක්කගෙන යනවා ඉසේ වලට. අපි එකට ඉඳිමු. මට ඔයා වගේම ඔයාගේ අම්මා තාත්තා හුඟක් උදව් කළා. දැන් මට පුළුවනි ඒ උදව් වලට වන්දි ගෙවන්න. අපිට මාළු කඩයක් තියෙනවා. කරදරයක් නෑ."

"ඔෂින්, ඕවා කියලා වැඩක් නෑ ඔෂින්. අම්මයි, තාත්තයි දැන් නෑ. එයාලා මැරුණා."

"මැරුණා ???"

කායෝ නිහඬව නැගිට ගොස් ලාච්චුවක දමා තිබූ සුදු රෙද්දෙන් ආවරණය කළ මිනී අළු සහිත පෙට්ටි දෙක ඔෂින්ට පෙන්නුවා.

Scanned with CamScanner

sinhalaebooks.com



"මම යුතුකම් දන්න හොඳ දුවෙක් නෙමෙයි ඔෂින්. මේ අළු මේ වගේ තැනක තියන්න හොඳ නෑ. ඒක අගෞරවයක්. ඒත් සකාටා ගෙනිහින් පන්සලකට භාර දෙන්න මට සල්ලි නෑ ඔෂින්. එයා දිවි නහ ගන්න කොට අපේ සේරම දේවල් උකස් තියලා. ණය තුරුස් ගෙවන්න සල්ලි නෑ. අපි තුන් දෙනාම ටෝකියෝ ආවා. ඇවිත් කුලී ගෙයක් ගත්තා. තාත්තාගේ මොලේ ලේ කැටියක් හිරවෙලා තාත්තා ඉක්මනින් මැරුණා. කිසි වේදනාවක් වින්දේ නැහැ. ඒකත් සැනසීමක්. මම රස්සාවල් හෙව්වා. ජපන් ආර්ථිකයේ පසුබෑමක්. රැකියා නෑ. මම ගිය පාර වැඩ කළ අවන්හලට ගියා. ඒත් වයස වැඩියි කිව්වා. මේ අතර අම්මා අසනීප වුණා. අංශභාගය හැදුණා. රෝහලේ මාස තුනක් හිටියා. මම ඉස්පිරිතාලෙට ගෙවන්න සල්ලි හෙව්වා. මෙහෙන් විතරක් යෙන් පන්සීයක් දෙන්න පොරොන්දු වුණා. අවුරුදු පහක්ම ඒ වෙනුවෙන් මෙහෙ සේවය කළ යුතු බව කිව්වා. මට එකම සැනසීම වුණේ නගෝමි තියාගන්න අවසර දුන්න එකයි. අම්මාගේ අවසන් කටයුතු කළා ඒ මුදල් වලින්. මගෙත් බඩේ අමාරුවක් හැදිලා වරින් වර රෝහලේ නතර වුණා."

"කායෝ ඔයා නගෝමි හදන්නේ මෙහෙම තැනක ද?"

"ඒත් ඔෂින්, මට තියෙන එකම සම්පත නගෝමි."

"බැහැ මම ඔයාව මෙහෙ තියන්නේ නැහැ. අපි කොහොම හරි මෙහෙ ණය ගෙවමු. ඔයාව හෙට මම එක්කගෙන යනවා."

"අන්න ඔයාට කස්ටමර් කෙනෙක්." කාන්තාවක් කාමරයට එබුණා.

"ඔෂින්, ඔයා යන්න ඔෂින්."

ඔෂින් කේන් එක්ක පිටවී ආවා.

"එහෙම නම් යෙන් දාහ ගෙවනකල් කායෝ නිදහස් කරන්නේ නැතිලු ද?"

"ඔව් එහෙම තමයි කීවේ." කේන් කිව්වා.

"යෙන් දාහක් කියන්නේ ලොකු මුදලක්. සමාවෙන්න ඔෂින් මට නම් එහෙම උදව්වක් කරන්න බැරිවෙයි." හසකාවා මැඩම් කිව්වා.

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් කායෝ ගැන සිතමින් නින්දට ගියා.

එදින රාත්‍රියේ කායෝ ගේ සේවාදායකයා ලවා ඇය සකේ බෝතල් කීපයක් ම ගෙන්වා ගෙන ඒවා ඉවර වන විට ළඟම වූ කාමරයට ගොස් එහි තිබූ සකේ බෝතල් කීපයක්ම ගෙනවිත් බිව්වා. ඉන්පසු වෙරි මතින්ම මෙට්ටය මතට ඇද වැටුණා.

ඔෂින් පසුවදා උදේම කායෝට කෑම සූදානම් කළා. ඒ සමඟම ඇයගේත්, නගෝමිගේත් ඇඳුම් ගෙන ඒමට ලොකු ලේන්සුවක් සොයා ගත්තා. මිනී අළු බඳුන් ද ඒ සමඟම රැගෙන ඒමට ඇය අදහස් කළා.

"හෙට උදේ ම යමු ඔෂින්. මම යාළුවෝ දෙන්නෙක් එක්ක ගෙන ම එනවා. මම දන්නවා කායෝ නිදහස් කරන හැටි. උන් මෙච්චර කල් කොච්චර හම්බ කරන්න ඇති ද? අහිංසක ගෑනියෙක් බව දැනගෙනයි ඔය නීති. මම කතා කරන්නම්."

කේන් ගේ මේ වචන ඔෂින්ටත් ධෛර්යයක් වුණා. කෙසේ හෝ කායෝත් නගෝමිත් එම අපායෙන් මුදා ගැනීම ඔෂින් ගේ බලාපොරොත්තුව හා අධිෂ්ඨානය වුණා. බැරි වුණොත් නගෝමිව අරගෙන යනවා ඉසේ වලට. මගේ ම දරුවෙක් වගේ හදාගන්නවා.

"මම නම් හිතන්නේ නෑ කායෝ දරුවා දෙයි කියලා."

ඇගේ අදහස දැනගත් මැඩම් හසකාවා කිව්වා.

"ඒත් මැඩම් කායෝගේ දෙමාපියන්ගේ අළු මම අද එහෙන් අරගෙන එනවා. ඒවා සකාටා ගෙනියන්නම ඕනෑ."

"හොඳයි, ප්‍රවේශමෙන් ගිහින් එන්න."

කේන් ගේ මිතුරන් තිදෙනෙක් ද ගමනට එක් වුණා. ඔවුන් අවන්හලට යන විට වෛද්‍යවරයෙක් ඉන් බැහැරව ගියා.

"ආ කේන් මම මේ එහෙ එන්න හිටියේ. අන්න අර කරදරකාර ගෑනි මළා. දැන් මිනිය ගෙනියන එකයි. ඕයත් ගෙවලා දැම්මොත් හොඳයි."

"කායෝ.... කා....යෝ.. මැරුණා."

Scanned with CamScanner

sinhalaebooks.com



ඔෂින් විස්මිත්තව ටික වෙලාවක් හිටියා. ඇය පියගැට පෙළ නැග කායෝ ගේ කාමරයට දුව ගියා. කායෝ ගේ මුහුණ වසා තිබූ පොරවනය ඉවත් කළ ඔෂින් ඇය ගේ මුහුණ දෙස බලාගෙන හිටියා.

"ඇයි කායෝ..... කායෝ නැගිටින්න."

ඔෂින් ඉක්මනින් කෑම බඳුන විවෘත කර තෝෆු කෑල්ලක් අතට ගත්තා.

"මේ බලන්න මම ඔයා ආසම කරන කෑම හදාගෙන ආවා. මේ බලන්න කායෝ."

ඔෂින් තොල් මතුරමින් කායෝට කතා කළා.

"දැන් ඇති ගෑනියේ ඔය ළමයයි, මේ මිනියයි එළියට ගෙනියනවා."

අවන්හල අයිතිකරු කාමරයට කඩා වැදී කායෝ ගේ ඇඳුම් ඔෂින් වෙතට විසි කළා.

"මේවත් ගෙනියනවා."

ඔහු අල්මාරියේ පහත ලාච්චුව අරින විට ඔෂින් එතනට පැන දෙමාපියන්ගේ අළු බඳුන් අතට ගත්තා.

"මේ මොනවද?"

"මේ එයාගේ දෙමාපියන්ගේ අළු."

"මොනවා මම දැනගෙන හිටියේ නෑ ඔය ගෑනි මේ ජරාවත් අල්මාරියේ දමාගෙන කියලා."

"කට වහපන්." කේන් කෑගැහුවා.

"දැන් ණය ගෙවපන් ගෑනියේ."

"කතා කරන්න ඉගෙන ගනින්. මේ ඔෂින්. එයා කායෝගේ යාළුවෙක් විතරයි."

"ඒකට කමක් නෑ ණයට යෙන් පන්සීයයි. බෙහෙත් වලට, ළමයගෙ කිරිපිටි වලට, මේ ගෑනිගේ වැඩේ සකේ බිව්වා. එව්වාට, දවසට වේල් තුනක් කන්න දුන්නා. සේරම යෙන් දාහක් ගෙවනවා."

Scanned with CamScanner

sinhalaebooks.com



"කටවහපන්, මම දන්නවා උඹ මේ අහිංසක ගෑනිගෙන් කොයි තරම් හම්බ කළා ද කියලා. වැඩිය කෑ ගැහුවොත් පොලිසියට කියනවා. ඊයේ කායෝ හොඳ සනීපෙන් හිටියා. අද උදේ එයා මැරිලා. ඒ කොහොමද කියලා එතකොට උත්තර දීපන්."

"නෑ නෑ ණය එපා. මිනිය ගෙනියනවලා." කී අවන්හල අයිතිකරු යන්න ගියා.

"ඔෂින් ඔයා නශෝමි අරගෙන යන්ඩ. තව ටික වෙලාවකින් මිනි සාප්පුවෙන් එයි. මම යාළුවෙක් පිටත් කළා."

කායෝ ගේ අවසන් කටයුතු නිමකර ඒ අළු බඳුනක දමා සුදු රෙද්දකින් ගැට ගසා යශිරෝ මැඩම්ගේ නිවසට ගෙන ආවා.

ඔවුන් ඒවා කෙටි මේසයක් මත තබා මල් බඳුන් තිබ්බා. කේන් දුම් බඳුනක් ගෙනැවිත් ඔෂින් අතට දුන්නා.

ඇය ගෞරවයෙන් හිස නමා එම බඳුන් වලට දුම් ඇල්ලුවා. එකවරම එක් පෙට්ටියකින් පෙනුන සුදු ලියුම් කවරයක් ඔෂින් දැක්කා. ඇය එය අතට ගත්තා.

"ලියමනක්."

ඇය එහි කවරය විවර කළා.

"මේ කෝටා දුන්න යෙන් සීයත් තියෙනවා. කායෝ ගේ අකුරු."

ඇය ඉක්මනින් ලිපිය කියෙව්වා.

***ඔෂින්,***

***ස්තූතියි, ඔයා මාව බලන්න ආවාට. මම ඔයාට කීවේ නැහැ. මගෙ බඩේ අමාරුව උත්සන්නයි. මම මැරෙන්න බය නෑ ඔෂින්. මම ඔයා ගැන දන්නවා. ඔයා මගේ නශෝමි ඔයා ගේ දරුවෙක් වගේ බලාගන්න බව මම දන්නවා.***

***මම වැඩකට නැති ගෑනියෙක්. ඔයා හෙට මාව එක්කගෙන යන්න එන බව මම දන්නවා. ඒ නිසයි මම මේ ලිපිය ලිව්වේ. මේ සමගම කෝටා***

Scanned with CamScanner

sinhalaebooks.com



දුන්න මුදල් තියෙනවා. ඔයා ඒ මුදල් වලින් සකාටා වල අම්මලාගේ අඩු තැන්පත් කරන්න. මගේ අඩු විසුරුවා දමන්න. මම අම්මලට හරියට වද දුන්නා ඔෂින්.

අපි එකට සෙල්ලම් කළ කාලය ඔයාට මතක ද ඔෂින්. ඒක සුන්දර ලෝකයක් නේද ඔෂින්, මට සමාවෙන්න. නශෝමිගේ බර ඔයාට පැවෙව්වාට. ඉතින් මම සදහටම සමුගන්නම්. ඔෂින් මාව අමතක කරන්න එපා මගෙ ළබැඳි සොයුරියේ.

කායෝ.

**ඔෂින් තෙවන කොටසින් ඔබ හමුවන තෙක්**
**දෙවන කොටස මෙසේ නිමාව දකියි.**

Scanned with CamScanner